# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය

## II වැනි කාණ්ඩය

අමාත්‍ය මණ්ඩලයේ අධිකාරය යටතේ රාජ්‍ය
පරිපාලන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා
විසින්
නිකුත් කරන ලදී

**1999**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ගත හැක.

මිළ : රු. 65.00 තැපැල් ගාස්තුව : රු. 7.00

# ආයතන සංග්‍රහය

## II වැනි කාණ්ඩය

ආයතන සංග්‍රහයේ මෙම කාණ්ඩය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41,51,52,54 සහ 114 (6) යන ව්‍යවස්ථාවල සඳහන් රජයේ නිලධරයන් ද, යුද හමුදාවේ, නාවික හමුදාවේ සහ ගුවන් හමුදාවේ සාමාජිකයන් ද හැර සෙසු සියලුම රජයේ නිලධරයන්ගේ විනය පාලනය පිළිබඳව වූවකි.

02. මෙම කාණ්ඩයෙහි අඩංගු විධිවිධානයන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55 (4) වැනි ව්‍යවස්ථාව ප්‍රකාර අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර ඇත.

03. දැනට ව්‍යවහාරයේ පවත්නා 1981.04.08 දාතමින් යුතු II වැනි කාණ්ඩය වෙනුවට මෙම අභිනව II වැනි කාණ්ඩය 1999 නොවැම්බර් 01 වැනි දින සිට බලපැවැත්වෙනු ඇත.

04. අර්ථ කථනය සම්බන්ධයෙන් පැනනඟින ප්‍රශ්න හා ගැටලු ද, මෙම ව්‍යවස්ථාවල ආවරණය නොවනු අවස්ථා ද ආයතන අධ්‍යක්ෂ ජනරාල් වෙත වාර්තා කළ යුතු ය.

පී.ඒ. සේනාරත්න,
ලේකම්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

1999 අගෝස්තු මස 02 වැනි දින.

# පටුන


| පරිච්ඡේදය | මාතෘකාව | පිටුව |
|---|---|---|
| XLVII | සාමාන්‍ය හැසිරීම හා විනය | 1 |
| XLVIII | විනය කාර්ය පරිපාටිය පිළිබඳ රීති | 15 |
| | * රජයේ නිලධරයන් විසින් සිදුකළ හැකි වරදවල් සම්බන්ධ පළමුවන උපලේඛනය | 91 |
| | * රජයේ නිලධරයන් විසින් සිදුකළ හැකි වරදවල් සම්බන්ධ දෙවන උපලේඛනය | 93 |
| | * පරිශිෂ්ට ලැයිස්තුව | 95 |

# XLVII වැනි පරිච්ඡේදය

## සාමාන්‍ය හැසිරීම හා විනය

1. සාමාන්‍ය හැසිරීම
2. මත්පැන් හා විෂ මත්ද්‍රව්‍ය භාවිතය
3. තෑගිබෝග හා ආධාර ලැයිස්තු
4. මුදල් දුෂ්කරතා
5. පෞද්ගලික කාර්යයන් සඳහා රජයේ මුදල් පාවිච්චි කිරීම
6. ජනමාධ්‍යවලට හෝ මහජනයාට හෝ නිල ප්‍රවෘත්ති සැපයීම
7. පොත් පත් හා ලිපි පළකිරීම සහ විද්‍යුත් ජනමාධ්‍ය මඟින් කථා ප්‍රචාරය කිරීම යනාදී කටයුතු
8. ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි සහ වෙනත් අදාළ විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීම
9. රජයේ නිලධරයන් දේශපාලන කටයුතුවල නියැලීම

# XLVII වැනි පරිච්ඡේදය

# සාමාන්‍ය හැසිරීම හා විනය

## 1. සාමාන්‍ය හැසිරීම

1:1 රජයේ නිලධරයකුගේ සේවය ලබා ගැනීමට රජයට අවශ්‍ය වන සෑම විටකම ද සෑම වේලාවකම ද ඔහු රජයට පූර්ණ පක්ෂපාතීත්වය ඇතිව කටයුතු කළ යුතු ය.

පූර්ණ පක්ෂපාතීත්වය දැක්විය යුතු බව.

1:2 නිලධරයකු ලවා ඉටු කරවා ගැනීම මැනවැයි රජයට හැඟී යන ඕනෑම රාජකාරියක් ඉටු කරන ලෙස නියම කරනු ලැබූ විට නිලධරයා විසින් ඒ රාජකාරිය කාර්යක්ෂමව ද අනලස්ව ද ඉටු කළ යුතු ය.

පවරනු ලබන ඕනෑම රාජකාරියක් ඉටුකළ යුතු බව .

1:3 නිලධරයකු විසින් මුදල් රෙගුලාසි සංග්‍රහයේ හා ආයතන සංග්‍රහයේ විධිවිධාන ද, රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, භාණ්ඩාගාරයේ චක්‍රලේඛ හා වෙනත් දෙපාර්තමේන්තු චක්‍රලේඛ උපදෙස් ද, දෙපාර්තමේන්තු අත්පොත්වල හා උපදෙස් සංග්‍රහවල විධිවිධාන ද සැලකිල්ලෙන් කියවා තේරුම් ගෙන ඒවා පිළිපැදිය යුතු ය.

අදාළ රාජකාරිමය උපදෙස් තේරුම් ගෙන පිළිපැදිය යුතු බව.

1:4 නිලධරයකු විසින් සෑම විටකම ක්‍රියා කළයුත්තේ තමා දරන තනතුරට ගැලපෙන ආකාරයෙනි. නිලධරයකු රජයේ සේවය හෝ තමා දරන තනතුර හෝ අපකීර්තියට පත්වීමට තුඩු දෙන කිසිදු ක්‍රියාවක් නොකළ යුතු ය. රජයේ නිලධරයකු එවැනි ක්‍රියාවක් කළහොත් ඔහුගේ ආසන්නතම ප්‍රධානයා හෝ වෙනත් බලධරයකු හෝ විසින් පූර්වෝක්ත නිලධරයා සේවය කරන දෙපාර්තමේන්තුවේ ප්‍රධානයා වෙත හෝ ඒ නිලධරයා සේවය කරන අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත හෝ ඔහුගේ විනය බලධරයා වෙත හෝ අප්‍රමාදව ඒ පිළිබඳව වාර්තා කළ යුතු ය.

සිය තනතුරේ සහ සේවයේ හොඳ නම රැකිය යුතු බව.

1:5 නිලධරයකු විසින් ස්වකීය පෞද්ගලික කටයුතුත් රාජකාරී කටයුතුත් අතර ගැටුමක් ඇතිවන අන්දමේ කිසිම දෙයක් හෝ සිය නිල කටයුතුවලට අවහිර වන අන්දමේ කිසිම දෙයක් හෝ නොකළ යුතු ය. ඔහු සෑමවිටම හැසිරිය යුත්තේ ද එබඳු ගැටුම් මාත්‍රයක්වත් අවහිරයක්වත් පැන නැඟීමට ඉඩක් නොලැබෙන පරිද්දෙනි. ඔහු විසින් විශේෂයෙන්ම ආයතන සංග්‍රහයේ XXIX වැනි පරිච්ඡේදයේ විධිවිධානයන් සුපරීක්ෂාකාරීව පිළිපැදිය යුතු ය.

පෞද්ගලික කටයුතු සමඟ ගැටුම් වැළකිය යුතු බව.

**උසස් කිරීම් ආදිය සම්බන්ධයෙන් බලපෑම් නොකළ යුතු බව.**

1:6 රජයේ සේවයෙහි පත්කිරීම්, උසස් කිරීම්, මාරු කිරීම් හා විනයානුකූලව කටයුතු සම්බන්ධයෙන් නිලධරයකු විසින් කෙළින්ම හෝ අන් අයගේ මාර්ගයෙන් හෝ කවරකුගෙන් වූව ද අනියම් උදව්වක් ඉල්ලීම විනයානුකූලව ක්‍රියා කිරීමට හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 60 වැනි ව්‍යවස්ථාවෙන් විධිවිධාන සැලසී ඇති පරිදි නඩු මාර්ගයෙන් ක්‍රියා කිරීමට හෝ තුඩු දෙන විෂමාචාර ක්‍රියාවක් ලෙස සලකනු ලැබේ.

**අයුතු ප්‍රතිලාභ උදෙසා රාජකාරී හුවමාරු කර ගැනීම නොකළ යුතු බව.**

1:7 නිලධරයකු අයුතු ප්‍රතිලාභ තකා රාජකාරී හුවමාරු කරගැනීම හෝ ඊට තැත් කිරීම හෝ ඔහුට විරුද්ධව විනයානුකූලව ක්‍රියා කිරීමට හේතු වන්නේ ය.

**මහජනයාට ආචාරශීලී විය යුතු බව.**

1:8 නිලධරයකු මහජනයාට ආචාරශීලී විය යුතු ය. රාජකාරී කටයුතු සඳහා රජයේ කාර්යාලවලට පැමිණෙන සියලුම පුද්ගලයන්ට නොපැකිලව සහාය විය යුතු ය. සිය රාජකාරී කටයුතුවල දීත්, ලිපි ගනුදෙනු කිරීමේ දීත් හැමවිටම විනීත විය යුතු ය.

**භාෂා විලාසය සංවර විය යුතු බව.**

1:9 ලිපි ගනුදෙනු කිරීමේදීත්, කාර්යාල සටහන් හා වාර්තා ලිවීමේදීත්, නිලධරයකු විසින් සංයම වූ ද, සංවර වූ ද භාෂා විලාසයක් යොදා ගත යුතු ය.

**යටත් නිලධාරීන් වෙතින් මුදල් එකතු කිරීම නොකළ යුතු බව.**

1:10 නිලධරයකු විසින් මහජන පුණ්‍යාධාර සඳහා ස්වකීය යටත් සේවකයන්ගෙන් මුදල් එකතු කිරීමට කෙළින්ම සම්බන්ධ වීම හෝ ස්වකීය යටත් සේවකයන්ගෙන් එවැනි මුදල් එකතු කිරීමට තම පවුලේ අයට ඉඩදීම හෝ නොකළ යුතු ය.

**පෞද්ගලික කටයුතු සඳහා රජයේ සේවකයන් හෝ රජයේ දේපළ යොදා නොගත යුතු බව.**

1:11 නිලධරයකු විසින් කාර්යාල වේලාවල දී හෝ ඉන් බැහැර වේලාවක දී හෝ කවර අන්දමක පෞද්ගලික කටයුත්තකට වූව ද ලේකම්වරයාගේ විශේෂ අවසරය රහිතව සේවකයකු යොදා ගැනීම හෝ රජයේ දේපළ පාවිච්චි කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම් ය.

**රජයට බඩු බාහිරාදිය විකිණීම නොකළ යුතු බව.**

1:12 ලේකම්වරයාගේ විශේෂ පූර්ව අනුමැතිය නොමැතිව රජය වෙත බඩු බාහිරාදිය විකිණීමට හෝ ඒවායේ සාම්පල් ඉදිරිපත් කිරීමට හෝ කිසිම නිලධරයකු විසින් ක්‍රියා නොකළ යුතු ය.

## 2. මත්පැන් හා විෂ මත්ද්‍රව්‍ය භාවිතය

2:1 නිලධරයකු රාජකාරියෙහි නිරතව සිටිය දී හෝ රාජකාරියෙන් වියුක්තව සිටිය දී හෝ තමා සේවය කරන කාර්යාල පරිශ්‍රය තුළ හෝ වෙනත් රජයේ ආයතනයක පරිශ්‍රයක් තුළ හෝ බීමත්ව සිටීම හෝ එවැනි ස්ථානයක දී නිලධරයකු වෙතින් මත්පැන් ගඳ වහනය වෙමින් පැවතීම හෝ විෂ මත්ද්‍රව්‍ය භාවිතා කර සිටීම හෝ බරපතල විෂමාචාරයක් වේ. එවැනි අවස්ථාවක දී එම නිලධරයාට විරුද්ධව අදාළ ආයතන ප්‍රධානයා සහ අදාළ විනය බලධරයා විසින් අනිවාර්යයෙන්ම විනයානුකූලව කටයුතු කළයුතු වන්නේ ය.

මත්පැන් හා විෂ මත්ද්‍රව්‍ය භාවිතය විෂමාචාරයක් බව.

2:2 බීමත්ව සිටීම හෝ මත්පැන් ගඳ වහනය වෙමින් පැවතීම හෝ පිළිබඳව කරනු ලබන විධිමත් විනය පරීක්ෂණයක දී එම වරද සිදුකර ඇති බවට තහවුරු කිරීමට රජයේ වෛද්‍ය නිලධරයකුගේ හෝ මාණ්ඩලික මට්ටමේ නිලධරයන් දෙදෙනෙකුගේ සාක්ෂි වුව ද ප්‍රමාණවත් වන අතර, එම විධිමත් විනය පරීක්ෂණයක් මඟින් ඔහු වරදකරු බවට නිගමනය කරනු ලැබුවහොත් එම නිලධරයා සේවයෙන් පහ කිරීමට හෝ මෙම සංග්‍රහයේ 24:3 උප වගන්තිය යටතේ දැක්වෙන වෙනත් බරපතල දඬුවමක් පැනවීමට හෝ විනය බලධරයාට බලය ඇත්තේ ය.

බරපතල දඬුවම් පැමිණවිය යුතු බව.

2:3 ඉහත 2:2 උප වගන්තියේ සඳහන් වරදකට දෙවන වරට ද වරදකරු බවට පත්වන නිලධරයකු අනිවාර්යයෙන්ම සේවයෙන් පහකළ යුතු වන්නේ ය.

දෙවන අවස්ථාවේ දී අනිවාර්යයෙන්ම සේවයෙන් පහකළ යුතු බව.

2:4 ඉහත 2:1 උප වගන්තියේ සඳහන් පරිදි විෂ මත් ද්‍රව්‍ය පාවිච්චි කර ඇති බවට සැක කරනු ලබන නිලධරයකු එම වරද කර ඇති බව රජයේ වෛද්‍ය නිලධරයකුගේ හෝ අධිකරණ වෛද්‍යවරයකුගේ හෝ වාර්තාවකින් තහවුරු විය යුතු ය. විධිමත් විනය පරීක්ෂණයක් මඟින් නිලධරයා එම වරද කර ඇති බව ඔප්පු වුවහොත් ඔහු අනිවාර්යයෙන්ම සේවයෙන් පහකළ යුතු වන්නේ ය.

විෂ මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් වන කල අනිවාර්යයෙන්ම සේවයෙන් පහකළ යුතු බව.

## 3. තෑගිබෝග හා ආධාර ලැයිස්තු

තෑගිබෝග භාර ගැනීම නිලධරයන්ට හා ඔවුන්ගේ පවුල්වල අයට තහනම් බව

3:1 නෑ හිතමිතුරන් වෙතින් හුදෙක්ම පෞද්ගලික කාර්යයන්ට අදාළව තමන්ට ලැබෙන සාමාන්‍ය තෑගිබෝග හැර, නිලධරයකු විසින් හෝ ඔහුගේ පවුලේ කෙනෙකු විසින් නිලධරයා වෙනුවෙන් හෝ කිසිවකුගෙන් මුදලින් හෝ භාණ්ඩවලින් හෝ නිදහස් යාන පත්‍රයක නොහොත් සේවාවක ස්වරූපයෙන් හෝ සපයනු ලැබූ ද්‍රව්‍යවල නැතහොත් ඉටු කරනු ලැබූ සේවයක අගය උදෙසා පිරිනැමෙන අසාමාන්‍ය වට්ටමක් වශයෙන් හෝ කිසිම තුටු පඬුරක්, තෑගි බෝග ආදියක් හෝ වෙනත් ලාභ ප්‍රයෝජනාදියක් කෙළින්ම හෝ අන් කෙනෙකුගේ මාර්ගයෙන් හෝ භාර නොගත යුතු ය.

පවුලේ සාමාජිකයන්ගේ ක්‍රියාවන් පිළිබඳව වගබලා ගත යුතු බව

3:2 ස්වකීය පවුලේ සාමාජිකයන් ද උක්ත 3:1 උප වගන්තියේ නියමයන් පිළිපදින බවට නිලධරයා විසින් වගබලා ගත යුතු ය.

තෑගි පිරිනමනුයේ නිල තත්ත්වය මත බව

3:3 විදේශීය රාජ්‍ය නායකයකුගෙන් හෝ නියෝජිතයකුගෙන් හෝ රජයේ නිලධරයකුට ලැබෙන තෑගිබෝග වනාහී හුදෙක් රජයේ නියෝජිතයකු වශයෙන් තමා දරන තත්ත්වය නිසා ලැබුණු තෑගිබෝග සංඛ්‍යාවෙහිලා සැළකිය යුතු ය.

ප්‍රතික්ෂේප කළ නොහැකි විට උපදෙස් පිළිපැදිය යුතු බව

3:4 මෙරටට අමුත්තන් වශයෙන් පැමිණෙන රාජ්‍ය නායකයින් වැනි පුද්ගලයන්ගෙන් ලැබෙන ප්‍රතික්ෂේප කළ නොහැකි අන්දමේ තෑගිබෝග භාරගත යුත්තේ පහත සඳහන් උප වගන්තිවලට යටත්ව ය.

විදේශ කටයුතු ලේකම් වෙත වාර්තා කළ යුතු බව

3:4:1 එසේ තෑගිබෝගාදියක් ලැබුණහොත් ඒ බව විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත වාර්තා කළ යුතු ය.

විදේශ කටයුතු ලේකම්ගේ නියමය පරිදි ක්‍රියාකළ යුතු බව

3:4:2 වටිනාකම රු. 5,000 ට අඩුයැයි රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් තක්සේරු කරනු ලබන තෑගි බෝග ත්‍යාගලාභියාට දෙනු ලැබේ. වටිනාකමින් රු. 5,000 ට වැඩි තෑගිබෝග ඊට නියම කෙරෙන තීරු ගාස්තු ගෙවා ලබා ගැනීමට ඔහු අදහස් නොකරන්නේ නම් විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්වරයා නියම කරන පරිදි එම තෑගිබෝග පිළිබඳව සුදුස්සක් කළ යුතු ය.

3:5 නිලධරයකු කෙරෙහි ඇති මහජන ප්‍රසාදය දැක්වීම පිණිස එකතු කරන ලද මුදල් මහජන සම්මානයට පාත්‍ර වූ එකී පුද්ගලයාගේ නාමයෙන් පොදු ජනතාවට ප්‍රයෝජනවත් වූ යම්කිසි කාර්යයකට යෙදවිය හැකි ය.

නිලධරයකු වෙනුවෙන් එකතු කරන මුදල් පොදු කාර්යයක් සඳහා යෙදවිය හැකි බව.

3:6 උසස් නිලධරයන්ට ස්තුති පත්‍ර ප්‍රදානය කිරීම හා තෑගිබෝග පිරිනැමීම පිණිස අවශ්‍ය වියදම් දැරීම සඳහා යටත් නිලධරයන්ගෙන් මුදල් එකතු කිරීම තහනම් ය.

යටත් නිලධරයන්ගෙන් මුදල් එකතු නොකළ යුතු බව.

3:7 නිලධරයකුට තෑගිබෝග ආදිය පිරිනැමීම සඳහා හෝ අලුත් අවුරුදු සමය, නත්තල් සමය හා වෙනත් එවැනි අවස්ථාවන්හි නිලධරයන්ට බෙදා දීම සඳහා හෝ මුදල් එකතු කිරීම ද ආධාර පත්‍ර සංසරණය කිරීම ද තහනම් ය.

රජයේ නිලධරයන් අතර ආධාර පත්‍ර සංසරණය කිරීම තහනම් බව.

3:8 නිලධරයකු රාජකාරී ස්ථානමාරු වී යෑමේ දී හෝ අවසාන වශයෙන් රජයේ සේවයෙන් ඉවත් වී යෑමේ දී හෝ මේ වගන්තියේ නියමයන් ලිහිල් කළ හැකිය. එහෙත් එසේ කළ හැක්කේ දෙපාර්තමේන්තු ප්‍රධානයා හෝ ලේකම්වරයාගේ හෝ අවසරය ඇතිව පමණි.

ස්ථාන මාරුවීමේ/ හෝ විශ්‍රාම ගැනීමේ අවස්ථාවන්හි දී මෙම නියමයන් ලිහිල් කළ හැකි බව.

## 4. මුදල් දුෂ්කරතා

4:1 කවර හේතුවකින් වුව ද නිලධරයකුට බරපතල තත්ත්වයේ මුදල් දුෂ්කරතා ඇතිවීම වනාහි ඔහුගේ කාර්යක්ෂමතාව පිරිහීමට ද එබඳු මුදල් දුෂ්කරතා නොතිබුණු අවධියේ දී ඔහු කෙරෙහි වූ ප්‍රයෝජනවත් භාවය හා විශ්වාසීභාවය අඩුවීමට ද තුඩු දෙන කාරණයක් වශයෙන් සැලකිය යුතු ය.

කාර්යක්ෂමතාවට බාධා පමුණුවන්නන් සේ සැලකෙන බව.

4:2 එබඳු මුදල් දුෂ්කරතා ඇතිවූයේ පමණ ඉක්මවා වියදම් කිරීම නිසා හෝ අවිචක්ෂණතාවය නිසා හෝ දොස් තැබිය යුතු වෙනත් හේතුවක් නිසා හෝ නම් එය රජයේ සේවය අපකීර්තියට පමුණුවන්නාවූ ද, නිලධරයා කෙරෙහි තැබිය හැකි විශ්වාසය අඩුවීමට හේතුවන්නා වූ ද වරදක් හැටියට සැලකෙනු ඇත.

නිලධරයා කෙරෙහි ඇති විශ්වාසය අඩුවිය හැකි බව.

4:2:1 මේ අන්දමින් බරපතල මුදල් දුෂ්කරතා ගැන දැනගන්නට ලැබුණු විට, ඒ ගැන නිසි පරිදි සලකා බලනු ඇති අතර, ඒ ඒ අවස්ථාවේ හැටියට සුදුසු යැයි පෙනෙන අන්දමට, අදාළ නිලධරයාට එරෙහිව විනයානුකූලව කටයුතු කළ හැකි ය.

විනය කටයුතු කළ හැකි බව.

වැටුප් කුවිතාන්සි ඇපයට තබා ණය ලබා නොගත යුතු බව.

4:3 වැටුප් කුවිතාන්සියක් ඇපයට තබා මුදල් ණයට ගැනීම නිලධරයකුට තහනම් ය. ණයට ගත් මුදලට ඇපයක් වශයෙන් "රැගෙන එන අයට ගෙවනු" යනුවෙන් සඳහන් වැටුප් කුවිතාන්සියක් ඉදිරිපත් කොට යම් නිලධරයකු විසින් මුදලක් ණයට ගන්නා ලද බව ඔප්පු වුවහොත් ඔහුට විරුද්ධව ක්‍රියා කළ හැකි ය. නිලධරයකුගේ වැටුප සාමාන්‍යයෙන් එම නිලධරයා විසින්ම වැටුප් ලේඛනයේ අත්සන් කොට ලබාගත යුතු ය. (මුදල් රෙගුලාසි බලන්න.)

ණය ගැතිවීම හෝ වස්තු භංගත්වයට පත්වීම නිසා සිරභාරයට ගනු ලැබුවහොත් විනය පියවර ගතයුතු බව.

4:4 යම්කිසි නිලධරයකු තමා ගෙන ඇති ණය ආපසු නොගෙවීමේ හේතුවෙන් අධිකරණය විසින් වරදකරුවකු කරනු ලැබුවහොත් හෝ වස්තු භංගත්වයට පත් වූවකු සේ අධිකරණයකින් විනිශ්වය කරනු ලැබුවහොත් හෝ ණය මුදලින් කොටසක් ගෙවා බේරීමට ණය හිමියන් සමඟ එකඟත්වයකට පැමිණියහොත් හෝ රජයේ සේවය අපකීර්තියට පත් කිරීමේ චෝදනාව මත මෙම සංග්‍රහයේ විධිවිධාන යටතේ අදාළ නිලධරයාට විරුද්ධව විනයානුකූලව කටයුතු කළ යුතු ය. ඒ පිළිබඳව පවත්වනු ලබන විධිමත් විනය පරීක්ෂණයක දී චූදිත නිලධරයා වැරදිකරු බව ඔප්පු වුව ද ඔහු විසින් එම වරද සිදුකර ඇත්තේ වැළැක්විය නොහැකි අභාග්‍යයක් නිසා බව පෙනී ගියහොත් දඬුවම් පැනවීමේ දී එම කරුණ පිළිබඳව සානුකම්පිකව සලකා බැලිය හැක්කේ ය.

දෙපාර්තමේන්තු ප්‍රධානියාට දැන්විය යුතු බව.

4:5 ණය ගැතිවීම හේතුකොට ගෙන තමා අත්අඩංගුවට ගනු ලැබූ වහාම හෝ තමාට විරුද්ධව වස්තු භංගත්ව නීති කෘත්‍යයක් ආරම්භ කරනු ලැබූ වහාම හෝ නිලධරයකු ඒ බව තම දෙපාර්තමේන්තු ප්‍රධානයාට දැන්විය යුතු ය. එසේ නොකළහොත් එය ද බරපතල විෂමාචාරයක් සේ සලකා අදාළ නිලධරයාට එරෙහිව විනයානුකූලව පියවර ගත හැක්කේ ය.

අධිකරණය විසින් එබඳු අය ගැන වාර්තා කළ යුතු බව.

4:6 වස්තු භංගත්වය සම්බන්ධයෙන් නිලධරයකුට විරුද්ධව නීති කෘත්‍යයක් ආරම්භ කොට ඇති සෑම අවස්ථාවක දී ද නිලධරයකු විනිශ්චිත ණයකාරයකු කොට උසාවියෙන් තීරණය කරනු ලබන සෑම අවස්ථාවක දී ද අදාළ අධිකරණය විසින් ඒ බව එකී නිලධරයා සේවය කරන දෙපාර්තමේන්තුවේ ප්‍රධානයා වෙත වාර්තා කළ යුතු ය.

එබඳු වාර්තාවක් පිළිබඳව නීතියෙන් නියම කර ඇති ආකාරයට ක්‍රියා කළ යුතු බව.

4:7 දෙපාර්තමේන්තු ප්‍රධානයන් විසින් මේ වාර්තා සම්බන්ධයෙන් ක්‍රියා කළ යුත්තේ නිලධරයාගේ අකාර්යක්ෂමතාව ගැන හෝ විෂමාචාරය ගැන හෝ විමර්ශනය කොට දඬුවම් කිරීම සම්බන්ධයෙන් විනය ව්‍යවස්ථාවල නියම කර ඇති ආකාරයට වේ.

## 5. පෞද්ගලික කාර්යයන් සඳහා රජයේ මුදල් පාවිච්චි කිරීම

5:1 රජයේ සේවයේ නියුතු කිසිම සරප් කෙනෙකුගෙන් හෝ මුදල් භාරකරුවකුගෙන් හෝ රජයේ මුදල් භාරව සිටින කිසිම නිලධරයකු වෙතින් හෝ ඔවුන් භාරයේ ඇති රජයේ මුදල් ණයට ගැනීම නිලධරයකුට සපුරා තහනම් වේ.

රජයේ මුදල් ණයට ගැනීම තහනම් බව.

5:2 අවසර නොමැතිව කිසිම නිලධරයකුට අත්තිකාරම් මුදල් දීම, ණය මුදල් දීම සරප්වරුන්ටත්, මුදල් භාරකරුවන්ටත් රජයේ මුදල් භාරව සිටින ඕනෑම නිලධරයකුටත් සපුරා තහනම් වේ.

අවසර නොමැතිව අත්තිකාරම් දීම තහනම් බව.

5:3 පෞද්ගලික කටයුතු වෙනුවෙන් රජයේ මුදල් කොතරම් කෙටි කාලසීමාවක් තුළ වුව ද උපයෝගී කර ගැනීම ඉතා බරපතල වරදක් සේ සැලකිය යුතු ය. එවැනි චෝදනාවන්ට ලක් වන නිලධරයාට විරුද්ධව නඩු පැවරීමට ද විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීමට ද විනය බලධරයා ක්‍රියා කළ යුතු ය.

රජයේ මුදල් පෞද්ගලිකව පාවිච්චි කිරීම බරපතල වරදක් බව.

රා.ප.ච 04/2015
(6 වගන්තිය සම්බන්ධ විධිවිධාන)

## 6. ජනමාධ්‍යවලට හෝ මහජනයාට හෝ නිල ප්‍රවෘත්ති සැපයීම.

6:1 තම විෂය පථයට අදාළ රජයේ කටයුතු හා අමාත්‍යාංශයේ හෝ දෙපාර්තමේන්තුවේ කටයුතු පිළිබඳව මහජනයාට ප්‍රයෝජනවත් විය හැකි හා වැදගත් විය හැකි තොරතුරු ජනමාධ්‍යවලට හෝ මහජනයාට සැපයීම සම්බන්ධයෙන් ලේකම්වරයාට හා දෙපාර්තමේන්තු ප්‍රධානයාට ස්වකීය අභිමතය පරිදි ක්‍රියා කළ හැකි ය.

ලේකම්වරයා හෝ දෙපාර්තමේන්තු ප්‍රධානයා විසින් පමණක් සැපයිය හැකි බව.

6:1:1 එවැනි තොරතුරු ජනමාධ්‍යවලට සැපයිය යුත්තේ සාමාන්‍යයෙන් ප්‍රවෘත්ති අධ්‍යක්ෂගේ මාර්ගයෙනි. එතෙකුදු වුවත් අවස්ථානුකූලව කිසියම් ප්‍රවෘත්තියක් කෙලින්ම නිකුත් කිරීම අවශ්‍ය බව ලේකම්වරුන්ට හා දෙපාර්තමේන්තු ප්‍රධානයන්ට හැඟෙතොත් ඔවුන්ට එම ප්‍රවෘත්ති කෙළින්ම නිකුත් කළ හැකි ය.

ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව මඟින් යැවිය යුතු බව.

6:1:2 උක්ත 6:1 උප වගන්තිය ප්‍රකාරව නිකුත් කරනු ලබන ප්‍රවෘත්ති සෑම අවස්ථාවකදීම සත්‍ය කරුණුවලට හා නිවැරදි සංඛ්‍යාලේඛන ආදියට පමණක් සීමා විය යුතු ය. මොනම හේතුවක් නිසාවත් කිසිම මතයක් ප්‍රකාශ නොකළ යුතු ය.

සත්‍ය කරුණු හා නිවැරදි සංඛ්‍යා ලේඛනවලට පමණක් සීමාවිය යුතු බව

රජය අසීරු තත්ත්වයකට පත්වන තොරතුරු ප්‍රකාශ නොකළ යුතු බව.

6:1:3 යථා තත්ත්වය ප්‍රකාශ කිරීමට පමණක් සීමා වූ යම් ප්‍රවෘත්තියක් වුව ද පළ කිරීමෙන් මුළු රජයම හෝ රජයේ යම් ආයතනයක් හෝ නිලධරයකු හෝ අසීරු තත්ත්වයකට පත්වීමට ඉඩ ඇතොත්, එබඳු ප්‍රවෘත්ති නිකුත් නොකළ යුතු ය. සැක සහිත අවස්ථාවන්හි දී අදාළ අමාත්‍යවරයා විමසා ක්‍රියා කළ යුතු ය.

විවේචනය කිරීමට දුක්ගැනවිලි ප්‍රකාශ කිරීමට ජනමාධ්‍ය යොදා නොගත යුතු බව.

6:1:4 රජය හෝ රජයේ ආයතනයක් හෝ විවේචනය කිරීමේ නැතහොත් ස්වකීය ආයතනයේ දුක්ගැනවිලි ප්‍රකාශයට පත් කිරීමේ හෝ මාධ්‍යයක් වශයෙන් ජනමාධ්‍ය යොදා නොගත යුතු ය. (ආයතන සංග්‍රහයේ XXXI පරිච්ඡේදයේ 3:2 වගන්තිය බලන්න.)

ධුරයේ නමින් නිල වශයෙන් නිකුත් කළ යුතු බව.

6:2 ලේකම්වරයා විසින් හෝ දෙපාර්තමේන්තු ප්‍රධානයා විසින් හෝ ජනමාධ්‍ය වෙත ප්‍රවෘත්ති සපයන සෑම අවස්ථාවක දීම ඒවා සැපයිය යුත්තේ තමා විසින් නිල වශයෙන් නිකුත් කරනු ලබන ප්‍රවෘත්ති වශයෙනි.

අවසර නොමැතිව ජනමාධ්‍යවලට තොරතුරු සපයා ඇති විට වගකිව යුත්තන් පිළිබඳව සොයා බැලිය යුතු බව.

6:3 රජයේ සේවයේ නියුක්ත යම් නිලධරයකු හෝ නිලධරයන් හෝ විසින් එසේ නැතහොත් සාමාන්‍යයෙන් දෙපාර්තමේන්තුවක සේවයේ නියුක්ත කිසිවකු විසින් හෝ යම් ප්‍රවෘත්තියක් සපයන ලදැයි යම් ජනමාධ්‍ය වාර්තාවක සඳහන් වුවහොත්, එම නිලධරයා හෝ නිලධරයන් හෝ විසින් එම ප්‍රවෘත්ති සැපයුවේ ද යනවග අදාළ දෙපාර්තමේන්තුවේ ප්‍රධානයා විසින් එකී නිලධරයාගෙන් හෝ නිලධරයන්ගෙන් හෝ විමසිය යුතු ය. එසේ නිලධරයකු හෝ නිලධරයන් හෝ ගැන සඳහන් නොකොට එම ප්‍රවෘත්තිය දෙපාර්තමේන්තුවේ සේවයේ නියුක්ත වූවකුගෙන් ලැබුණු බව සාමාන්‍යයෙන් සඳහන් වී ඇති විටක එම ප්‍රවෘත්තිය තමන් විසින් සපයන ලද්දේ ද නැද්ද යන්නත් නොඑසේනම් එම ප්‍රවෘත්තිය සැපයීමේ වගකීම තම ශාඛාවේ යම්කිසි නිලධරයකු වෙත පැවරිය හැකි ද යන්නත් අදාළ අංශය භාරව කටයුතු කරන මාණ්ඩලික නිලධරයන් සියලු දෙනාගෙන්ම විමසිය යුතු ය. මේ සම්බන්ධයෙන් ලැබෙන පිළිතුර හෝ පිළිතුරු දෙපාර්තමේන්තු ප්‍රධානයාගේ රහස්‍ය වාර්තාවක් ද සහිතව අදාළ ලේකම්වරයා වෙත යොමුකළ යුතු ය. ඒ සම්බන්ධයෙන් තවදුරටත් ක්‍රියා කිරීම යෝග්‍ය යයි හැඟෙන අවස්ථාවල දී ලේකම්වරයා විසින් එසේ ක්‍රියා කරනු ඇත.

6:4 උක්ත 6:1 හා 6:2 උප වගන්ති මඟින් ප්‍රකාශිත බලයෙන් ආවරණය නොවන්නා වූ ද තම අමාත්‍යාංශයට හෝ දෙපාර්තමේන්තුවට අදාළ වන්නා වූ ද ජනමාධ්‍ය වාර්තා පළවූ විට ඒවා තමාගේ දැනගැනීම පිණිස ඉදිරිපත් කෙරෙන බවට ද එබඳු වාර්තා පළවීම සම්බන්ධයෙන් 6:3 උප වගන්තිය අනුව පියවර ගන්නා බවට ද සෑම ලේකම්වරයකු සහ දෙපාර්තමේන්තු ප්‍රධානයකු විසින්ම වගබලා ගත යුතු ය.

ජනමාධ්‍ය වාර්තා කෙරෙහි අවධානය යොමු කිරීමට අදාළ ප්‍රධානයන් වගබලා ගත යුතු බව.

6:5 උක්ත 6:2 උප වගන්තියේ සඳහන් නිලධරයන් හැර ඒ සඳහා විශේෂ අවසරය නොලත් කිසිම නිලධරයකු විසින් ස්වකීය රාජකාරී කටයුතු ඉටුකර ගෙන යාමේ දී තමාට දැනගන්නට ලැබුණු කිසිදු තොරතුරක්, නිල වශයෙන් දැන ගැනීමට අයිතිවාසිකමක් නොමැති, ජනමාධ්‍ය වාර්තාකරුවන් ද ඇතුලු කිසිම පුද්ගලයකුට නියම වශයෙන් හෝ, අනියම් වශයෙන් හෝ හෙළිදරව් කිරීම හෝ, එබඳු තොරතුරක් පිළිබඳව එබඳු පුද්ගලයකුට තමා සමඟ සාකච්ඡා කිරීමට ඉඩදීම හෝ තහනම් වන්නේ ය.

අවසර නොලබා සම්මුඛ පරීක්ෂණ සඳහා ඉඩ ලබා නොදිය යුතු ය.

6:6 රාජකාරියේ යෙදී සිටිය දී හෝ නිවාඩු පිට සිටිය දී හෝ කිසිම නිලධරයකු විසින් රාජ්‍ය ප්‍රතිපත්තිවලට අදාළ ප්‍රශ්න ගැන හෝ ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආරක්ෂාව හෝ අභ්‍යන්තර ආරක්ෂාව හෝ කෙරෙහි බලපාන කරුණු ගැන හෝ තමා සමඟ සාකච්ඡා කිරීමට කිසිවකුට අවකාශ නොදිය යුතු ය.

රජයේ ප්‍රතිපත්ති ආදිය පිළිබඳව තමා සමඟ සාකච්ඡා කිරීමට බාහිර පාර්ශවයන්ට අවකාශ නොසැලසිය යුතු බව.

6:7 නිලධරයකු විසින් ලේකම්වරයාගේ සහ/හෝ දෙපාර්තමේන්තු ප්‍රධානයාගේ අවසරය කල් ඇතුව ලබා නොගෙන කාර්යාලයීය වූ කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ කුමන අවශ්‍යතාවක් සඳහා හෝ ජනමාධ්‍ය වෙත ලබාදීම හෝ ඊට ඉඩ සැලසීම හෝ සම්පූර්ණයෙන්ම තහනම් වන්නේ ය.

කාර්යාලයීය ලියකියවිලි ප්‍රකාශයට පත් කිරීම තහනම් බව.

6:8 රාජ්‍ය පරිපාලන විෂය භාර ලේකම්වරයාගේ පූර්ව අවසරය ලබා නොගෙන කිසිම නිලධරයකු විසින් කුමන හෝ ජනමාධ්‍ය ආයතනයක කිසිම නිලයක් දැරීම හෝ නියම වශයෙන් හෝ අනියම් වශයෙන් හෝ එවැන්නකට සම්බන්ධ වීම හෝ නොකළ යුතු ය.

අවසර නොලබා ජනමාධ්‍යයන්ට සම්බන්ධ නිලයන් නොදැරිය යුතු බව.

රා.ප.ච 04/2015
(7 වගන්තිය සම්බන්ධ විධිවිධාන)

## 7. පොත්පත් හා ලිපි පළ කිරීම සහ විද්‍යුත් ජනමාධ්‍ය මඟින් කථා ප්‍රචාරය කිරීම යනාදී කටයුතු

*නිර්නාමිකව හෝ ආරූඪ නාමිකව හෝ ලිපි නොසැපයිය යුතු බව.*

7:1 කිසිම නිලධරයකු විසින් ශ්‍රී ලංකාවේ හෝ විදේශයක ජනමාධ්‍යයකට නිර්නාමිකව හෝ ආරූඪ නාමිකව හෝ ලිපි හෝ නිර්මාණ හෝ තොරතුරු හෝ නොසැපයිය යුතු ය.

*පරිපාලනමය කරුණු පිළිබඳ ලිපි, කථා පැවැත්වීම ආදිය නොකළ යුතු බව.*

7:2 කිසිම නිලධරයකු විසින් පරිපාලන කටයුතුවලට අදාළ යැයි සැලකිය හැකි කරුණු පිළිබඳව අදාළ ලේකම්වරයාගේ අනුමැතිය කල් ඇතිව ලබා නොගෙන පොත්පත් හෝ ලිපි ප්‍රසිද්ධ කිරීමත්, එසේම විද්‍යුත් ජනමාධ්‍ය මඟින් කථා පැවැත්වීමත්, ප්‍රසිද්ධියේ මත ප්‍රකාශ කිරීමත් නොකළ යුතු ය. එම අනුමැතිය ලබාගැනීම සඳහා එවන ඉල්ලුම් පත්‍ර සමඟ අදාළ ලිපිය හෝ කථා පිටපත හෝ දෙපිටපතකින් යුතුව ඉදිරිපත් කළ යුතු ය. එබඳු පිටපතක් තමා වෙත ඉදිරිපත් කිරීම අනවශ්‍ය යැයි අමාත්‍යවරයා නියෝග කර නැත්නම් මිස ලේකම්වරයා විසින් එකී ඉල්ලීම අනුමත කිරීමට පෙර එම පිටපත් ස්වකීය අමාත්‍යවරයාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතු ය.

*වෙනත් කරුණු ගැන සිය අත්සන සහිත ලිපි පළ කිරීමට ඉඩ ඇති බව.*

7:3 රජයේ හෝ රජයේ දෙපාර්තමේන්තුවක් හෝ රජයේ නිලධරයකු හෝ අපහසුතාවයකට පත් නොවන ආකාරයෙන් වෙනත් සාමාන්‍ය විෂයයන් ගැන ප්‍රවෘත්ති පත්‍රයකට හෝ වෙනත් යම්කිසි ප්‍රකාශනයකට හෝ සිය අත්සන සහිත ලිපි යැවීමටත්, සිය නමින් පෙනී සිට විද්‍යුත් ජනමාධ්‍ය මඟින් කථා පැවැත්වීමටත් වෙනත් කරුණු ප්‍රසිද්ධියට පත්කිරීමටත් නිලධරයකුට පුළුවන.

*කාර්යාලයීය ලේඛන බැලීමට ආයතන ප්‍රධානයාගේ පූර්ව අනුමැතිය ලබාගත යුතු බව.*

7:4 පොතක් හෝ වෙනත් කෘතියක් ප්‍රසිද්ධ කිරීම සඳහා කාර්යාලයීය ලිපිලේඛන හැදෑරීමට හෝ ප්‍රයෝජන ගැනීමට අපේක්ෂා කරන නිලධරයකු විසින් ඒ ලිපිලේඛන පිළිබඳ වගකීම දරන ආයතන ප්‍රධානයාගේ පූර්ව අවසරය ලබාගත යුතු ය.

*පොත්පත් හා ලිපි පළ කිරීමට ලේකම්වරයාගේ පූර්ව අනුමැතිය ලබාගත යුතු බව.*

7:5 යම්කිසි නිලධරයකු විසින් තමාගේ හෝ වෙන යම්කිසි නිලධරයකුගේ හෝ රාජකාරී කටයුතුවලට සම්බන්ධ කරුණු ඇතුළත් වූ හෝ කාර්යාලයීය ලිපිලේඛන බැලීමෙන් සම්පාදනය කළා වූ හෝ යම්කිසි පොතක් නැතහොත් වෙනත් කෘතියක් ප්‍රසිද්ධ කිරීමට පෙර ඒ සඳහා ලේකම්වරයාගේ ලිඛිත අනුමැතිය ලබාගත යුතු ය. එසේ අනුමැතිය දෙන විට අවස්ථාවෝචිතව තමා විසින් තීරණය කරනු ලබන විශේෂ සහන මිලකට පොතෙහි හෝ කෘතියෙහි හෝ කිසියම් පිටපත් සංඛ්‍යාවක් රජයේ ප්‍රයෝජනය සඳහා

සැපයිය යුතු යැයි කොන්දේසියක් පැනවීමට ද ලේකම්වරයාට පුළුවන.

## 8. ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි සහ වෙනත් අදාළ විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීම.

8:1 ආයතන සංග්‍රහයෙහි සහ මුදල් රෙගුලාසිවල දැක්වෙන විධිවිධානයන්ට ද, ඒවාට කලින් කලට කරනු ලබන සංශෝධනවලට ද, රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛවලට ද, කලින් කල නිකුත් කරනු ලබන රාජ්‍ය පරිපාලන හා භාණ්ඩාගාර චක්‍රලේඛවලට ද, අමාත්‍යාංශ ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානයන් සහ වෙනත් නිසි බලධරයන් විසින් විධිමත් ලෙස නිකුත් කර ඇති චක්‍රලේඛ, රෙගුලාසි, ස්ථාවර නියෝග, කාර්ය පටිපාටි, නියෝග හා උපදෙස්වලට ද අනුකූලව සියලුම රජයේ නිලධරයන් ක්‍රියා කළයුතු වන්නේ ය.

අදාළ සියලුම නීතිරීති, රෙගුලාසි ආදියට එකඟව රජයේ නිලධරයන් ක්‍රියා කළ යුතු බව.

8:2 උක්ත 8:1 උප වගන්තියේ සඳහන් විධිවිධාන කඩ කිරීමක්, මෙම ආයතන සංග්‍රහයේ පළමුවන උපලේඛනයේ දැක්වෙන වරදක් ලෙස සලකා අදාළ නිලධරයාට එරෙහිව අදාළ විනය බලධරයා විසින් වහාම විනයානුකූලව පියවර ගතයුතු වන්නේ ය.

විනය පියවර ගත යුතු බව.

8:3 උක්ත 8:1 උප වගන්තියේ සඳහන් විධිවිධානයන් උල්ලංඝනය කරනු ලැබුවේ කිසියම් නිලධරයකුගේ හෝ බලධරයකුගේ හෝ වෙනත් පාර්ශ්වයක හෝ බලපෑමක් නිසා යන්න කිසිදු නිලධරයකුට තම නිදහසට කරුණක් ලෙස ඉදිරිපත් කළ නොහැකි වන්නේ ය.

බාහිර බලපෑම් නිදහසට කරුණු ලෙස ඉදිරිපත් කළ නොහැකි බව.

8:4 කිසියම් නීතියකට හෝ ව්‍යවස්ථාවකට හෝ අනුකූලව, අමාත්‍ය මණ්ඩලය විසින් හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් හෝ අමාත්‍යාංශයක ලේකම්වරයකු විසින් හෝ දෙපාර්තමේන්තු ප්‍රධානයකු විසින් හෝ බලය පවරනු ලැබ ඇති රජයේ නිලධරයකුට ඉහත 8:1 උප වගන්තියෙහි සඳහන් විධිවිධානයන් උල්ලංඝනය වන පරිදි ක්‍රියා කරන ලෙසට කිසියම් රජයේ නිලධරයකු විසින් නියෝග කිරීම හෝ අනිසි බලපෑම් කිරීම හෝ මෙහෙයවීම හෝ කර ඇති විටෙක, එසේ කරන ලද නිලධරයා පළමුවන උපලේඛනය යටතට වැටෙන බරපතල

අනිසි බලපෑම් කරන නිලධරයන්ට විරුද්ධව විනයානුකූලව කටයුතු කළ යුතු බව.

විෂමාචාරයක් කරන ලද සේ සලකා නියමිත විනය බලධරයා විසින් ඔහුට විරුද්ධව වහාම විනයානුකූලව පියවර ගතයුතු වන්නේ ය.

## 9. රජයේ නිලධරයන් දේශපාලන කටයුතුවල නියැලීම

9:1 ආයතන සංග්‍රහයේ පළමුවන කාණ්ඩයේ XXXII පරිච්ඡේදය ප්‍රකාරව දේශපාලන අයිතිවාසිකම් භුක්ති විඳීමට වරප්‍රසාද හිමි නිලධරයන් එම දේශපාලන අයිතිවාසිකම් භුක්ති විඳිය යුතු වන්නේ එම පරිච්ඡේදයේ දක්වා ඇති විධිවිධානයන්ට යටත්ව ය. එම විධිවිධාන හා සීමාවන් ඉක්මවා යාම රාජ්‍ය සේවයකු විසින් කරනු ලබන බරපතල විෂමාචාරයක් සේ සැලකෙන අතර, එය මෙම සංග්‍රහයේ පළමුවන උපලේඛනය යටතේ දඬුවම් පැමිණවිය හැකි වරදක් ලෙස සැලකිය යුතු වන්නේ ය.

9:2 ආයතන සංග්‍රහයේ පළමුවන කාණ්ඩයේ XXXII පරිච්ඡේදය ප්‍රකාරව දේශපාලන අයිතිවාසිකම් අහිමි කොට ඇති යම් රාජ්‍ය නිලධරයකු දේශපාලන කටයුතුවල නිරතවීම ඉතා බරපතල ගණයේ විෂමාචාරයක් සේ සැලකෙන අතර, එය මෙම සංග්‍රහයේ පළමුවන උපලේඛනය යටතේ දඬුවම් පැමිණවිය හැකි වරදක් ලෙස සැලකිය යුතු වන්නේ ය.

# XLVIII වැනි පරිච්ඡේදය

# විනය කාර්ය පටිපාටිය පිළිබඳ රීති

1. සාමාන්‍ය කරුණු.

2. සේවයෙන් පහකිරීමේ බලතල හා විනය පාලන බලතල.

3. විනය කටයුතු සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය විසින් අනුගමනය කෙරෙන කාර්ය පටිපාටිය.

4. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් විනය කටයුතු සම්බන්ධයෙන් ක්‍රියාකරනු ලබන විට අනුගමනය කළයුතු කාර්ය පටිපාටිය.

5. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් විධිමත්ව බලය පවරනු ලැබූ අමාත්‍යාංශයක ලේකම්වරයකු විසින් විනය කටයුතු සම්බන්ධයෙන් ක්‍රියාකරනු ලබන විට අනුගමනය කළයුතු කාර්ය පටිපාටිය

6. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් විධිමත්ව බලය පවරනු ලැබූ දෙපාර්තමේන්තු ප්‍රධානයකු හෝ වෙනත් නිලධරයකු හෝ විසින් විනය කටයුතු සම්බන්ධයෙන් ක්‍රියාකරනු ලබන විට අනුගමනය කළයුතු කාර්ය පටිපාටිය.

7. ව්‍යවස්ථාපිත මණ්ඩලයකට හෝ රාජ්‍ය සංස්ථාවකට හෝ රජයට පවරාගත් ආයතනයකට හෝ රාජ්‍ය සමාගමකට හෝ කොමිෂන් සභාවකට හෝ වෙනත් අර්ධ රජයේ ආයතනයකට හෝ රජයේ සේවයෙන් තාවකාලිකව මුදාහරිනු ලැබූ නිලධරයෝ.

8. ව්‍යවස්ථාපිත මණ්ඩලයකට හෝ රාජ්‍ය සංස්ථාවකට හෝ රජයට පවරාගත් ආයතනයකට හෝ රාජ්‍ය සමාගමකට හෝ කොමිෂන් සභාවකට හෝ වෙනත් අර්ධ රජයේ ආයතනයකට හෝ රජයේ සේවයෙන් ස්ථිර ලෙසට මුදාහරිනු ලැබූ නිලධරයෝ.

9. එක් අමාත්‍යාංශයක හෝ දෙපාර්තමේන්තුවක හෝ සිට වෙනත් අමාත්‍යාංශයකට හෝ දෙපාර්තමේන්තුවකට හෝ ස්ථාන මාරු කරනු ලැබූ හෝ වෙනත් තනතුරකට පත්කරනු ලැබූ හෝ නිලධරයෝ.

10. විනය පරීක්ෂණය අතරතුර දී නිලධරයකු සම්බන්ධයෙන් වන විනය බලධරයා වෙනත් විනය බලධරයකු බවට පත්වී ඇති කල්හි එවැනි නිලධරයකුට විරුද්ධව විනයානුකූලව කටයුතු කිරීම.

11. එකම සිද්ධියකට හෝ සිදුවීම් මාලාවකට හෝ අදාළව චෝදනා ලබන නිලධරයෝ.

12. රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

13. මූලික විමර්ශනය.

14. චූදිත නිලධරයකු වෙත චෝදනා පත්‍රයක් නිකුත් කිරීම.

15. චූදිත නිලධරයා විසින් චෝදනා පත්‍රය සම්බන්ධයෙන් ස්වකීය නිදහසට කරුණු ඉදිරිපත් කිරීම

16. විධිමත් විනය පරීක්ෂණයක දී ලේඛනගත සාක්ෂි වශයෙන් උපයෝගී කරගනු ලබන ලිපිලේඛන.

17. විධිමත් විනය පරීක්ෂණයක දී පැමිණිල්ල මෙහෙයවීම.

18. විධිමත් විනය පරීක්ෂණයක දී චූදිත නිලධරයන් වෙනුවෙන් පෙනී සිටීම.

19. පරීක්ෂණ විනිශ්චය සභා.

20. විධිමත් විනය පරීක්ෂණයක රජයේ සාක්ෂිකරුවකු වන රාජ්‍ය නිලධරයකු සතු කාර්යභාරය.

21. විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීම.

22. විනය බලධරයාගේ කාර්යභාරය.

23. විනය නියෝගය.

24. දඬුවම්.

25. ලඝු විනය කාර්ය පටිපාටිය යටතේ දඬුවම් පැමිණවීම.

26. විනය නියෝගවලට විරුද්ධව අභියාචනා ඉදිරිපත් කිරීම සහ විනය නියෝග ප්‍රතිශෝධනය කිරීම.

27. අධිකරණයක් විසින් හෝ ව්‍යවස්ථාපිත බලධරයකු විසින් හෝ රජයේ නිලධරයකුට විරුද්ධව කටයුතු කරන අවස්ථාවක දී අනුගමනය කළයුතු ක්‍රියාපටිපාටිය.

28. රාජ්‍ය නිලධරයකුට විරුද්ධව අධිකරණයක් විසින් හෝ ව්‍යවස්ථාපිත බලධරයකු විසින් හෝ පනවනු ලබන නියෝග සැලකිල්ලට ගෙන ඔහුට විරුද්ධව විනයානුකූලව කටයුතු කිරීම.

29. විගණන වාර්තාවක් මඟින් අනාවරණය වන විෂමාචාර.

30. පරීක්ෂණ කොමිෂන් සභා වාර්තාවකින් අනාවරණය වන වැරදි.

31. රාජ්‍ය නිලධරයකු රාජකාරී වැඩ තහනමකට භාජනය කිරීම සහ අනිවාර්යය නිවාඩු පිට තැබීම.

32. පළමුවන උප ලේඛනයේ දැක්වෙන වැරදි සම්බන්ධයෙන් අනිවාර්යය විශ්‍රාම ගැන්වීම.

33. සාමාන්‍ය අකාර්යක්ෂමතාව මත රජයේ නිලධරයකු විශ්‍රාම ගැන්වීම.

34. රජයේ නිලධරයකුට විරුද්ධව විනයානුකූලව කටයුතු කිරීමට මූලික කටයුතු සම්පාදනය කරමින් තිබිය දී හෝ චෝදනා පත්‍රයක් නිකුත් කර විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වෙමින් තිබිය දී හෝ අදාළ නිලධරයාට දිවයිනෙන් බැහැරව යාමට අවසර දීම.

35. රජයේ නිලධරයකුට විරුද්ධව විනයානුකූලව කටයුතු කෙරෙමින් පවතින අවස්ථාවක දී නිලධරයා සේවයෙන් ඉල්ලා අස්වීම.

36. වෛකල්පික විශ්‍රාම ගැන්වීමේ වයසට එළැඹෙන නිලධරයකුට විරුද්ධව විනයානුකූලව කටයුතු කිරීම.

37. තනතුර අතහැර යාම.

38. පාඨ අතර අනනුකූලතාවයක් ඇති වූ විට ක්‍රියා කළයුතු ආකාරය.

# XLVIII වන පරිච්ඡේදය

# විනය කාර්ය පටිපාටිය පිළිබඳ රීති

## 1. සාමාන්‍ය කරුණු

රජයේ නිලධරයන් සේවයෙන් පහ කිරීමේ බලතල සහ ඔවුන්ගේ විනය පාලනය පිළිබඳ බලතල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් අමාත්‍ය මණ්ඩලය වෙත පැවරී ඇත. පහත සඳහන් නියමයන් කියවිය යුත්තේ අමාත්‍ය මණ්ඩලය විසින් කලින් කල නිකුත් කරනු ලබන නියෝග කිසිවක් වේ නම් ඒවා ද සමඟ ය.

1:1 මෙම පරිච්ඡේදයේ කාර්යයන් සඳහා -

1:1:1 "විනය බලධරයා" යනුවෙන් අදහස් කරන්නේ පහත සඳහන් 2 වන වගන්තිය අනුව කිසියම් නිලධරයකු සේවයෙන් පහ කිරීමට හෝ ඔහු පිළිබඳ විනය පාලන කටයුතු කිරීමට හෝ බලය පැවරී ඇති නිසි බලධරයාය ; තනතුර නිත්‍ය වශයෙන් දරන තැනැත්තා නැති අවස්ථාවක දී එම තනතුරෙහි වැඩ බැලීමට පත් කරනු ලැබ සිටින ඕනෑම බලධරයෙක් ද "විනය බලධරයා" යන පාඨයෙන් අදහස් කෙරේ.

රා.ප.ච 10/2017 මගින් 1:1:1 හා 1:1:2 උප වගන්ති සංශෝධනය කර ඇත.

1:1:2 වැඩ බැලීමේ පත්වීමක් දරන රජයේ නිලධරයකු සම්බන්ධයෙන් වන කල්හි "විනය බලධරයා" යනුවෙන් අදහස් කරන්නේ ඉදින් එම නිලධරයා එම පත්වීම නිත්‍ය පදනමක් මත දැරුවේ නම් එවිට ඔහු සම්බන්ධයෙන් වන නිසි විනය බලධරයා ය.

1:1:3 දෙපාර්තමේන්තුවක් හෝ වෙනත් ආයතනයක් හෝ සම්බන්ධයෙන් වන කල්හි "අමාත්‍යවරයා" යන්නෙන් අදහස් කෙරෙන්නේ එම දෙපාර්තමේන්තුව හෝ වෙනත් ආයතනය හෝ භාර අමාත්‍යවරයා වේ. තනතුරක් හෝ නිලධරයකු සම්බන්ධයෙන් වන කල්හි ඉන් අදහස් කෙරෙන්නේ එම තනතුර හෝ නිලධරයා අයත් දෙපාර්තමේන්තුව හෝ වෙනත් ආයතනය හෝ භාර අමාත්‍යවරයා වේ.

1:1:4 "අදාළ අමාත්‍යවරයා" සහ "අදාළ අමාත්‍යාංශය" යන්නෙන් අදහස් කරන්නේ පිළිවෙලින්, අදාළ රජයේ නිලධරයා සේවය කරන දෙපාර්තමේන්තුව හෝ වෙනත් ආයතනය හෝ භාර අමාත්‍යවරයා සහ අමාත්‍යාංශය වේ.

1:1:5 අමාත්‍යාංශ ලේකම්වරුන් හැර ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබූ නිලධරයන් භාරයේ පවත්නා කාර්යාල සම්බන්ධයෙන් වන කල්හි "අදාළ අමාත්‍යවරයා" යන්නෙන් අදහස් කෙරෙන්නේ ජනාධිපතිවරයා වේ. පාර්ලිමේන්තුවේ සභානායකගේ කාර්යාලය සම්බන්ධයෙන් වන කල්හි "අදාළ අමාත්‍යවරයා" යන්නෙන් අදහස් කෙරෙන්නේ පාර්ලිමේන්තුවේ සභානායක වශයෙන් පත් කරනු ලැබ සිටින අමාත්‍යවරයා වේ. අමාත්‍ය මණ්ඩල කාර්යාලය, රාජ්‍ය සේවා කොමිෂන් සභාව, මැතිවරණ දෙපාර්තමේන්තුව සහ විගණකාධිපති දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් වන කල්හි "අමාත්‍යවරයා" යන්නෙන් අදහස් කෙරෙන්නේ ජනාධිපතිවරයා වේ.

1:1:6 දෙපාර්තමේන්තුවක් හෝ වෙනත් ආයතනයක් හෝ සම්බන්ධයෙන් වන කල්හි "ලේකම්" යන්නෙන් අදහස් කෙරෙන්නේ එම දෙපාර්තමේන්තුව හෝ වෙනත් ආයතනය හෝ භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා ය. තනතුරක් හෝ නිලධරයකු සම්බන්ධයෙන් වන කල්හි ද ලේකම්වරයා යන්නෙන් අදහස් කෙරෙන්නේ එම තනතුර හෝ නිලධරයා හෝ අයත් දෙපාර්තමේන්තුව හෝ වෙනත් ආයතනය හෝ භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා ය. අමාත්‍යාංශ යටතේ වර්ග කරනු ලැබ නැති දෙපාර්තමේන්තු හෝ වෙනත් ආයතනය හෝ සම්බන්ධයෙන් වන කල්හි, වෙනත් ආකාරයකින් නියම කරනු ලැබ නැත්නම්, ඉන් අදහස් කෙරෙන්නේ එම දෙපාර්තමේන්තුවේ හෝ වෙනත් ආයතනයේ හෝ ප්‍රධානයා වේ.

1:1:7 "දෙපාර්තමේන්තු ප්‍රධානයන්" යන්නෙන් අදහස් කෙරෙන්නේ ආයතන සංග්‍රහයේ I වන කාණ්ඩයේ 1 වන පරිශිෂ්ටය යටතේ ලැයිස්තු ගත කරනු ලැබ ඇති දෙපාර්තමේන්තු ප්‍රධානයන් සහ විටින්විට අමාත්‍ය මණ්ඩලව විසින් දෙපාර්තමේන්තු ප්‍රධානයන් වශයෙන් පත් කරනු ලබන අනෙකුත් නිලධරයන් වේ.

1:1:8 අමාත්‍යාංශ කාර්යාලයක් සම්බන්ධයෙන් වන කල්හි "දෙපාර්තමේන්තු ප්‍රධානයා" යන්නෙන් අදහස් කෙරෙන්නේ අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයා වේ.

1:1:9 ඒකාබද්ධ සේවාවක් සම්බන්ධයෙන් වන කල්හි "අමාත්‍යාංශයේ ලේකම් හෝ දෙපාර්තමේන්තු ප්‍රධානයා" යන්නෙන් අදහස් කෙරෙන්නේ අවස්ථාවෝචිත පරිදි රාජ්‍ය පරිපාලන විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වේ.

1:1:10 "මාණ්ඩලික ශ්‍රේණියේ නිලධරයා" යන්නෙන් අදහස් කෙරෙන්නේ වර්ෂයකට රු. 74,160 ක හෝ ඊට වැඩි හෝ ආරම්භක ඒකාබද්ධ වැටුපක් සහ රු. 1,560 ක හෝ ඊට වැඩි හෝ වාර්ෂික වැටුප් වර්ධක හිමි නිලධරයෙක් වේ.

1:1:11 "රජයේ නිලධරයා" යන්නෙන් අදහස් කෙරෙන්නේ ජනරජය යටතේ වැටුප් සහිත ඕනෑම ධුරයක් උසුලන ඕනෑම තැනැත්තකු වන අතර, ඊට මතු දැක්වෙන අය ඇතුළත් නොවේ.

(අ). ජනාධිපති;
(ආ). කථානායක;
(ඇ). ඇමතිවරයෙක්;
(ඈ). අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයෙක්;
(ඉ). රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයෙක්;
(ඊ). අධිකරණ නිලධරයෙක්;
(උ). නියෝජ්‍ය ඇමතිවරයෙක්;
(ඌ). පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙක්;
(එ). පාර්ලිමේන්තු මහ ලේකම්;
(ඒ). ජනාධිපතිවරයාගේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයෙක්;
(ඔ). පාර්ලිමේන්තුවේ මහලේකම්ගේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයෙක්;
(ඕ). රජය වෙත පවරනු ලැබ ඇති ආයතනවල, ව්‍යවස්ථාපිත මණ්ඩලවල සහ සංස්ථාවල සේවකයෝ;

1:1:12 "අභියාචන බලධරයා" යන්නෙන් අදහස් කෙරෙන්නේ අමාත්‍ය මණ්ඩලය හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කමිටුවක් හෝ වේ.

1:1:13 "කොමිෂන් සභාව" යන්නෙන් අදහස් කෙරෙන්නේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ එහි කමිටුවක් හෝ වේ.

1:2 නිලධරයන් අතින් සිදුවන්නා වූ ද කවරාකාරයකින් වුව ද දඬුවම් පැමිණවිය යුතු වූ ද සියලුම විෂමාචාර ක්‍රියාවන් හෝ ප්‍රමාද දෝෂයන් හෝ සම්බන්ධයෙන් මෙම නියමයන්ට අනුකූලව හැකිතාක් ඉක්මණින් විනය බලධරයන්, දෙපාර්තමේන්තු ප්‍රධානයන් සහ අදාළ අනෙකුත් ආයතන ප්‍රධානයන් විසින් ක්‍රියාකළ යුතු ය. එසේ ක්‍රියා කිරීමට හැකිවනු පිණිස අදාළ විෂමාචාරයන් හෝ ප්‍රමාද දෝෂයන් පිළිබඳව සැපයිය යුතු සෑම ආකාරයකම වාර්තා සහ තොරතුරු ආදිය එපරිදිම කඩිනමින් අදාළ විනය බලධරයන්, දෙපාර්තමේන්තු ප්‍රධානයන් හා අදාළ අනෙකුත් ආයතන ප්‍රධානයන් වෙත සැපයීම එම නිලධරයා සේවයේ යෙදී සිටින ආයතනයේ හෝ කාර්යාලයේ හෝ එම නිලධරයා සම්බන්ධයෙන් අධීක්ෂණ හෝ පාලන හෝ බලයක් ඇති නිලධරයකුගේ හෝ නිලධරයන් ගේ හෝ වගකීම වන්නේ ය. එම වගකීම පැහැර හැරීම ද විනයානුකූලව කටයුතු කළ යුතු යන විෂමාචාරයක් වන්නේ ය.

1:3 මෙම නියමයන් යටතේ ගන්නා ලද ක්‍රියා මාර්ගයක් හෝ පනවන ලද නියෝගයක් හෝ හුදෙක් යම්කිසි ක්‍රියා පටිපාටිමය දෝෂයක් හෝ ඌණතාවයක් හෝ සිදු වී තිබීමේ හේතුවෙන්වත්, යුක්තිය ඉටුවීමට බාධාවක් නොවන ආකාරයෙන් මෙම නියමයන් හෝ එහි අඩංගු විධිවිධානයන් හෝ උල්ලංඝනය වී තිබීමේ හේතුවෙන්වත් නිර්බල නොවන්නේ ය.

1:4 රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත හෝ අමාත්‍ය මණ්ඩලය වෙත හෝ විනය ක්‍රියාවලියකට අදාළ කාර්ය සටහන් ආදී ලියවිලි ඉදිරිපත් කරන කුමන හෝ අවස්ථාවක දී ඒ සමඟ ප්‍රස්තුත විෂයට අදාළ වැදගත් කරුණු පිඩුකොට දැක්වෙන සංක්ෂිප්තවූත් අවශ්‍ය සියලු දෑ අඩංගු වන්නාවූත් වාර්තාවක් ද ඉදිරිපත් කළ යුතු ය. එම වාර්තාවේ දෙපාර්තමේන්තුවේ හෝ ආයතනයේ හෝ විවිධ ලියවිලිවලට යොමුව දක්වා ඇති කල්හි ඒවා පහසුවෙන් හැඳැරිය හැකි වන පරිදි පැහැදිලිව සලකුණු කර හෝ කොඩි යොදා හෝ තිබිය යුතු ය. පැමිණිල්ලෙන් ඉදිරිපත් කරන ලියවිලිවල මුල් පිටපත් හෝ සහතික කළ පිටපත් හෝ මෙන්ම විත්තියෙන් ඉදිරිපත් කරන ලද ලියවිලිද අදාළ නිලධරයාගේ පෞද්ගලික ලිපිගොනුව, චර්යා සටහන හා අදාළ වන අනෙකුත් ලියවිලි යන ආදිය ද එම වාර්තාව සමඟ ඉදිරිපත් කළ යුතු ය.

1:4:1 විධිමත් විනය පරීක්ෂණයක් පවත්වා තිබේ නම් අදාළ කාර්ය සටහන් ලියවිලි කාලක්‍රමානුගතව පිළියෙල කොට මූලික විමර්ශනයට සම්බන්ධ ලේඛන, චෝදනා පත්‍රය ඊට ලැබුණු පිළිතුරු, පරීක්ෂණ සටහන්, තීරණ සහ විනය නියෝග වැනි විවිධ අවස්ථාවලට අදාළ සියලු ලියවිලි වෙන් වෙන් වශයෙන් සලකුණු කොට හෝ කොඩි යොදා හෝ ඉදිරිපත් කළ යුතු ය.

## 2. සේවයෙන් පහ කිරීමේ බලතල හා විනය පාලන බලතල

2:1 රජයේ නිලධරයන් සේවයෙන් පහ කිරීමේ බලතල සහ ඔවුන්ගේ විනය පාලනය පිළිබඳ බලතල පැවරී ඇත්තේ අමාත්‍ය මණ්ඩලය වෙතය. අමාත්‍ය මණ්ඩලය පහත සඳහන් නිලධරයන් සම්බන්ධයෙන් එකී බලතල කෙළින්ම ක්‍රියාත්මක කරයි.

අමාත්‍යාංශවල අතිරේක ලේකම්වරු,
දිස්ත්‍රික් ලේකම්වරු හා ආණ්ඩුවේ ඒජන්තවරු,
දෙපාර්තමේන්තු ප්‍රධානයෝ, ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරු
සහ අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරනු ලබන වෙනත් නිලධරයන්.

2:2 අනෙකුත් සියලුම කාණ්ඩවලට අයත් නිලධරයන් සම්බන්ධයෙන් සේවයෙන් පහ කිරීමේ බලතල සහ විනය පාලනය පිළිබඳ බලතල අමාත්‍ය මණ්ඩලය විසින් කොමිෂන් සභාව වෙත පවරා දී ඇත.

2:2:1 පහත සඳහන් නිලධරයන් හැර මාණ්ඩලික ශ්‍රේණියේ අනෙක් සියලුම වර්ගවල නිලධරයන් සම්බන්ධයෙන්, ඔවුන් සේවයෙන් පහ කිරීම සහ ඔවුන්ගේ විනය පාලනය පිළිබඳ ස්වකීය බලතල කොමිෂන් සභාව විසින් කෙළින්ම ක්‍රියාත්මක කරයි.

2:2:1:1 ඒකාබද්ධ සේවාවලට අයත් නොවන විගණකාධිපති දෙපාර්තමේන්තුවේ සහ මැතිවරණ දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික ශ්‍රේණියට අයත් නිලධරයන් සම්බන්ධයෙන් විනය බලධරයා වන්නේ ජනාධිපති ලේකම්වරයා ය.

2:2:1:2 අමාත්‍යාංශයක් යටතට නොවැටෙන්නාවූත් ඒකාබද්ධ සේවාවලට අයත් නොවන්නාවූත් මාණ්ඩලික ශ්‍රේණියට අයත් නිලධරයන් සම්බන්ධයෙන් විනය බලධරයා වන්නේ දෙපාර්තමේන්තු ප්‍රධානියා වේ.

2:3 මෙහි 2:2:1 උප වගන්තියෙන් සඳහන් නොවන සියලු නිලධරයන් සම්බන්ධයෙන් වන කල්හි, ඔවුන් සේවයෙන් පහ කිරීම සහ ඔවුන්ගේ විනය පාලනය පිළිබඳ බලතල කොමිෂන් සභාව විසින් අදාළ අමාත්‍යාංශ ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානයන් හෝ රජයේ නිලධරයන් හෝ වෙත පවරා දී තිබේ. ඒකාබද්ධ සේවාවලට අයත් නිලධරයන් සම්බන්ධයෙන් වන කල්හි ඔවුන් සේවයෙන් පහ කිරීම සහ ඔවුන්ගේ විනය පාලනය පිළිබඳ බලතල ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත එපරිදිම පවරා දී ඇත.

2:4 කොමිෂන් සභාව විසින් පවරා දී ඇති බලතල එහි අභිමතය පරිදි විටින්විට කොමිෂන් සභාව වෙත ආපසු පවරා ගැනීම හෝ තවදුරටත් බලතල පවරාදීම හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයක් මඟින් කොමිෂන් සභාව විසින් සිදුකරනු ලැබේ.

## 3. විනය කටයුතු සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය විසින් අනුගමනය කෙරෙන කාර්ය පටිපාටිය

3:1 උක්ත 2:1 වැනි උප වගන්තියෙහි සඳහන් කර ඇති නිලධරයකුට විරුද්ධව විනයානුකූලව ක්‍රියා කිරීමට අදහස් කර ඇති විට අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් අවශ්‍ය මූලික විමර්ශන කරවිය යුතු ය.

3:2 එම නිලධරයාට විරුද්ධව චෝදනා නැඟීමට තරම් බැලූ බැල්මට පෙනෙන ආකාරයේ හේතු සාධක ඇති බව එම මූලික විමර්ශනය මඟින් හෙළිදරව් වුවහොත්, ලේකම්වරයා විසින් චෝදනා පත්‍රයක් එම නිලධරයා වෙත විධිමත්ව නිකුත් කළ යුතු ය. එසේ වුව ද, අදාළ නිලධරයා ඒකාබද්ධ සේවාවන්ට අයත් නිලධරයකු වන කල්හි අදාළ අමාත්‍යාංශ ලේකම්වරයා විසින් මූලික විමර්ශන වාර්තාව ද සමඟ චෝදනා පත්‍ර කෙටුම්පත ද රාජ්‍ය පරිපාලන විෂය භාර ලේකම්වරයා වෙත නොපමාව යොමු කළ යුතු ය. අදාළ කරුණු තවදුරටත් පරීක්ෂා කර බලා අවශ්‍ය වේ නම් සුදුසු සංශෝධනයක් ද සහිතව රාජ්‍ය පරිපාලන විෂය භාර ලේකම්වරයාගේ අත්සනින් එම චෝදනා පත්‍රය අදාළ නිලධරයා වෙත විධිමත්ව නිකුත් කළ යුතු ය.

3:3 නියමිත කාලසීමාවක් ඇතුළත දී එම චෝදනා සම්බන්ධයෙන් තම නිදහසට කරුණු ඉදිරිපත් කරන ලෙස චූදිත නිලධරයාට නියම කළ යුතු ය. එසේ නියම කරන කාලසීමාව ඇතුළත සිය නිදහසට කරුණු ඉදිරිපත් කිරීමට ඔහු අපොහොසත් වුවහොත්, තම නිදහසට ඉදිරිපත් කළ හැකි කරුණු කිසිවක් ඔහුට නොමැති සේ සලකා ක්‍රියා කළ යුතු ය.

3:4 නිදහසට කරුණු ඉදිරිපත් කරනු ලැබුවහොත් හෝ නියමිත කාලසීමාව ඇතුළත නිදහසට කරුණු ඉදිරිපත් කිරීමට චූදිත නිලධරයා අපොහොසත් වුවහොත් හෝ එහි ලා අනුගමනය කළ පටිපාටිය පිළිබඳ විස්තරයක් සිය නිර්දේශත් සමඟ ලේකම්වරයා විසින්, අදාළ අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. ඒකාබද්ධ සේවාවන්ට අයත් නිලධරයකු සම්බන්ධයෙන් වන කල්හි එම ලේකම්වරයා විසින් රාජ්‍ය පරිපාලන විෂයභාර ලේකම්වරයා වෙත තම අමාත්‍යවරයාගේ නිරීක්ෂණ ද සහිතව උක්ත සඳහන් ලියවිලි හා වාර්තා ඉදිරිපත් කළ යුතු ය.

3:5 උක්ත 3:4 උප වගන්තිය යටතේ තමා වෙත ලැබුණු විස්තර සිය නිර්දේශයන් සමඟ රාජ්‍ය පරිපාලන විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් රාජ්‍ය පරිපාලන විෂයභාර අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

3:6 උක්ත 3:4 සහ 3:5 උප වගන්තිවල දක්වා ඇති ආකාරයට චූදිත නිලධරයා විසින් ඉදිරිපත් කරන ලද නිදහසට කරුණු සහ අදාළ ලේකම්වරයා විසින් ඉදිරිපත් කර ඇති නිර්දේශයන් ද සැලකිල්ලට ගෙන අදාළ අමාත්‍යවරයා විසින්, චූදිත නිලධරයා සිය නිර්දෝශීභාවය සනාථ කොට ඇති බව නිරීක්ෂණය වන්නේ නම්, චෝදනා පත්‍රයේ සඳහන් සියලු චෝදනාවලින් නිදොස් කොට නිදහස් කිරීමට හෝ දෙවන උපලේඛනය යටතට වැටෙන වරදකට වරදකරු වී ඇති බව නිරීක්ෂණය වන්නේ නම් සුළු දඬුවමක් නියම කිරීම පිළිබඳව හෝ චූදිත නිලධරයා බැලූ බැල්මට පෙනී යන ආකාරයට පළමුවන උපලේඛනය යටතට වැටෙන වරදක් සිදුකර ඇති බව නිරීක්ෂණය වන්නේ නම් එහිලා ඔහුට විරුද්ධව විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීමට හෝ සුදුසු යැයි හැඟෙන වෙනත් ක්‍රියාමාර්ගයක් ගැනීම පිළිබඳව හෝ ස්වකීය නිර්දේශයන් ද සමඟ වාර්තාවක් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු ය. ඒකාබද්ධ සේවාවන්ට අයත් නිලධරයෙක් සම්බන්ධයෙන් නම් අදාළ අමාත්‍යවරයා වන්නේ රාජ්‍ය පරිපාලන විෂයභාර අමාත්‍යවරයා ය.

3:7 චූදිත නිලධරයා විසින් ඉදිරිපත් කර ඇති නිදහසට කරුණු ද ඒ පිළිබඳව අදාළ ලේකම්වරයාගේ හා අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා නිර්දේශයන් ද සලකා බැලීමෙන් පසු චූදිත නිලධරයා ස්වකීය නිර්දෝශීභාවය ප්‍රමාණවත් ලෙස සනාථ කර ඇති බව අමාත්‍ය මණ්ඩලය විසින් නිගමනය කරන්නේ නම් ඔහු චෝදනා පත්‍රයේ සියලුම චෝදනාවලින් නිදොස් කොට නිදහස් කිරීමට හෝ යම් හෙයකින් චූදිත නිලධරයා දෙවන උපලේඛනය යටතට වැටෙන වරදකට වරදකරු වී ඇති බව අමාත්‍ය මණ්ඩලය නිගමනය කරන්නේ නම් එහිලා අමාත්‍ය මණ්ඩලයේ අභිමතය පරිදි ඔහු වෙත සුළු දඬුවමක් නියම කිරීමට හෝ චූදිත නිලධරයා බැලූ බැල්මට පෙනී යන ආකාරයට පළමුවන උපලේඛනය යටතට වැටෙන වරදක් සිදුකර ඇති බව අමාත්‍ය මණ්ඩලයේ නිගමනය වන්නේ නම් එහිලා ඔහුට විරුද්ධව විධිමත් විනය පරීක්ෂණයක් පවත්වන ලෙසට හෝ අමාත්‍ය මණ්ඩලය විසින් නිගමනය කරන වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙසට හෝ අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත විධාන කළ යුතු ය. ඒකාබද්ධ සේවාවන්ට අයත් නිලධරයකු සම්බන්ධයෙන් අදාළ ලේකම්වරයා වන්නේ රාජ්‍ය පරිපාලන විෂයභාර ලේකම්වරයා ය.

3:8 තමා වෙත විධිමත්ව නිකුත් කර ඇති චෝදනා පත්‍රයේ සියලුම චෝදනාවන් සඳහා වැරදිකරු යයි ස්වකීය නිදහසට කරුණු දක්වනු ලබන අවස්ථාවේ දී චූදිත නිලධරයා විසින් පිළිගනු ලැබ ඇත්නම්, අදාළ අමාත්‍යාංශයේ ලේකම් විසින් චෝදනා පත්‍රයේ සඳහන් එක් එක් චෝදනාව සලකා බලා පැනවිය යුතු දඬුවම් පිළිබඳව ස්වකීය නිරීක්ෂණ හා නිර්දේශයන් අදාළ අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. මෙහි දී අදාළ අමාත්‍යවරයා විසින් ලේකම්වරයාගේ නිර්දේශයන් ද, සැලකිල්ලට ගෙන ඒ පිළිබඳව තම නිර්දේශයන් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු ය. ඒකාබද්ධ සේවාවන්ට අයත් නිලධරයකු සම්බන්ධයෙන් නම් එම නිලධරයා සේවය කරන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් තම නිර්දේශයන් ද සහිතව අදාළ ලියවිලි හා වාර්තා රාජ්‍ය පරිපාලන විෂයභාර ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. මෙහි දී රාජ්‍ය පරිපාලන විෂයභාර ලේකම්වරයා විසින් අදාළ නිරීක්ෂණ හා නිර්දේශයන් සැලකිල්ලට ගෙන ස්වකීය නිර්දේශය රාජ්‍ය පරිපාලන විෂයභාර අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. රාජ්‍ය පරිපාලන විෂයභාර

අමාත්‍යවරයා අදාළ සියලු නිරීක්ෂණ හා නිර්දේශයන් සැලකිල්ලට ගෙන, ඒ පිළිබඳව තම නිර්දේශයන් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු ය.

3:9 අදාළ සියලු නිරීක්ෂණ හා නිර්දේශයන් සැලකිල්ලට ගෙන හෝ නොගෙන හෝ චූදිත නිලධරයා වෙත සුදුසු යයි හැඟෙන දඬුවමක් පැනවීමට හෝ චූදිත නිලධරයාගේ වරද පිළිගැනීම නොසලකා හැර විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීම අවශ්‍ය යයි අමාත්‍ය මණ්ඩලයේ නිගමනය වන්නේ නම් එවැනි විධිමත් විනය පරීක්ෂණයක් පවත්වන ලෙසට හෝ සුදුසු යයි හැඟෙන වෙනත් ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙසට හෝ අදාළ ලේකම්වරයා වෙත විධානයක් කිරීමට අමාත්‍ය මණ්ඩලයට පුළුවන. ඒකාබද්ධ සේවාවන්ට අයත් නිලධරයකු සම්බන්ධයෙන් නම් අදාළ ලේකම්වරයා වන්නේ රාජ්‍ය පරිපාලන විෂය භාර ලේකම්වරයා ය.

3:10 චූදිත නිලධරයා වෙත දඬුවමක් පැනවීම අවශ්‍ය නොවන බවට අමාත්‍ය මණ්ඩලය විසින් නිගමනය කර ඇති කල්හි එම තීරණය අප්‍රමාදව නිලධරයා වෙත දැනුම් දී අවශ්‍ය පියවර ගැනීමට ද නිලධරයා වෙත දඬුවමක් පැනවීමට විධාන කර ඇති කල්හි එම තීරණය නිලධරයා වෙත දැනුම් දී අවශ්‍ය පියවර ගැනීමට ද චූදිත නිලධරයාට විරුද්ධව විධිමත් විනය පරීක්ෂණයක් පවත්වන ලෙසට විධාන කර ඇති කල්හි සුදුසු විනිශ්චය සභාවක් පත් කොට එම විනය පරීක්ෂණ පැවැත්වීමට කටයුතු කිරීමට ද වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙසට නියෝග කොට ඇති කල්හි එම ක්‍රියාමාර්ගය ගැනීමට ද, අදාළ ලේකම්වරයා විසින් අප්‍රමාදව කටයුතු කළයුතු වන්නේ ය. ඒකාබද්ධ සේවාවන්ට අයත් නිලධරයෙකු සම්බන්ධයෙන් අදාළ ලේකම්වරයා වන්නේ රාජ්‍ය පරිපාලන විෂයභාර ලේකම්වරයා ය.

3:11 චූදිත නිලධරයාට නිකුත් කර ඇති චෝදනා පත්‍රය සම්බන්ධයෙන් උක්ත 3:10 වගන්තිය ප්‍රකාරව පත්කරනු ලබන විනිශ්චය සභාව විසින් පැවැත්වූ විධිමත් විනය පරීක්ෂණයට අදාළ, තම වාර්තාව, පරීක්ෂණ සටහන්, පැමිණිල්ලේ සාක්ෂි සම්පිණ්ඩනය, විත්තියේ සාක්ෂි සම්පිණ්ඩනය හා පැමිණිල්ල හා විත්තිය විසින් ඉදිරිපත් කරන අනෙකුත් ලියවිලි ද සමඟ අදාළ ලේකම්වරයා වෙත නොපමාව ඉදිරිපත් කළ යුතු ය. පරීක්ෂණය පැවැත්වීමේ දී නොවැළැක්විය හැකි ප්‍රමාදයන් ඇති වන්නේ නම් ඒ පිළිබඳව අදාළ අවස්ථාවන්හි දී ලේකම්වරයා වෙත අප්‍රමාදව ලිඛිතව වාර්තා කළ යුතු ය.

3:12 චූදිත නිලධරයාට විරුද්ධව පවත්වනු ලබන විධිමත් විනය පරීක්ෂණය අනවශ්‍ය ලෙස ප්‍රමාද වන්නේ යැයි අදාළ ලේකම්වරයාට පෙනී යන්නේ නම් විනය පරීක්ෂණයේ කුමන අවස්ථාවක දී වුව ද, එතෙක් පැවති පරීක්ෂණ කටයුතු මුළුමනින්ම අවලංගු කර නව පරීක්ෂණයක් පැවැත්වීමට හෝ අදාළ පාර්ශවයන් එකඟ වන්නේ නම් එතෙක් පැවති පරීක්ෂණයේ කටයුතු අවසන් කළ අවස්ථාවේ දී සිට අඛණ්ඩව ඉදිරියට පවත්වාගෙන යාමට හෝ නව විනිශ්චය සභාවක් පත් කිරීමට අදාළ ලේකම්වරයාට බලය ඇත්තේ ය.

3:13 විධිමත් විනය පරීක්ෂණ වාර්තාවක් හා අදාළ අනෙකුත් සියලු ලියවිලි හා වාර්තා ස්වකීය නිර්දේශයන් ද සහිතව අදාළ අමාත්‍යවරයා වෙත ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ යුතු ය. ඒකාබද්ධ සේවාවන්ට අයත් නිලධරයෙකු සම්බන්ධයෙන් වන කල්හි අදාළ විනය පරීක්ෂණ වාර්තාව හා අනෙකුත් ලියවිලි හා වාර්තා රාජ්‍ය පරිපාලන විෂයභාර ලේකම්වරයා විසින් නිලධරයා සේවය කරන අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත යොමු කළ යුතු ය. ඒ සම්බන්ධයෙන් තම නිරීක්ෂණ හා නිර්දේශයන් ද අදාළ ලියවිලි හා වාර්තා ද අදාළ ලේකම්වරයා විසින් රාජ්‍ය පරිපාලන විෂයභාර ලේකම්වරයා වෙත අප්‍රමාදව ඉදිරිපත් කළ යුතු ය. රාජ්‍ය පරිපාලන විෂයභාර ලේකම්වරයා විසින් අදාළ නිරීක්ෂණ හා නිර්දේශයන් සැලකිල්ලට ගෙන ස්වකීය නිරීක්ෂණ හා නිර්දේශයන් සමඟ සියලු ලියවිලි හා වාර්තා රාජ්‍ය පරිපාලන විෂයභාර අමාත්‍යවරයා වෙත නොපමාව ඉදිරිපත් කළ යුතු ය.

3:14 විනිශ්චය සභාවේ වාර්තා හා අනෙකුත් අදාළ ලියවිලි අදාළ නිලධරයන්ගේ නිරීක්ෂණ හා නිර්දේශයන් සහිතව තමන් වෙත ලැබුණ කල්හි ඒවා අධ්‍යයනය කිරීමෙන් අනතුරුව තම නිරීක්ෂණ හා නිර්දේශ අමාත්‍ය මණ්ඩලය වෙත අදාළ අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කළයුතු වන්නේ ය. ඒකාබද්ධ සේවාවන්ට අයත් නිලධරයකු සම්බන්ධයෙන් වන කල්හි අදාළ අමාත්‍යවරයා වන්නේ රාජ්‍ය පරිපාලන විෂයභාර අමාත්‍යවරයා ය.

3:15 අදාළ අමාත්‍යවරයා විසින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇති සියලු නිරීක්ෂණ හා නිර්දේශයන් සුපරීක්ෂාකාරී ලෙස අධ්‍යයනය කිරීමෙන් පසු චූදිත නිලධරයාට විරුද්ධව නගා ඇති චෝදනාවන්ට වැරදිකරු හෝ නිවැරදිකරු වන්නේ ද යන්න තීරණය කිරීමට ද, ඔහු නිවැරදිකරු බව තීරණය කරන්නේ නම් චෝදනා පත්‍රයේ සඳහන් සියලු චෝදනාවන්ගෙන් නිදොස් කොට නිදහස් කිරීමට ද, ඔහු වැරදිකරු යැයි නිගමනය කරන්නේ නම් සේවයෙන් පහ කිරීම හෝ සුදුසු වෙනත් දඬුවමක් හෝ පැනවීමට ද, නොඑසේ නම් අමාත්‍ය මණ්ඩලයේ අභිමතය පරිදි සුදුසු යැයි හැඟෙන වෙනත් ක්‍රියාමාර්ගයක් ගැනීමට ද, අදාළ ලේකම්වරයා වෙත විධාන කිරීමට අමාත්‍ය මණ්ඩලය විසින් කටයුතු කරනු ඇත.

3:16 අමාත්‍ය මණ්ඩලය විසින් උක්ත 3:15 උප වගන්තිය අනුව අදාළ ලේකම්වරයා වෙත එසේ විධාන කරනු ලැබූවිට එම ලේකම්වරයා විසින් ඒ අනුව අප්‍රමාදව ක්‍රියා කර අදාළ අමාත්‍යවරයා වෙත වාර්තා කළ යුතු ය.

## 4. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් විනය කටයුතු සම්බන්ධයෙන් ක්‍රියා කරනු ලබන විට අනුගමනය කළ යුතු කාර්යය පටිපාටිය

4:1 උක්ත 2:2:1 වැනි උප වගන්තියේ සඳහන් නිලධරයකුට විරුද්ධව විනයානුකූලව ක්‍රියා කිරීමට අදහස් කර ඇති විට අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් හෝ දෙපාර්තමේන්තු ප්‍රධානයා විසින් හෝ අවශ්‍ය මූලික විමර්ශන කරවිය යුතු ය.

4:2 එම නිලධරයාට විරුද්ධව චෝදනා නැඟීමට තරම් ප්‍රමාණවත් හේතු සාධක ඇති බව එම මූලික විමර්ශනය මඟින් බැලූ බැල්මට පෙනී යන්නේ නම්, අදාළ අමාත්‍යාංශ ලේකම්/ දෙපාර්තමේන්තු ප්‍රධානයා විසින් කොමිෂන් සභාව නියම කරනු ලබන පිළිවෙතකට හෝ මෙම සංග්‍රහයේ 5 වැනි පරිශිෂ්ටය අනුකූලව චෝදනා කෙටුම්පතක් සකස් කර අදාළ මූලික විමර්ශන වාර්තාව හා අනෙකුත් ලියවිලි සමඟ දෙපාර්තමේන්තු ප්‍රධානයකු නම් ස්වකීය අමාත්‍යාංශ ලේකම්වරයා මඟින් ද අමාත්‍යාංශ ලේකම්වරයකු නම් තමා විසින් ද, කොමිෂන් සභාව වෙත නොපමාව ඉදිරිපත් කළ යුතු ය. එසේ වූව ද, ඒකාබද්ධ සේවාවන්ට අයත් නිලධරයකු සම්බන්ධයෙන් වන කල්හි නිලධරයා සේවය කරන දෙපාර්තමේන්තුවට අයත් අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් චෝදනා කෙටුම්පත ඇතුලු අනෙකුත් ලියවිලි රාජ්‍ය පරිපාලන විෂය භාර ලේකම්වරයා වෙත නොපමාව ඉදිරිපත් කළ යුතු ය.

4:3 ඒකාබද්ධ සේවාවන්ට අයත් නිලධරයකු සම්බන්ධයෙන් වන කල්හි චෝදනා කෙටුම්පත ඇතුලු අනෙකුත් ලියවිලි පරීක්ෂා කර බලා, බැලූ බැල්මට නිලධරයාට විරුද්ධව චෝදනා නැඟීමට තරම් ප්‍රමාණවත් හේතු සාධක ඇති බවට සෑහීමකට පත් වන්නේ නම්, අවශ්‍ය අවස්ථාවන්හි දී සුදුසු සංශෝධනයන් ද සහිතව ඒවා රාජ්‍ය පරිපාලන විෂයභාර ලේකම්වරයා විසින් කොමිෂන් සභාව වෙත නොපමාව ඉදිරිපත් කළ යුතු ය.

4:4 අදාළ චෝදනා කෙටුම්පත ඇතුලු අනෙකුත් ලියවිලි පරීක්ෂා කර බලා, අවශ්‍ය වේ නම් සුදුසු සංශෝධනයන් ද සහිතව, නිලධරයාට විරුද්ධව චෝදනා පත්‍රය නිකුත් කිරීම මැනවැයි කොමිෂන් සභාව තීරණය කරන්නේ නම් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයාගේ අත්සනින් එම

චෝදනා පත්‍රය නිලධරයා වෙත අදාළ අමාත්‍යාංශ ලේකම්වරයා හා/හෝ දෙපාර්තමේන්තු ප්‍රධානයා මඟින් විධිමත්ව නිකුත් කළ යුතු ය.

4:5 නියමිත කාලසීමාව තුළ දී එම චෝදනා සම්බන්ධයෙන් තම නිදහසට කරුණු ඉදිරිපත් කරන ලෙස කොමිෂන් සභාව විසින් චූදිත නිලධරයාට නියම කළ යුතු ය.

4:6 තම නිදහසට කරුණු ඉදිරිපත් කිරීම සඳහා චූදිත නිලධරයා විසින් පරීක්ෂා කිරීමට අවශ්‍ය වේ යැයි සැලකෙන සියලු ලියවිලි කොමිෂන් සභාව විසින්, චෝදනා පත්‍රය නිකුත් කරන අවස්ථාවේ දී ම අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයා/දෙපාර්තමේන්තු ප්‍රධානයා වෙත යොමු කළ යුතු ය.

4:7 චූදිත නිලධරයා විසින් නියමිත කාලසීමාව තුළ දී තම නිදහසට කරුණු ඉදිරිපත් කරනු ලැබුවහොත් එසේ ඉදිරිපත් කර ඇති නිදහසට කරුණු පිළිබඳව තම නිරීක්ෂණ හා විනය ක්‍රියා පටිපාටිය සම්බන්ධයෙන් අදාළ නිර්දේශයන් ද දෙපාර්තමේන්තු ප්‍රධානයා හා/හෝ අදාළ අමාත්‍යාංශ ලේකම්වරයා විසින්, කොමිෂන් සභාව වෙත නොපමාව ඉදිරිපත් කළ යුතු ය. ඒකාබද්ධ සේවාවන්ට අයත් නිලධරයකු සම්බන්ධයෙන් වූ කල්හි අදාළ නිරීක්ෂණ හා නිර්දේශයන් ඉදිරිපත් කළ යුත්තේ රාජ්‍ය පරිපාලන විෂයභාර ලේකම්වරයා මඟිනි.

4:8 නියමිත කාලසීමාව ඇතුළත දී නිදහසට කරුණු ඉදිරිපත් කිරීමට චූදිත නිලධරයා අපොහොසත් වී ඇති කල්හි ඔහු වෙත චෝදනා පත්‍රය විධිමත්ව භාර දුන් බවට සහතිකයක් ද සමඟ අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානයා හා/හෝ අමාත්‍යාංශ ලේකම්වරයා විසින් ඉදිරි විනය ක්‍රියා පටිපාටිය පිළිබඳව තම නිරීක්ෂණ හා නිර්දේශයන් ද සහිතව කොමිෂන් සභාවේ ලේකම්වරයා වෙත නොපමාව වාර්තා කළ යුතු ය. ඒකාබද්ධ සේවාවන්ට අයත් නිලධරයකු සම්බන්ධයෙන් නම් අදාළ වාර්තාව ඉදිරිපත් කළ යුත්තේ රාජ්‍ය පරිපාලන විෂය භාර ලේකම්වරයා මඟිනි.

4:9 නියමිත කාලසීමාව තුළ දී තම නිදහසට කරුණු ඉදිරිපත් කිරීමට අපොහොසත් වන හෝ නිදහසට කරුණු ඉදිරිපත් කිරීම හිතාමතා පැහැර හරින හෝ චූදිත නිලධරයකු සම්බන්ධයෙන් තම අභිමතය පරිදි චූදිත නිලධරයා සියලුම චෝදනාවලට වරද පිළිගත්තා සේ සලකා සුදුසු විනය නියෝගයක් පැනවීමට හෝ උචිත යැයි හැඟෙන වෙනත් ක්‍රියා මාර්ගයක් අනුගමනය කිරීමට හෝ කොමිෂන් සභාවට බලය ඇත්තේ ය.

4:10 ඉහත උපවගන්ති මඟින් දක්වා ඇති ආකාරයට චූදිත නිලධරයා විසින් ඉදිරිපත් කර ඇති නිදහසට කරුණු ද අදාළ ලේකම්වරයා ඇතුලු අනෙකුත් නිලධරයන් විසින් ඉදිරිපත් කර ඇති නිරීක්ෂණ හා නිර්දේශයන් ද සලකා බැලීමෙන් පසුව චූදිත නිලධරයා විසින් ස්වකීය නිර්දෝෂීභාවය ප්‍රමාණවත් ලෙස සනාථ කර ඇති බවට කොමිෂන් සභාව නිගමනය කරන්නේ නම්, ඔහු චෝදනා පත්‍රයේ සඳහන් සියලුම චෝදනාවලින් නිදොස් කොට නිදහස් කිරීමට හෝ යම් හෙයකින් චූදිත නිලධරයා දෙවන උපලේඛනය යටතට වැටෙන වරදකට වරදකරු වී ඇති බව කොමිෂන් සභාව නිගමනය කරන්නේ නම් එහිලා කොමිෂන් සභාවේ අභිමතය පරිදි ඔහු වෙත සුළු දඬුවමක් නියම කිරීමට හෝ චූදිත නිලධරයා බැලූ බැල්මට පෙනී යන ආකාරයට පළමුවැනි උපලේඛනය යටතට වැටෙන වරදක් සිදුකර ඇති බවට කොමිෂන් සභාවේ නිගමනය වන්නේ නම් එහිලා ඔහුට විරුද්ධව විධිමත්ව විනය පරීක්ෂණයක් පැවැත්වීමට හෝ කොමිෂන් සභාව විසින් නිගමනය කරන වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට හෝ කොමිෂන් සභාවට බලය ඇත්තේ ය.

4:11 චූදිත නිලධරයා තම නිදහසට කරුණු ඉදිරිපත් කිරීමේ දී චෝදනා පත්‍රයේ සඳහන් චෝදනාවලින් එකකට හෝ කීපයකට හෝ පමණක් වරදකරු බව පිළිගන්නා අවස්ථාවේ දී හෝ චූදිත නිලධරයා විසින් ඉදිරිපත් කර ඇති නිදහසට කරුණු මඟින් චෝදනාවලින් එකකට හෝ

කීපයකට හෝ පමණක් වරදකරු බව පෙනී යන අවස්ථාවේ දී හෝ සම්පූර්ණ චෝදනා පත්‍රය සම්බන්ධයෙන් විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීමට කොමිෂන් සභාව කටයුතු කළ යුතු ය.

4:12 චූදිත නිලධරයා විසින් තමා චෝදනා පත්‍රයේ ඇති සියලුම චෝදනා සඳහා වැරදිකරු බව ප්‍රකාශිතව පිළිගෙන ඇත්නම්, අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානයා හා/හෝ අමාත්‍යාංශ ලේකම්වරයා විසින් චෝදනා පත්‍රයේ සඳහන් එක් එක් චෝදනාව සලකා බලා පැනවිය යුතු දඬුවම් පිළිබඳව ස්වකීය නිරීක්ෂණ හා නිර්දේශයන් ද සහිතව අදාළ ලියවිලි කොමිෂන් සභාවේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. ඒකාබද්ධ සේවාවන්ට අයත් නිලධරයකු සම්බන්ධයෙන් වන කල්හි අදාළ නිරීක්ෂණ හා නිර්දේශ ඉදිරිපත් කළ යුත්තේ රාජ්‍ය පරිපාලන විෂයභාර ලේකම්වරයා මඟිනි.

4:13 තමා වෙත ඉදිරිපත් කර ඇති සියලුම නිරීක්ෂණ හා නිර්දේශයන් සැලකිල්ලට ගෙන හෝ නොගෙන හෝ චූදිත නිලධරයා වෙත සුදුසු යැයි හැඟෙන දඬුවමක් පැනවීමට හෝ චූදිත නිලධරයාගේ වරද පිළිගැනීම නොසලකා හැර විනය පරීක්ෂණයක් පැවැත්වීම මැනවැයි කොමිෂන් සභාව නිගමනය කරන්නේ නම් එවැනි විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීමට හෝ සුදුසු යැයි හැගෙන වෙනත් ක්‍රියාමාර්ගයක් ගැනීමට හෝ කොමිෂන් සභාවට බලය ඇත්තේ ය.

4:14 4:13 උප වගන්තියට අනුව චූදිත නිලධරයා වෙත දඬුවමක් පැනවීමට අවශ්‍ය නොවන බවට කොමිෂන් සභාව විසින් විධාන කර ඇති කල්හි එම තීරණය වහාම නිලධරයා වෙත දැනුම් දී අවශ්‍ය පියවර ගැනීමට ද, නිලධරයා වෙත දඬුවමක් පැනවීමට තීරණය කර ඇති කල්හි එම තීරණය නිලධරයා වෙත වහාම දැනුම් දී අවශ්‍ය පියවර ගැනීමට ද චූදිත නිලධරයාට විරුද්ධව විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීමට තීරණය කර ඇති කල්හි නොපමාව විනිශ්චය සභාවක් පත් කොට එපරිදි ක්‍රියා කිරීමට ද වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට තීරණය කර ඇති කල්හි අප්‍රමාදව එපරිදි ක්‍රියා කිරීමට ද කොමිෂන් සභාව විසින් කටයුතු කළයුතු වන්නේ ය.

4:15 චූදිත නිලධරයාට විරුද්ධව නිකුත් කර ඇති චෝදනා පත්‍රය සම්බන්ධයෙන්, විනිශ්චය සභාව විසින් පැවැත් වූ විධිමත් විනය පරීක්ෂණයට අදාළ තම වාර්තාව, පරීක්ෂණ සටහන්, පැමිණිල්ලේ හා විත්තියේ සාක්ෂි සම්පිණ්ඩනය, පැමිණිල්ල හා විත්තිය විසින් ඉදිරිපත් කරන ලද අනෙකුත් ලියවිලි ද සමඟ විනිශ්චය සභාව විසින් කොමිෂන් සභාවේ ලේකම්වරයා වෙත නොපමාව ඉදිරිපත් කළ යුතු ය. පරීක්ෂණය පැවැත්වීමේ දී නොවැළැක්විය හැකි ප්‍රමාදයන් ඇති වන්නේ නම් ඒ පිළිබඳව අදාළ අවස්ථාවන්හි දී විනිශ්චය සභාව විසින් කොමිෂන් සභාවේ ලේකම්වරයා වෙත නොපමාව ලිඛිතව වාර්තා කළ යුතු ය.

4:16 චූදිත නිලධරයාට විරුද්ධව පවත්වනු ලබන විධිමත් විනය පරීක්ෂණය අනවශ්‍ය ලෙස ප්‍රමාද වන්නේ යැයි කොමිෂන් සභාවට පෙනී යන්නේ නම් විනය පරීක්ෂණයේ කුමන අවස්ථාවක දී වුව ද එතෙක් පැවති පරීක්ෂණ කටයුතු මුළුමනින්ම අවලංගු කර නව පරීක්ෂණයක් පැවැත්වීමට හෝ අදාළ පාර්ශවයන් එකඟ වන්නේ නම් එතෙක් පැවති පරීක්ෂණ කටයුතු අවසන් කළ අවස්ථාවේ සිට අඛණ්ඩව ඉදිරියට පවත්වා ගෙන යාමට හෝ නව විනිශ්චය සභාවක් පත් කිරීමට කොමිෂන් සභාවට බලය ඇත්තේ ය.

4:17 විනිශ්චය සභාව විසින් විධිමත් විනය පරීක්ෂණයෙන් පසු ඉදිරිපත් කළ සියලු වාර්තා හා ලියවිලි සුපරීක්ෂාකාරී ලෙස අධ්‍යයනය කිරීමෙන් පසු චූදිත නිලධරයාට විරුද්ධව නඟා ඇති චෝදනාවන්ට ඔහු වැරදිකරු හෝ නිවැරදිකරු හෝ වන්නේ ද යන්න නිගමනය කිරීමට ද, ඔහු නිවැරදිකරු බවට නිගමනය කරන්නේ නම් චෝදනා පත්‍රයේ සඳහන් සියලුම චෝදනාවන්ගෙන් නිදොස් කොට නිදහස් කිරීමට ද, ඔහු වැරදිකරු යැයි නිගමනය කරන්නේ නම් සේවයෙන් පහ කිරීම හෝ වෙනත් සුදුසු විනය නියෝගයක් පැනවීමට ද, නොඑසේනම් කොමිෂන් සභාවට මැනවැයි හැඟෙන වෙනත් ක්‍රියාමාර්ගයක් ගැනීමට ද කොමිෂන් සභාවට බලය ඇත්තේ ය.

4:18 විනිශ්චය සභාව විසින් විනය පරීක්ෂණය අවසානයේ දී ඉදිරිපත් කර ඇති නිගමනයන්ට අදාළ විනය බලධරයා එකඟ නොවන අවස්ථාවන්හි දී අදාළ පරීක්ෂණ වාර්තාව ඇතුලු අනෙකුත් ලියවිලි අනුසාරයෙන් තමා විසින්ම ස්වාධීනව එළඹෙන නිගමනයන්ට අනුකූලව විනිශ්චය සභාවේ නිගමනයන්ට ප්‍රතිවිරුද්ධ විනය නියෝගයක් නිකුත් කිරීමේ බලය විනය බලධරයා සතු වන්නේ ය. එවැනි ප්‍රතිවිරුද්ධ විනය නියෝගයක් නිකුත් කරන අවස්ථාවක දී එසේ කිරීමට හේතු කාරක වූ සියලු කරුණු විනය බලධරයා විසින් විනය නියෝගය නිකුත් කිරීමට පෙර පැහැදිලිවත්, නිශ්චිතවත් අදාළ විනය ගොනුවේ සටහන් කර තැබිය යුතු වන්නේ ය.

4:19 කොමිෂන් සභාව විසින් උක්ත 4:17 සහ 4:18 උප වගන්තීන්ට අනුව ගනු ලබන තීරණ අදාළ ලේකම්වරයා හා/හෝ දෙපාර්තමේන්තු ප්‍රධානයා වෙත දන්වා එවනු ලැබූ විට ඔහු විසින් එපරිදි වහාම ක්‍රියා කර ඒ බැව් කොමිෂන් සභාව වෙත වාර්තා කළ යුතු ය.

## 5. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් විධිමත්ව බලය පවරනු ලැබූ අමාත්‍යාංශයක ලේකම්වරයකු විසින් විනය කටයුතු සම්බන්ධයෙන් ක්‍රියා කරනු ලබන විට අනුගමනය කළයුතු කාර්යය පටිපාටිය

5:1 රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයක් මඟින් අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත වරින් වර බලය පවරා දෙනු ලැබිය හැකි අතර, එවැනි අවස්ථාවක දී අදාළ නිලධරයන් සම්බන්ධයෙන් විනය පාලනය පිළිබඳ බලතල, අදාළ අමාත්‍යාංශ ලේකම්වරුන් සතු වනු ඇත.

5:2 උක්ත 5:1 උප වගන්තිය මඟින් පවරන ලද බලය ලැබූ අමාත්‍යාංශ ලේකම්වරයකු විසින් තම විනය බලධාරීත්වය යටතට වැටෙන නිලධර කාණ්ඩයකට අයත් නිලධරයකුට විරුද්ධව විනයානුකූලව ක්‍රියා කිරීමට අදහස් කර ඇති විටක, ඔහු විසින් හෝ අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානයා විසින් හෝ ආයතන ප්‍රධානයා විසින් හෝ නම් කරනු ලබන වෙනත් නිලධරයකු හෝ නිලධර කණ්ඩායමක් හෝ මඟින් මූලික විමර්ශනයක් පැවැත්විය යුතු ය.

5:3 උක්ත 5:2 උප වගන්තිය ප්‍රකාරව අදාළ නිලධරයාට විරුද්ධව චෝදනා නැඟීමට තරම් ප්‍රමාණවත් හේතු සාධක ඇති බව එම මූලික විමර්ශනය මඟින් බැලූ බැල්මට පෙනී යන්නේ නම්, අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානයා විසින්, තම නිරීක්ෂණ හා නිර්දේශය සහිත මූලික විමර්ශන වාර්තාව ද, අදාළ අනෙකුත් ලියවිලි ද, චෝදනා කෙටුම්පතක් ද අදාළ ලේකම්වරයා වෙත නොපමාවම ඉදිරිපත් කළ යුතු ය. එසේ වුව ද ඒකාබද්ධ සේවාවකට අයත් නිලධරයකු සම්බන්ධයෙන් වන කල්හි නිලධරයා සේවය කරන දෙපාර්තමේන්තුව අයත් අමාත්‍යාංශ ලේකම්වරයා විසින් චෝදනා කෙටුම්පත ඇතුලු ලියවිලි රාජ්‍ය පරිපාලන විෂයභාර ලේකම්වරයා වෙත නොපමාවම ඉදිරිපත් කළ යුතු ය.

5:4 උක්ත 5:3 උප වගන්තියේ සඳහන් අදාළ සියලු ලියවිලි පරීක්ෂා කර බලා අදාළ නිලධරයාට විරුද්ධව චෝදනා පත්‍රයක් නිකුත් කිරීම මැනවැයි අදාළ ලේකම්වරයා තීරණය කරන්නේ නම්, අවශ්‍ය වේ නම් සුදුසු සංශෝධනයක් ද සහිතව එම චෝදනා පත්‍රය අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානයා මඟින් අදාළ නිලධරයා වෙත විධිමත්ව නිකුත් කළ යුතු ය.

5:5 චූදිත නිලධරයා විසින් නියමිත කාලසීමාව තුළ දී තම නිදහසට කරුණු ඉදිරිපත් කරනු ලැබුවහොත් එසේ ඉදිරිපත් කර ඇති නිදහසට කරුණු තම නිරීක්ෂණ හා විනය ක්‍රියා පටිපාටිය සම්බන්ධයෙන් තම නිර්දේශය ද සහිතව අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානයා විසින් අදාළ ලේකම්වරයා වෙත අප්‍රමාදව ඉදිරිපත් කළ යුතු ය. ඒකාබද්ධ සේවාවකට අයත් නිලධරයකු සම්බන්ධයෙන් වන කල්හි එම ලේකම්වරයා විසින් තම නිරීක්ෂණ හා නිර්දේශයන් සහිතව එම නිදහසට කරුණු රාජ්‍ය පරිපාලන විෂයභාර ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

5:6 නියමිත කාලසීමාව ඇතුළත දී තම නිදහසට කරුණු ඉදිරිපත් කිරීමට චූදිත නිලධරයා අපොහොසත් වී ඇති කල්හි ඔහු වෙත චෝදනා පත්‍රය විධිමත්ව බාර දුන් බවට සහතිකයක් ද සමඟ ඉදිරි විනය ක්‍රියා පටිපාටිය පිළිබඳව තම නිරීක්ෂණ හා නිර්දේශයන් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානයා විසින් අදාළ ලේකම්වරයා වෙත නොපමාවම ඉදිරිපත් කළ යුතු ය. ඒකාබද්ධ සේවාවකට අයත් නිලධරයකු සම්බන්ධයෙන් වන කල්හි එම ලේකම්වරයා විසින් නිරීක්ෂණ හා නිර්දේශයන් සහිතව එම සියලු ලියවිලි රාජ්‍ය පරිපාලන විෂය භාර ලේකම්වරයා වෙත ඉදිරිපත් කළයුතු වන්නේ ය.

5:7 නියමිත කාලසීමාව තුළ දී තම නිදහසට කරුණු ඉදිරිපත් කිරීමට අපොහොසත් වන හෝ නිදහසට කරුණු ඉදිරිපත් කිරීම සිතා මතා පැහැර හරින හෝ චූදිත නිලධරයෙකු සම්බන්ධයෙන්, තම අභිමතය පරිදි සියලුම චෝදනාවලට වරද පිළිගත්තා සේ සලකා සුදුසු විනය නියෝගයක් පැනවීමට හෝ සුදුසු යැයි හැඟෙන වෙනත් ක්‍රියාමාර්ගයක් අනුගමනය කිරීමට හෝ අදාළ ලේකම්වරයාට බලය ඇත්තේ ය.

5:8 උක්ත 5:5 උප වගන්තිය මඟින් දක්වා ඇති ආකාරයට චූදිත නිලධරයා විසින් ඉදිරිපත් කර ඇති නිදහසට කරුණු ද අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානයා විසින් ඉදිරිපත් කර ඇති නිරීක්ෂණ හා නිර්දේශයන් ද සලකා බැලීමෙන් පසු චූදිත නිලධරයා විසින් ස්වකීය නිර්දෝෂීභාවය ප්‍රමාණවත් ලෙස සනාථ කර ඇති බවට අදාළ ලේකම්වරයා නිගමනය කරන්නේ නම් ඔහු චෝදනා පත්‍රයේ සඳහන් සියලුම චෝදනාවලින් නිදොස් කොට නිදහස් කිරීමට හෝ යම් හෙයකින් චූදිත නිලධරයා දෙවන උපලේඛනය යටතට වැටෙන වරදකට වරදකරු වී ඇති බව අදාළ ලේකම්වරයා නිගමනය කරන්නේ නම් එහිලා ලේකම්වරයාගේ අභිමතය පරිදි ඔහු වෙත සුළු දඬුවමක් නියම කිරීමට හෝ බැලූ බැල්මට පෙනී යන ආකාරයට පළමු උපලේඛනය යටතට වැටෙන වරදක් සිදු කර ඇති බවට අදාළ ලේකම්වරයාගේ නිගමනය වන්නේ නම් එහිලා ඔහුට විරුද්ධව විධිමත් විනය පරීක්ෂණයක් පවත්වන ලෙසට හෝ ලේකම්වරයා විසින් නිගමනය කරන වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට හෝ ලේකම්වරයාට බලය ඇත්තේ ය. ඒකාබද්ධ සේවාවන්ට අයත් නිලධරයකු සම්බන්ධයෙන් වන කල්හි අදාළ ලේකම්වරයා වන්නේ රාජ්‍ය පරිපාලන විෂයභාර ලේකම්වරයා ය.

5:9 චූදිත නිලධරයා තම නිදහසට කරුණු ඉදිරිපත් කිරීමේ දී, චෝදනා පත්‍රයේ සඳහන් චෝදනාවලින් එකකට හෝ කීපයකට හෝ පමණක් වරදකරු බව පිළිගන්නා අවස්ථාවේ දී හෝ චූදිත නිලධරයා විසින් ඉදිරිපත් කර ඇති නිදහසට කරුණු මඟින් චෝදනාවලින් එකකට හෝ කීපයකට හෝ පමණක් නිවැරදිකරු වන බව පෙනී යන අවස්ථාවේ දී හෝ සම්පූර්ණ චෝදනා පත්‍රය සම්බන්ධයෙන්ම විධිමත් විනය පරීක්ෂණයක් පවත්වන ලෙසට නියම කිරීමට අදාළ ලේකම්වරයා විසින් කටයුතු කළයුතු වන්නේ ය. ඒකාබද්ධ සේවාවකට අයත් නිලධරයකු සම්බන්ධයෙන් වන කල්හි අදාළ ලේකම්වරයා වන්නේ රාජ්‍ය පරිපාලන විෂයභාර ලේකම්වරයා ය.

5:10 තමා වෙත විධිමත්ව නිකුත් කර ඇති චෝදනා පත්‍රයේ සඳහන් සියලුම චෝදනාවලට වැරදිකරු බව චූදිත නිලධරයා විසින් චෝදනා පත්‍රයට පිළිතුරු සපයන අවස්ථාවේ දී ප්‍රකාශිතව පිළිගෙන ඇත්නම්, අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානයා විසින් එක් එක් චෝදනාව සලකා බලා පැනවිය යුතු දඬුවම් පිළිබඳව ස්වකීය නිරීක්ෂණ හා නිර්දේශයන් ද සහිතව චූදිත නිලධරයා විසින් ඉදිරිපත් කර ඇති පිළිතුර අදාළ ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. ඒකාබද්ධ සේවාවකට අයත් නිලධරයකු සම්බන්ධයෙන් වන කල්හි එම ලේකම්වරයා විසින් තම නිර්දේශයන් ද සහිතව එම අදාළ සියලු ලියවිලි රාජ්‍ය පරිපාලන විෂයභාර ලේකම්වරයා වෙත ඉදිරිපත් කළයුතු වන්නේ ය.

5:11 තමා වෙත ඉදිරිපත් කර ඇති සියලුම නිරීක්ෂණ හා නිර්දේශයන් සැලකිල්ලට ගෙන චූදිත නිලධරයා වෙත සුදුසු යැයි හැඟෙන දඬුවම් පැනවීමට හෝ චූදිත නිලධරයාගේ වරද පිළිගැනීම නොසලකා හැර විනය පරීක්ෂණයක් පැවැත්වීම මැනවැයි අදාළ ලේකම්වරයා නිගමනය කරන්නේ නම් එවැනි විධිමත් විනය පරීක්ෂණයක් පවත්වන ලෙසට හෝ සුදුසු යැයි හැඟෙන වෙනත් ක්‍රියා මාර්ගයක් ගන්නා ලෙසට හෝ විධානයක් කිරීමට ලේකම්වරයාට බලය ඇත්තේය. ඒකාබද්ධ සේවාවකට අයත් නිලධරයකු සම්බන්ධයෙන් වන කල්හි අදාළ ලේකම්වරයා වන්නේ රාජ්‍ය පරිපාලන විෂයභාර ලේකම්වරයා ය.

5:12 චූදිත නිලධරයාට විරුද්ධව නිකුත් කර ඇති චෝදනා පත්‍රය සම්බන්ධයෙන් පැවැත්වූ විධිමත් විනය පරීක්ෂණයට අදාළ වාර්තාව, පරීක්ෂණ සටහන්, පැමිණිල්ලේ සාක්ෂි සම්පිණ්ඩනය, විත්තියේ සාක්ෂි සම්පිණ්ඩනය, පැමිණිල්ල හා විත්තිය විසින් ඉදිරිපත් කර ඇති අනෙකුත් ලියවිලි ද සමඟ අදාළ ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. පරීක්ෂණය පැවැත්වීමේ දී නොවැළැක්විය හැකි ප්‍රමාදයක් ඇති වන්නේ නම්, ඒ පිළිබඳ අදාළ අවස්ථාවන්හි දී විනිශ්චය සභාව විසින් අදාළ ලේකම්වරයා වෙත නොපමාව ලිඛිතව වාර්තා කළ යුතු ය.

5:13 චූදිත නිලධරයාට විරුද්ධව පවත්වනු ලබන විධිමත් විනය පරීක්ෂණය අනවශ්‍ය ලෙස ප්‍රමාදවන්නේ යැයි අදාළ ලේකම්වරයාට පෙනී යන්නේ නම්, විනය පරීක්ෂණයේ කුමන අවස්ථාවක දී වුව ද එතෙක් පැවති පරීක්ෂණ කටයුතු මුළුමනින්ම අවලංගු කර නව පරීක්ෂණයක් පැවැත්වීමට හෝ අදාළ පාර්ශවයන් එකඟ වන්නේ එතෙක් පැවති පරීක්ෂණයේ කටයුතු අවසන් කළ අවස්ථාවේ සිට අඛණ්ඩව ඉදිරියට පවත්වා ගෙන යාමට හෝ නව විනිශ්චය සභාවක් පත් කිරීමට අදාළ ලේකම්වරයාට බලය ඇත්තේ ය.

5:14 විනිශ්චය සභාව විසින් විධිමත් විනය පරීක්ෂණයෙන් පසු තමා වෙත ඉදිරිපත් කළ සියලු වාර්තා ලියවිලි සුපරීක්ෂාකාරී ලෙස අධ්‍යයනය කිරීමෙන් පසු එම නිර්දේශයන් පිළිගෙන හෝ නොපිළිගෙන හෝ චූදිත නිලධරයාට විරුද්ධව නඟා ඇති චෝදනාවන්ට ඔහු වැරදිකරු හෝ නිවැරදිකරු හෝ වන්නේ ද යන්න නිගමනය කිරීමට ද ඔහු නිවැරදිකරු බව නිගමනය කරන්නේ නම්, චෝදනා පත්‍රයේ සඳහන් සියලුම චෝදනාවන්ගෙන් නිදොස් කොට නිදහස් කිරීමට ද ඔහු වැරදිකරු යයි නිගමනය කරන්නේ නම් සේවයෙන් පහ කිරීම හෝ වෙනත් සුදුසු විනය නියෝගයක් පැනවීමට ද නොඑසේ නම් ලේකම්වරයාට මැනවැයි හැඟෙන වෙනත් ක්‍රියා මාර්ගයක් ගැනීමට ද අදාළ ලේකම්වරයාට බලය ඇත්තේ ය. ඒකාබද්ධ සේවාවන්ට අයත් නිලධරයකු සම්බන්ධයෙන් වන කල්හි අදාළ ලේකම්වරයා වන්නේ රාජ්‍ය පරිපාලන විෂයභාර ලේකම්වරයා ය.

5:15 විනිශ්චය සභාව විසින් විධිමත් විනය පරීක්ෂණය අවසානයේ දී ඉදිරිපත් කර ඇති නිගමනයන්ට අදාළ විනය බලධරයා එකඟ නොවන අවස්ථාවන්හි දී අදාළ පරීක්ෂණ වාර්තාව ඇතුළු අනෙකුත් ලියවිලි අනුසාරයෙන් තමා විසින්ම ස්වාධීනව එළඹෙන නිගමනයන්ට අනුකූලව, විනිශ්චය සභාවේ නිගමනයන්ට ප්‍රතිවිරුද්ධව විනය නියෝගයක් නිකුත් කිරීමේ බලය විනය බලධරයා සතු වන්නේ ය. එසේ කිරීමට හේතුකාරක වූ සියලු කරුණු විනය බලධරයා විසින් විනය නියෝගය නිකුත් කිරීමට පෙර පැහැදිලිවත්, නිශ්චිතවත් අදාළ විනය ගොනුවේ සටහන් කර තැබිය යුතු වන්නේ ය.

## 6. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් විධිමත්ව බලය පවරනු ලැබූ දෙපාර්තමේන්තු ප්‍රධානියෙක් හෝ වෙනත් නිලධරයකු හෝ විසින් විනය කටයුතු සම්බන්ධයෙන් ක්‍රියා කරනු ලබන විට අනුගමනය කළයුතු කාර්යය පටිපාටිය.

6:1 රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයක් මඟින් දෙපාර්තමේන්තු ප්‍රධානයන් වෙත හා වෙනත් නිලධරයන් වෙත වරින්වර බලය පවරා දෙනු ලැබිය හැකි අතර, එවැනි අවස්ථාවක දී අදාළ නිලධරයන් සම්බන්ධයෙන් හා විනය පාලනය පිළිබඳ බලතල, අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානයන් හා අදාළ නිලධරයන් සතු වනු ඇත.

6:2 උක්ත 6:1 උප වගන්තිය මඟින් පවරන ලද බලය ලැබූ දෙපාර්තමේන්තු ප්‍රධානයකු සහ වෙනත් නිලධරයකු විසින් තම විනය බලධාරීත්වය යටතට වැටෙන නිලධර කාණ්ඩයකට අයත් නිලධරයකුට විරුද්ධව විනයානුකූලව ක්‍රියා කිරීමට අදහස් කර ඇති විටක, අදාළ විනය බලධරයාම විසින් හෝ ඔහු විසින් පත්කරනු ලබන වෙනත් නිලධරයකු හෝ නිලධර කණ්ඩායමක් හෝ මඟින් හෝ මූලික විමර්ශනයක් පැවැත්විය යුතු ය.

6:3 උක්ත 6:2 උප වගන්තිය ප්‍රකාරව නිලධරයාට විරුද්ධව චෝදනා නැඟීමට තරම් ප්‍රමාණවත් හේතු සාධක ඇති බව එම මූලික විමර්ශනය මඟින් බැලූ බැල්මට පෙනී යන්නේ නම්, අදාළ විනය බලධරයා විසින්, චෝදනා පත්‍රයක් සකස් කර අදාළ නිලධරයා වෙත විධිමත්ව නිකුත් කළ යුතු ය. එසේ වුව ද ඒකාබද්ධ සේවාවන්ට අයත් නිලධරයකු සම්බන්ධයෙන් වන කල්හි නිලධරයා සේවය කරන දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් චෝදනා කෙටුම්පත ඇතුලු අනෙකුත් ලියවිලි ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත නොපමාවම ඉදිරිපත් කළ යුතු ය.

6:4 චූදිත නිලධරයා ඒකබද්ධ සේවාවකට අයත් නිලධරයකු වන කල්හි අදාළ චෝදනා කෙටුම්පත ඇතුලු අනෙකුත් ලියවිලි පරීක්ෂා කර බලා අවශ්‍ය වේ නම්, සුදුසු සංශෝධනයන් සහිතව නිලධරයාට විරුද්ධව චෝදනා පත්‍ර නිකුත් කිරීම මැනවැයි ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් තීරණය කරන්නේ නම්, එම චෝදනා පත්‍රය නිලධරයා සේවය කරන දෙපාර්තමේන්තුවේ ප්‍රධානයා මඟින් අදාළ නිලධරයා වෙත ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් විධිමත්ව නිකුත් කළ යුතු ය.

6:5 නියමිත කාලසීමාව තුළ දී තම නිදහසට කරුණු ඉදිරිපත් කිරීමට අපොහොසත් වන හෝ නිදහසට කරුණු ඉදිරිපත් කිරීම සිතා මතා පැහැර හරින හෝ චූදිත නිලධරයෙකු සම්බන්ධයෙන් තම අභිමතය පරිදි සියලුම චෝදනාවලට වරද පිළිගත්තා සේ සලකා සුදුසු විනය නියෝගයක් පැනවීමට හෝ සුදුසු යැයි හැඟෙන වෙනත් ක්‍රියා මාර්ගයක් අනුගමනය කිරීමට හෝ අදාළ විනය බලධරයාට බලය ඇත්තේ ය.

6:6 චූදිත නිලධරයා විසින් ඉදිරිපත් කර ඇති නිදහසට කරුණු සලකා බැලීමෙන් පසු චූදිත නිලධරයා විසින් ස්වකීය නිර්දෝෂීභාවය ප්‍රමාණවත් ලෙස සනාථ කර ඇති බවට අදාළ විනය බලධරයා නිගමනය කරන්නේ නම් ඔහු චෝදනා පත්‍රයේ සඳහන් සියලුම චෝදනාවලින් නිදොස් කොට නිදහස් කිරීමට හෝ යම් හෙයකින් චූදිත නිලධරයා දෙවන උපලේඛනය යටතට වැටෙන වරදකට වරදකරු වී ඇති බව අදාළ විනය බලධරයා නිගමනය කරන්නේ නම් එහිලා අදාළ විනය බලධරයාගේ අභිමතය පරිදි ඔහු වෙත සුළු දඬුවමක් නියම කිරීමට හෝ බැලූ බැල්මට පෙනී යන ආකාරයට පළමුවන උපලේඛනය යටතට වැටෙන වරදක් සිදුකර ඇති බවට අදාළ විනය බලධරයාගේ නිගමනය වන්නේ නම් එහිලා ඔහුට විරුද්ධව විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීමට හෝ විනය බලධරයා විසින් නිගමනය කරන වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට හෝ අදාළ විනය බලධරයාට බලය ඇත්තේ ය. ඒකාබද්ධ සේවාවන්ට අයත් නිලධරයකු සම්බන්ධයෙන් වන කල්හි අදාළ විනය බලධරයා වන්නේ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් ය.

6:7 චූදිත නිලධරයා තම නිදහසට කරුණු ඉදිරිපත් කිරීමේ දී චෝදනා පත්‍රයේ සඳහන් චෝදනාවලින් එකකට හෝ කීපයකට හෝ පමණක් වරදකරු බව පිළිගන්නා අවස්ථාවේ දී හෝ චූදිත නිලධරයා විසින් ඉදිරිපත් කර ඇති නිදහසට කරුණු මඟින් චෝදනාවලින් එකකට හෝ කීපයකට හෝ පමණක් නිවැරදිකරු වන බව පෙනී යන අවස්ථාවක දී හෝ සම්පූර්ණ චෝදනා පත්‍රය සම්බන්ධයෙන්ම විධිමත් විනය පරීක්ෂණයක් පවත්වන ලෙසට නියම කිරීමට අදාළ විනය බලධරයා විසින් කටයුතු කළයුතු වන්නේ ය. ඒකාබද්ධ සේවාවන්ට අයත් නිලධරයකු සම්බන්ධයෙන් වන කල්හි අදාළ විනය බලධරයා වන්නේ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් ය.

6:8 චූදිත නිලධරයා විසින් තමා වෙත විධිමත්ව නිකුත්කර ඇති චෝදනා පත්‍රයේ සියලුම චෝදනා සඳහා වැරදිකරු බව චෝදනා පත්‍රයට පිළිතුරු සපයන අවස්ථාවේ දී ප්‍රකාශිතව පිළිගෙන ඇත්නම් අදාළ විනය බලධරයා විසින් එක් එක් චෝදනාව සලකා බලා චූදිත නිලධරයා වෙත සුදුසු යැයි හැඟෙන දඬුවම් පැනවීමට හෝ චූදිත නිලධරයාගේ වරද පිළිගැනීම නොසලකා හැර විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීම මැනවැයි අදාළ විනය බලධරයා නිගමනය කරන්නේ නම් එවැනි විධිමත් විනය පරීක්ෂණයක් පවත්වන ලෙසට හෝ සුදුසු යැයි හැඟෙන වෙනත් ක්‍රියා මාර්ගයක් ගන්නා ලෙසට හෝ විධානයක් කිරීමට අදාළ විනය බලධරයාට බලය ඇත්තේ ය. ඒකාබද්ධ සේවාවකට අයත් නිලධරයකු සම්බන්ධයෙන් වන කල්හි අදාළ විනය බලධරයා වන්නේ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් ය.

6:9 චූදිත නිලධරයාට විරුද්ධව නිකුත් කර ඇති චෝදනා පත්‍රය සම්බන්ධයෙන් විනිශ්චය සභාව විසින් පැවැත් වූ විධිමත් විනය පරීක්ෂණයට අදාළ තම වාර්තාව, පරීක්ෂණ සටහන්, පැමිණිල්ලේ සාක්ෂි සම්පිණ්ඩනය, විත්තියේ සාක්ෂි සම්පිණ්ඩනය, පැමිණිල්ල හා විත්තිය විසින් ඉදිරිපත් කරන අනෙකුත් ලියවිලි ද සමඟ අදාළ විනය බලධරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. පරීක්ෂණය පැවැත්වීමේ දී නොවැළැක්විය හැකි ප්‍රමාදයන් ඇති වන්නේ නම්, ඒ පිළිබඳව අදාළ අවස්ථාවන්හි දී විනිශ්චය සභාව විසින් අදාළ විනය බලධරයා වෙත නොපමාව ලිඛිතව වාර්තා කළ යුතු ය.

6:10 චූදිත නිලධරයාට විරුද්ධව පවත්වනු ලබන විධිමත් විනය පරීක්ෂණය අනවශ්‍ය ලෙස ප්‍රමාද වන්නේ යයි අදාළ විනය බලධරයාට පෙනී යන්නේ නම්, විනය පරීක්ෂණයේ කුමන අවස්ථාවක දී වුව ද, එතෙක් පැවති පරීක්ෂණ කටයුතු මුළුමනින්ම අවලංගු කර නව පරීක්ෂණයක් පැවැත්වීමට හෝ අදාළ පාර්ශ්වය එකඟ වන්නේ නම් එතෙක් පැවති පරීක්ෂණ කටයුතු අවසන් කළ අවස්ථාවේ සිට අඛණ්ඩව ඉදිරියට පවත්වා ගෙන යාමට හෝ නව විනිශ්චය සභාවක් පත් කිරීමට අදාළ විනය බලධරයාට බලය ඇත්තේ ය.

6:11 විනිශ්චය සභාව විසින් විධිමත් විනය පරීක්ෂණයෙන් පසු තමා වෙත ඉදිරිපත් කළ සියලු වාර්තා හා ලියවිලි සුපරීක්ෂාකාරී ලෙස අධ්‍යයනය කර එම නිර්දේශයන් පිළිගෙන හෝ නොපිළිගෙන හෝ චූදිත නිලධරයාට විරුද්ධව නඟා ඇති චෝදනාවන්ට ඔහු වැරදිකරු හෝ නිවැරදිකරු හෝ වන්නේ ද යන්න නිගමනය කිරීමට ද ඔහු නිවැරදිකරු බව නිගමනය කරන්නේ නම්, චෝදනා පත්‍රයේ සඳහන් සියලුම චෝදනාවන්ගෙන් නිදොස් කොට නිදහස් කිරීමට ද, ඔහු වැරදිකරු යැයි නිගමනය කරන්නේ නම්, සේවයෙන් පහ කිරීම හෝ වෙනත් සුදුසු විනය නියෝගයක් පැනවීමට ද, නොඑසේ නම්, විනය බලධරයාට මැනවැයි හැඟෙන වෙනත් ක්‍රියා මාර්ගයක් ගැනීමට ද බලය ඇත්තේ ය. ඒකාබද්ධ සේවාවන්ට අයත් නිලධරයකු සම්බන්ධයෙන් වන කල්හි අදාළ විනය බලධරයා වන්නේ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් ය.

6:12 විනිශ්චය සභාව විසින් විනය පරීක්ෂණය අවසානයේ දී ඉදිරිපත් කර ඇති නිගමනයන්ට අදාළ විනය බලධරයා එකඟ නොවන අවස්ථාවන් හි දී අදාළ පරීක්ෂණ වාර්තාව ඇතුලු අනෙකුත් ලියවිලි අනුසාරයෙන් තමා විසින්ම ස්වාධීනව එළඹෙන නිගමනයන්ට අනුකූලව විනිශ්චය සභාවේ නිගමනයන්ට ප්‍රතිවිරුද්ධ විනය නියෝගයක් නිකුත් කිරීමේ බලය විනය බලධරයා සතු වන්නේ ය. එසේ කිරීමට හේතුකාරක වූ සියලු කරුණු විනය බලධරයා විසින් විනය නියෝගය

නිකුත් කිරීමට පෙර පැහැදිලිවත්, නිශ්චිතවත් අදාළ විනය ගොනුවේ සටහන්කර තැබිය යුතු වන්නේ ය.

## 7. ව්‍යවස්ථාපිත මණ්ඩලයකට හෝ රාජ්‍ය සංස්ථාවකට හෝ රජයට පවරා ගත් ආයතනයකට හෝ රාජ්‍ය සමාගමකට හෝ කොමිෂන් සභාවකට හෝ වෙනත් අර්ධ රජයේ ආයතනයකට හෝ රජයේ සේවයෙන් තාවකාලිකව මුදාහරිනු ලැබූ නිලධරයෝ

7:1 රජයේ සේවයෙන් තාවකාලිකව මුදාහරිනු ලැබූ නිලධරයකු විසින් ඔහු කලින් දැරූ තනතුරක සිටිය දී කරන ලද වරදක් සම්බන්ධයෙන් විනයානුකූලව ක්‍රියා කිරීමට නිලධරයාගේ නිත්‍ය තනතුරට හෝ සේවයට හෝ අදාළ විනය බලධරයා තීරණය කර ඇති කල්හි අදාළ නිලධරයා මුදාහැරීමට පෙර අවසන් වරට සේවය කළ තනතුරට හෝ සේවයට හෝ වහාම ක්‍රියාත්මක වන පරිදි ආපසු කැඳවීම විනය බලධරයාගේ හෝ පත්වීම් බලධරයාගේ හෝ පරිපාලන බලධරයාගේ හෝ වගකීම වන්නේ ය.

7:2 රජයේ සේවයෙන් තාවකාලිකව මුදාහරිනු ලැබූ නිලධරයකු විසින් එසේ මුදාහරිනු ලැබීමෙන් පසු කරන ලද වරදක් සම්බන්ධයෙන් අදාළ ආයතන ප්‍රධානයා විසින් මූලික විමර්ශනයක් කර ප්‍රමාණවත් කරුණු නිරීක්ෂණය වන්නේ නම් චෝදනා කෙටුම්පතක් සකස් කොට අදාළ අනෙකුත් ලියවිලි ද සහිතව එම ආයතනය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිරීක්ෂණ හා නිර්දේශ සහිතව අදාළ චූදිත නිලධරයාගේ නිත්‍ය තනතුර භාර විනය බලධරයා වෙත නොපමාව ඉදිරිපත් කළ යුතු ය. එසේ ක්‍රියා කිරීමෙන් පසු චූදිත නිලධරයාට විරුද්ධව විනයානුකූලව ක්‍රියා කළහැකි වනු පිණිස ඔහු මුදා හැරීමට පෙර අවසන් වරට සේවය කළ තනතුරට හෝ සේවයට හෝ වහාම ක්‍රියාත්මක වන පරිදි ආපසු කැඳවීම විනය බලධරයාගේ හෝ පත්වීම් බලධරයාගේ හෝ පරිපාලන බලධරයාගේ හෝ වගකීම වන්නේ ය.

7:3 තාවකාලිකව මුදාහරිනු ලැබ සිටින නිලධරයකු ඔහු තාවකාලිකව මුදාහැර සිටි කාලයේ දී කරනු ලැබ ඇතැයි සොයා ගනු ලැබූ යම් විෂමාචාරයක් ඔහු නැවත නිත්‍ය සේවයට කැඳවනු ලැබීමෙන් පසු හෝ වාර්තා කිරීමෙන් පසු හෝ අනාවරණය වී ඇත්නම් නිලධරයා මුදාහැරීම මත සේවයේ යෙදී සිටි ආයතනයේ ප්‍රධානයා විසින් මූලික විමර්ශනයක් පවත්වා ප්‍රමාණවත් කරුණු නිරීක්ෂණය වන්නේ නම් චෝදනා කෙටුම්පතක් සකස් කර අදාළ අනෙකුත් ලියවිලි ද සහිතව තම අමාත්‍යාංශයේ ලේකම්වරයා මඟින් නිලධරයාගේ වර්තමාන විනය බලධරයා වෙත ඉදිරිපත් කළ යුත්තේ ය. මෙසේ පවත්වනු ලබන මූලික විමර්ශනයේ කාර්යයන් සඳහා අවශ්‍ය ප්‍රකාශන ලබාදීම හෝ ලියවිලි ලබාදීම හෝ තමා දන්නා සහ දැන සිටිය යුතු කරුණු විමර්ශන නිලධරයා වෙත ඉදිරිපත් කිරීම මූලික විමර්ශනයට භාජනය වී ඇති නිලධරයාගේ වගකීම වන්නේ ය.

7:4 7:1 හෝ 7:2 හෝ 7:3 හෝ උප වගන්ති යටතේ තම නිත්‍ය තනතුරට හෝ සේවයට හෝ ආපසු කැඳවනු ලැබූ හෝ ආපසු වාර්තා කළ හෝ නිලධරයෙකුට විරුද්ධව නඟා ඇති චෝදනා ඔප්පු වුවහොත් සේවයෙන් පහකිරීමට තරම් බරපතල යයි බැලූ බැලුමට පෙනී යන්නේ නම් හෝ ඔහු තවදුරටත් රජයේ සේවයේ රඳවා ගැනීම ප්‍රඥාගෝචර නොවන්නේ යයි හෝ විනය බලධරයාට පෙනී යන්නේ නම් අදාළ නිලධරයාගේ රාජකාරී වැඩ තහනම් කළ යුතු ය.

7:5 උක්ත 7:1 හෝ 7:2 හෝ 7:3 හෝ උප වගන්ති ප්‍රකාරව නිත්‍ය සේවයට කැඳවූ නිලධරයා වෙත ඔහුගේ නිත්‍ය තනතුරට අදාළ විනය බලධරයා විසින් විධිමත් චෝදනා පත්‍රයක් නිකුත් කර මෙම සංග්‍රහයේ නියමිත විධිවිධානවලට අනුකූලව විනිශ්චය සභාවක් පත් කොට විනයානුකූලව කටයුතු කළ යුතු ය. විනිශ්චය සභාව විසින් පරීක්ෂණ වාර්තාව සහ අදාළ පරීක්ෂණ සටහන් ඇතුලු අනෙකුත් ලියවිලි විනය බලධරයා වෙත ඉදිරිපත් කළ විට, අවස්ථාවෝචිත පරිදි අදාළ නිලධරයා මුදාහරිනු ලැබ තිබූ ආයතනය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිරීක්ෂණ හා

නිර්දේශයන් ද ලබාගෙන චූදිත නිලධරයා වෙත සුදුසු විනය නියෝගයක් පැනවීමට අදාළ විනය බලධරයා ක්‍රියා කළ යුතු වන්නේ ය.

## 8. ව්‍යවස්ථාපිත මණ්ඩලයකට හෝ රාජ්‍ය සංස්ථාවකට හෝ රජයට පවරාගත් ආයතනයකට හෝ රාජ්‍ය සමාගමකට හෝ කොමිෂන් සභාවකට හෝ වෙනත් අර්ධ රජයේ ආයතනයකට හෝ රජයේ සේවයෙන් ස්ථිර ලෙසට මුදාහරිනු ලැබූ නිලධරයෝ

8:1 රජයේ ස්ථිර හා විශ්‍රාම වැටුප් හිමි වූ තනතුරක් දැරූ නිලධරයෙක් රජයේ සේවයෙන් ස්ථිර ලෙස මුදාහරිනු ලැබ ඇති අවස්ථාවක ඔහු විසින් කලින් දැරූ තනතුරක සිටිය දී කරන ලද වරදක් සම්බන්ධයෙන් විනයානුකූලව ක්‍රියා කිරීමට තරම් ප්‍රමාණවත් තොරතුරු ඇති බව නිලධරයා ස්ථිර ලෙස මුදා හැරීමට පෙර සේවය කළ නිත්‍ය තනතුරට හෝ සේවයට හෝ අදාළ විනය බලධරයා තීරණය කර ඇති කල්හි, නිලධරයා වර්තමානයේ සේවය කරන ආයතනයේ ප්‍රධානයා වෙත ඒ බව එම ආයතනය භාර අමාත්‍යාංශයේ ලේකම් මඟින් දැනුම් දිය යුතු ය.

8:2 අදාළ නිලධරයාට විරුද්ධව විනයානුකූලව ක්‍රියා කිරීමට හැකි වනු පිණිස නිලධරයා වරදක් සිදු කර ඇති බවට අනාවරණය වූ දෙපාර්තමේන්තුවේ ප්‍රධානයා විසින් චෝදනා පත්‍ර කෙටුම්පතක් සකස් කොට අදාළ අනෙකුත් ලියවිලි ද සමඟම නිලධරයා ස්ථිර ලෙස මුදාහැරීමට පෙර සේවය කළ නිත්‍ය තනතුරට හෝ සේවයට හෝ අදාළ විනය බලධරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

8:3 විනය බලධරයා විසින් 8:2 උප වගන්තිය ප්‍රකාරව තමා වෙත ඉදිරිපත් කරන ලද චෝදනා පත්‍රය අදාළ නිලධරයා වෙත නිකුත් කොට මෙම සංග්‍රහයේ විධිවිධානයන්ට අනුකූලව, නිලධරයාට විරුද්ධව විනයානුකූලව කටයුතු කිරීමට පියවර ගත යුතු ය. එසේ නිකුත් කරන ලද චෝදනා පත්‍රයේ පිටපත් චූදිත නිලධරයා දැනට සේවයේ යෙදී සිටින ආයතනය අයත් වන අමාත්‍යාංශයේ ලේකම්වරයාට ද එම ආයතනයේ ප්‍රධානයාට ද යැවිය යුතු වන්නේ ය.

8:4 විනිශ්චය සභාව විසින් පරීක්ෂණ, වාර්තාව පරීක්ෂණ සටහන් ඇතුලු අනෙකුත් ලියවිලි විනය බලධරයා වෙත ඉදිරිපත් කළ පසු ඔහුට නඟා ඇති චෝදනාවන් එකක් හෝ කීපයක් හෝ සියල්ලම හෝ සනාථ වන්නේ නම් කරන ලද වරදේ ස්වභාවය සැලකිල්ලට ගෙන චූදිත නිලධරයාට හිමි විශ්‍රාම වැටුප් සම්පූර්ණ වශයෙන් අහිමි කරන ලෙස හෝ විශ්‍රාම වැටුපෙන් යම් ප්‍රතිශතයක් අඩු කරන ලෙස හෝ නිර්දේශ කර රාජ්‍ය පරිපාලන විෂයභාර ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

8:5 උක්ත 8:4 උපවගන්තිය පරිදි අදාළ විනය බලධරයකු වෙතින් නිර්දේශයක් ලැබුණු කල්හි සියලුම කරුණු සුපරීක්ෂාකාරී ලෙස අධ්‍යයනය කර චූදිත නිලධරයාගේ විශ්‍රාම වැටුප හා/හෝ පාරිතෝෂිකය හා/හෝ සම්පූර්ණ වශයෙන් අහිමි කිරීමට හෝ විශ්‍රාම වැටුපෙන් හා/හෝ පාර්තෝෂිකයෙන් හා/හෝ යම් ප්‍රතිශතයක් අඩු කරන ලෙස හෝ නියම කිරීමට රාජ්‍ය පරිපාලන විෂයභාර ලේකම්වරයාට බලය ඇත්තේ ය.

8:6 රාජ්‍ය පරිපාලන විෂයභාර ලේකම්වරයා විසින් ගනු ලබන තීරණය ඔහු විසින් චූදිත නිලධරයා වෙත සෘජුවම දන්වා යැවිය යුතු අතර, එහි පිටපත් විනය බලධරයාට ද, ඔහු අවසන් වරට සේවය කළ දෙපාර්තමේන්තු ප්‍රධානයාට ද, නිලධරයාගේ වර්තමාන ආයතන ප්‍රධානයාට ද විධිමත් ලෙස දන්වා යැවිය යුතු ය.

8:7 රාජ්‍ය පරිපාලන විෂයභාර ලේකම්වරයාගේ නියෝගය අනුව කටයුතු කරන බවට නිලධරයා අවසන් වරට සේවය කළ දෙපාර්තමේන්තුවේ ප්‍රධානයා විසින් විනය බලධරයාට ද පිටපතක් සහිතව රාජ්‍ය පරිපාලන විෂයභාර ලේකම්වරයා වෙත සනාථ කළ යුතු ය.

8:8 මෙවැනි විනය නියෝගයක් මඟ හැරීමකින් තොරව ක්‍රියාත්මක කිරීමට සහතික කරනු පිණිස එවැනි නියෝගයන් පිළිබඳ විස්තර ඒ සඳහා විශේෂයෙන් පිළියෙල කළ ලේඛනයක ඇතුළත් කොට තැබීම හා ඒවා ක්‍රියාත්මක කිරීම විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ කාර්ය භාරය වන්නේ ය.

## 9. එක් අමාත්‍යාංශයක හෝ දෙපාර්තමේන්තුවක හෝ සිට වෙනත් අමාත්‍යාංශයකට හෝ දෙපාර්තමේන්තුවකට හෝ ස්ථානමාරු කරනු ලැබූ හෝ වෙනත් තනතුරකට පත් කරනු ලැබූ හෝ නිලධරයෝ

9:1 එක් අමාත්‍යාංශයක හෝ දෙපාර්තමේන්තුවක හෝ සිට වෙනත් අමාත්‍යාංශයකට හෝ දෙපාර්තමේන්තුවකට හෝ ස්ථානමාරු කරනු ලැබූ හෝ වෙනත් තනතුරකට පත් කරනු ලැබූ හෝ නිලධරයකු විසින් එසේ ස්ථානමාරු කිරීමට හෝ වෙනත් තනතුරකට පත් කිරීමට පෙර අවස්ථාවක දී ඔහු විසින් කරන ලද වරදක් සම්බන්ධයෙන් විනයානුකූලව ක්‍රියා කිරීමට ඔහුගේ පූර්ව ආයතන ප්‍රධානියා තීරණය කර ඇති කල්හි එම පූර්ව ආයතන ප්‍රධානියා විසින් එම නිලධරයාට විරුද්ධව මූලික විමර්ශනයක් පවත්වා බැලූ බැල්මට ප්‍රමාණවත් චෝදනා නිරීක්ෂණය වන්නේ නම් චෝදනා පත්‍ර කෙටුම්පත් සකස් කොට මූලික විමර්ශන වාර්තාව ඇතුලුව සියලු ලියවිලි ද සමඟ නිලධරයාගේ වර්තමාන ආයතන ප්‍රධානියා මඟින් නියමිත විනය බලධරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. වර්තමාන ආයතන ප්‍රධානියා වෙත එම ලියවිලි ලැබුණු කල්හි ඒ සියලු ලියවිලි විනය බලධරයා වෙත අප්‍රමාදව යොමු කිරීමට ඔහු විසින් පියවර ගත යුතු ය.

9:2 උක්ත 9:1 උප වගන්තියේ සඳහන් පරිදි නියමිත විනය බලධරයකු වෙත චෝදනා කෙටුම්පත හා අනෙකුත් අදාළ ලිපිලේඛන ලැබුණු කල්හි අවශ්‍ය සංශෝධන වේනම් ඒවා සිදු කිරීමෙන් පසු චෝදනා පත්‍රය විධිමත් ලෙස නිලධරයා වෙත නිකුත් කර, විනිශ්චය සභාවක් පත් කොට, මෙම සංග්‍රහයේ නියමිත විධිවිධානයන්ට අනුකූලව නිලධරයාට විරුද්ධව විනයානුකූලව ක්‍රියාකිරීම අදාළ විනය බලධරයාගේ වගකීම වන්නේ ය.

9:3 එසේ පවත්වනු ලබන විධිමත් විනය පරීක්ෂණයක දී පැමිණිලි මෙහෙයවීමේ නිලධරයකු පත්කිරීමේ වගකීම රදා පවතින්නේ නිලධරයා වරද සිදුකළ අවස්ථාවේ සේවයේ යෙදී සිටි ආයතනයේ ප්‍රධානයා වෙත වන්නේ ය.

## 10. විනය පරීක්ෂණය අතරතුර දී නිලධරයකු සම්බන්ධයෙන් වන විනය බලධරයා වෙනත් විනය බලධරයකු බවට පත්වී ඇති කල්හි එවැනි නිලධරයෙකුට විරුද්ධව විනයානුකූලව කටයුතු කිරීම.

10:1 යම්කිසි නිලධරයෙකුට විරුද්ධව විධිමත් චෝදනා පත්‍රයක් නිකුත් කර ඇති විටක දී විනය නියෝගයක් නිකුත් කිරීමට පෙර කුමන අවස්ථාවක දී හෝ ඔහු සම්බන්ධයෙන් වන විනය බලධාරීත්වය වෙනස් වීමකට භාජනය වූවහොත් එම විනය බලධාරීත්වය වෙනස්වීම පවත්වා ගෙන යනු ලබන විනය ක්‍රියා පටිපාටියට කුමන ආකාරයකින් හෝ බාධාවක් නොවිය යුත්තේ ය. අදාළ නිලධරයා සම්බන්ධයෙන් වන නව විනය බලධාරීත්වය නොසලකා හැර මෙම සංග්‍රහයේ විධිවිධානයන්ට අනුකූලව ඔහුගේ පූර්ව විනය බලධරයා විසින් ඉදිරි විනය ක්‍රියා පටිපාටිය අඛණ්ඩව පවත්වා ගෙන යා යුත්තේ ය.

10.2 විධිමත් විනය පරීක්ෂණය අවසන් වීමෙන් පසු විනිශ්චය සභාවේ නිගමනයන් ද එම නිගමනය පිළිබඳව සහ නිකුත් කළ යුතු විනය නියෝගය පිළිබඳව තම නිර්දේශය ද සහිතව විනය පරීක්ෂණයට අදාළ සියලුම ලිපිලේඛන නිලධරයා සම්බන්ධයෙන් වන පූර්ව විනය බලධරයා විසින් ඔහුගේ වර්තමාන විනය බලධරයා වෙත අප්‍රමාදව ඉදිරිපත් කළ යුතු වන්නේ ය.

10:3 උක්ත 10:2 උප වගන්තියේ සඳහන් ලියවිලි, නිලධරයා සම්බන්ධයෙන් වන පූර්ව විනය බලධරයාගේ නිරීක්ෂණ හා නිර්දේශ ද සහිතව තමන් වෙත ලැබුණු පසු ඒවා සුපරීක්ෂාකාරී ලෙස අධ්‍යයනය කිරීමෙන් පසු සුදුසු විනය නියෝගයක් නිකුත් කිරීම නිලධරයා සම්බන්ධයෙන් වන වර්තමාන විනය බලධරයාගේ වගකීම වන්නේ ය.

10:4 විනිශ්චය සභාව විසින් විධිමත් විනය පරීක්ෂණය අවසානයේ දී ඉදිරිපත් කර ඇති නිගමනයන්ට හෝ පූර්ව විනය බලධරයාගේ නිර්දේශයන්ට අදාළ විනය බලධරයා එකඟ නොවන අවස්ථාවන් හි දී අදාළ පරීක්ෂණ වාර්තාව ඇතුලු අනෙකුත් ලියවිලි අනුසාරයෙන් තමා විසින්ම ස්වාධීනව එළඹෙන නිගමනයන්ට අනුකූලව විනිශ්චය සභාවේ නිගමනයන්ට ප්‍රතිවිරුද්ධ විනය නියෝගයන් නිකුත් කිරීමේ බලය වර්තමාන විනය බලධරයා සතු වන්නේ ය. එවැනි ප්‍රතිවිරුද්ධ විනය නියෝගයක් නිකුත් කරන අවස්ථාවක දී එසේ කිරීමට හේතුකාරක වූ සියලු කරුණු විනය බලධරයා විසින් විනය නියෝගය නිකුත් කිරීමට පෙර පැහැදිලිවත් නිශ්චිතවත් අදාළ විනය ගොනුවේ සටහන් කර තැබිය යුතු වන්නේ ය.

## 11. එකම සිද්ධියකට හෝ සිදුවීම් මාලාවකට හෝ අදාළව චෝදනා ලබන නිලධරයෝ

11:1 එකම සිද්ධියකට හෝ සිදුවීම් මාලාවකට හෝ අදාළව කරනු ලැබූ වරදක් වෙනුවෙන් එකම විනය බලධරයෙකුගේ විනය බලධාරීත්වය යටතට වැටෙන නිලධරයන් එක් අයකුට වැඩි සංඛ්‍යාවකට විරුද්ධව විනයානුකූලව ක්‍රියා කිරීම සඳහා එම විනය බලධරයා විසින් චෝදනා පත්‍ර නිකුත් කර ඇති කල්හි අදාළ සියලුම චූදිත නිලධරයන් වෙනුවෙන් එකම විනිශ්චය සභාවක් පත්කොට මෙම සංග්‍රහයේ විධිවිධානයන්ට අනුකූලව විනයානුකූලව ක්‍රියා කළ යුතු වන්නේ ය.

11:2 උක්ත 11:1 උප වගන්තියේ සඳහන් පරිදි එසේ පත් කරනු ලබන විනිශ්චය සභාව විසින් අවස්ථාවෝචිත පරිදි නිකුත් කොට ඇති විවිධ චෝදනා පත්‍රවල සඳහන් සියලුම චෝදනාවල සමාන අසමානකම් සැලකිල්ලට ගෙන සියලුම චූදිතයන් වෙනුවෙන් එක් විධිමත් විනය පරීක්ෂණයක් පවත්වන ලෙස හෝ චූදිත නිලධරයන් සියලු දෙනා සම්බන්ධයෙන් වෙන වෙනම විනය පරීක්ෂණයක් පවත්වන ලෙස හෝ චූදිත නිලධරයන් කණ්ඩායම් වශයෙන් බෙදා වෙන වෙනම විනය පරීක්ෂණ පවත්වන ලෙස හෝ නියෝග කිරීමට විනය බලධරයාට බලය ඇත්තේ ය. සියලුම චූදිත නිලධරයන් වෙනුවෙන් එක් විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වූ අවස්ථාවක දී හෝ චූදිත නිලධරයන් කණ්ඩායම් වශයෙන් බෙදා විධිමත් විනය පරීක්ෂණ කීපයක් පැවැත් වූ අවස්ථාවක දී හෝ එක් එක් චූදිත නිලධරයා වෙනුවෙන් වෙන වෙනම පරීක්ෂණ වාර්තා සකස් කොට අදාළ විනය බලධරයා වෙත ඉදිරිපත් කිරීම විනිශ්චය සභාවේ වගකීම වන්නේ ය.

11:3 එකම සිද්ධියකට හෝ සිද්ධි මාලාවකට හෝ අදාළව කරනු ලැබූ වරදක් වෙනුවෙන් චෝදනා ලබා ඇති නිලධරයන් සම්බන්ධයෙන් විනය බලධාරීත්වය එකම විනය බලධරයෙකු වෙත පැවරී නොමැති අවස්ථාවන්හි දී සිද්ධියට හෝ සිද්ධිවලට හෝ අදාළ වරද සිදුවූ ආයතනයේ ප්‍රධානියා විසින් එක් එක් නිලධරයා සඳහා වෙන වෙනම චෝදනා කෙටුම්පත් සකස් කොට අදාළ විනය බලධරයන් වෙත ඒවා ඉදිරිපත් කළ යුත්තේ ය. එසේ ඉදිරිපත් කරනු ලබන චෝදනා කෙටුම්පත සම්බන්ධයෙන් අදාළ සිද්ධිය පිළිබඳව චෝදනා ලබා ඇති අනෙකුත් සියලුම

නිලධරයන් පිළිබඳ විස්තර ද, සිද්ධිය පිළිබඳ පසුබිම් වාර්තාවක් ද, අදාළ සෑම විනය බලධරයෙකුගේම දැන ගැනීම සඳහා අදාළ ආයතන ප්‍රධානියා විසින් ඉදිරිපත් කළ යුත්තේ ය.

11:4 අදාළ විනය බලධරයන් විසින් චූදිත නිලධරයන්ට විරුද්ධව විනය ක්‍රියා පටිපාටිය ආරම්භ කිරීමට තීරණය කරනු ලැබ ඇති කල්හි සිද්ධියට සම්බන්ධ සියලු චූදිත නිලධරයන් සඳහා එකම විනය පරීක්ෂණයක් පැවැත්වීම ප්‍රඥාගෝචර වන්නේ නම් චෝදනා ලබා ඇති ඉහළම චූදිත නිලධරයාට විරුද්ධව විනය පරීක්ෂණ පැවැත්වීම සඳහා ඔහුගේ විනය බලධරයා විසින් පත් කරනු ලැබ සිටින විනිශ්චය සභාවම අනෙකුත් චූදිත නිලධරයන්ගේ විනිශ්චය සභාව ලෙස පත් කිරීමට අනෙකුත් විනය බලධරයන් විසින් ක්‍රියා කිරීම වඩාත් උචිත වන්නේ ය.

## 12. රාජ්‍ය සේවා කොමිෂන් සභාව

12:1 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 58 (2) වැනි ව්‍යවස්ථාවේ සඳහන් වන බලතල රාජ්‍ය සේවා කොමිෂන් සභාවට හෝ එහි කමිටුවකට හෝ ඇත්තේ ය. ඒ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් හෝ එහි කමිටුවක් විසින් හෝ රජයේ යම් නිලධරයකු වෙත ස්වකීය බලතල පවරනු ලැබුවේ ද, එම රජයේ නිලධරයා විසින් කරන ලද යම් මාරු කිරීමේ නියෝගයකින් හෝ සේවයෙන් පහ කිරීමේ නියෝගයකින් හෝ විනය කටයුත්තක් සම්බන්ධව කරන ලද වෙනත් යම් නියෝගයකින් හෝ අතෘප්ත වූ කවර හෝ රජයේ නිලධරයෙකුට රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත හෝ එහි කමිටුවක් වෙත හෝ අභියාචනය කිරීමට අයිතියක් ඇත්තේ ය.

12:2 කොමිෂන් සභාව වෙත හෝ එහි කමිටුවක් වෙත හෝ යොමු කරනු ලබන යම්කිසි කරුණක් සම්බන්ධයෙන් නිරීක්ෂණ හෝ නිර්දේශ හෝ ඇතුළත් සෑම ලිපියකටම අමාත්‍යාංශයක නම් එහි ලේකම්වරයා විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද අතිරේක ලේකම්වරයකු විසින් හෝ අත්සන් කළ යුතු ය. දෙපාර්තමේන්තුවකින් නම් දෙපාර්තමේන්තු ප්‍රධානයා විසින්ම අත්සන් කළ යුතු ය. මුදල් විෂය භාර අමාත්‍යාංශය සම්බන්ධයෙන් වන විට භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයාට ද, ලේකම්වරයා වෙනුවෙන් එවැනි ලියවිලි අත්සන් කිරීමට බලය දීමට ලේකම්වරයාට පුළුවන.

12:3 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හෝ එහි කමිටුවක හෝ රැස්වීමකට සහභාගී වන ලෙස අමාත්‍යාංශ ලේකම්වරයකුට හෝ දෙපාර්තමේන්තු ප්‍රධානයකුට හෝ ආරාධනා ලැබුණු කල්හි හැකි සෑම අවස්ථාවක දී ම ඔහු ඊට පෞද්ගලිකවම සහභාගී විය යුතු ය. නොවැළැක්විය හැකි හේතුවක් මත අමාත්‍යාංශ ලේකම්වරයාහට එම රැස්වීමට සහභාගී වීමට නොහැකි වන අවස්ථාවක දී අමාත්‍යාංශ ලේකම්වරයාගේ ලිඛිත බලය මත එම අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයකුට ඒ සඳහා සහභාගීවීමට හැකි වන්නේ ය. මුදල් විෂය භාර අමාත්‍යාංශය සම්බන්ධයෙන් වන විට එහි ලේකම්වරයාට නොවැළැක්විය හැකි අවස්ථාවක දී තමා වෙනුවෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කැඳවනු ලැබූ රැස්වීමකට සහභාගී වීමේ බලය භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්වරයා වෙත ද පැවැරිය හැකි වන්නේ ය.

12:4 කවර කරුණක් පිළිබඳ වුව ද කරුණු පැහැදිලි කරවා ගැනීම පිණිස විනිශ්චය සභාවට හෝ චූදිත නිලධරයාට හෝ චූදිත නිලධරයාගේ රැකවරණ නිලධරයාට හෝ වෙනත් අදාළ ඕනෑම පුද්ගලයෙකුට හෝ කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටින ලෙස නියම කිරීමට කොමිෂන් සභාව වෙත බලය ඇත්තේ ය.

12:5 චූදිත නිලධරයකු විසින් ඉදිරිපත් කර ඇති ලිපිලේඛනවල සහතික කළ පිටපත්වල සත්‍යාසත්‍ය භාවය පිරික්සිය යුතු යැයි රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් හෝ එහි කමිටුවක් විසින් හෝ අදහස් කර ඇති විටක දී, එම පිටපත් ඒවායේ මුල් පිටපත් සමඟ සසඳා බලා වාර්තා කරන ලෙස ඕනෑම නිලධරයකු වෙත නියම කිරීමට බලය ඇත්තේ ය. එවැනි නියෝගයක් ලත්

නිලධරයකු එම නියෝගය කඩිනමින් ඉටු කළයුතු වන්නේ ය. එවැනි නියෝගයක් ලැබූ නිලධරයකු තමා විසින් අදාළ ලිපිලේඛනවල පිටපත් සහතික කරන ලද්දේ නම් ඒ බව කොමිෂන් සභාව වෙත තහවුරු කළ පසු එසේ ඉදිරිපත් කොට ඇති වාර්තාව හෝ ලියවිලි හෝ පරීක්ෂණ වාර්තාවේ කොටසක් බවට පත් වන්නේ ය.

## 13. මූලික විමර්ශනය

13:1 කිසියම් රජයේ නිලධරයෙක් හෝ නිලධරයන් කීප දෙනෙකු හෝ විසින් විෂමාචාරයක් සිදු කර තිබේ ද යන්න පිළිබඳව සැකයක් ඇති වූ විට හෝ තොරතුරු ලද වහාම හෝ ඒ පිළිබඳව නියම තතු හෙළිදරව් කර ගැනීමට අවශ්‍ය මූලික සාධක සොයා ගැනීමත්, සැකයට පාත්‍රව සිටින නිලධරයාට හෝ නිලධරයන්ට හෝ විරුද්ධව චෝදනා ඉදිරිපත් කර විනයානුකූලව ක්‍රියා කිරීමට තරම් බැලූ බැල්මට පෙනී යන ආකාරයේ ප්‍රමාණවත් කරුණු හා සාක්ෂි සොයාගත හැකි ද යන්න සොයා ගැනීම සඳහාත් විනය බලධරයකු හෝ ආයතන ප්‍රධානියකු හෝ වෙනත් නිසි බලධරයකු හෝ විසින් ද නොඑසේ නම් එකී බලධරයන්ගේ නියෝග මත ඒ සඳහා පත් කරනු ලැබූ නිලධරයකු විසින් හෝ නිලධර කමිටුවක් විසින් ද ඒ පිළිබඳව සොයා බලා වාර්තා කිරීම මූලික විමර්ශනයක් නම් වේ. අදාළ පුද්ගලයන්ගේ ප්‍රකාශ සටහන් කර ගැනීම, ලේඛන හා වාර්තා පරීක්ෂා කිරීම හා ඒවායේ මුල් හෝ සත්‍ය හෝ සහතික කළ හෝ පිටපත් ලබාගැනීම, අවශ්‍ය වේ නම් විමර්ශනයට භාජනය වන නිලධරයා හෝ නිලධරයන් හෝ භාරයේ ඇති රජය සතු වත්කම්වල නිරවද්‍යතාවය භෞතිකව සත්‍යාපනය කිරීම, අදාළ පරිශ්‍රයන් පරීක්ෂණයට භාජනය කිරීම හෝ අවශ්‍ය යැයි සැලකිය හැකි සියලුම ලියවිලි හා භාණ්ඩ තම භාරයට ගැනීම, කර ඇති විෂමචාර පිළිබඳව තමන් විසින් සොයා ගත් කරුණු පිළිබඳව අප්‍රමාදව තම නිරීක්ෂණ හා නිර්දේශ ඉදිරිපත් කිරීම, මූලික විමර්ශන නිලධරයකු හෝ නිලධර කමිටුවක් හෝ විසින් ඉටු කළ යුතු මූලික කාර්යයන් වන්නේ ය.

13:2 කිසියම් විෂමාචාරයක් සම්බන්ධ සිදුවීමක් පිළිබඳව මූලික විමර්ශනයක් පැවැත්වීම සඳහා නියෝග කරන බලධරයකු විසින් ඒ ඒ සිදුවීමේ ස්වභාවය සැලකිල්ලට ගෙන අවස්ථාවෝචිතව මූලික විමර්ශනය කොතරම් කාලයක් ඇතුළත නිම කළයුතු ද යන්න නියෝගය නිකුත් කරන අවස්ථාවේ දීම මූලික විමර්ශනය සඳහා පත් කරනු ලබන නිලධරයා හෝ නිලධර කමිටුව හෝ වෙත අනිවාර්යයෙන්ම නියම කළ යුතු වන්නේ ය. කෙසේ වෙතත් එසේ නිශ්චිතව නියම කරනු ලැබූ කාලසීමාව ඇතුළත එම මූලික විමර්ශනය නිම කිරීමට පිළිගත හැකි ආකාරයේ බාධාවක් ඇතිවන බව මූලික විමර්ශන නිලධරයා විසින් හේතුසාධක සහිතව තහවුරු කරන කල්හි අදාළ බලධරයා විසින් අවස්ථාවෝචිතව සුදුසු පමණට කාලය දීර්ඝ කළහැකි වන්නේ ය. එතෙකුදු වුවත් සෑම මූලික විමර්ශනයක්ම නොපමාව නිම කිරීමට අදාළ සෑම පාර්ශවයක්ම නිරන්තරයෙන්ම වග බලා ගතයුතු වන්නේ ය. රා.ප.ච 30/2019 මගින් 13:2 උප වගන්තිය සංශෝධනය කර ඇත.

13:3 මූලික විමර්ශනයක් සඳහා අදාළ බලධරයකු විසින් පත්කරනු ලැබූ නිලධරයකුට එම කාර්යය අවශ්‍ය වන පරිදි හා පූර්ණකාලීනව අඛණ්ඩව කරගෙන යාමට හැකිවන සේ අදාළ ආයතන ප්‍රධානයා ඔහු නිත්‍ය රාජකාරීවලින් නිදහස් කළයුතු වන්නේ ය.

13:4 එකම සිද්ධියක් හෝ සිදුවීම් මාලාවක් හෝ සම්බන්ධයෙන් ස්වාධීන මූලික විමර්ශනය පැවැත්වීම සඳහා නිලධරයන් කීප දෙනෙකු හෝ කණ්ඩායම් කීපයක් හෝ අවස්ථාවෝචිත පරිදි යෙදවීමට අදාළ බලධරයාට බලය ඇත්තේ ය.

13:5 මූලික විමර්ශනයක දී සම්බන්ධිත පාර්ශව වෙතින් ප්‍රකාශ සටහන් කර ගන්නා විටක සැකයට පාත්‍ර වූ නිලධරයා හෝ නිලධරයන් හෝ ඔහු හෝ ඔවුන් හෝ වෙනුවෙන් කිසිදු නියෝජිතයෙකුට හෝ රැඳී සිටීමට අවසර නොදිය යුතු වන්නේ ය.

13:6 එල්ලවී ඇති චෝදනා, භාණ්ඩ ඌනතාවයක් හෝ භාණ්ඩ අයථා පරිහරණයක් හෝ සම්බන්ධයෙන් වන කල්හි, අදාළ නිලධරයා භාරයේ ඇති ඊට අදාළ සියලුම භාණ්ඩ තොග ගණන් ගැනීමකට භාජනය කළයුතු වන්නේ ය.

13:7 සැකයට පාත්‍ර වූ නිලධරයා හෝ නිලධරයන් හෝ භාරයේ ඇති රජයේ ලිපිලේඛන හා බඩු බාහිරාදිය ප්‍රමාණයන්ගේ නිරවද්‍යතාවය ගණනය කිරීමේ දී එහි රැඳී සිටීමට සැකයට භාජනය වූ නිලධරයාට හෝ නිලධරයනට හෝ අයිතියක් ඇත්තේ ය. මෙහිදී අදාළ පරීක්ෂා කිරීම සිදු කරනු ලැබුවේ තමා ඉදිරිපිට දී බවත්, එහි ප්‍රතිඵල පිළිබඳව තමා සෑහීමකට පත් වූයේ ද නැද්ද යන්න පිළිබඳව ප්‍රකාශයක් තොග ගණන් ගැනීම අවසානයේ දී මූලික විමර්ශන නිලධරයා වෙත ලබාදිය යුතු ය. තවද විධිමත් පරීක්ෂණය සඳහා ඉදිරිපත් කළයුතු බව පෙනී යන ද්‍රව්‍ය වෙන් කොට ගෙන ඒවාට මුද්‍රා තබනු ලබන අවස්ථාවන්හි දී එහි සිටීමටත්, එම ක්‍රියාවලිය නිරීක්ෂණය කිරීමටත්, සැකයට පාත්‍ර වූ නිලධරයාට හෝ නිලධරයන්ට හෝ අයිතියක් ඇත්තේ ය.

13:8 මූලික විමර්ශනයක් පැවැත්වීමේ දී කිසියම් නිලධරයකු හෝ නිලධරයන් හෝ විසින් තමන් භාරයේ ඇති රජයේ බඩු බාහිරාදිය, ලිපිලේඛන හා මුදල් පරීක්ෂාවට ලක්කිරීමට ඉඩදීම උවමනාවෙන්ම මගහරින අවස්ථාවන්හි දී හෝ වෙනත් හේතුවක් නිසා තම භාරයේ ඇති එකී දේපළ පරීක්ෂාවට භාජනය කිරීමට, ඉදිරිපත් කිරීමට ඔහු අපොහොසත් වන අවස්ථාවන්හි දී හෝ එකී ලිපිලේඛන, භාණ්ඩ හා මුදල් පරීක්ෂාවට ලක්කිරීමට හෝ ලේඛනගත කිරීමට හෝ පිටපත් තබා ගැනීමට හෝ අදාළ බලධරයා විසින් සුදුසු නිලධරයන් තිදෙනෙකුගෙන් සමන්විත මණ්ඩලයක් පත්කළ යුතු වන්නේ ය. එකී මණ්ඩලයට අවශ්‍ය අවස්ථාවන්හි දී අදාළ ගබඩා කාමර, අල්මාරි, සේප්පු, ලාච්චු හෝ වෙනත් අගුලුලා ඇති ස්ථානවල අගුලු කඩා ඉවත් කිරීමට ද බලය ඇත්තේ ය.

13:9 මූලික විමර්ශන නිලධරයා සෑම විටකම සැකයට පාත්‍ර වූ නිලධරයාට වඩා ජ්‍යෙෂ්ඨ නිලධරයකු වීම අත්‍යාවශ්‍ය නොවේ. එහෙත් හැකි සෑම අවස්ථාවකදීම සැකයට පාත්‍ර වූ නිලධරයාට වඩා ජ්‍යෙෂ්ඨ නිලධරයකු පත් කිරීම වඩාත් උචිත වන්නේ ය.

13:10 විධිමත් ලෙස පත් කරනු ලැබූ මූලික විමර්ශන නිලධරයකු එම විමර්ශනයට අදාළව කිසියම් නිලධරයකු වෙතින් ප්‍රකාශයක් ලබාගැනීමට අවශ්‍ය වූ විටක එම ප්‍රකාශය ලබාදීම ප්‍රතික්ෂේප කිරීම බරපතල විෂමාචාරයක් වන්නේ ය. එවැනි අවස්ථාවන් මූලික විමර්ශන නිලධරයකු විසින් වාර්තා කරනු ලැබූ විට අදාළ නිලධරයාට විරුද්ධව විනයානුකූලව ක්‍රියාකිරීම පිණිස අදාළ විනය බලධරයා වෙත වාර්තා කිරීම අදාළ ආයතන ප්‍රධානයාගේ වගකීම වන්නේ ය.

13:11 මූලික විමර්ශනය අතරතුර දී සැකයට භාජනය වන නිලධරයා හෝ නිලධරයන් හෝ තමන් විසින් අදාළ විෂමාචාරය සිදුකළ බව පිළිගනු ලැබුව ද, මූලික විමර්ශනය සම්පූර්ණයෙන්ම පවත්වා තම නිරීක්ෂණ හා නිර්දේශ සහිත වාර්තාව අදාළ බලධරයා වෙත ඉදිරිපත් කිරීම මූලික විමර්ශන නිලධරයා සතු වගකීම වන්නේ ය.

13:12 මූලික විමර්ශන නිලධරයා විසින් විමර්ශනය පවත්වා අවසන් කළ පසු, අදාළ පාර්ශවයන් වෙතින් ලබාගත් ප්‍රකාශ, තම භාරයට ලබාගත් ලිපිලේඛන ආදිය තම නිරීක්ෂණ හා නිර්දේශයන් සහිත මූලික විමර්ශන වාර්තාව සමඟ අදාළ බලධරයා වෙත ඉදිරිපත් කිරීමට පියවර ගත යුත්තේය. සැකයට පාත්‍ර වූ නිලධරයාට හෝ නිලධරයනට හෝ එරෙහිව විනයානුකූලව ක්‍රියා කිරීමට තරම් ප්‍රමාණවත් චෝදනාවන් බැලූ බැල්මට හෙළිදරව් වන්නේ නම් මෙම සංග්‍රහයේ 5 වන පරිශිෂ්ටය ප්‍රකාරව චෝදනා පත්‍ර කෙටුම්පතක් සකස් කර අදාළ බලධරයා වෙත ඉදිරිපත් කිරීම ද, මූලික විමර්ශන නිලධරයකු සතු කාර්යයක් වන්නේය.

## 14. චූදිත නිලධරයකු වෙත චෝදනා පත්‍රයක් නිකුත් කිරීම

14:1 චෝදනා පත්‍රයේ අන්තර්ගත කරනු ලබන චෝදනාවන් නීතිමය ස්වරූපයක් ගැනීම අවශ්‍ය නොවේ. එසේ වුව ද චූදිත නිලධරයාට විරුද්ධව විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීමට හේතු කාරක විය හැකි ඔහු විසින් කරන ලද හෝ ඔහු විසින් කරන ලදැයි ඒත්තු ගොස් ඇති හෝ විෂමාචාර ක්‍රියාවක් හෝ ප්‍රමාද දෝෂයක් හෝ පිළිබඳව කරුණු ඇතුළත් වූ පැහැදිලි වූත්, සරලවූත් ප්‍රකාශයකින් හෝ ප්‍රකාශයන්ගෙන් හෝ චෝදනා පත්‍රය සමන්විත විය යුත්තේ ය.

14:2 චෝදනා පත්‍රයක් තුළ පහත සඳහන් අංගයන් අනිවාර්යයෙන්ම ඇතුළත් වී තිබිය යුතු ය.

14:2:1 චූදිත නිලධරයාට විරුද්ධව චෝදනා පත්‍රය නිකුත් කරනු ලබන්නේ මෙම සංග්‍රහයේ කුමන පරිච්ඡේදයේ කුමන වගන්තිය හෝ වගන්තීන් යටතේ ද යන වග.

14:2:2 නඟා ඇති චෝදනා ඇතුළත් වන්නේ මෙම සංග්‍රහයේ කුමන උපලේඛනය යටතේ ද යන වග.

14:2:3 චෝදනා පත්‍රයට පිළිතුරු සැපයීමට චූදිත නිලධරයාට කොපමණ කාල සීමාවක් ලබා දෙන්නේ ද යන වග.

14:2:4 චෝදනා පත්‍රය සඳහා පිළිතුරු සැපයිය යුත්තේ කා වෙත ද යන වග.

14:2:5 නඟා ඇති චෝදනා කුමක් ද යන වග

14:2:6 චෝදනාවක් සනාථ කිරීම සඳහා විධිමත් විනය පරීක්ෂණයක දී කැඳවීමට අපේක්ෂිත සාක්ෂිකරුවන්ගේ නම් තනතුරු, වර්තමාන සේවා ස්ථාන මොනවා ද යන වග.

14:2:7 විධිමත් විනය පරීක්ෂණයේ දී චෝදනාවන් තහවුරු කිරීම සඳහා උපයෝගී කර ගනු ලබන සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශ හා ලිපිලේඛන මොනවා ද යන වග.

14:2:8 සාක්ෂි අඩංගු ලිපිලේඛන ඇත්තේ කවරකු භාරයේ ද, චූදිත නිලධරයාට හෝ ඔහුගේ රැකවරණ නිලධරයා සමඟ හෝ රැකවරණ නිලධරයාට හෝ ඒවා පරීක්ෂා කර බැලිය හැක්කේ කෙසේ ද, කවර ස්ථානයක දී ද යන වග.

14:2:9 චූදිත නිලධරයා වෙනුවෙන් පෙනී සිටීමට රැකවරණ නිලධරයෙක් පත් කර ගැනීමට ඔහුට අයිතියක් ඇති වග.

14:2:10 නියමිත කාලසීමාව ඇතුළත චෝදනා පත්‍රයට පිළිතුරු නොසැපයුවහොත් ගනු ලබන පියවර කුමක් ද යන වග.

14:3 විනය බලධරයකු විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද වෙනත් බලධරයකු විසින් හෝ චූදිත නිලධරයකු වෙත චෝදනා පත්‍රයක් නිකුත් කරන සෑම අවස්ථාවක දී ම අදාළ වන පරිදි 5 වන හෝ 6 වන හෝ පරිශිෂ්ටයේ සඳහන් කර ඇති ආදර්ශ ආකෘතිය උපයෝගී කරගත යුත්තේ ය.

14:4 චෝදනා පත්‍රයක් චූදිත නිලධරයා වෙත නිකුත් කර විධිමත් විනය පරීක්ෂණය ආරම්භ කරන අවස්ථාව දක්වා කාලසීමාව අතරතුර දී, එම චෝදනා පත්‍රය සංශෝධනය කිරීමට විනය බලධරයාට බලය ඇත්තේ ය.

14:5 උක්ත 14:4 උපවගන්තිය යටතේ චෝදනා පත්‍රය සංශෝධනය කරනු ලබන අවස්ථාවන් හි දී එම සංශෝධිත චෝදනා පත්‍රය සම්බන්ධයෙන් නැවත නිදහසට කරුණු ඉදිරිපත් කිරීමට හෝ ලිපිලේඛන පරීක්ෂා කිරීමට හෝ චූදිත නිලධරයාට ප්‍රමාණවත් කාලයක් ලබා දීමට විනය බලධරයා විසින් ක්‍රියා කළ යුත්තේ ය.

14:6 චෝදනා පත්‍රයක් මත විධිමත් විනය පරීක්ෂණයක් ආරම්භ කර පැමිණිල්ලේ සාක්ෂි මෙහෙයවීම අවසන් කිරීමට පෙර චෝදනා පත්‍රය සංශෝධනය කළ යුතු යැයි පැමිණිල්ල මෙහෙයවන නිලධරයාට ඒත්තු යන විටක එම සංශෝධනයන් නඟා ඇති චෝදනා සම්බන්ධයෙන් වන කල්හි, යෝජිත සංශෝධනයන් නියමිත විනය බලධරයා වෙත පැමිණිල්ල මෙහෙයවන නිලධරයා විසින් ලිඛිතව ඉදිරිපත් කළ යුත්තේ ය. මෙවැනි අවස්ථාවන්හි දී එම සංශෝධන විනය බලධරයා විසින් අනුමත කිරීම හෝ නොකිරීම හෝ කරන තෙක් විනය පරීක්ෂණය තාවකාලිකව අත්හිටුවීමට විනිශ්චය සභාව විසින් ක්‍රියා කළ යුත්තේ ය. විනය පරීක්ෂණය අඛණ්ඩව පවත්වා ගෙන යාමට හැකි වන සේ අනලස්ව තම තීරණය ලබා දීම විනය බලධරයාගේ වගකීම වන්නේ ය.

14:7 උක්ත 14:6 උප වගන්තිය යටතේ චෝදනා පත්‍රය සංශෝධනය කළ හැකි වාර ගණන අවස්ථා දෙකකට සීමා වන්නේ ය.

14:8 විධිමත් විනය පරීක්ෂණය ආරම්භ කිරීමෙන් පසු චෝදනා පත්‍රයේ අඩංගු කර ඇති සාක්ෂිගත ලේඛන හා සාක්ෂිකරුවන්ගේ නාම ලේඛනය සංශෝධනය කිරීම සඳහා පැමිණිල්ල මෙහෙයවන නිලධරයා විසින් ඉල්ලීමක් ඉදිරිපත් කළ විට අවස්ථාවෝචිත පරිදි ඒ සම්බන්ධයෙන් තීරණයක් ගැනීමට විනිශ්චය සභාවට බලය ඇත්තේ ය. එසේ විනය පරීක්ෂණයට අදාළ ලිපිලේඛන හෝ සාක්ෂිකරුවන්ගේ නාමාවලිය හෝ සංශෝධනයට ලක් කළ හැකි අවස්ථා ගණන දෙකකට සීමා විය යුත්තේ ය.

14:9 චූදිත නිලධරයෙකුට විරුද්ධව නිකුත් කර ඇති චෝදනා පත්‍රයේ සඳහන් කරනු ලබන ලිඛිත සාක්ෂිවලට අදාළ ප්‍රකාශ හා ලිපිලේඛන පරීක්ෂා කර බැලීමට ඔහුට හෝ විධිමත් ලෙස පත් කරනු ලැබූ ඔහුගේ ආරක්ෂක නිලධරයාට හෝ අවස්ථාව සලසා දීම විනය බලධරයාගේ හෝ ලිපි ලේඛන භාරව සිටින බවට චෝදනා පත්‍රයේ සඳහන් කර ඇති වෙනත් නිලධරයකුගේ හෝ වගකීම වන්නේ ය.

14:10 උක්ත 14:9 උප වගන්තියේ සඳහන් පරිදි එවැනි පරීක්ෂා කිරීමක දී අදාළ ප්‍රකාශ හා ලිපිලේඛනවල පූර්ණ සුරක්ෂිතභාවය පිළිබඳව නිසි පියවර ගැනීම එම ලිපිලේඛන භාර නිලධරයාගේ වගකීම වන්නේ ය.

14:11 චූදිත නිලධරයාගේ හෝ ඔහුගේ ආරක්ෂක නිලධරයාගේ ඉල්ලීම පරිදි අදාළ ප්‍රකාශ, ලිපිලේඛනවල ඡායාස්ථ පිටපත් ලබාදීම එම ලේඛනභාර නිලධරයාගේ අභිමතය පරිදි සිදු කළ හැක්කේ ය. එවැනි අවස්ථාවක දී ඡායාස්ථ පිටපත් ලබාදීම සඳහා නියමිත ගාස්තුවක් රජයට අය කර ගැනීමට කටයුතු කළ යුතු වන්නේ ය.

14:12 යම්කිසි නිලධරයකුට විරුද්ධව විනයානුකූලව ක්‍රියා කිරීම සඳහා විධිමත් චෝදනා පත්‍රයක් නිකුත් කරනු ලැබීමෙන් පසු එම විනය ක්‍රියා පටිපාටිය පිළිබඳ අවසාන නිගමනයකට එළඹෙන තෙක් අදාළ චූදිත නිලධරයාගේ වැටුප් වර්ධක, උසස්වීම්, විදේශ චාරිකා හා ශිෂ්‍යත්ව, වැටුප් සහිත අධ්‍යයන නිවාඩු, වැටුප් ණය හා අත්තිකාරම්, වැටුප් රහිත දේශීය හා විදේශීය නිවාඩු, ද්වීතීයනය කිරීම් ලබාදීම වහාම ක්‍රියාත්මක වන පරිදි අත්හිටුවිය යුතු ය.

රා.ප.ච 30/2019 මඟින් 14:12 උප වගන්තිය සංශෝධනය කර ඇත.

14:13 චූදිත නිලධරයාගේ අසනීපයක් සඳහා වෛද්‍ය විශේෂඥයකුගේ නිර්දේශය මත ප්‍රතිකාර ගැනීම පිණිස විදේශගත වීම අවශ්‍ය වූ විටෙක, ඒ සඳහා විනය බලධරයාගේ අවසරය ලබාගත යුතු වන්නේ ය.

## 15. චූදිත නිලධරයා විසින් චෝදනා පත්‍රය සම්බන්ධයෙන් ස්වකීය නිදහසට කරුණු ඉදිරිපත් කිරීම.

15:1 චෝදනා පිළිබඳව ස්වකීය නිදහසට කරුණු චෝදනා පත්‍රයේ සඳහන් කර ඇති නිශ්චිත කාලසීමාව ඇතුළත චෝදනා පත්‍රයේ නියම කර ඇති ආකාරයට චූදිත නිලධරයා විසින් විනය බලධරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

15:2 නියමිත කාලසීමාව ඇතුළත නිදහසට කරුණු දැක්වීමට අපොහොසත්වීම පිළිබඳ සාධාරණ හේතු ද සහිතව චූදිත නිලධරයා විසින් විනය බලධරයා වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කළහොත්, එම හේතු සාධක සලකා බලා ස්වකීය අභිමතය පරිදි නිදහසට කරුණු දැක්වීමේ කාලය දීර්ඝ කිරීමේ බලය විනය බලධරයා සතු වන්නේ ය.

15:3 නියමිත කාලසීමාව තුළ ස්වකීය නිදහසට කරුණු ඉදිරිපත් කිරීමට චූදිත නිලධරයා අපොහොසත් වී ඇති අවස්ථාවන්හි දී, ඔහු වෙත චෝදනා පත්‍රය විධිමත්ව භාරදුන් බව සනාථ කෙරෙන සහතිකයක් ද සමඟ අදාළ ආයතන ප්‍රධානයා විසින් විනය බලධරයා වෙත වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය.

15:4 නියමිත කාලසීමාව තුළ දී තම නිදහසට කරුණු ඉදිරිපත් කිරීමට අපොහොසත් වන හෝ නිදහසට කරුණු ඉදිරිපත් කිරීම සිතාමතා පැහැර හරින හෝ චූදිත නිලධරයකු සම්බන්ධයෙන්, තම අභිමතය පරිදි ඔහු සියලුම චෝදනාවලට වරදකරු බව නිගමනය කොට සුදුසු විනය නියෝගයක් පැනවීමට හෝ සුදුසු යැයි හැඟෙන වෙනත් ක්‍රියා මාර්ගයක් අනුගමනය කිරීමට හෝ විනය බලධරයාට බලය ඇත්තේ ය.

15:5 චූදිත නිලධරයා විසින් තම නිදහසට කරුණු ඉදිරිපත් කිරීමේ දී, චෝදනා පත්‍රයේ සඳහන් චෝදනාවලින් එකකට හෝ කීපයකට හෝ පමණක් වරදකරු බව පිළිගන්නා අවස්ථාවේ දී හෝ චූදිත නිලධරයා විසින් ඉදිරිපත් කර ඇති නිදහසට කරුණු මඟින් චෝදනාවලින් එකකට හෝ කීපයකට හෝ පමණක් නිවැරදිකරු වන බව පෙනී යන අවස්ථාවේ දී හෝ සම්පූර්ණ චෝදනා පත්‍රය සම්බන්ධයෙන්ම විධිමත් විනය පරීක්ෂණයක් පවත්වන ලෙසට නියම කිරීමට විනය බලධරයා කටයුතු කළයුතු වන්නේ ය.

15:6 චූදිත නිලධරයා විසින් තමා වෙත විධිමත්ව නිකුත් කර ඇති චෝදනා පත්‍රය සියලුම චෝදනා සඳහා වැරදිකරු බව චෝදනා පත්‍රයට පිළිතුරු සපයන අවස්ථාවේ දී ප්‍රකාශිතව පිළිගෙන ඇත්නම්, චූදිත නිලධරයා වෙත සුදුසු යයි හැඟෙන දඬුවම් පැනවීමට හෝ වරද පිළිගැනීම නොසලකා හැර විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීමට විධාන කිරීමට හෝ විනය බලධරයාට බලය ඇත්තේ ය.

15:7 චෝදනා පත්‍රයට පිළිතුරු සැපයීමට නියම කරනු ලැබූ නිලධරයකුට සෑම ආකාරයෙන්ම අංග සම්පූර්ණ වූ පිළිතුරක් ඉදිරිපත් කිරීමට හෝ චෝදනාවලට තමා වරදකරු හෝ නිවැරදිකරු හෝ බව පවසා සිය නිදොස් බව සනාථ කිරීම සඳහා තවදුරටත් පරීක්ෂණයක් පවත්වන ලෙස ඉල්ලා සිටීමට හෝ හැකියාවක් ඇත්තේ ය.

15:8 15:7 උපවගන්තිය ප්‍රකාරව චෝදනා පත්‍රයක් සඳහා අංගසම්පූර්ණ පිළිතුරක් ඉදිරිපත් කරනු ලබන චූදිත නිලධරයකු විසින් තමාගේ නිර්දෝශීභාවය සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන ලිපිලේඛනවල මුල් පිටපත් හෝ ඒවායේ සහතික කළ පිටපත් හෝ මෙන්ම තමන්ගේ

සාක්ෂිකරුවන් පිළිබඳ විස්තර ද ඔවුන්ගේ ප්‍රකාශ ඇතුළත් දිවුරුම් ප්‍රකාශ ද එම පිළිතුර සමඟ ඉදිරිපත් කළ යුතු ය.

15:9 චූදිත නිලධරයා විසින් ඉදිරිපත්කර ඇති නිදහසට කරුණු මඟින් ස්වකීය නිර්දෝශීභාවය ප්‍රමාණවත් ලෙස සනාථ කර ඇති බවට විනය බලධරයා විසින් නිගමනය කරන්නේ නම්, ඔහු චෝදනා පත්‍රයේ සඳහන් සියලුම චෝදනාවලින් නිදොස් කොට නිදහස් කිරීමට හෝ යම් හෙයකින් චූදිත නිලධරයා දෙවන උපලේඛනය යටතට වැටෙන වරදකට වරදකරු වී ඇති බවට විනය බලධරයා විසින් නිගමනය කරන්නේ නම් ඔහු වෙත සුළු දඬුවමක් නියම කිරීමට හෝ බැලූ බැල්මට පෙනී යන ආකාරයට පළමුවන උපලේඛනය යටතට වැටෙන වරදක් සිදු කර ඇති බවට විනය බලධරයාගේ නිගමනය වන කල්හි ඔහුට විරුද්ධව විධිමත් විනය පරීක්ෂණයක් පවත්වන ලෙසට නියම කිරීමට හෝ විනය බලධරයාට බලය ඇත්තේ ය.

## 16. විධිමත් විනය පරීක්ෂණයක දී ලේඛනගත සාක්ෂි වශයෙන් උපයෝගී කර ගනු ලබන ලිපිලේඛන

16:1 චූදිත නිලධරයාට එරෙහිව ඉදිරිපත් කර ඇති චෝදනා සනාථ කිරීම සඳහා විධිමත් විනය පරීක්ෂණයක දී ඉදිරිපත් කරනු ලබන සියලුම ලිපිලේඛන අදාළ චෝදනා පත්‍රයේ ලේඛනගත සාක්ෂි වශයෙන් සඳහන් කර ඇති ලිපිලේඛනවලට පමණක් සීමා විය යුත්තේ ය. චෝදනා පත්‍රයක් විධිමත් ලෙස සංශෝධනය කරන අවස්ථාවක දී ලේඛනගත සාක්ෂි වශයෙන් අලුතෙන් ලිපිලේඛන ඇතුළත් කළ හැක.

16:2 උක්ත 16:1 උප වගන්තිය ප්‍රකාරව විධිමත් විනය පරීක්ෂණයක දී විනිශ්චය සභාව වෙත, අදාළ වන්නා වූ ලිපිලේඛන අදාළ වන ආකාරයට තමන් විසින් පෞද්ගලිකවම ඉදිරිපත් කිරීමට හෝ අදාළ සාක්ෂිකරුවන් මාර්ගයෙන් ඉදිරිපත් කිරීමට හෝ පැමිණිල්ල මෙහෙයවන නිලධරයා වෙත බලය පැවරෙන්නේ ය.

16:3 මෙම සංග්‍රහය යටතේ වූ විධිමත් විනය පරීක්ෂණයක දී රජයේ ආයතනයක හෝ අර්ධ රජයේ ආයතනයක හෝ නිලධරයකු භාරයේ ඇති කාර්යාලයීය ලේඛනයක මුල් පිටපතම විනිශ්චය සභාව වෙත ඉදිරිපත් කිරීම අත්‍යවශ්‍ය නොවේ. විනිශ්චය සභාව විසින් එබඳු ලේඛනයක මුල් පිටපතම කියවා බැලීම අවශ්‍යයයි සළකතහොත් මිස එහි විධිමත් ලෙස සහතික කළ පිටපතක් ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් වන්නේ ය.

16:4 උක්ත 16:3 උප වගන්තියේ සඳහන් ආකාරයේ නොවන ලේඛනයක නම් එහි මුල්පිටපතම විධිමත් විනය පරීක්ෂණයක දී විනිශ්චය සභාව වෙත ඉදිරිපත් කළ යුත්තේ ය. එසේ කිරීමට නොහැකි වන අවස්ථාවල දී නිගමනයකට එළඹීමට පෙර විනිශ්චය සභාව විසින් අදාළ ලේඛනයේ සහතික කළ පිටපතක් එහි මුල් ලේඛනය සමඟ සසඳා පරීක්ෂා කර බලා සෑහීමකට පත්වීමෙන් පසු, සහතික කළ පිටපත පිළිගත හැක්කේ ය.

16:5 චූදිත නිලධරයෙකුට විරුද්ධව උපයෝගී කර ගැනීමට අදහස් කරනු ලබන කවර ලේඛනයක් වුව ද පරීක්ෂා කර බැලීමට අදාළ චූදිත නිලධරයාට හෝ ඔහුගේ රැකවරණ නිලධරයාට හෝ අවසර දීමට චෝදනා පත්‍රයේ බලය පවරා ඇති නිලධරයා ක්‍රියා කළ යුත්තේ ය. එහෙත් විධිමත් විනය පරීක්ෂණයක් පවත්වාගෙන යන අතරතුර දී යම් ලේඛනයක් ඉදිරිපත් කරන අවස්ථාවල දී විනිශ්චය සභාව විසින් එය එම අවස්ථාවේ දී පරීක්ෂා කොට බැලීම සඳහා ද විත්ති පක්ෂයට අවසර දීම ප්‍රමාණවත් වේ. අවශ්‍ය වේනම් ඒ සඳහා පරීක්ෂණය කල් දැමීමට ද විනිශ්චය සභාවට බලය ඇත්තේ ය.

16:6 මෙම පරිච්ඡේදයේ 21:25 වැනි උප වගන්තියේ සඳහන් කර ඇති අන්දමේ ලේඛනයක් සම්බන්ධයෙන් 16:5 වැනි උප වගන්තියට අදාළ නොවේ.

## 17. විධිමත් විනය පරීක්ෂණයක දී පැමිණිල්ල මෙහෙයවීම

17:1 විධිමත් විනය පරීක්ෂණයක දී පැමිණිල්ල මෙහෙයවීමේ නිලධරයාට පත් කළ යුත්තේ, චූදිත නිලධරයා වරද සිදු කළ අවස්ථාවේදී සේවය කළ අමාත්‍යාංශයේ හෝ දෙපාර්තමේන්තුවේ හෝ අදාළ වෙනත් ආයතනයේ හෝ ප්‍රධානයා විසිනි.

17:2 චූදිත නිලධරයාට විරුද්ධව විනය බලධරයා විසින් නිකුත් කර ඇති චෝදනා පත්‍රයේ සඳහන් චෝදනා අදාළ ලිපිලේඛන හා අදාළ සාක්ෂිකරුවන් උපයෝගී කර ගනිමින් නඟා ඇති චෝදනාවන් සනාථ කෙරෙන ආකාරයට පැමිණිල්ල මෙහෙයවීම, පැමිණිල්ල මෙහෙයවන නිලධරයාගේ පූර්ණ වගකීම වන්නේ ය.

17:3 පැමිණිල්ල මෙහෙයවන නිලධරයකුට එම විධිමත් විනය පරීක්ෂණයේම සාක්ෂිකරුවෙකු විය නොහැක්කේ ය.

17:4 විධිමත් විනය පරීක්ෂණය ආරම්භ කිරීමෙන් පසු පැමිණිල්ලේ සාක්ෂි මෙහෙයවීම අවසන් වීමට පෙර චූදිත නිලධරයාට නඟා ඇති චෝදනා සංශෝධනය කළයුතු වන්නේයැයි පැමිණිල්ල මෙහෙයවන නිලධරයා සාධාරණ කරුණු මත නිගමනයට එළඹෙන්නේ නම් අවස්ථා දෙකක උපරිමයකට යටත්ව එම චෝදනා පත්‍රය සංශෝධනය කරන ලෙස, විනය බලධරයා වෙත ලිඛිත ඉල්ලීම් ඉදිරිපත් කිරීමට පැමිණිල්ල මෙහෙය වන නිලධරයාට බලය ඇත්තේ ය.

17:5 අදාළ ආයතන ප්‍රධානයා විසින් තමා විසින්ම හෝ වෙනත් ආයතන ප්‍රධානයකුගේ එකඟත්වය මත හෝ පැමිණිල්ල මෙහෙයවන නිලධරයකු පත් කර ඇති විටක, එම කාර්යය සාර්ථකව ඉටුකිරීමට හැකිවනු පිණිස අවශ්‍ය අවස්ථාවන්හි දී ඔහුගේ සාමාන්‍ය රාජකාරීවලින් මුදාහැරීම අදාළ ආයතන ප්‍රධානියාගේ වගකීම වන්නේ ය.

17:6 යම්කිසි රාජ්‍ය නිලධරයකු විධිමත් විනය පරීක්ෂණයක පැමිණිල්ල මෙහෙයවීමේ නිලධරයකු ලෙස, දෙපාර්තමේන්තු ප්‍රධානියකු හෝ අදාළ බලධරයකු හෝ විසින් පත් කර ඇති විටක දී එම පත්වීම භාර ගැනීම එම නිලධරයා විසින් ප්‍රතික්ෂේප නොකළ යුත්තේ ය. එසේ වූව ද, පැමිණිල්ල මෙහෙයවීම සඳහා පත්කර ඇති නිලධරයකු එම කාර්යය සාර්ථකව ඉටු කිරීමට තමාට ඇති බාධක හෝ අපහසුකම් හෝ පිළිබඳව අදාළ බලධරයා වෙත ලිඛිතව කරුණු ඉදිරිපත් කොට ඇති කල්හි එසේ ඉදිරිපත් කර ඇති කරුණු සැලකිල්ලට භාජනය කර අවශ්‍ය වේ නම් එම පත්වීම අවලංගු කිරීමට එම බලධරයාට බලය ඇත්තේ ය.

17:7 විනය පරීක්ෂණයක පැමිණිල්ල මෙහෙයවීමේ නිලධරයකු වශයෙන් පත්වීමක් ලැබ ඇති රාජ්‍ය නිලධරයකු පිළිගත හැකි සාධාරණ හේතුවක් නොමැතිව එම පත්වීම පිළිගැනීම ප්‍රතික්ෂේප කිරීම විෂමාචාරයක් වශයෙන් සලකා විනයානුකූලව කටයුතු කිරීමට යටත් වන්නේ ය.

17:8 විධිමත් විනය පරීක්ෂණයක තමා වෙත පැමිණිල්ල මෙහෙයවීමේ වගකීම පැවරී ඇති නිලධරයකු ඊට සම්බන්ධිත පාර්ශවයන් අපහසුතාවයකට පත් නොවන ආකාරයට අදාළ විනය පරීක්ෂණය අඛණ්ඩව පවත්වා ගෙන යාම සඳහා විනිශ්චය සභාව වෙත තම උපරිම සහයෝගය ලබාදිය යුත්තේ ය.

17:9 විනය පරීක්ෂණයක පැමිණිල්ල මෙහෙයවන නිලධරයකු එම විනය පරීක්ෂණයේ කටයුතු අවසන් වීමට පෙරාතුව රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගත්තේ නම් එම පැමිණිල්ල මෙහෙයවීමේ කටයුතු සඳහා එම විශ්‍රාම ගැන්වීම කිසිදු ආකාරයකින් බාධාවක් නොවිය යුත්තේ ය.

17:10 පැමිණිල්ල මෙහෙයවීම සඳහා පත්කරනු ලැබූ නිලධරයකු පැමිණිල්ල මෙහෙයවීමේ කටයුතු කාර්යක්ෂමව හා විශ්වාසවන්තව ඉටු නොකිරීමේ හේතුව මත හෝ සේවයෙන් පහ කිරීම හෝ වැඩ තහනම් කිරීම හෝ බලවත් ලෙස රෝගාතුරවීම හෝ පැමිණිල්ල මෙහෙයවීමට තරම් නුසුදුසු ශාරීරික හෝ මානසික තත්ත්වයකට පත්වීම හෝ මරණයට පත්වීම හෝ යන හේතූන් මත මිස එම කාර්යය වෙනත් නිලධරයකු වෙත නොපැවරිය යුත්තේ ය.

17:11 පැමිණිල්ලක් මෙහෙයවන සෑම නිලධරයකු විසින්ම, එම කාර්යය පිළිබඳව ඔහු කෙරෙහි අදාළ බලධරයා විසින් තබන ලද විශ්වාසය නොබිඳෙන ආකාරයට අවංකව ද, කාර්යක්ෂමව ද, විශ්වාසවන්තව ද, රජයේ අයිතිවාසිකම් සුරකෙන ලෙස ද කටයුතු කිරීමට වගබලා ගත යුතු වන්නේ ය.

17:12 චූදිත නිලධරයා වෙත නඟා තිබූ චෝදනාවලට ඔහු වරදකරු කිරීමට අදාළ කරගත හැකි සියලු හේතු සාධක විදහා දැක්වෙන අදාළ සියලු කරුණු ඇතුළත් සාක්ෂි සම්පිණ්ඩිත වාර්තාවක් විධිමත් විනය පරීක්ෂණය අවසාන වී දින විසි එකක් තුළ දී හෝ විනිශ්චය සභාව විසින් නියම කරනු ලබන නියමිත කාලයක් තුළ දී හෝ පැමිණිල්ල මෙහෙයවන නිලධරයා විසින් විනිශ්චය සභාව වෙත ඉදිරිපත් කළ යුත්තේ ය.

17:13 විධිමත් විනය පරීක්ෂණයක දී ඉදිරිපත් කිරීම සඳහා තීරණය කොට ඇති ලියවිලි නිවැරදිව, විධිමත්ව තමන්ගේ භාරයට ලබා ගැනීමත් ඒවා විනය පරීක්ෂණයට ඉදිරිපත් කරන තෙක් රහස්‍යව ද, ආරක්ෂා සහිතව ද තම භාරයේ තබා ගැනීමත් විනය පරීක්ෂණයේ දී ඒවා සලකුණු කිරීම සඳහා විනිශ්චය සභාව වෙත ඉදිරිපත් කිරීමත්, එසේ සලකුණු කරන ලද ලියවිලි විනිශ්චය සභාවේ භාරයට ගත් බවට විනිශ්චය සභාව වෙතින් විධිමත් ලියවිල්ලක් ලබා ගැනීමත්, පරීක්ෂණයට ඉදිරිපත් නොකොට තමන් අත ඉතිරි වී ඇති ලිපිලේඛන ඇත්නම් ඒවා නිසි බලධරයන් වෙත ආපසු භාරදීමත් විනිශ්චය සභාව විසින් ලිපිලේඛන භාර ගන්නා ලද බව සනාථ කරන ලද ලියවිල්ලේ පිටපත් ද එම අදාළ බලධරයා වෙත ලබාදීමත් පැමිණිල්ල මෙහෙයවන නිලධරයාගේ වගකීම වන්නේ ය.

## 18. විධිමත් විනය පරීක්ෂණයක දී චූදිත නිලධරයන් වෙනුවෙන් පෙනී සිටීම

18:1 විනය බලධරයාගේ පූර්ව හා ලිඛිත එකඟත්වය ඇතිව තමා වෙනුවෙන් විධිමත් විනය පරීක්ෂණයේ දී පෙනී සිටීම සඳහා රැකවරණ නිලධරයකු වශයෙන් 18:2 හා 18:3 වගන්තිවල සඳහන් සුදුසුකම් සපුරා ඇති අයකු පත් කර ගැනීමට චූදිත නිලධරයාට හිමිකමක් ඇත්තේ ය.

18:2 චූදිත නිලධරයා විසින් තමා වෙනුවෙන් පෙනී සිටීම සඳහා එම අවස්ථාව වන විට රාජ්‍ය සේවයේ නියුතුව සිටින හෝ රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ලබා සිටින හෝ අයකු රැකවරණ නිලධරයකු වශයෙන් පත් කර ගත හැකි ය.

18:3 තමා වෙනුවෙන් විධිමත් විනය පරීක්ෂණයේ දී රැකවරණ නිලධරයා වශයෙන් නීතිඥවරයෙකු පත් කර ගැනීම සඳහා චූදිත නිලධරයකු විසින් ඉල්ලීමක් කර ඇති අවස්ථාවක දී චෝදනා පත්‍රයේ සඳහන් කර ඇති චෝදනාවල ස්වභාවය හා විධිමත් විනය පරීක්ෂණයේ දී ඉදිරිපත් කරනු ලැබිය හැකි සාක්ෂිවල සංකීර්ණභාවය සැලකිල්ලට ගෙන අවස්ථාවෝචිත පරිදි එවැනි ඉල්ලීමක් සඳහා එකඟත්වය පළ කිරීමට විනය බලධරයාට හැකියාව ඇත්තේ ය.

18:4 රැකවරණ නිලධරයා වශයෙන් නම් කොට ඇති පුද්ගලයා රජයේ නිලධරයෙක් වන නීතිඥයකු වන්නේ නම් එම පුද්ගලයා රජයේ නිලධරයකු වශයෙන් විනය බලධරයා විසින් සැලකිය යුතු වන්නේ ය.

18:5 යම් රැකවරණ නිලධරයකු තමා පෙනී සිටින විධිමත් විනය පරීක්ෂණය යථාපරිදි පවත්වාගෙන යාමට බාධාවන ආකාරයෙන් කටයුතු කරන්නේ යැයි විනිශ්චය සභාවට ඒත්තු යන අවස්ථාවක දී ඒ පිළිබඳව විස්තරාත්මක වාර්තාවක් එම විනිශ්චය සභාව විසින් චූදිත නිලධරයාගේ විනය බලධරයා වෙත ඉදිරිපත් කළ යුතු වන්නේ ය. එකී වාර්තාවේ කරුණු සැලකිල්ලට ගෙන රැකවරණ නිලධරයාට තවදුරටත් එම කාර්යයේ යෙදී සිටීමට ඉඩදීම මඟින් විනය කාර්ය පටිපාටියට බලවත් සේ බාධා වන්නේ යැයි විනය බලධරයා නිගමනය කරන අවස්ථාවක දී එම රැකවරණ නිලධරයා වෙනුවෙන් ඔහු විසින් ලබා දී ඇති එකඟතාවය ඉවත් කොට ගෙන වෙනත් රැකවරණ නිලධරයකු පත්කොට ගන්නා ලෙස චූදිත නිලධරයාට නියම කිරීමට අදාළ විනය බලධරයාට බලය ඇත්තේ ය.

## 19. පරීක්ෂණ විනිශ්චය සභා

19:1 විධිමත් විනය පරීක්ෂණයක දී පත් කරනු ලබන විනිශ්චය සභාව මෙම සංග්‍රහයේ ප්‍රකාශිත විධිවිධානයන්ට අනුකූලව කවර පුද්ගලයකුගෙන් හෝ පුද්ගලයන්ගෙන් හෝ සමන්විත විය යුතු ද යන්න තීරණය කිරීම විනය බලධරයාට අයත් කාර්යයක් වන්නේ ය.

19:2 තමන්ට විරුද්ධව පවත්වනු ලබන විධිමත් විනය පරීක්ෂණයක දී නීතිඥවරයෙකු විනිශ්චය සභාව වශයෙන් පත්කර ගැනීමට යම් චූදිත නිලධරයකු හට අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා ප්‍රමාණවත් හේතු සාධක සහිත ලිඛිත ඉල්ලීමක් ඔහු විසින් විනය බලධරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. එහෙත් ඒ සම්බන්ධයෙන් අවස්ථාවෝචිත පරිදි තීරණයක් ගැනීම විනය බලධරයාගේ අභිමතය අනුව විය යුත්තේ ය. එවැනි ඉල්ලීමක් ප්‍රතික්ෂේප කරන අවස්ථාවක දී විනය බලධරයා විසින් එසේ ප්‍රතික්ෂේප කිරීමට හේතු ඉතා පැහැදිලිව අදාළ ලිපිගොනුවේ සටහන් කර තැබිය යුතු වේ.

19:3 විනිශ්චය සභාවක සාමාජියකු වශයෙන් අදාළ විනය බලධරයා විසින් පත් කළ යුත්තේ චූදිත නිලධරයාට වඩා ජ්‍යෙෂ්ඨ තනතුරක් දරන හෝ එවැනි තනතුරක් දැරූ හෝ තැනැත්තකු පමණක් වේ.

19:4 රජයේ සේවයේ නියුතු නිලධරයකු විධිමත් විනය පරීක්ෂණයක දී විනිශ්චය සභාවක් වශයෙන්, විනය බලධරයා විසින් පත් කරනු ලැබිය හැක්කේ අදාළ නිලධරයා ස්වකීය සේවා කාලය තුළ දී වරදකට ආයතන සංග්‍රහයේ පළමුවන උපලේඛනය යටතේ දැක්වෙන වරදකට දඬුවම් ලබා නොමැත්තේ නම් පමණකි.

රා.ප.ච. 07/2010 මඟින් 19:4 උප වගන්තිය සංශෝධනය කර ඇත

19:5 රජයේ සේවයෙන් විශ්‍රාමලත් සහ ස්වකීය සේවා කාලය තුළ දී ආයතන සංග්‍රහයේ පළමුවන උපලේඛනය යටතේ දැක්වෙන වරදකට විනයානුකූල දඬුවම් නොලැබූ, මාණ්ඩලික නිලධරයෙක් වශයෙන් දස වසරකට හෝ ඊට වැඩි සේවා කාලයක් ඇති තැනැත්තන්ගෙන් සහ නීතිඥයන්ගෙන් සමන්විත විනය පරීක්ෂණ නිලධර සංචිතයක්, රාජ්‍ය පරිපාලන විෂය භාර ලේකම්වරයා විසින් ස්ථාපනය කොට අවස්ථාවෝචිත පරිදි සංශෝධනය කරමින් අඛණ්ඩව පවත්වාගෙන යා යුත්තේ ය. එසේම එම පරීක්ෂණ මඩුල්ල සම්බන්ධයෙන් විස්තර වරින්වර අමාත්‍යාංශ ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ අදාළ අනෙකුත් බලධරයන්ට ලිඛිතව දැනුම්දීම රාජ්‍ය පරිපාලන විෂය භාර ලේකම්වරයාගේ වගකීමක් වන්නේ ය.

රා.ප.ච. 07/2010 මඟින් 19:5 උප වගන්තිය සංශෝධනය කර ඇත

19:6 රජයේ සේවයේ විශ්‍රාමික නිලධරයකු හෝ අවම වශයෙන් වසර දහයක පළපුරුද්දක් ඇති නීතිඥයකු පරීක්ෂණ නිලධරයා වශයෙන් පත් කිරීමට විනය බලධරයා විසින් තීරණය කර ඇති කල්හි අදාළ පරීක්ෂණ නිලධරයා තෝරා ගත යුත්තේ උක්ත 19:5 වගන්තියේ සඳහන් සංචිතය ඇසුරින් පමණක් වේ. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් එම සංචිතය ඇසුරින් හෝ වෙනත් ආකාරයකින් හෝ පරීක්ෂණ නිලධාරීන් තෝරාගනු ඇත.

19:7 විධිමත් විනය පරීක්ෂණයක දී විනිශ්චය සභාව වශයෙන් විනය පරීක්ෂණ නිලධරයන් එක් අයෙකුට වැඩි සංඛ්‍යාවක් විනය බලධරයා විසින් පත් කරනු ලබන අවස්ථාවන්හි දී එම සංඛ්‍යාව ඔත්තේ සංඛ්‍යාවක් විය යුතු අතර ඔවුන්ගෙන් එක් අයෙකු සභාපති වශයෙන් පත් කළ යුතු ය.

19:8 විනය බලධරයකු විසින් චූදිත නිලධරයකුට විරුද්ධව මෙම සංග්‍රහයේ දෙවන උපලේඛනය යටතේ චෝදනා පත්‍රයක් නිකුත් කර විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීමට අදහස් කර ඇති විටක දී පත් කරනු ලබන විනිශ්චය සභාව එක් සාමාජිකයෙකුගෙන් පමණක් සමන්විත විය යුත්තේ ය.

19:9 සේවයේ සිටින රාජ්‍ය නිලධරයෙක් විධිමත් විනය පරීක්ෂණයක විනිශ්චය සභාවක් ලෙස, විනය බලධරයෙක් විසින් පත් කර ඇති කල්හි එම විනය පරීක්ෂණය සාර්ථකව ඉටුකිරීමට හැකිවනු පිණිස අවශ්‍ය අවස්ථාවන්හි දී ඔහු සාමාන්‍ය රාජකාරීවලින් මුදාහැරීම අදාළ ආයතන ප්‍රධානියාගේ වගකීම වන්නේ ය.

19:10 උක්ත 19:9 උප වගන්තියට අනුකූලව රාජ්‍ය නිලධරයකු විනිශ්චය සභාවක් වශයෙන් පත්කර ඇති කල්හි අදාළ විධිමත් විනය පරීක්ෂණය මෙම සංග්‍රහයේ විධිවිධානයන්ට අනුකූලව, අපක්ෂපාතිවත්, අවංකවත්, අප්‍රමාදවත්, කාර්යක්ෂමවත් පවත්වා විනය පරීක්ෂණ වාර්තාව නොපමාව විනය බලධරයා වෙත ඉදිරිපත් කිරීම එම නිලධරයාගේ වගකීම වන්නේ ය.

19:11 විධිමත් විනය පරීක්ෂණ වාර්තාව අදාළ විනය බලධරයා විසින් නියම කරන ලද කාලසීමාව තුළ හෝ සාධාරණ කාලසීමාවක් තුළ හෝ ඉදිරිපත් නොකරන ලද කල්හි, අදාළ විනය පරීක්ෂණ නිලධරයාට එරෙහිව විනයානුකූලව ක්‍රියා කිරීම සඳහා ඔහු සම්බන්ධයෙන් අදාළ වන විනය බලධරයා වෙත වාර්තා කිරීමට විනය බලධරයාට බලය ඇත්තේ ය.

19:12 උක්ත 19:5 උප වගන්තිය යටතේ පවත්වා ගෙන යනු ලබන විනය පරීක්ෂණ නිලධර සංචිතයට අයත් නිලධරයකු විධිමත් විනය පරීක්ෂණයක දී විනිශ්චය සභාව ලෙස විනය බලධරයා විසින් පත් කරනු ලැබ ඇති විටක දී අදාළ පරීක්ෂණය මෙම සංග්‍රහයේ විධිවිධානයන්ට අනුකූලව අපක්ෂපාතවත්, අවංකවත්, අප්‍රමාදවත්, කාර්යක්ෂමවත් පවත්වා, විනය පරීක්ෂණ වාර්තාව නොපමාව විනය බලධරයා වෙත ඉදිරිපත් කිරීම විනිශ්චය සභාවේ වගකීම වන්නේ ය. විනය බලධරයා විසින් නියම කරනු ලබන කාලසීමාවන් තුළ දී හෝ සාධාරණ කාලසීමාවක් තුළ දී හෝ විධිමත් විනය පරීක්ෂණ වාර්තාව ඉදිරිපත් කිරීමට අපොහොසත් වන පරීක්ෂණ නිලධරයන්ගේ දීමනාවෙන් සුදුසු ප්‍රතිශතයක් කපා හැරීමටත්, අවස්ථාවෝචිත පරිදි අදාළ පරීක්ෂණ නිලධරයාගේ නම ලියාපදිංචි පරීක්ෂණ නිලධර සංචිතයෙන් කපා හරින ලෙස රාජ්‍ය පරිපාලන විෂය භාර ලේකම්වරයා වෙත නිර්දේශ කිරීමටත් විනය බලධරයාට බලය ඇත්තේ ය.

19:13 උක්ත 19:12 උප වගන්තිය පරිදි විනය බලධරයකු විසින්, විනය පරීක්ෂණ නිලධරයකුගේ නම, රාජ්‍ය පරිපාලන විෂයභාර අමාත්‍යාංශයේ ලියාපදිංචි විනය පරීක්ෂණ නිලධර මඩුල්ලෙන් ඉවත් කරන ලෙස හේතු සාධක සහිතව ඉල්ලා ඇති විටක දී අදාළ කරුණු සැලකිල්ලට ගෙන අවස්ථාවෝචිත පරිදි එම නම ලියාපදිංචි මඩුල්ලෙන් කපා හැරීමට රාජ්‍ය පරිපාලන විෂයභාර ලේකම්වරයාට බලය ඇත්තේ ය.

19:14 එකම සිදුවීමක් හෝ සිදුවීම් මාලාවක් හෝ සම්බන්ධයෙන් පවත්වනු ලබන එකිනෙකට සම්බන්ධයක් හෝ සමානත්වයක් හෝ ඇති විධිමත් විනය පරීක්ෂණ කීපයක් අතුරින් එක් විධිමත් විනය පරීක්ෂණයක විනිශ්චය සභාව වශයෙන් පත් කරන ලද නිලධරයකු ඒ හා සම්බන්ධ අනෙකුත් විධිමත් පරීක්ෂණයක දී රැකවරණ නිලධරයා හෝ පැමිණිල්ල මෙහෙයවන නිලධරයා හෝ වශයෙන් පත්කරනු ලැබීමට සුදුසුකම් නොලබන්නේ ය.

## 20. විධිමත් විනය පරීක්ෂණයක රජයේ සාක්ෂිකරුවකු වන රාජ්‍ය නිලධරයකු සතු කාර්යභාරය

20:1 විධිමත් විනය පරීක්ෂණයක දී විනය බලධරයකු විසින් පැමිණිල්ලේ සාක්ෂිකරුවකු වශයෙන් නම් කරනු ලබන ඕනෑම රාජ්‍ය නිලධරයකු වෙත අදාළ විනිශ්චය සභාව මඟින් කැඳවීමක් ලැබුණු කල්හි විනිශ්චය සභාව විසින් උපදෙස් දී ඇති ආකාරයට විධිමත් විනය පරීක්ෂණය සඳහා අනිවාර්යයෙන්ම සාක්ෂිකරුවකු වශයෙන් සහභාගී විය යුතු ය.

20:2 උක්ත 20:1 උප වගන්තිය පරිදි විධිමත් විනය පරීක්ෂණයක දී සාක්ෂිදීම සඳහා කැඳවීමක් ලබන රාජ්‍ය නිලධරයකු එම විනය පරීක්ෂණයට අදාළව, තමන් දන්නා, එසේම තමාගේ රාජකාරීමය ස්වභාවය අනුව තමන් විසින් දැන සිටිය යුතු, සියලු කරුණු පිළිබඳව, අවංකවත්, විශ්වාසවන්ත ලෙසත්, සම්පූර්ණ ලෙසත්, නිවැරදි ලෙසත් සත්‍ය සාක්ෂි ඉදිරිපත් කිරීමට වගකීමකින් බැඳී සිටින අතර, එය ඔහු දරමින් සිටින තනතුරට අයත් රාජකාරියේ කොටසක් ලෙස සැලකිය යුතු වන්නේ ය.

20:3 උක්ත 20:1 උප වගන්තිය ප්‍රකාරව විධිමත් විනය පරීක්ෂණයක සාක්ෂි දීමට කැඳවීමක් ලැබූ රාජ්‍ය නිලධරයකු 20:2 උප වගන්තියේ සඳහන් කොට ඇති වගකීම් සිතාමතා හෝ නොසැලකිල්ලෙන් හෝ අනවධානයෙන් හෝ පැහැර හරින අවස්ථාවන්හි දී එම ක්‍රියාව ඔහුට විරුද්ධව විනයානුකූලව කටයුතු කිරීමට තරම් බරපතල යයි විනිශ්චය සභාව නිගමනය කරන්නේ නම්, එම නිලධරයාට විරුද්ධව ඉදිරිපත් වන චෝදනා සනාථ කෙරෙන ආකාරයේ කරුණු සහිත සම්පූර්ණ වාර්තාවක් විනිශ්චය සභාව විසින් චූදිත නිලධරයාගේ විනය බලධරයාට පිටපතක් සහිතව අදාළ සාක්ෂිකාර රාජ්‍ය නිලධරයාගේ විනය බලධරයා වෙත තම නිරීක්ෂණ හා නිර්දේශ සහිතව නොපමාව ඉදිරිපත් කළ යුතු වන්නේ ය.

20:4 උක්ත 20:3 උප වගන්තියට ප්‍රකාරව වාර්තාවක් ලබන විනය බලධරයකු එම වාර්තාව මත අදාළ රාජ්‍ය නිලධරයාට විරුද්ධව විනය ක්‍රියාමාර්ගයක් අනුගමනය කිරීමට තරම් කරුණු අඩංගු බවට සෑහීමකට පත් වන්නේ නම්, ඔහුට විරුද්ධව විනිශ්චය සභාව විසින් ඉදිරිපත් කොට ඇති චෝදනා සම්බන්ධයෙන්, චෝදනා පත්‍රයක් නිකුත් කර, ඒ සම්බන්ධයෙන් නිදහසට කරුණු විමසා, එම වරද මෙම සංග්‍රහයේ දෙවන උපලේඛනය යටතේ ඇති වරදක් ලෙස සලකා සුදුසු දඬුවම් නියම කළහැකි වන්නේ ය.

## 21. විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීම

21:1 විධිමත් විනය පරීක්ෂණයක විනිශ්චය සභාවක් ලෙස පත් කරනු ලැබූ නිලධරයකු අප්‍රමාදව හෝ විනය බලධරයා විසින් නියම කරනු ලබන කාලසීමාවක් තුළ හෝ අදාළ විධිමත් විනය පරීක්ෂණය පවත්වා නොපමාව පරීක්ෂණ වාර්තාව විනය බලධරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. යම් පාර්ශවයක් විසින් ඉදිරිපත් කරනු ලබන කරුණු යුක්තිය පසිඳලීම ප්‍රමාද කිරීමේ හෝ ව්‍යර්ත කිරීමේ හෝ පරමාර්ථයෙන් සිදු කරන බව පැහැදිලිව නිරීක්ෂණය වන අවස්ථාවන්හි දී පරීක්ෂණය කල් දැමීම සඳහා කරනු ලබන ඉල්ලීම් විනිශ්චය සභාව විසින් ප්‍රතික්ෂේප කළ යුතු ය.

21:2 චූදිත පක්ෂය, පිළිගත හැකි හේතූන් පිළිබඳව පූර්ව දැනුම්දීමකින් තොරව විධිමත් විනය පරීක්ෂණයකට පිටපිට දෙවතාවක් සහභාගීවීමට අපොහොසත් වී ඇති කල්හි ඊළඟ දිනයේ දී ද චූදිත පක්ෂය විධිමත් විනය පරීක්ෂණය සඳහා සහභාගී නොවන්නේ නම් තමන් විනය පරීක්ෂණය එක පාර්ශවිකව පැවැත්වීමට කටයුතු කරන බව විනිශ්චය සභාව විසින් චූදිත නිලධරයා වෙත ලේඛනගත තැපෑලෙන් දන්වා යැවිය යුත්තේ ය. විනය පරීක්ෂණය පැවැත්වීමට නියම කරනු ලබන ඊළඟ දිනයේ දී චූදිත පක්ෂය ඊට සහභාගීවීමට අපොහොසත් වුවහොත් එදින සිට ඉදිරි පරීක්ෂණ දිනයන්හි චූදිත පක්ෂය ඒ සඳහා සහභාගී වුව ද නොවුව ද විනය පරීක්ෂණය අඛණ්ඩව පවත්වාගෙන යාමට විනිශ්චය සභාව කටයුතු කළයුතු වන්නේ ය.

රා.ප.ච 30/2019 මගින් 21:2 උප වගන්තිය සංශෝධනය කර ඇත.

21:3 නගා ඇති චෝදනාවල ස්වභාවය අනුව විනිශ්චය සභාවට ඉදිරිපත් කොට ඇති ලේඛනගත සාක්ෂි මත පමණක් නිගමනයකට එළඹීමට පුළුවන. එපරිදිම විනිශ්චය සභාව වෙත ඉදිරිපත් කර ඇති වාචික සාක්ෂි පමණක් පදනම් කොට ගෙන ද නිගමනයකට එළඹීමට විනිශ්චය සභාවට බලය ඇත්තේ ය. එසේම තමන් වෙත ඉදිරිපත් වී ඇති ලේඛනගත සාක්ෂි හා වාචික සාක්ෂි යන දෙවර්ගයම පදනම් කොට ගෙන නිගමනයකට එළඹීමට ද විනිශ්චය සභාවට බලය ඇත්තේ ය.

21:4 විධිමත් විනය පරීක්ෂණයක් ආරම්භ වීමෙන් පසු චෝදනා පත්‍රය සංශෝධනය කරන ලද විටක දී සංශෝධනයන්ට අනුකූලව සාක්ෂිකරුවන් යළි කැඳවීමට, අලුත් සාක්ෂිකරුවන් කැඳවීමට සහ අවශ්‍ය යැයි සැලකෙන වෙනත් ලිපිලේඛන සලකා බැලීමට පැමිණිල්ල මෙහෙයවන නිලධරයා ඉල්ලා සිටින අවස්ථාවල දී විනිශ්චය සභාව විසින් ඒ සඳහා ඉඩ සැලසිය යුතු ය.

21:5 උක්ත 21:4 උප වගන්තියේ සඳහන් අවස්ථාවක දී අදාළ ලේඛන පරීක්ෂා කිරීමෙන් හෝ හරස් ප්‍රශ්න ඇසීමෙන් හෝ සංශෝධිත චෝදනා සම්බන්ධයෙන් තම නිර්දෝෂීභාවය ඔප්පු කිරීමට ප්‍රමාණවත් අවස්ථාවක් චූදිත නිලධරයාට ලබාදීමට විනිශ්චය සභාව ක්‍රියා කළ යුතු ය.

21:6 තම නිගමනයන්ට එළඹීම සඳහා සහාය විය හැකි අතිශයින්ම රහස්‍ය යැයි අවස්ථාචෝචිතව අදාළ බලධරයා විසින් නිගමනය කරන ලද ලියවිල්ලක් හැර, වෙනත් ලියවිල්ලක් හෝ ලේඛනයක් හෝ විනිශ්චය සභාව වෙත ඉදිරිපත් වී නොමැති අවස්ථාවක දී එවැනි ලිපිලේඛනයක් තමන් වෙත ඉදිරිපත් කරන ලෙස අදාළ පාර්ශවයන්ට නියෝග කිරීමට විනිශ්චය සභාවට බලය ඇත්තේ ය.

21:7 රහස්‍යභාවයෙන් යුක්ත බව අදාළ බලධරයා විසින් නිගමනය කරන ලද ලේඛනයක් කියවා බැලීමට විනිශ්චය සභාවට පුළුවන. එහෙත් එවැනි ලේඛනයක අඩංගු කරුණු චූදිත නිලධරයාට විරුද්ධව උපයෝගී කර ගැනීමට අදහස් කරන්නේ නම්, එම ලේඛන හෝ එහි අදාළ කොටස හෝ චූදිත නිලධරයාට හෝ ඔහුගේ රැකවරණ නිලධරයාට හෝ පෙන්විය යුත්තේ ය.

21:8 විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීම සඳහා මෙම සංග්‍රහයේ, නියමිත කාර්ය පටිපාටිය පිළිබඳ ඕනෑම කරුණක් සම්බන්ධයෙන් හෝ කාර්ය පටිපාටියට අදාළ හේතූන් මත පැනනඟින ඕනෑම විරෝධතාවයක් සම්බන්ධයෙන් හෝ විනිශ්චය සභාව විසින් ගනු ලබන තීරණය අවසාන තීරණය වන්නේ ය. එබැවින්, එබඳු කරුණුවල දී විනිශ්චය සභාව විසින් ගුරුපදේශ කොට ගත යුත්තේ "පරීක්ෂණයේ පරමාර්ථය වනුයේ අප්‍රමාදව සත්‍ය අසත්‍ය බව සොයා ගැනීම බැවින්, කාර්ය පටිපාටියම වූ හෝ අන්‍ය වූ හෝ නොසලකා හැරිය හැකි කරුණු නිසා පරීක්ෂණයට බාධාවක් වන්නට ඉඩ නොතැබිය යුතු ය" යන මූලධර්මය වේ.

21:9 චූදිත නිලධරයා හෝ ඔහුගේ රැකවරණ නිලධරයා හෝ චූදිත නිලධරයා වෙනුවෙන් වෙනත් පාර්ශවයන් හෝ විසින් විධිමත් විනය පරීක්ෂණය පවත්වාගෙන යෑමට බාධා පමුණුවන කල්හි, ඒ පිළිබඳ අදාළ විනය බලධරයා වෙත හේතු සාධක සහිතව වාර්තා කිරීමට විනිශ්චය සභාව විසින් අප්‍රමාදව පියවර ගත යුත්තේ ය.

21:10 විධිමත් විනය පරීක්ෂණයක දී විනිශ්චය සභාව නිගමනයකට එළඹිය යුත්තේ එම සභාවට ඉදිරිපත් වූ හෝ ලබාගත හැකි වූ හෝ හොඳම සාක්ෂි අනුව ය. එම සාක්ෂි අධිකරණයක දී පිළිගත හැකි සාක්ෂියක් වේ ද නැද්ද යන්න මෙහිදී සැලකිය යුතු නොවේ.

21:11 විධිමත් විනය පරීක්ෂණයක් පවත්වා ගෙන යන අතරතුර දී ඉදිරිපත් කරනු ලබන කිසියම් විරෝධතාවයක් වේ නම්, එය ද, ඒ පිළිබඳව අදාළ හේතූන් සහිත විනිශ්චය සභාවේ තීරණය ද, විනිශ්චය සභාව විසින් පරීක්ෂණ සටහන්වල හතරැස් වරහන් තුළ ලිවිය යුතු ය.

21:12 විධිමත් විනය පරීක්ෂණයක් පවත්වාගෙන යන අතරතුර දී නිලධරයකුගේ අත් අකුරු හෝ අත්සන් පිළිබඳව හෝ ගැටලුවක් උද්ගත වූ අවස්ථාවක දී එම නිලධරයාගේ අත් අකුරු හෝ අත්සන් හෝ මැනවින් හඳුනන සාක්ෂිකරුවන් දෙදෙනෙකු විසින් ඒ බව තහවුරු කරනු ලැබීම ප්‍රමාණවත් වන්නේ ය. එහෙත් අවශ්‍ය අවස්ථාවන්හි ඒ පිළිබඳව විශේෂඥ මතයක් වුව ද ලබාගැනීමට විනිශ්චය සභාවට බලය ඇත්තේ ය.

21:13 මූලික විමර්ශනයක දී සාක්ෂිකරුවකු විසින් කරනු ලැබ ඇති ලිඛිත ප්‍රකාශයක් සත්‍ය බව සාක්ෂිකරු විසින් විධිමත් විනය පරීක්ෂණයේ දී පිළිගන්නේ නම්, එහි අඩංගු කරුණු විධිමත් විනය පරීක්ෂණයට සාක්ෂි ලෙස ඉදිරිපත් වූවා සේ පිළිගත යුතු වන්නේ ය.

21:14 උක්ත 21:13 උප වගන්තිය ප්‍රකාරව තවදුරටත් කරුණු පැහැදිළි කරගැනීම අවශ්‍ය යැයි විනිශ්චය සභාව හෝ පැමිණිල්ල මෙහෙයවන නිලධරයා හෝ අදහස් කරන ඕනෑම කරුණක් සම්බන්ධයෙන් සාක්ෂිකරුවකුගෙන් ප්‍රශ්න කිරීමට ද එසේම සාක්ෂිකරුවකුගේ වාර්තාගත ප්‍රකාශය සම්බන්ධයෙන් හා පරීක්ෂණයේ දී ඔහුගෙන් ලබාගන්නා ලද වෙනත් ඕනෑම වාචික සාක්ෂියක් සම්බන්ධයෙන් හා හරස් ප්‍රශ්න ඇසීමට විත්ති පක්ෂයට අවසර දීමට ද විනිශ්චය සභාවට බලය ඇත්තේ ය.

21:15 විධිමත් විනය පරීක්ෂණයක දී චූදිත නිලධරයෙකුට තමා වෙනුවෙන් සාක්ෂි දීමට අවස්ථාව ඇත්තේ ය. එම සාක්ෂි ද හරස් ප්‍රශ්න ඇසීමට භාජනය කළ හැකි වන්නේ ය. එසේම චූදිත නිලධරයාට අවශ්‍ය වන්නේ නම්, සාක්ෂි දීමෙන් වැළකීමට හෝ ලිඛිත හෝ වාචික හෝ ප්‍රකාශයක් පමණක් ඉදිරිපත් කිරීමට හෝ හැකියාව ඇත්තේ ය.

21:16 සියලුම සාක්ෂිකරුවන් අදාළ විධිමත් විනය පරීක්ෂණයකට කැඳවිය යුත්තේ විනිශ්චය සභාව විසිනි. රජයේ නිලධරයන් වන සාක්ෂිකරුවන් කැඳවිය යුත්තේ ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන් මාර්ගයෙනි.

21:17 කිසියම් සාක්ෂිකරුවකු පරීක්ෂණයට කැඳවීමට අවසර දීමට පෙර හෝ කිසියම් ලේඛනයක් එකී පරීක්ෂණයට ඉදිරිපත් කරනු ලැබීමට පෙර හෝ එම සාක්ෂියෙහි හෝ ලේඛනයෙහි හෝ අදාළ භාවය පිළිබඳව විනිශ්චය සභාව සෑහීමකට පත්වීම අවශ්‍ය වන්නේ ය.

21:18 විධිමත්ව කැඳවනු ලැබ ඇති රජයේ නිලධරයකු නොවන සාක්ෂිකරුවකු පැමිණ නැත්නම් ද, ඔහුගේ පැමිණීම ඉඳුරාම අවශ්‍ය යැයි විනිශ්චය සභාව අදහස් කරන්නේ නම් ද පරීක්ෂණයට පැමිණෙන ලෙස එම සාක්ෂිකරුට බලකිරීමේ බලතල ලබාගත හැකි වන පරිදි, විනිශ්චය සභාව පරීක්ෂණ කොමිෂන් සභාවක් වශයෙන් සංස්ථාපනය කිරීම සඳහා (393 වැනි අධිකාරය වන) පරීක්ෂණ කොමිෂන් සභා පනතේ 2 වැනි වගන්තිය ප්‍රකාරව ඉල්ලීමක් කරනු ලැබිය හැකි වන්නේ ය.

21:19 යම්කිසි සාක්ෂිකරුවකුගේ සාක්ෂි සටහන් කරනු ලබන අවස්ථාවක දී වෙනත් කිසිම සාක්ෂිකරුවකුට එහි රැඳී සිටීමට විනිශ්චය සභාව විසින් අවකාශ නොදිය යුත්තේ ය.

21:20 සාක්ෂි සියල්ල සටහන් කරගත් පසු ප්‍රකාශයක් කිරීමට තමා කැමති බව කියා සිටීමට චූදිත නිලධරයාට පුළුවන. එබඳු අවස්ථාවක දී එම ප්‍රකාශය සම්බන්ධයෙන් හරස් ප්‍රශ්න අසනු ලැබීමට ඔහු යටත් නොවීම එහි සාක්ෂිමය අගය නිගමනය කිරීමේ සැලකිල්ලට ගත යුතු වන්නේ ය. එවැනි ප්‍රකාශයක් හරස් ප්‍රශ්ණ අසනු ලැබීමට භාජනය නොවූව ද එම ප්‍රකාශය සම්බන්ධයෙන් අවශ්‍ය යැයි හැඟෙන කරුණු පිළිබඳව පැහැදිලි කිරීමක් ඔහු වෙතින් කරවා ගැනීමට විනිශ්චය සභාවට බලය ඇත්තේ ය.

21:21 විධිමත් විනය පරීක්ෂණය පැවැත් වූ ආකාරය සම්බන්ධයෙන් විනය පරීක්ෂණයට සම්බන්ධිත පාර්ශවයන් විසින් යම් යම් විරෝධතාවයන් දක්වා තිබේ නම් ඒවා ද, එම විරෝධතා පිළිබඳ විනිශ්චය සභාවේ අදහස් ද පරීක්ෂණය අවසානයේ දී කාර්ය වාර්තාවෙහි සටහන් කළ යුතු වන්නේ ය. එවැනි විරෝධතා කිසිවක් නොතිබුණේ නම් පරීක්ෂණය පැවැත්වීම සම්බන්ධව සෑහීමකට පත්වූ බව සඳහන් කළ යුතු ය. පරීක්ෂණයට සම්බන්ධ අදාළ සියලුම පාර්ශවයන් විසින් කාර්ය වාර්තාව අත්සන් කළ යුතු ය.

21:22 විධිමත් විනය පරීක්ෂණයක එක් එක් පරීක්ෂණ දින අවසානයේ දී සාක්ෂිකරුවන්ගේ සාක්ෂි ඇතුළත් පරීක්ෂණ සටහන්වල සහතික නොකළ පිටපත් විනිශ්චය සභා විසින් පැමිණිල්ල මෙහෙයවන නිලධරයාට හා චූදිත නිලධරයාට හෝ ඔහුගේ රැකවරණ නිලධරයාට හෝ ලබාදිය යුත්තේ ය.

21:23 විනිශ්චය සභාව තමන් විසින් ගනු ලබන තීරණය පිළිබඳව කිසිදු ඉඟියක් කිසිදු අවස්ථාවක දී කිසිම පුද්ගලයෙකු වෙත නොකළ යුත්තේ ය.

21:24 විධිමත් විනය පරීක්ෂණයක් අවසානයේ දී තම ලිඛිත ප්‍රකාශන එදින සිට දින දාහතරක් ඇතුළත තමා වෙත ඉදිරිපත් කරන ලෙස විනිශ්චය සභාව විසින් පැමිණිල්ල මෙහෙය වන නිලධරයාට සහ චිත්ති පක්ෂයට දන්වා සිටිය යුතු ය. කෙසේ වෙතත් පරීක්ෂණයේ ස්වභාවය හෝ නොවැළැක්විය හැකි හේතූන් මත හෝ ලිඛිත ප්‍රකාශය ඉදිරිපත් කිරීම සඳහා දින දාහතරක කාලයක් ප්‍රමාණවත් නොවේ යැයි විනිශ්චය සභාව අදහස් කරන අවස්ථාවල දී ඒ සඳහා සාධාරණ කාලයක් නියම කිරීමට විනිශ්චය සභාවට බලය ඇත්තේ ය. දින දාහතරක් ඇතුළත හෝ විනිශ්චය සභාව විසින් නියම කරන ලද කාලය ඇතුළත හෝ ලිඛිත ප්‍රකාශ ඉදිරිපත් කිරීමට අදාළ පාර්ශවයන් අපොහොසත් වුවහොත් ලිඛිත ප්‍රකාශන ඉදිරිපත් නොකළා සේ සලකා සිය අවසාන වාර්තාව අප්‍රමාදව අදාළ විනය බලධරයා වෙත ඉදිරිපත් කිරීමට විනිශ්චය සභාව කටයුතු කළයුතු වන්නේ ය. ඉදිරිපත් කරනු ලැබ ඇති ලිඛිත ප්‍රකාශයන් පරීක්ෂණ වාර්තාවේ කොටසක් ලෙස සලකා එහි ඇමුණුම් වශයෙන් ඉදිරිපත් කළයුතු වන්නේ ය.

21:25 තීරණයකට එළඹීමේ දී ඒ සඳහා ආධාර කරගත හැකි, එහෙත් සාක්ෂිවල දී ඉදිරිපත් කර නොමැති ලේඛනයක් වුව ද, ඇසුරු කර ගැනීමට විනිශ්චය සභාවට පුළුවන. එතෙකුදු වුවත්, එබඳු ලේඛනයක් නියම සාක්ෂියක් වශයෙන් සැලකිය යුතු නොවේ.

21:26 විනිශ්චය සභා වාර්තාව සැකසීමේ දී අදාළ වන අනෙකුත් කරුණු ද සමඟ පහත සඳහන් කරුණු අනිවාර්යයෙන්ම ඇතුළත් කර තිබිය යුතු වන්නේ ය.

21:26:1 සිද්ධිය පිළිබඳ පසුබිම සැකෙවින්

21:26:2 විධිමත් විනය පරීක්ෂණය පැවැත් වූ ආකාරය පිළිබඳ පොදු කරුණු

21:26:3 එක් එක් චෝදනාවට අදාළව ඉදිරිපත් කර ඇති සාක්ෂි සම්පිණ්ඩනය

21:26:4 එක් එක් චෝදනාව පිළිබඳ ඉදිරිපත් වී ඇති සාක්ෂි විශ්ලේෂණය සහ එක් එක් චෝදනා සම්බන්ධයෙන් විනිශ්චය සභාවේ නිගමන.

21:26:5 චූදිත නිලධරයා එක් චෝදනාවකට හෝ වරදකරු බව නිගමනය කර ඇත්නම් එම චෝදනාවල බරපතලකම පිළිබඳව විනිශ්චය සභාවේ මතය සහ විනය බලධරයා විසින් දඬුවමක් නියම කිරීමේ දී සැලකිල්ලට ගතයුතු කරුණු පිළිබඳව විනිශ්චය සභාවේ අදහස්

21:26:6 පරීක්ෂණයේ දී ඉදිරිපත් වූ කරුණු අනුව පරීක්ෂණයට ඉදිරිපත් වූ සාක්ෂිකරුවකු හෝ චූදිත නිලධරයා හෝ වෙනත් රාජ්‍ය නිලධරයකු හෝ විසින් වෙනත් විෂමාචාරයක් සිදුකර ඇති බවට විනිශ්චය සභාව වෙත කරුණු ඉදිරිපත් වී ඇත්නම්, ඊට සම්බන්ධිත පාර්ශවයන්ට විරුද්ධව විනයානුකූලව කටයුතු කිරීමට හැකිවන සේ අදාළ සියලු විස්තර.

21:26:7 විනය පරීක්ෂණය අදාළ වූ සිදුවීම තුළින් හෙළිදරව් වූ කරුණු අනුව රාජ්‍ය සේවයේ ඉදිරි යහපැවැත්ම පිණිස මෙවැනි සිදුවීම් නැවත සිදුවීම වැළැක්වීම හෝ සීමා කිරීම හෝ සඳහා පරිපාලනයේ හෝ කාර්ය පටිපාටියේ හෝ කළ යුතු යම් වෙනස්කම් පිළිබඳ විනිශ්චය සභාවේ නිරීක්ෂණ හා යෝජනා

21:27 විනිශ්චය සභාව විසින් පරීක්ෂණය අවසන් කළ පසු යතුරුලියනය කරන ලද විනිශ්චය සභාවේ වාර්තාව සමඟ විනය පරීක්ෂණයේ කාර්ය වාර්තාව ද අදාළ සියලුම ලිපිලේඛන හා ඉදිරිපත් කරන ලද අනෙකුත් දේවල් ද අප්‍රමාදව අදාළ විනය බලධරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. අසාමාන්‍ය ලෙස පරීක්ෂණ වාර්තාව ඉදිරිපත් කිරීමට ප්‍රමාදයක් වී ඇති අවස්ථාවක දී එම ප්‍රමාදයන් සඳහා හේතූන් පරීක්ෂණ වාර්තාව සමඟ ඉදිරිපත් කළයුතු වන්නේ ය.

21:28 විධිමත් විනය පරීක්ෂණයක දී සාක්ෂි වශයෙන් පැමිණිලි පක්ෂයෙන් හෝ විත්ති පක්ෂයෙන් හෝ විනිශ්චය සභාව වෙත ඉදිරිපත් කරනු නොලැබුව ද තම නිගමනයන්ට එළැඹීමේ දී අදාළ කාලපරිච්ඡේදය තුළ දී රටේ බලපැවැත් වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, ව්‍යවස්ථාපිත අණපනත්, ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි, අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු චක්‍රලේඛ, ඒ ඒ රාජ්‍ය ආයතන විසින් නිකුත් කර ඇති විධිමත් ස්ථාවර නියෝග හා අනුමත කාර්ය පටිපාටි ආදිය පරිශීලනය කිරීමට විනිශ්චය සභාවට බලය ඇත්තේ ය.

## 22. විනය බලධරයාගේ කාර්යභාරය

22:1 විධිමත් විනය පරීක්ෂණයක කටයුතු පවත්වාගෙන යන ආකාරය නිරීක්ෂණය කිරීමේ දී අදාළ පරීක්ෂණය අනවශ්‍ය ලෙස ප්‍රමාදවන බව පැහැදිලිව පෙනී යන්නේ නම්, එම ප්‍රමාදයන් වැළැක්වීම සඳහා ඒ ඒ අවස්ථාවන්හිදී නිසි පියවර ගැනීම විනය බලධරයාගේ වගකීම වන්නේ ය.

රා.ප.ච 30/2019 මඟින් 22:1 උප වගන්තිය සංශෝධනය කර ඇත.

22:2 විධිමත් විනය පරීක්ෂණයක් පවත්වා ගෙන යන අතරතුර දී පරීක්ෂණය කල්දැමීම මඟින්, ගමන් වියදම්, පරීක්ෂණ සඳහා ගෙවීම් සඳහා රජයට සිදුවන වියදම් අවම කර ගැනීමට හැකිවන සේ එම පරීක්ෂණයේ කටයුතු ආරම්භයේ සිට අවසානය දක්වා නිරන්තර අවධානයකින් යුතුව නිරීක්ෂණය කර අවශ්‍ය අවස්ථාවන්හි දී නිසි පියවර ගැනීම විනය බලධරයාගේ වගකීම වන්නේ ය.

22:3 තමන් විසින් විනය නියෝගයක් නිකුත් කළයුතුව තිබෙන විධිමත් විනය පරීක්ෂණයක අවසාන වාර්තාව සහ අදාළ ලේඛන අප්‍රමාදව තමා වෙත ගෙන්වා ගැනීමට කටයුතු කිරීම විනය බලධරයාගේ වගකීම වන්නේ ය.

22:4 විනය බලධරයෙකු වෙත ඉදිරිපත් කරනු ලබන විධිමත් විනය පරීක්ෂණයක වාර්තාව සුපරීක්ෂාකාරී ලෙස අධ්‍යයනය කොට අප්‍රමාදව තම විනය නියෝගය නිකුත් කිරීම විනය බලධරයෙකුගේ වගකීම වන්නේ ය. මෙහි දී "යුක්තිය පසිඳලීම ප්‍රමාද කිරීම යුක්තිය ඉටු නොකිරීමක් වන්නේ ය" යන ආප්තය විනය බලධරයා විසින් සැලකිල්ලට ගතයුතු වන්නේ ය.

22:5 විනිශ්චය සභාව විසින් තමන් වෙත ඉදිරිපත් කරනු ලබන විධිමත් විනය පරීක්ෂණ වාර්තාව සුපරීක්ෂාකාරී ලෙස අධ්‍යයනය කිරීමෙන් පසු විනය බලධරයෙකුට පහත සඳහන් තීරණයන්ට එළැඹීමට බලය ඇත්තේ ය.

22:5:1 චූදිත නිලධරයා සියලුම චෝදනාවන්ට හෝ චෝදනා කිහිපයකට හෝ එක් චෝදනාවකට හෝ වරදකරු කිරීම.

22:5:2 චූදිත නිලධරයා සියලුම චෝදනාවන්ට හෝ චෝදනා කිහිපයකට හෝ එක් චෝදනාවකට හෝ නිවැරදිකරු කිරීම.

22:5:3 අදාළ විධිමත් විනය පරීක්ෂණය සම්පූර්ණයෙන්ම නිෂ්ප්‍රභ කොට අලුත් විනය පරීක්ෂණයක් පැවැත්වීම.

22:6 උක්ත 22:5:1 හා 22:5:2 යටතේ විනය බලධරයා විසින් නිගමනයකට එළඹීමේ දී, තමා වෙත ඉදිරිපත් වී ඇති විනිශ්චය සභාවේ නිගමන සියල්ලම හෝ නිගමන කීපයක් හෝ එක් නිගමනයක් හෝ පිළිගැනීමට, ප්‍රතික්ෂේප කිරීමට නැතහොත් ප්‍රතිශෝධනය කිරීමට විනය බලධරයාට බලය ඇත්තේ ය.

22:7 උක්ත 22:6 උප වගන්තිය යටතේ විනිශ්චය සභාවක නිගමන සියල්ලම හෝ නිගමන කීපයක් හෝ එක් නිගමනයක් හෝ ප්‍රතික්ෂේප කිරීම නැතහොත් ප්‍රතිශෝධනය කිරීම සිදුකරන අවස්ථාවක දී එම තීරණයට පදනම් කරගනු ලැබූ සියලු හේතු සාධක විනය බලධරයා විසින් අදාළ විනය ගොනුවේ පැහැදිලිවත්, නිශ්චිතවත් සටහන් කර තැබිය යුත්තේ ය.

22:8 උක්ත 22:5:3 යටතේ විධිමත් විනය පරීක්ෂණයක් නිෂ්ප්‍රභ කිරීමට විනය බලධරයා විසින් තීරණය කළ යුත්තේ විනිශ්චය සභාව විසින් අදාළ විනය පරීක්ෂණය නිසි ආකාරයට සහ අනුමත කාර්ය පටිපාටියට අනුකූල නොවන අන්දමින් සිදුකර ඇති විටක දී හෝ පැමිණිල්ල මෙහෙයවන නිලධරයා රජයේ අයිතිවාසිකම් සුරැකෙන ආකාරයෙන් පැමිණිල්ල මෙහෙයවීම සිතාමතාම හෝ නොසැලකිල්ලෙන් හෝ අනවධානයෙන් හෝ යථා පරිදි සිදුකර නොමැති අවස්ථාවක දී පමණක් වේ.

22:9 උක්ත 22:8 උප වගන්තිය යටතේ තීරණයක් ගන්නා අවස්ථාවක දී තමාගේ එම තීරණයට පදනම් වූ සියලුම හේතු සාධක විනය බලධරයා විසින් අදාළ විනය ගොනුවේ ඉතා පැහැදිලිවත්, නිශ්චිතවත් සටහන් කර තැබිය යුත්තේ ය.

## 23. විනය නියෝගය

23:1 විනය බලධරයෙකු විසින් පනවනු ලබන විනය නියෝගයක පහත සඳහන් කරුණු අනිවාර්යයෙන්ම ඇතුළත් වී තිබිය යුතු ය.

23:1:1 චූදිත නිලධරයාට විරුද්ධව අදාළ චෝදනා පත්‍රය මඟින් නඟා ඇති එක් එක් චෝදනාවට ඔහු වැරදිකරු ද නැතහොත් නිවැරදිකරු ද යන වග

23:1:2 වරදකරු වී ඇති චෝදනා සම්බන්ධයෙන් පනවනු ලබන දඬුවම් හා/හෝ කොන්දේසි.

23:2 විනය බලධරයකු විසින් චූදිත නිලධරයෙකුට විරුද්ධව නඟා ඇති සියලුම චෝදනාවලින් ඔහු නිදහස් වී ඇති බව තීරණය කරන්නේ නම් එම තීරණය වහාම චූදිත නිලධරයා වෙත දැන්විය යුතු ය. ඔහු අදාළ චෝදනා සම්බන්ධයෙන් වැඩ තහනමට භාජනය වී සිටින්නේ නම් නැවත සේවයේ පිහිටුවීමේ නියෝගයක් ද, වැඩ තහනම් කළ කාලයේ නොගෙවා සිටි වැටුප් කිසිවක් ඇත්නම් ඒවා ගෙවන ලෙසට කරන නියෝගයක් ද විනය නියෝගයේ අන්තර්ගතව තිබිය යුතු වන්නේ ය.

23:3 චූදිත නිලධරයාට විරුද්ධව නඟා තිබූ සියලුම චෝදනාවලට හෝ චෝදනා කීපයකට හෝ එක් චෝදනාවකට හෝ ඔහු වරදකරු බවට විනය බලධරයා විසින් නිගමනය කර ඇති විටක දී, වරදකරු බවට නිගමනය කර ඇති එක් එක් චෝදනාව සඳහා වෙන් වෙන්ව දඬුවම් පැනවීමට හෝ වරදකරු වී ඇති චෝදනාවන් සඳහා පොදුවේ දඬුවමක් හෝ දඬුවම් හෝ පැනවීමට හෝ විනය බලධරයාට බලය ඇත්තේ ය.

23:4 පනවන ලද විනය නියෝගය සේවයෙන් පහකිරීමක් නොවන අවස්ථාවක දී, චූදිත නිලධරයා වැඩ තහනමකට භාජනය වී සිටින්නේ නම්, ඔහු වහාම නැවත සේවයේ පිහිටුවීමේ නියෝගයක් ද, වැඩ තහනමකට භාජනය වී සිටි කාලය තුළ දී නොගෙවා රඳවාගන්නා ලද වැටුප් හා දීමනා කිසිවක් වේ නම් එම වැටුප් හා දීමනාවලින් කුමන ප්‍රතිශතයක් ඔහු වෙත ගෙවිය යුතු ද යන්න හෝ සියලුම හිඟ වැටුප් හා දීමනා නොගෙවිය යුතු වන්නේ ද යන්න හෝ පිළිබඳ තීරණය ද විනය නියෝගයේ ඇතුළත් වී තිබිය යුතු වන්නේ ය.

23:5 විනය නියෝගයේ දඬුවමක් වශයෙන් චූදිත නිලධරයා වෙත අනිවාර්ය ස්ථාන මාරුවීමක් නියෝග කොට ඇති විටක දී නිලධරයා ස්ථානමාරු කරනු ලබන නව සේවා ස්ථානය හැකි සෑම අවස්ථාවක දීම විනය නියෝගයේ අඩංගු විය යුතු ය. එසේ නියෝග කරනු ලබන ස්ථාන මාරුවීම්වල දී ගමන් වියදම් හා උපවේශන දීමනා ආදිය ලබාගැනීමට චූදිත නිලධරයාට හිමිකමක් නොමැත්තේ ය.

23:6 අධිභාරයක් වශයෙන් හෝ රජයට සිදු වූ අලාභහානි සම්බන්ධයෙන් හෝ චූදිත නිලධරයාගෙන් යම් මුදලක් අය කර ගැනීම හෝ විනය නියෝගයේ කොටසක් වන අවස්ථාවල දී එම මුදල් අයකර ගැනීම අදාළ ගණන් දීමේ නිලධරයාගේ වගකීම වන්නේ ය. විනය නියෝගයේ සඳහන් කොට ඇති ආකාරයට නිලධරයා වෙත යම් හිඟ වැටුපක් හෝ දීමනාවක් හෝ ගෙවිය යුතු වන්නේ නම් එම ගෙවීම් කළ යුතු වන්නේ නිලධරයා වෙතින් රජයට අයකර ගැනීමට ඇති මුදල අයකර ගැනීමෙන් අනතුරුව ය.

23:7 සේවයෙන් පහකිරීමේ දඬුවමක් ලැබ සිටින චූදිත නිලධරයෙකුගෙන් අධිභාරයක් වශයෙන් හෝ සිදුකර ඇති අලාභයක් සම්බන්ධයෙන් හෝ රජයට යම් මුදලක් අයකොට ගත යුතුව තිබේනම් එම මුදල අය කර ගැනීම සඳහා අවශ්‍ය අවස්ථාවන්හිදී අප්‍රමාදව අධිකරණමය ක්‍රියාමාර්ගයක් අනුගමනය කිරීම අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානයාගේ වගකීම වන්නේ ය.

23:8 දෙවන උපලේඛනය යටතට වැටෙන වරදක් සම්බන්ධයෙන් වරදකරු වී ඇති චූදිත නිලධරයෙකු වෙත පැනවිය හැකි වන්නේ පහත 24:2 උපවගන්තියේ සඳහන් සුළු දඬුවමක් පමණි.

23:9 විධිමත් විනය පරීක්ෂණයක් අවසානයේ දී හෝ නිදහසට කරුණු විමසීමකින් පසු හෝ විනය බලධරයා විසින් චූදිත නිලධරයා වෙත පනවනු ලබන දඬුවම ක්‍රියාත්මක කළයුතු දිනය ලෙස සැලකිය යුතු වන්නේ චූදිත නිලධරයා චෝදනාවට සම්බන්ධ වරද කළ දිනය විය යුත්තේ ය.

## 24. දඬුවම්

24:1 දඬුවම් සුළු හා බරපතල යනුවෙන් කොටස් දෙකකි. සුළු දඬුවම් අදාළ වනුයේ දෙවන උපලේඛනයේ දැක්වෙන වැරදිවලට හා ඊට සමාන වන වැරදිවලටය. බරපතල දඬුවම් අදාළ වනුයේ පළමුවන උපලේඛනයේ දැක්වෙන වැරදිවලට හා ඊට සමාන වන වැරදිවලට ය.

**24:2 සුළු දඬුවම්**

24:2:1 තරවටු කිරීම (අවවාද කිරීම හෝ තදින් අවවාද කිරීම දඬුවමක් නොවේ.)

24:2:2 තදින් තරවටු කිරීම

24:2:3 දෝෂ දර්ශනයට ලක් කිරීම.

24:2:4 එක් අවුරුද්දකට වැඩි නොවන කාලයකට වැටුප් වර්ධකය අත්හිටුවීම

24:2:5 එක් අවුරුද්දකට වැඩි නොවන කාලයකට වැටුප් වර්ධකය නතර කිරීම

24:2:6 විනය හේතු පිට කෙරෙන ස්ථාන මාරුවීමක් වශයෙන් නිලධරයාගේ වියදමින් ඔහු වෙනත් ස්ථානයකට මාරු කිරීම

24:2:7 සතියක වැටුපට වැඩි නොවන දඩයක්

24:2:8 ඉහත සඳහන් කරන ලද දඬුවම්වලට වඩා බරපතල නොවන සහ සමාන වන අදාළ විනය බලධරයා විසින් තීරණය කරනු ලබන වෙනත් ආකාරයක දඬුවමක්

**24:3** **බරපතල දඬුවම්**

24:3:1 සේවයෙන් පහ කිරීම

24:3:2 පරිවාස කාලයේ පසුවන නිලධරයෙකුගේ සේවය අවසන් කිරීම

24:3:3 සාමාන්‍ය අකාර්යක්ෂමතාවය මත විශ්‍රාම ගැන්වීම

24:3:4 සේවයෙන් පහ කිරීම වෙනුවට සානුකම්පික විකල්පයක් වශයෙන් අනිවාර්යයෙන් විශ්‍රාම ගැන්වීම.

24:3:5 වෛකල්පික විශ්‍රාම ගන්නා වයසින් ඔබ්බට සේවා දිගු ලබා නොදීම.

රා.ප.ච 28/2017 මඟින් 24:3:5 උප වගන්තිය සංශෝධනය කර ඇත.

24:3:6 ජ්‍යෙෂ්ඨත්වයෙන් පහළ දැමීම (එනම් නිලධරයා අයත්වන ශ්‍රේණියේ නියමිත පියවර ගණනකින් පහළ දැමීම)

24:3:7 නිල තත්ත්වයෙන් පහළ දැමීම (එනම් ඔහු අයත්වන සේවයේ ඊළඟ පන්තියට හෝ ශ්‍රේණියට ප්‍රත්‍යාවර්තනය කිරීම)

24:3:8 ඔහු කිසියම් "සේවයකට" අයත් නොවී දෙපාර්තමේන්තු තනතුරක් දරන අවස්ථාවක දී නම් ඒ තනතුරට වඩා නිල තත්ත්වයෙන් පහළ තනතුරකට යැවීම.

24:3:9 නිලධරයා ලබමින් සිටි වැටුප නියම කරනු ලබන වැටුප් වර්ධක ගණනකින් අඩු කිරීම.

24:3:10 නිලධරයාගේ වැටුප් වර්ධක විලම්භනය කිරීම

24:3:11 නිශ්චිත කාලපරිච්ඡේදයක් ගතවන තුරු උසස්වීම් විලම්භනය කිරීම

24:3:12 නිශ්චිත කාලපරිච්ඡේදයක් ගතවන තුරු කිසිම උසස් කිරීමේ පරීක්ෂණයකට පෙනී සිටීමට නුසුදුස්සකු කිරීම.

24:3:13 ඉහත සඳහන් කරන ලද දඬුවම්වලට වඩා බරපතල නොවන සහ සමාන වන අදාළ විනය බලධරයා විසින් තීරණය කරනු ලබන වෙනත් ආකාරයක දඬුවමක්

24:4 උක්ත 24:2:6 යටතේ චූදිත නිලධරයෙකු වෙත පනවනු ලබන දඬුවමක් වශයෙන් විනයානුකූල ස්ථාන මාරුවීමක් නියෝග කළ හැකි යයි සඳහන්ව තිබීම නිසා මෙම සංග්‍රහය යටතේ විනය ක්‍රියාමාර්ගයක් ගැනීමට පියවර නොගෙන එබඳු ස්ථාන මාරුවීමක් නියෝග කිරීමට නිසි බලය පැවරී ඇති බලධරයාට නොහැකි බවක් මෙයින් අදහස් නොවන්නේ ය. එහෙයින් මෙම සංග්‍රහයේ නියමයන් ගැන නොසලකා මාරු කිරීමේ බලධරයාට හුදෙක් තම අභිමතය පරිදි කිසියම් නිලධරයෙකු ඒ නිලධරයාගේ වියදමින්ම වෙනත් ස්ථානයකට මාරු කර යැවීමට පුළුවන. එසේ වුව ද නිලධරයාට විරුද්ධව අදාළ චෝදනා සම්බන්ධයෙන් පසුකාලීනව පවත්වනු ලබන විනය ක්‍රියා පටිපාටියක දී කිසිම චෝදනාවක් ඔප්පු නොවුවහොත් ඔහුට ලබාදුන් ස්ථාන මාරුවීම සාමාන්‍ය ස්ථාන මාරුවීමක් ලෙස සලකා ආයතන සංග්‍රහය අනුව ඔහුට ලැබිය යුතු සියලුම දීමනා ලබා දිය යුත්තේ ය.

24:5 චූදිත නිලධරයකු වෙත විනය නියෝගයේ කොටසක් වශයෙන් ස්ථාන මාරු නියෝගයක් නිකුත් කර ඇති අවස්ථාවක දී අදාළ නිලධරයාට තමන් සේවය කළ කාර්යාලයේ කුමන තනතුරකට හෝ නැවත ස්ථාන මාරුවීමක් ලබාගත හැක්කේ කිනම් කාලයකට පසුවදැයි යන්න විනය නියෝගයේ නිශ්චිතව සඳහන් කළ යුතු ය.

24:6 විනය නියෝගයක කොටසක් වශයෙන් වැටුප් වර්ධක විලම්භනය කිරීම හෝ වැටුප් අඩු කිරීමක් හෝ වැටුප නැවැත්වීමක් හෝ නියෝග කොට ඇති අවස්ථාවක දී එය ක්‍රියාත්මක කළයුතු වන්නේ නිලධරයා අවසාන වරට ලබාගනු ලැබූ වැටුප් තලය පදනම් කරගෙන ය.

රා.ප.ච18/2013 මගින් 24:6 උප වගන්තිය සංශෝධනය කර ඇත

උදා :- 1990.01.01 දින වැඩ තහනමකට භාජනය කළ නිලධරයකුගේ ඊළඟ වැටුප් වර්ධක දිනය 1990.06.01 දිනට නියමිතව ඇති අවස්ථාවක දී විනය නියෝගයක් වශයෙන් 1992.02.01 දින ඔහුගේ එක් අවුරුද්දක වැටුප් වර්ධකයක් විලම්භනය කරන ලෙස විනය බලධරයා නියෝග කොට ඇත්නම් විලම්භනය කිරීමට භාජනය කළ යුත්තේ අදාළ නිලධරයාට 1990.06.01 දිනට ලැබීමට තිබූ වැටුප් වර්ධකය වේ. ඊළඟ වර්ෂවල වැටුප් වර්ධක ඔහු සේවයේ යෙදී නොසිටිය ද ඔහු වෙත ලබාදිය යුතු ය.

24:7 විනය නියෝගයේ කොටසක් වශයෙන් වැඩ තහනම් කර තිබූ කාල පරිච්ඡේදය සඳහා හිඟ වැටුප් නොගෙවීමට නියෝග කර ඇත්නම් නිලධරයෙකුට ඔහුට ලැබිය හැකිව තිබූ වැටුප් වර්ධක සඳහා හිඟ වැටුප් ලබා ගැනීමට අයිතියක් නැත්තේ ය. එසේ වුව ද ඔහු සේවයේ යෙදී නොසිටි බව නොසලකා අදාළ නිලධරයාට ලැබිය හැකිව තිබූ වැටුප් වර්ධක මත වැටුප් පරිමාණයේ අදාළ පියවරේ තබා වැටුප් ගෙවිය යුතු ය.

24:8 සේවයෙන් පහ කිරීම වෙනුවට සානුකම්පික විකල්පයක් වශයෙන් අනිවාර්යයෙන් විශ්‍රාම ගැන්වීමේ නියෝගයක් නිකුත් කිරීමට, අමාත්‍ය මණ්ඩලයට සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවට හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කමිටුවකට හෝ හැර වෙනත් විනය බලධරයකුට බලය නැත. මෙය වනාහි අභියාචනා බලධරයා සතු විශේෂ අයිතිවාසිකමකි. එබඳු නියෝගයක් කළ යුතු දැයි සලකා බැලිය යුත්තේ විධි ප්‍රකාරව අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබුවහොත් පමණකි. එබඳු අවස්ථාවක දී සලකා බැලිය යුත්තේ දීර්ඝ වූ ද, ප්‍රශංසනීය වූ ද පූර්ව වාර්තාවක් ඇති නිලධරයෙකු සම්බන්ධයෙනි.

## 25. ලඝු විනය කාර්ය පටිපාටිය යටතේ දඬුවම් පැමිණවීම

25:1 රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් චූදිත නිලධරයන්ට සුළු දඬුවම් පැමිණවීම සම්බන්ධයෙන් විධිමත් ලෙස බලය පවරා ඇති රාජ්‍ය නිලධරයන් විසින් ලඝු ක්‍රියා පටිපාටි අනුගමනය කිරීම මඟින් එවැනි දඬුවම් පැමිණවීමට ක්‍රියා කළ හැක්කේ ය.

25:2 උක්ත 25:1 උප වගන්තිය ප්‍රකාරව කටයුතු කළයුතු වන්නේ සිදුකර ඇතැයි වාර්තා වී ඇති වරද විධිමත් විනය කාර්ය පටිපාටිය අනුගමනය කිරීමට තරම් බරපතල විෂමාචාරයක් නොවන අවස්ථාවන් හි දී පමණකි.

25:3 උක්ත 25:1 උප වගන්තිය ප්‍රකාරව නිසි බලය හිමි වූ නිලධරයෙකු විසින් යටත් නිලධරයෙකුට විරුද්ධව ලඝු ක්‍රියා පටිපාටියක් මත විනය පියවර ගැනීමට අදහස් කරන කල්හි චූදිත නිලධරයා විසින් සිදු කරනු ලැබ ඇතැයි අනාවරණය වී ඇති විෂමාචාරය ඔහු වෙත ලිඛිතව දන්වා එම විෂමාචාරය හේතුවෙන් ඔහුට දඬුවම් නොපැමිණවීමට හේතු ඇත්නම් අවස්ථාවෝචිත පරිදි සුදුසු හා සාධාරණ කාලසීමාවක් ඇතුළත ලිඛිතව ඉදිරිපත් කරන ලෙස නියෝග කළ යුත්තේ ය. නියමිත කාලසීමාව තුළ දී නිදහසට කරුණු ඉදිරිපත් කිරීමට චූදිත නිලධරයා අපොහොසත් වී ඇති විටක දී ඉදිරිපත් කිරීමට තරම් නිදහසට කරුණු චූදිත නිලධරයාට නොමැති සේ සලකා නිසි කටයුතු කරන බව ද එම ලිපියේ සටහන් කළ යුතු ය.

25:4 උක්ත 25:3 උප වගන්තිය ප්‍රකාරව නිදහසට කරුණු ඉදිරිපත් කරන ලෙස නියෝග ලත් නිලධරයකු, නියමිත කාලය තුළ දී ඉදිරිපත් කොට ඇති නිදහසට කරුණු, සිදුකර ඇතැයි වාර්තා වී ඇති වරද සම්බන්ධයෙන් ඔහු නිදහස් කිරීමට තරම් ප්‍රමාණවත් නොවන විටක දී හෝ නියමිත කාලය තුළ දී ස්වකීය නිදහසට කරුණු ඉදිරිපත් කිරීමට චූදිත නිලධරයා අපොහොසත් වී ඇති

විටක දී හෝ බලයලත් නිලධරයා හට වරදේ ස්වභාවය අනුව 25:5 උප වගන්තියට ප්‍රකාරව දඬුවම් නියම කළ හැක්කේ ය.

25:5 ලඝු ක්‍රියා පටිපාටිය යටතේ වරදකරු බවට නිගමනය කරනු ලබන නිලධරයකුට පැනවිය හැකි දඬුවම, ඔහුගේ එක් දිනක වැටුපට සමාන දඩයකට වඩා බරපතල නොවිය යුත්තේ ය.

25:6 උක්ත 25:5 උප වගන්තිය ප්‍රකාර ලඝු ක්‍රියා පටිපාටිය යටතේ සුළු දඬුවම්වලට භාජනය වන නිලධරයන්ට එම දඬුවම්වලට විරුද්ධව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අභියාචන බලතල පවරා ඇති නිලධරයකු වෙත හෝ අභියාචනා ඉදිරිපත් කළ හැකි වන්නේ ය.

## 26. විනය නියෝගවලට විරුද්ධව අභියාචනා ඉදිරිපත් කිරීම සහ විනය නියෝග ප්‍රතිශෝධනය කිරීම.

26:1 අමාත්‍ය මණ්ඩලය හැර වෙනත් විනය බලධරයෙකු විසින් යම් විනය නියෝගයක් නිකුත් කිරීමෙන් පසු එකී නියෝගය ප්‍රතිශෝධනය කිරීම හෝ වෙනස් කිරීම හෝ අහෝසි කිරීම හෝ එම විනය බලධරයා විසින්ම කළ හැකි වන්නේ හුදෙක්ම එම නියෝගයේ පවත්නා දෝෂයක්, අක්‍රමවත් බවක් හෝ නිවැරදි කිරීමේ අවශ්‍යතාවය සඳහා පමණි. තමන් විසින්ම නිකුත් කරන ලද විනය නියෝගයක් ප්‍රතිශෝධනය කිරීමට හෝ වෙනස් කිරීමට හෝ අහෝසි කිරීමට හෝ එම විනය බලධරයා ඉහත පරිදි තීරණය කරන ලද අවස්ථාවක දී ඊට පදනම් වූ සියලුම කරුණු පැහැදිලිව, නිශ්චිතව අදාළ විනය ගොනුවේ සටහන් කර තැබිය යුත්තේ ය.

26:2 විනය බලධරයකු විසින් නිකුත් කොට ඇති විනය නියෝගයක් සම්බන්ධයෙන් විනය නියෝගයට පාත්‍ර වූ නිලධරයා විසින් නියමිත කාලපරිච්ඡේදය තුළ ඉදිරිපත් කරනු ලබන අභියාචනයක සඳහන් කරුණු මත අදාළ වන පරිදි අභියාචනා බලධාරීත්වය දරන අමාත්‍ය මණ්ඩලයට හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවට හෝ කොමිෂන් සභාවේ කමිටුවකට හෝ පනවා ඇති විනය නියෝගය ප්‍රතිශෝධනය කිරීමට හෝ වෙනස් කිරීමට හෝ අහෝසි කිරීමට හෝ බලය ඇත්තේ ය.

26:3 විනය බලධරයකු විසින් පනවනු ලැබූ යම් විනය නියෝගයකට පාත්‍ර වූ රාජ්‍ය නිලධරයෙකුට එම විනය නියෝගයට එරෙහිව අදාළ වන පරිදි අමාත්‍ය මණ්ඩලය වෙත හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත හෝ ලිඛිත අභියාචනයක් ඉදිරිපත් කළ හැකි වන්නේ ය.

රා.ප.ච 05/2017 මගින් 26:3 උප වගන්තිය සංශෝධනය කර ඇත.

26:4 විනය නියෝගයක් සම්බන්ධයෙන් අභියාචනයක් ඉදිරිපත් කළ යුත්තේ නියෝගයෙන් අතෘප්තියට පත් නිලධරයා විසිනි. ඔහු වෙනුවෙන් වෙනත් පුද්ගලයකු විසින් ඉදිරිපත් කරනු ලබන කිසිදු අභියාචනයක් අදාළ අභියාචනා බලධරයා විසින් භාරගනු ලබන්නේවත් ලැබුණු බව දන්වනු ලැබන්නේවත් නොමැත.

26:5 රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ එහි කමිටුවක් හෝ විසින් බලතල පවරනු ලැබ ඇති රජයේ නිලධරයෙකු විසින් පනවන ලද විනය නියෝගයකින් අතෘප්තියට පත් වූ රජයේ නිලධරයෙකුට එම විනය නියෝගයට විරුද්ධව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත එක් අභියාචනයක් පමණක් ඉදිරිපත් කිරීමට හිමිකම් ඇත්තේ ය.

26:6 උක්ත 26:5 උප වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කරනු ලබන අභියාචනය විනය නියෝගය ලැබී මාස තුනක් ඇතුළත ඉදිරිපත් කළයුතු වන්නේ ය. එසේ වුව ද පිළිගත හැකි හේතුන් ඇත්නම් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අභිමතය පරිදි මාස තුනකට පසු සහ මාස 06 කට ප්‍රථම ලැබෙන සේ ඉදිරිපත් කරනු ලබන අභියාචනා ද පිළිගත හැක්කේ ය.

26:7 රාජ්‍ය සේවයේ යෙදී සිටින නිලධරයකු රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කළ යුතු වන්නේ තම ආයතන ප්‍රධානයා සහ විනය බලධරයා මඟිනි. විනය නියෝගය නිකුත් කර මාස තුනක් ගතවීමට ප්‍රථම තම ආයතන ප්‍රධානයා වෙත අභියාචනය නිසි පරිදි භාරදීම නියමිත කාලයේ දී අභියාචනය ඉදිරිපත් කිරීමක් සේ සලකනු ලැබේ. රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම සඳහා තමන් වෙත භාර දෙන අභියාචනා පිළිබඳව අප්‍රමාදව ක්‍රියා කොට තම නිරීක්ෂණ හා නිර්දේශ සහිතව මෙම සංග්‍රහයේ විධිවිධානයන්ට අනුකූලව අදාළ සියලුම ලිපිගොනු හා ලිපිලේඛන ද සහිතව නොපමාව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම ආයතන ප්‍රධානයාගේ මෙන්ම විනය බලධරයාගේ ද වගකීම වන්නේ ය. සේවයෙන් පහකර ඇති නිලධරයකු සම්බන්ධයෙන් වන කල්හි තම අභියාචනය ඔහු විසින් කෙළින්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා වෙත ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළයුතු වන්නේ ය.

26:8 අභියාචක තවදුරටත් සේවයේ යෙදී නොසිටී නම් අභියාචනය පිළිබඳ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය කෙළින්ම අභියාචකට දැන්විය යුතු අතර, අභියාචක සේවයේ යෙදී සිටී නම් අදාළ විනය බලධරයා සහ දෙපාර්තමේන්තු ප්‍රධානයා මඟින් එම තීරණය දැන්විය යුතු ය. එම අවස්ථා දෙකෙහි දී ම තීරණයේ පිටපතක් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් අදාළ විනය බලධරයා වෙත ද යැවිය යුතු වන්නේ ය.

26:9 රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ එහි කමිටුවක් හෝ තම විනය නියෝගයකට විරුද්ධව කරනු ලබන අභියාචනයක් විනිශ්චය කිරීම සඳහා භාර නොගත යුතු ය. ව්‍යතිරේකයක් වශයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හෝ අදාළ කමිටුවේ අභිමතයන් පාවිච්චි කළ යුත්තේ තමන්ගේ පැරණි තීරණයේ ඇති දෝෂයක් හෝ අක්‍රමවත් බවක් හෝ නිවැරදි කිරීම සඳහා පමණකි.

26:10 උක්ත 26:5 උප වගන්තිය යටතේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනයේ තීරණය සම්බන්ධයෙන් සෑහීමකට පත් නොවන නිලධරයකුට අමාත්‍ය මණ්ඩලය වෙත එක් අභියාචනයක් ඉදිරිපත් කළ හැකි වන්නේ ය. එවැනි අභියාචනා ඉදිරිපත් කළයුතු වන්නේ තමා සේවයේ යෙදී සිටින හෝ යෙදී සිටි හෝ අමාත්‍යාංශය භාර අමාත්‍යවරයා මඟිනි. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ හා ඒකාබද්ධ සේවාවන් සම්බන්ධයෙන් වන කල්හි අදාළ අමාත්‍යවරයා වන්නේ රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යවරයා ය.

26:11 උක්ත 26:10 උප වගන්තිය ප්‍රකාර ඉදිරිපත් කරනු ලබන අභියාචනයන් අදාළ අමාත්‍යවරයා විසින් අමාත්‍ය මණ්ඩල සංදේශයක් ආකාරයෙන් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු වන්නේ ය. අමාත්‍ය මණ්ඩලය වෙත මෙම වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ හැකි වන්නේ එක් විනය නියෝගයක් හෝ අභියාචනයක් හෝ සම්බන්ධයෙන් එක් අභියාචනයක් පමණකි.

26:12 රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ එහි කමිටුවක් හෝ විසින් කරනු ලැබ ඇති විනය නියෝගයක් හෝ අභියාචනයක් හෝ සම්බන්ධයෙන් කරනු ලැබ ඇති නියෝගයක් වෙනස් කිරීමට හෝ සංශෝධනය කිරීමට හෝ අවලංගු කිරීමට හෝ අමාත්‍ය මණ්ඩලයට බලය ඇත්තේ ය.

26:13 අභියාචනා බලධරයා විසින් විනය පරීක්ෂණ වාර්තාව ඇතුලු අනෙකුත් ලියවිලි සලකා බැලීමේ දී චූදිත නිලධරයා හැර වෙනත් නිලධරයකු යම්කිසි විෂමාචාර ක්‍රියාවක් හෝ ප්‍රමාද දෝෂයක් හෝ සම්බන්ධයෙන් වරදකරු බව අනාවරණය වුවහොත් එම නිලධරයාට විරුද්ධව විනයානුකූලව ක්‍රියා කරන ලෙස විනය බලධරයාට විධාන කිරීමට හෝ නිර්දේශ කිරීමට හෝ අභියාචනා බලධරයාට බලය ඇත්තේ ය.

## 27. අධිකරණයක් විසින් හෝ ව්‍යවස්ථාපිත බලධරයකු විසින් හෝ රජයේ නිලධරයකුට විරුද්ධව කටයුතු කරන අවස්ථාවක දී අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය

27:1 රාජ්‍ය නිලධරයකුට විරුද්ධව කරනු ලබන මූලික විමර්ශනයක් මඟින් හෝ වෙනත් ආකාරයකින් හෝ ශ්‍රී ලංකාවේ නීතිය යටතේ අධිකරණය විසින් නඩු විභාග කරන දඬුවම් පැමිණවිය යුතු සාපරාධී වරදක් එම රාජ්‍ය නිලධරයා විසින් සිදුකර ඇති බව ඉදිරිපත්ව ඇති සාධක හෝ සාක්ෂි හෝ මත බැලූ බැල්මට පෙනී යන අවස්ථාවක දී එම නිලධරයාට විරුද්ධව ශ්‍රී ලංකාවේ පවතින නීතිය යටතේ නිසි පියවර ගැනීම සඳහා එම නිලධරයාගේ විනය බලධරයා හෝ ආයතන ප්‍රධානයා හෝ විසින් ඒ පිළිබඳව පොලිස් දෙපාර්තමේන්තුව වෙත හෝ අදාළ ව්‍යවස්ථාපිත බලධරයකු වෙත හෝ අප්‍රමාදව දන්වා සිටීමට ක්‍රියා කළ යුතු ය.

27:2 රාජ්‍ය නිලධරයෙකුට විරුද්ධව කරනු ලබන මූලික විමර්ශනයක් මඟින් හෝ වෙනත් කුමන ආකාරයකින් හෝ අල්ලස් හෝ දූෂණ චෝදනා හෝ සම්බන්ධවන වරදක් එම රාජ්‍ය නිලධරයා විසින් සිදු කර ඇති බව ඉදිරිපත්ව ඇති සාධක හෝ සාක්ෂි හෝ මත බැලූ බැල්මට පෙනී යන අවස්ථාවක දී එම නිලධරයාට විරුද්ධව අදාළ නීතිය යටතේ නිසි පියවර ගැනීම සඳහා එම නිලධරයාගේ විනය බලධරයා හෝ ආයතන ප්‍රධානයා හෝ විසින් ඒ පිළිබඳව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත හෝ එවැනි චෝදනාවක් විමර්ශනය කිරීමට නීතියෙන් බලය පැවරී ඇති වෙනත් ව්‍යවස්ථපිත බලධරයෙකු වෙත හෝ අප්‍රමාදව දන්වා සිටීමට ක්‍රියා කළ යුතු ය.

27:3 රාජ්‍ය නිලධරයෙකුට විරුද්ධව කරනු ලබන මූලික විමර්ශනයක් මඟින් හෝ වෙනත් කුමන ආකාරයකින් හෝ ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාදායකය විසින් පනවන ලද පනතක කිසියම් විධිවිධානයක් උල්ලංඝනය කිරීම පිළිබඳව දඬුවම් පැමිණවීමට නිසි බලයලත් බලධරයකු හෝ ආයතනයක් හෝ (උදා :- රේගු අධ්‍යක්ෂ ජනරාල්, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්) මඟින් දඬුවම් පැමිණවිය හැකි යම් වරදක් එම රාජ්‍ය නිලධරයා විසින් සිදුකර ඇති බව ඉදිරිපත්ව ඇති සාධක හෝ සාක්ෂි හෝ මත බැලූ බැල්මට පෙනී යන අවස්ථාවක දී එම නිලධරයාට විරුද්ධව අදාළ නීතිය යටතේ නිසි පියවර ගැනීම සඳහා එම නිලධරයාගේ විනය බලධරයා හෝ ආයතන ප්‍රධානයා හෝ විසින් ඒ පිළිබඳව අදාළ ව්‍යවස්ථාපිත බලධරයා හෝ ආයතනය හෝ වෙත අප්‍රමාදව දන්වා සිටීමට ක්‍රියා කළ යුතු ය.

27:4 මූලික විමර්ශනයක් පවත්වන අවස්ථාවක දී හෝ පැවැත්වීමට තරම් සාධක ඉදිරිපත්ව ඇති අවස්ථාවක දී හෝ උක්ත 27:1, 27:2 හා 27:3 උප වගන්ති ප්‍රකාරව අදාළ බලධරයන් වෙත තොරතුරු දන්වා යැවීමෙන් පසුව වුව ද කරගෙන යනු ලබන හෝ කිරීමට අපේක්ෂිත හෝ මූලික විමර්ශන කටයුතු ප්‍රබල හේතුවක් හෝ නොවැළැක්විය හැකි බාධාවක් හෝ නොමැති අවස්ථාවක දී අදාළ වූ මූලික විමර්ශනය අත්හිටුවීම හෝ කල්දැමීම හෝ සිදු නොකළ යුත්තේ ය. මූලික විමර්ශනය අත්හිටුවන්නේ නම්, එසේ අත්හිටුවීමට හේතු වූ ප්‍රබල හේතුව හෝ බාධකය හෝ ඉවත් වූ වහාම එම මූලික විමර්ශනය නැවත පවත්වා අවසන් කළ යුතු ය.

27:5 උක්ත 27:1, 27:2 හා 27:3 උප වගන්ති ප්‍රකාරව නීතිමය කටයුතු කිරීම සඳහා අදාළ බලධරයන් වෙත දන්වනු ලැබ ඇති කල්හි එම බලධරයන් විසින් ඔවුන්ගේ විමර්ශන කටයුතු හා නීති කෘත්‍යයන් සඳහා අවශ්‍ය ලිපිලේඛන, අදාළ භාණ්ඩයන් හා අදාළ වන අනෙකුත් දේවල් අදාළ ආයතන ප්‍රධානයාගෙන් හෝ විනය බලධරයාගෙන් හෝ ඉල්ලා සිටි විටක දී ඒවා ඉල්ලා සිටි බලධරයන් වෙත භාරදිය යුතු වන්නේ ය.

27:6 උක්ත 27:5 උප වගන්තිය යටතේ තම විමර්ශන කටයුතුවලට හෝ නීති කෘත්‍යයන් සඳහා හෝ අදාළ වන ලිපි ලේඛනයන් අදාළ බලධරයා වෙත භාරදෙනු ලබන අවස්ථාවක දී අදාළ චූදිත

නිලධරයාට විරුද්ධව දෙපාර්තමේන්තුව මඟින් ගනු ලැබිය හැකි විනය ක්‍රියාමාර්ගයන් සඳහා අවශ්‍ය වන ලිපිලේඛනවල සහතික කළ ඡායා පිටපත් අදාළ දෙපාර්තමේන්තුවේ ප්‍රධානයා හෝ මාණ්ඩලික නිලධරයකු හෝ විසින් සහතික කර තබාගත යුත්තේය. එසේ රඳවාගනු ලබන ලිපිලේඛනවල සහතික කළ පිටපත් නිලධරයාට විරුද්ධව කරනු ලැබූ විධිමත් විනය පරීක්ෂණයක දී සම්පූර්ණයෙන් පිළිගත හැකි ලියවිලි වශයෙන් සැලකිය යුතු වන්නේ ය.

27:7 රජයේ නිලධරයකුට විරුද්ධව අධිකරණ කටයුතු ආරම්භ කිරීමේ එක් පියවරක් වශයෙන් අදාළ නිලධරයා පොලිස් හෝ වෙනත් ව්‍යවස්ථාපිත බලධරයකු හෝ විසින් අත් අඩංගුවට ගෙන ඇති අවස්ථාවක දි හෝ අධිකරණය ඉදිරියේ නීති කෘත්‍යයන් ආරම්භ කිරීමට පෙර රක්ෂිත බන්ධනාගාර ගතකොට ඇති අවස්ථාවක දී හෝ එම නිලධරයාට එම කාලය ආවරණය වන පරිදි අනිවාර්ය නිවාඩු ලබාදිය යුත්තේ ය.

27:8 පොලිස් දෙපාර්තමේන්තුව හෝ වෙනත් ව්‍යවස්ථාපිත බලධරයකු හෝ විසින් අත්අඩංගුවට ගනු ලැබූ රජයේ නිලධරයකු එම අත්අඩංගුවෙන් නිදහස් කරනු ලැබ ඇති විටක දී ඔහු නැවත සේවයේ පිහිටුවිය යුතු ය. එසේ වුව ද එම නැවත සේවයේ පිහිටුවීම මඟින් විනය බලධරයා විසින් පැවැත්වීමට නියමිතව ඇති විධිමත් විනය පරීක්ෂණයට බාධාවක් ඇති වන්නේ නම් අදාළ චූදිත නිලධරයා නැවත සේවයේ නොපිහිටුවා ඔහුගේ වැඩ තහනම් කළ යුතු ය.

27:9 නඩු පැවරීමට පෙරාතුව රක්ෂිත බන්ධනාගාර ගතකොට ඇති නිලධරයකු ඇප පිට නිදහස් කර ඇති අවස්ථාවක දී එම නිලධරයා නැවත රාජ්‍ය සේවයේ පිහිටුවීම රජයේ සේවයේ යහපතට අහිතකර නොවන්නේ යැයි විනය බලධරයා නිගමනය කරන අවස්ථාවක දී ඔහු නැවත සේවයේ පිහිටුවිය යුතු ය. ඔහු නැවත සේවයේ පිහිටුවීම රජයේ සේවයේ යහපතට අහිතකර වන්නේ යයි විනය බලධරයා සෑහීමකට පත්වන්නේ නම් ඔහු තවදුරටත් අනිවාර්ය නිවාඩු මත තැබිය යුත්තේය. එසේම නිලධරයාට විරුද්ධව විධිමත් විනය ක්‍රියා පටිපාටියක් ආරම්භ කිරීමට විනය බලධරයා තීරණය කර ඇති අවස්ථාවක දී සේවයේ පිහිටුවීම එසේ පවත්වනු ලැබීමට අපේක්ෂිත විධිමත් විනය ක්‍රියා පටිපාටියට බාධාවක් වන්නේ නම් අවස්ථාවෝචිත පරිදි ඔහුගේ වැඩ තහනම් කළ යුතු ය.

27:10 සාපරාධී වරදක් සම්බන්ධයෙන් හෝ අල්ලස් හෝ දූෂණ චෝදනා සම්බන්ධයෙන් හෝ රජයේ නිලධරයකුට විරුද්ධව අධිකරණයේ නඩු පවරා ඇති අවස්ථාවක දී නියමිත බලධරයා විසින් වහාම ක්‍රියාත්මක වන පරිදි අදාළ නිලධරයාගේ වැඩ තහනම් කළ යුත්තේ ය.

රා.ප.ච 27/2019 මඟින් 27:10:1 හා 27:10:2 වගන්ති සංශෝධනය කර ඇත.

27:11 යම් වරදක් සම්බන්ධයෙන් රජයේ නිලධරයෙකුට විරුද්ධව අධිකරණයේ නීති කෘත්‍යයක් පවත්වාගෙන යමින් තිබිය දී වුව ද එම වරද මෙම සංග්‍රහය යටතේ ගැනෙන වරදක් වන කල්හි අදාළ විනය බලධරයා විසින් නිලධරයාට විරුද්ධව අධිකරණ කටයුතුවලට ස්වාධීන වශයෙන් දෙපාර්තමේන්තු විනය පරීක්ෂණයක් ද පවත්වා ගෙන යා යුත්තේ ය. දෙපාර්තමේන්තු විනය ක්‍රියා පටිපාටිය අත්හිටුවීම හෝ කල් දැමීම හෝ කළයුතු වන්නේ එය පවත්වා ගෙන යාම සඳහා ප්‍රබල බාධාවක් හෝ නොවැළැක්විය හැකි හේතුවක් හෝ ඇතිවන අවස්ථාවක දී පමණකි.

27:12 උක්ත 27:11 උප වගන්තිය ප්‍රකාරව නිලධරයකුට විරුද්ධව පවත්වනු ලබන විධිමත් විනය පරීක්ෂණය අවසන් වීමෙන් පසු අදාළ විනය නියෝගය නිකුත් කිරීම සඳහා නිලධරයාට විරුද්ධව කරගෙන යනු ලබන අධිකරණ ක්‍රියාමාර්ගය අවසන් වී නොතිබීම කිසිඳු බාධාවක් නොවන්නේ ය.

27:13 උක්ත 27:11 උප වගන්තිය ප්‍රකාරව නිලධරයකුට විරුද්ධව පවත්වනු ලබන අධිකරණමය ක්‍රියා මාර්ගය අවසන්වීමෙන් පසු තීන්දුව ලබා දෙන අවස්ථාව වන විට එම නිලධරයාට විරුද්ධව පවත්වනු ලැබූ දෙපාර්තමේන්තු විනය පරීක්ෂණය අවසන් වී නොතිබුණහොත් විනය පරීක්ෂණය

තවදුරටත් පවත්වාගෙන යාමට ප්‍රබල බාධාවක් හෝ නොවැළැක්විය හැකි හේතුවක් හෝ පවතින්නේ නම් හැර අධිකරණ තීරණය විනය පරීක්ෂණයට බලපෑමක් නොකරන්නේ යැයි සලකා විධිමත් විනය පරීක්ෂණය අවසාන වන තෙක් පවත්වාගෙන ගොස් විනය නියෝගය නිකුත් කළ යුත්තේ ය.

27:14 එකම සිදුවීමක් හෝ සිදුවීම් මාලාවක් හෝ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු පරීක්ෂණයක් මඟින් නිදහස් කොට ඇති නිලධරයකු එම චෝදනා යටතේ පැවති අධිකරණ ක්‍රියා මාර්ගයකින් වැරදිකරු කොට ඇති අවස්ථාවක දී ඔහුට විරුද්ධව මෙම සංග්‍රහයේ 28 වන වගන්තිය යටතේ කටයුතු කිරීම සඳහා චූදිත නිලධරයා විනය පරීක්ෂණයෙන් නිදහස්වීම කිසිදු බාධාවක් නොවන්නේ ය.

27:15 එකම සිදුවීමක් හෝ සිදුවීම් මාලාවක් හෝ සම්බන්ධයෙන් අධිකරණමය නඩු විභාගයක් සහ දෙපාර්තමේන්තුමය විනය පරීක්ෂණයක් පැවැත්වූ අවස්ථාවක දී, දෙපාර්තමේන්තු විනය පරීක්ෂණයෙන් අදාළ නිලධරයා වරදකරු ලෙස නිගමනය කර ඇති අවස්ථාවක දී ඒ පිළිබඳ අධිකරණය ඉදිරියේ පැවති නඩු විභාගයෙන් අදාළ නිලධරයා නිදහස් කරනු ලැබීම දෙපාර්තමේන්තු විනය පරීක්ෂණයකින් හෙළිදරව් වූ කරුණු මත නිකුත් කරනු ලැබූ විනය නියෝගය ක්‍රියාත්මක කිරීමට කිසිදු බාධාවක් නොවිය යුත්තේ ය.

## 28. රාජ්‍ය නිලධරයකුට විරුද්ධව අධිකරණයක් විසින් හෝ ව්‍යවස්ථාපිත බලධරයකු විසින් හෝ පනවනු ලබන නියෝග සැලකිල්ලට ගෙන ඔහුට විරුද්ධව විනයානුකූලව කටයුතු කිරීම.

28:1 සාපරාධී නඩු කටයුත්තක දී අධිකරණයක් විසින් යම්කිසි රාජ්‍ය නිලධරයකු වරදකරු කරනු ලැබුවහොත් හෝ ළඝු නඩු විභාගයක දී උසාවියක් විසින් යම්කිසි නිලධරයකු අපරාධ නඩු විධාන සංග්‍රහයේ 449 වැනි වගන්තිය යටතේ වරදකරු කරනු ලැබුවහොත් හෝ නිලධරයකු යම් වරදකට වරදකරු කිරීමෙහි ලා නීතියෙන් බලයලත් යම් ව්‍යවස්ථාපිත බලධරයකු විසින් නිලධරයකු යම් වරදකට වරදකරු කරනු ලැබුවහොත් හෝ යම් දණ්ඩනයකට යටත් කරනු ලැබුවහොත් හෝ එකී උසාවිය හෝ ව්‍යවස්ථාපිත බලධරයා හෝ විසින් නඩු වාර්තාවේ සහතික කළ පිටපතක් සමඟ එම කරුණ විනය බලධරයා වෙත වාර්තා කළ යුතු ය.

28:2 උක්ත 28:1 වගන්තිය ප්‍රකාරව අධිකරණය විසින් වරදකරු කිරීම යන්නට 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහයේ 15 වැනි වගන්තිය යටතේ තරවටු කර මුදා හැරීම ද, කොන්දේසි සහිතව මුදාහැරීම ද ඇතුළත් වන්නේ ය.

28:3 උක්ත 28:1 උප වගන්තිය ප්‍රකාරව අධිකරණයකින් හෝ ව්‍යවස්ථාපිත බලධරයකුගෙන් හෝ විනය බලධරයකු වෙත වාර්තා ලැබුණු විටක එම සිද්ධිය පිළිබඳව දෙපාර්තමේන්තුව මඟින් එම නිලධරයාට විරුද්ධව විධිමත් විනය පරීක්ෂණයක් පවත්වා නැත්නම් හෝ විනය පරීක්ෂණයක් පැවැත්වීමට අදහස් නොකරන්නේ නම් හෝ අදාළ වන පරිදි අධිකරණයේ හෝ ව්‍යවස්ථාපිත බලධරයාගේ හෝ නිගමනයන් සැලකිල්ලට ගෙන විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීමෙන් තොරව අදාළ නිලධරයාට විරුද්ධව විනය නියෝගයක් පැනවීමට අදාළ විනය බලධරයාට බලය ඇත්තේ ය.

28:4 උක්ත 28:3 උප වගන්තිය ප්‍රකාරව විනය නියෝගයක් පැනවීමේ දී විනය බලධරයකු විසින් එම විනය නියෝගය සඳහා පදනම් කර ගත යුත්තේ චූදිත නිලධරයා වරදකරු බවට තීරණය කොට තිබීම හා එසේ වරදකරු කරනු ලැබූ වරදේ හෝ වැරදිවල හෝ බරපතලකම වේ. මෙහි දී අධිකරණය මඟින් හෝ ව්‍යවස්ථාපිත බලධරයා විසින් හෝ පනවනු ලැබූ දඬුවම සැලකිල්ලට භාජනය කිරීමට අවශ්‍ය නොවන්නේ ය.

28:5 උක්ත 28:1 උප වගන්තිය ප්‍රකාරව අධිකරණය විසින් හෝ ව්‍යවස්ථාපිත බලධරයකු විසින් හෝ රජයේ නිලධරයකු වරදකරු කරමින් දෙනු ලැබූ තීරණයට හෝ නියෝගයට හෝ විරුද්ධව අදාළ නිලධරයා තමා විසින් විධිමත් ආකාරයට අභියාචනයක් කර ඇති බව ප්‍රමාණවත් හේතු සාධක සහිතව විනය බලධරයා වෙත දන්වා සිටියහොත් අදාළ කරුණු සැලකිල්ලට ගෙන අදාළ අභියාචනය සම්බන්ධයෙන් නිගමනය ලැබෙන තෙක් විනය නියෝගය පැනවීම ප්‍රමාද කිරීමට විනය බලධරයා ක්‍රියා කළ යුත්තේය. නිලධරයාගේ වැඩ තහනම් කර තිබේ නම් ඔහු එලෙසින්ම තවදුරටත් තැබිය යුත්තේ ය.

28:6 නිලධරයෙකුට විරුද්ධව විනයානුකූලව කටයුතු කිරීමට තරම් ප්‍රමාණවත් කරුණු තිබේ නම් එම නිලධරයා අධිකරණය විසින් හෝ ව්‍යවස්ථාපිත බලධරයකු විසින් හෝ නිදොස් කර තිබීම හෝ නිදහස් කර තිබීම හෝ වරදකරු නොවන බවට තීරණය කිරීම හෝ අදාළ නිලධරයාට විරුද්ධව මෙම සංග්‍රහය යටතේ විනයානුකූලව කටයුතු නොකිරීමට කිසිඳු හේතුවක් නොවන්නේ ය.

28:7 උක්ත 28:3 උප වගන්තිය ප්‍රකාරව පනවනු ලබන දඬුවමක් හැර කිසියම් වරදකට මෙම සංග්‍රහය යටතේ දඬුවම් කරනු ලැබූ නිලධරයකුට එම වරද සම්බන්ධයෙන් පසු අවස්ථාවක දී අධිකරණය මඟින් හෝ නිදොස් කරනු ලැබීම හෝ නිදහස් කරනු ලැබීම හෝ අධිකරණ නියෝගය අභියාචනාධිකරණයේ දී ඉවත දමා තිබීම හෝ හේතුකොට ගෙන එම දඬුවම ලිහිල් කරන ලෙස ඉල්ලා සිටීමට ඔහුට නුපුළුවන.

## 29. විගණන වාර්තාවක් මඟින් අනාවරණය වන විෂමාචාර.

29:1 විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කොට ඇති වාර්තාවක් මඟින් කිසියම් නිලධරයකු හෝ නිලධර කණ්ඩායමක් හෝ විසින් නොසැළකිලිමත්කමින් හෝ අනවධානයෙන් හෝ බලපත්වන නීති රෙගුලාසිවලට අනුකූලව කටයුතු නොකිරීමෙන් හෝ අක්‍රමිකතාවයන් හෝ විෂමාචාරයන් හෝ සිදුකර ඇති බව පෙන්වා දී ඇති අවස්ථාවන්හි දී එම නිලධරයාට හෝ නිලධරයන්ට හෝ විරුද්ධව විධිමත් විනය පියවර අදාළ විනය බලධරයා විසින් අනිවාර්යයෙන්ම ගතයුතු වන්නේ ය.

29:2 විගණකාධිපතිවරයාගේ වාර්තාව විධිමත් විනය පරීක්ෂණයක දී අදාළ චූදිත නිලධරයාට විරුද්ධව ඉදිරිපත් කරනු ලබන චෝදනා සනාථ කිරීම සඳහා සෑම ආකාරයෙන්ම ප්‍රමාණවත් යැයි විනය බලධරයාට පෙනී යන්නේ නම් එම වාර්තාව මත චෝදනා පත්‍රයක් නිකුත් කොට විධිමත් විනය පරීක්ෂණයක් පවත්වා නිසි පියවර ගත යුත්තේ ය.

29:3 විගණකාධිපතිවරයාගේ වාර්තාව මත චූදිත නිලධරයාට විරුද්ධව චෝදනා පත්‍රයක් සකස් කිරීම හෝ විධිමත් විනය පරීක්ෂණයක දී චෝදනා සනාථ කිරීම හෝ අසීරු වන්නේ යැයි විනය බලධරයාට පෙනී යන අවස්ථාවක දී විගණකාධිපතිවරයාගේ වාර්තාවේ සඳහන් විෂමාචාර කරුණු තවදුරටත් තහවුරු කිරීම හා ඒවා නිසි පරිදි විධිමත් විනය පරීක්ෂණයක් වෙත ඉදිරිපත් කිරීම පහසු කර ගැනීම සඳහා අප්‍රමාදව මූලික විමර්ශනයක් පැවැත්වීමට අදාළ ආයතන ප්‍රධානයා හෝ විනය බලධරයා හෝ ක්‍රියා කළ යුත්තේ ය. අදාළ මූලික විමර්ශන වාර්තාව මඟින් බැලූ බැල්මට පෙනී යන විෂමාචාරයන් අනාවරණය වන්නේ නම් මෙම සංග්‍රහයේ විධිවිධානයන්ට අනුකූලව චූදිත නිලධරයාට විරුද්ධව විනයානුකූලව කටයුතු කිරීමට අදාළ විනය බලධරයා ක්‍රියා කළ යුත්තේ ය.

29:4 අභ්‍යන්තර විගණන පරීක්ෂණ වාර්තා මඟින් ද විෂමාචාරයන් හෙළිදරව් වන අවස්ථාවල දී උක්ත 29:1, 29:2 හා 29:3 වගන්ති ප්‍රකාරව අදාළ විනය බලධරයා විසින් කටයුතු කළයුතු වන්නේ ය.

## 30. පරීක්ෂණ කොමිෂන් සභා වාර්තාවකින් අනාවරණය වන වැරදි

30:1 තත්කාලයේ බලපවත්නා නීතිය යටතේ නිසි බලය ලබා ඇති බලධරයකු විසින් පත්කරනු ලැබ ඇති පරීක්ෂණ කොමිෂන් සභාවක වාර්තාවක් මඟින් යම් රජයේ නිලධරයකුට විෂමාචාරයක් සම්බන්ධයෙන් චෝදනා ඉදිරිපත් වී තිබේ නම් එම චෝදනා සම්බන්ධව කොමිෂන් සභාවේ යොමු කිරීමක් මඟින් පාර්ලිමේන්තුව හෝ අධිකරණය හෝ විසින් අදාළ නිලධරයා වෙත දඬුවම් පමුණුවා ඇති විටක දී මෙම සංග්‍රහයේ 28 වැනි වගන්තිය ප්‍රකාරව අදාළ විනය බලධරයා ක්‍රියාකළ යුත්තේ ය.

30:2 පරීක්ෂණ කොමිෂන් සභා වාර්තාවක් මඟින් ඉදිරිපත්ව ඇති කරුණු විධිමත් විනය පරීක්ෂණයක දී අදාළ චූදිත නිලධරයාට විරුද්ධව ඉදිරිපත් කරනු ලබන චෝදනා සනාථ කිරීම සඳහා සෑම ආකාරයෙන්ම ප්‍රමාණවත් යැයි විනය බලධරයාට පෙනී යන්නේ නම් එම වාර්තාව මත චෝදනා පත්‍රයක් නිකුත් කොට විධිමත් විනය පරීක්ෂණයක් පවත්වා නිසි පියවර ගත යුත්තේ ය.

30:3 පරීක්ෂණ කොමිෂන් සභා වාර්තාවක් මත චූදිත නිලධරයාට විරුද්ධව චෝදනා පත්‍රයක් සකස් කිරීම හෝ විධිමත් විනය පරීක්ෂණයක දී චෝදනා සනාථ කිරීම හෝ අසීරු වන්නේ යැයි විනය බලධරයාට පෙනී යන අවස්ථාවක දී පරීක්ෂණ කොමිෂන් සභා වාර්තාවේ සඳහන් විෂමාචාර කරුණු තවදුරටත් තහවුරු කිරීම හා ඒවා නිසි පරිදි විධිමත් විනය පරීක්ෂණයක් වෙත ඉදිරිපත් කිරීම පහසු කරගැනීම සඳහා අප්‍රමාදව මූලික විමර්ශනයක් පැවැත්වීමට අදාළ ආයතන ප්‍රධානයා හෝ විනය බලධරයා හෝ ක්‍රියාකළ යුත්තේ ය. අදාළ මූලික විමර්ශන වාර්තාව මඟින් විෂමාචාරයන් අනාවරණය වන්නේ නම් මෙම සංග්‍රහයේ විධිවිධානයන්ට අනුකූලව චූදිත නිලධරයාට විරුද්ධව විනයානුකූලව කටයුතු කිරීමට අදාළ විනය බලධරයා ක්‍රියාකළ යුත්තේ ය.

## 31. රාජ්‍ය නිලධරයකු රාජකාරී වැඩ තහනමකට භාජනය කිරීම සහ අනිවාර්ය නිවාඩු පිට තැබීම

31:1 රාජ්‍ය නිලධරයකු විසින් පහත සඳහන් විෂමාචාරයන් එකක් හෝ කීපයක් හෝ සියල්ලම හෝ සිදුකර ඇති බව බැලූ බැල්මට පෙනී යන්නේ නම් වහාම ක්‍රියාත්මක වන පරිදි ඔහුගේ රාජකාරී වැඩ තහනම් කිරීමට අදාළ විනය බලධරයාට හෝ විනය බලධාරීත්වය නොදරන අදාළ අමාත්‍යාංශ ලේකම්වරයකුට හෝ අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානයකුට හෝ විනය බලධරයාගේ ආවරණ අනුමැතියට යටත්ව බලය ඇත්තේය. එහෙත් ආවරණ අනුමැතිය ලබාගැනීම සඳහා වැඩ තහනම් කළ ලිපිය නිකුත් කළ වහාම විනය බලධරයාට එම ලිපියේ පිටපතක් සහිතව දන්වා යැවිය යුතු ය.

31:1:1 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අවනත නොවීම.

31:1:2 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය අපකීර්තියට පත්වන අයුරින් කටයුතු කිරීම හෝ එසේ කිරීමට ඉඩහැරීම.

31:1:3 රාජ්‍ය විරෝධී හෝ ත්‍රස්තවාදී හෝ සාපරාධී හෝ චෝදනා මත අධිකරණයක් ඉදිරියේ නඩු පවරා තිබීම.

31:1:4 අල්ලස් හෝ දූෂණ හෝ චෝදනා සම්බන්ධයෙන් අධිකරණය ඉදිරියේ නඩු පවරා තිබීම.

31:1:5 රාජකාරී වේලාව තුළ දී හෝ රජයේ කාර්යාල පරිශ්‍රයක් තුළ දී හෝ මත්පැන් පානය කර සිටීම හෝ ඔහු වෙතින් මත්පැන් ගඳ වහනය වීම.

31:1:6 රාජකාරී වේලාව තුළ දී හෝ රජයේ කාර්යාල පරිශ්‍රයක් තුළ දී හෝ විෂ මත්ද්‍රව්‍ය පාවිච්චි කිරීම හෝ ඒවා ළඟ තබාගෙන සිටීම.

31:1:7 රජයේ මුදල් සාවද්‍ය ලෙස හෝ අයථා ලෙස හෝ පරිහරණය කිරීම හෝ වෙනත් අයෙකුට එසේ කිරීමට ඉඩ සැලසීම.

31:1:8 රජයේ සම්පත් සාවද්‍ය ලෙස හෝ අයථා ලෙස හෝ පරිහරණය කිරීම හෝ එසේ කිරීමට ඉඩහැරීම හෝ අවධානයෙන් හෝ අනවධානයෙන් හෝ ඒවා විනාශ වීමට හෝ වටිනාකම අඩුවීමට හෝ ඉඩහැර තිබීම.

31:1:9 නොසැලකිල්ලෙන් හෝ අනවධානයෙන් හෝ හිතාමතා හෝ රජයේ අයිතිවාසිකම්වලට හානිවන අයුරින් ක්‍රියාකිරීම හෝ එසේ කිරීමට ඉඩහැර තිබීම.

31:1:10 රාජ්‍ය සේවය අපකීර්තියට පත්වන අයුරින් කටයුතු කිරීම.

31:1:11 රජයට හෝ රාජ්‍ය සේවයට හෝ රාජ්‍ය ආයතනයකට හෝ හානිකර විය හැකි අයුරින් තොරතුරු අනාවරණය කිරීම හෝ රාජ්‍ය ලේඛන හෝ ඒවායේ පිටපත් හෝ නිසි බලධරයකුගේ අවසරයක් නොමැතිව බාහිර පාර්ශවයන්ට ලබා දීම හෝ එසේ කිරීමට ඉඩ සැලසීම.

31:1:12 රාජකාරී ලිපිලේඛන වෙනස්කිරීමට හෝ විකෘති කිරීමට හෝ විනාශ කිරීමට හෝ කූට ලේඛන සැකසීමට හෝ කටයුතු කිරීම.

31:1:13 රජයේ නිලධරයකුගේ රාජකාරී කටයුතුවලට බාධාවන අයුරින් හැසිරීම හෝ කටයුතු කිරීම හෝ රජයේ නිලධරයකුට අපහාස කිරීමට හෝ අවඥා කිරීමට හෝ ශාරීරික පීඩා පැමිණවීමට හෝ තර්ජනය කරීමට හෝ කටයුතු කිරීම.

31:1:14 ජ්‍යෙෂ්ඨ නිලධරයකුගේ නීත්‍යානුකූල නියෝග ක්‍රියාත්මක කිරීම ප්‍රතික්ෂේප කිරීම හෝ අකීකරුවීම හෝ පැහැර හැරීම හෝ සිදුකර ඇති විටක දී.

31:1:15 නිලධරයාට ස්වකීය තනතුරට අයත් රාජකාරී කටයුතු කරගෙන යාමට ඉඩදීම රජයේ සේවයේ යහපතට හානිකර වන්නේ යැයි හෝ ප්‍රඥාගෝචර නොවන්නේ යැයි හෝ පැහැදිලිව පෙනීයෑම.

31:2 උක්ත 31:1:15 යටතේ රජයේ නිලධරයකුගේ වැඩ තහනම් කිරීමට බලය ඇත්තේ විනය බලධරයාට පමණි.

31:3 උක්ත 31:1 උප වගන්තිය ප්‍රකාරව යම් රාජ්‍ය නිලධරයකුගේ රාජකාරී වැඩ තහනම් කිරිමට තීරණයක් ගනු ලබන බලධරයකු විසින් එසේ ගනු ලැබූ තීරණයට පදනම් කොටගත් හේතූන් පැහැදිලිවත්, නිශ්චිතවත් අදාළ ලිපි ගොනුවෙහි සටහන් කර තැබිය යුතු වන්නේ ය.

31:4 සාමාන්‍යයෙන් රජයේ නිලධරයකුගේ වැඩ තහනම් කිරීම ඔහුට විරුද්ධව එල්ල වූ චෝදනා සම්බන්ධයෙන් කරනු ලැබූ මූලික විමර්ශනයකින් අනාවරණය වූ කරුණු මත සිදුවිය යුතු ය.

31:5 උක්ත 31:4 උප වගන්තිය ප්‍රකාරව මූලික විමර්ශනයක් පැවැත්වීමෙන් තොරව වුව ද පහත සඳහන් අවස්ථාවල දී රජයේ නිලධරයකුගේ රාජකාරී වැඩ තහනම් කිරීමට අදාළ බලධරයාට බලය ඇත්තේ ය.

31:5:1 නිලධරයා තවදුරටත් රජයේ සේවයේ යෙදී සිටීම ඔහුට විරුද්ධව මූලික විමර්ශනයක් පැවැත්වීමට බාධාවක් වන බව අදාළ බලධරයාට පැහැදිලිව පෙනී යන අවස්ථාවක දී.

31:5:2 නිලධරයා විසින් කරනු ලැබ ඇතැයි සැක කරනු ලබන විෂමාචාරයන් සම්බන්ධයෙන් ලැබී ඇති පළමු තොරතුරු මඟින් ම අදාළ කරුණු ප්‍රමාණවත් පරිදි තහවුරු වී ඇති අවස්ථාවක දී.

31:5:3 මෙම සංග්‍රහයේ 27 වගන්තිය ප්‍රකාරව රජයේ නිලධරයකුට විරුද්ධව අධිකරණයේ නඩුවක් පවරා ඇති අවස්ථාවක දී.

31:6 උක්ත 31:5:1 හා 31:5:2 යටතේ රාජකාරී වැඩ තහනම් කිරීමට භාජනය කරනු ලබන නිලධරයෙක් සම්බන්ධයෙන් වුව ද වැඩ තහනමට ලක් කිරීමෙන් පසු අප්‍රමාදව මූලික විමර්ශනයක් පැවැත්වීමට කටයුතු කළ යුතු වන්නේ ය.

31:7 උක්ත 31:5:3 යටතේ රාජකාරී වැඩ තහනම් කිරීමට භාජනය කරන නිලධරයෙක් සම්බන්ධයෙන් වන කල්හි හැකි සෑම විටකදීම මූලික විමර්ශනයක් පැවැත්වීමට කටයුතු කළයුතු වන්නේ ය.

31:8 උක්ත 31:5 උප වගන්තිය ප්‍රකාරව රාජකාරී වැඩ තහනමකට භාජනය කරනු ලබන රජයේ නිලධරයකු තමන් හෝ වෙනත් නිලධරයකු හෝ සම්බන්ධයෙන් පවත්වනු ලබන මූලික පරීක්ෂණයකට සහභාගීවීම සඳහා කැඳවනු ලැබ ඇති අවස්ථාවක දී ඒ සඳහා සහභාගී වීම සහ එහිදී තමන් දන්නා හෝ තමන් දැනසිටිය යුතු හෝ තොරතුරු විමර්ශන නිලධරයාට ලබාදීමේ වගකීමෙන් බැඳී සිටින්නේ ය.

31:9 විනය බලධරයකු නොවන අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානයකු හෝ අමාත්‍යාංශ ලේකම්වරයකු හෝ විසින් රාජ්‍ය නිලධරයකුගේ රාජකාරී වැඩ තහනම් කරනු ලැබූ අවස්ථාවක දී එම වැඩ තහනම් කිරීමට පදනම් වූ මූලික විමර්ශන වාර්තාව සහ අදාළ අනෙකුත් විස්තර ද, නිලධරයා වැඩ තහනම් කර සිටින කාලය තුළ ඔහුට ගෙවිය යුතු වැටුප පිළිබඳ නිර්දේශයන් ද අඩංගු වාර්තාව වහාම අදාළ විනය බලධරයා වෙත ඉදිරිපත් කළ යුතු වන්නේ ය.

31:10 රාජකාරී වැඩ තහනමකට භාජනය කරනු ලබන නිලධරයකු වැඩ තහනම් කර සිටින කාලය තුළ දී වැටුප් නොගෙවීම හෝ අඩ වැටුප් ගෙවීම හෝ තීරණය කරනු ලබන්නේ විනය බලධරයා විසිනි.

31:11 පහත දක්වා ඇති අවස්ථාවන්හි දී වැඩ තහනමකට භාජනය කරනු ලබන රජයේ නිලධරයකුට වැඩ තහනම් කර සිටින කාලය තුළ දී කිසිදු වැටුපක් නොගෙවිය යුතු වන්නේ ය.

31:11:1 ත්‍රස්තවාදී වරදක් සම්බන්ධයෙන් හෝ රාජ්‍ය විරෝධී කටයුතු සම්බන්ධයෙන් හෝ සාපරාධී වරදක් සම්බන්ධයෙන් හෝ අල්ලස් හෝ දූෂණ හෝ වංචා හෝ සම්බන්ධ වරදක් සම්බන්ධයෙන් හෝ අධිකරණය ඉදිරියේ නඩුවක් පවරා ඇති විටක දී.

31:11:2 බරපතල ගනයේ ලා සැලකිය හැකි රජයේ මුදල් හා දේපළ සාවද්‍ය පරිහරණයට හෝ යොදාගෙන ඇති විටක දී හෝ එසේ කිරීමට ඉඩහැරීම හෝ අනවධානයෙන් හෝ අවධානයෙන් හෝ ඒවා විනාශවීමට හෝ වටිනාකම අඩුවීමට හෝ ඉඩහැර ඇති විටක දී.

31:12 උක්ත 31:11 උප වගන්තිය යටතට නොවැටෙන අනෙකුත් අවස්ථාවන්හි දී චෝදනාවේ බරපතලකම නිලධරයාගේ පූර්ව සේවා වාර්තා, නිලධරයාගේ ආර්ථික අවශ්‍යතාවයන් ආදී කරුණු පිළිබඳව සලකා බලා වැටුප නොගෙවීමට හෝ අඩ වැටුප් ගෙවීමට හෝ තීරණය කිරීමට විනය බලධරයාට බලය ඇත්තේ ය.

රා.ප.ච. 06/2004 මඟින් 31:12 උප වගන්තිය සංශෝධනය කර ඇත

31:13 රාජකාරී වැඩ තහනම් කරනු ලැබ සිටින නිලධරයකු අඩ වැටුප් ලබමින් සිටිය දී ඔහු හිතාමතාම හෝ නොසැලකිල්ලෙන් හෝ ඔහුට විරුද්ධව නඟා ඇති චෝදනා සම්බන්ධයෙන් පවත්වනු ලබන විධිමත් විනය ක්‍රියා පටිපාටියට බාධාවන අයුරින් හෝ එහි කටයුතු අනවශ්‍ය පරිදි ප්‍රමාද වන අයුරින් හෝ ක්‍රියාකරන බවට තමා සෑහීමකට පත් වී ඇති විටක දී එම නිලධරයාට ගෙවනු ලබන අඩ වැටුප් අත්හිටුවීමට විනය බලධරයාට බලය ඇත්තේ ය. එවැනි අවස්ථාවක දී එම තීරණයට පදනම් වූ හේතූන් අදාළ විනය බලධරයා විසින් පැහැදිලිවත්, නිශ්චිතවත් අදාළ ගොනුවේ සටහන් කර තැබිය යුතු වන්නේ ය.

31:14 විධිමත් විනය පරීක්ෂණයේ ප්‍රතිඵලයක් ලෙස පනවනු ලබන විනය නියෝගය සේවයෙන් පහ කිරීමට වඩා අඩු තත්ත්වයේ දඬුවමක් නම් නොගෙවන ලද වැටුප හා දීමනා සම්පූර්ණ ප්‍රමාණය හෝ ඉන් කිසියම් ප්‍රතිශතයක් හෝ ගෙවීම ගැන විනය බලධරයා විසින් තීරණය කොට එම තීරණය ද විනය නියෝගයේ සඳහන් කළ යුතු ය.

31:15 නිලධරයකුගේ වැටුප හා දීමනා යනුවෙන් අදහස් කරන්නේ ඔහුගේ නිත්‍ය තනතුරේ වැටුප හා දීමනාය. රාජකාරී දීමනාවක ස්වරූපයෙන් ගෙවන දීමනා හෝ රාජකාරී ඉටුකිරීමේ දී දරන වියදම් ප්‍රතිපූරණය කිරීම් වශයෙන් ගෙවනු ලබන ගමන් වියදම්, ප්‍රවාහන වියදම් හා සංයුක්ත දීමනා යන කිසිවක් හෝ ඊට ඇතුළත් නොවේ.

31:16 යම් නිලධරයකුගේ රාජකාරී වැඩ ඉහත සඳහන් උප වගන්තිවලින් නියම කර ඇති පරිදි තහනම් කළ නොහැකි වන්නා වූ, එහෙත් මූලික විමර්ශනයේ හෝ විධිමත් විනය ක්‍රියා පටිපාටියේ හෝ යහපත තකා එම නිලධරයා ඔහුගේ නිල කාර්යයන්හි නියුක්ත නොවිය යුතු තත්ත්වයේ පවතින්නා වූ අවස්ථාවක දී එම නිලධරයා අදාළ අමාත්‍යාංශය තුළ ස්ථාන මාරුකිරීම හෝ යම් ආයතනකට අනුයුක්ත කිරීම හෝ ආයතන සංග්‍රහයේ පළමු කාණ්ඩයේ විධිවිධාන පරිදි ඔහු අනිවාර්යය නිවාඩු පිට තැබීම හෝ කළයුතු වන්නේ ය.

31:17 ප්‍රමාණවත් සාක්ෂි නොමැතිව යම් නිලධරයකුගේ රාජකාරී වැඩ තහනම් කිරීමේ දී ඔහු වැරදිකරු නොවන බව තීරණය වී යළි සේවයේ පිහිටුවීමට සිදුවීමෙන් ඔහු රාජකාරී ඉටු නොකළ කාලසීමාවකට ද වැටුප් ගෙවීමට සිදුවන හෙයින් රාජකාරී වැඩ තහනම් කිරීමට පෙර නියමිත බලධරයා ඒ පිළිබඳව පෞද්ගලිකවම සැලැකිලිමත් විය යුතු ය.

## 32. පළමුවන උපලේඛනයේ දැක්වෙන වැරදි සම්බන්ධයෙන් අනිවාර්ය විශ්‍රාම ගැන්වීම.

32:1 පළමුවන උපලේඛනයේ දැක්වෙන වරදක් සම්බන්ධයෙන් අමාත්‍යාංශ අතිරේක ලේකම්වරයකුට, ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයකුට, දෙපාර්තමේන්තු ප්‍රධානයකුට, ආණ්ඩුවේ ඒජන්තවරයකුට හෝ දිස්ත්‍රික් ලේකම්වරයකුට හෝ විරුද්ධව විනයානුකූලව කටයුතු කිරීමට බැලූ බැල්මට පෙනී යන හේතු පවතින අවස්ථාවක දී, වරදේ ස්වභාවය, නිලධරයාගේ සේවා කාලය, පූර්ව සේවා තත්ත්වය, විධිමත් විනය ක්‍රියා පටිපාටියක් අනුගමනය කිරීමට ඇති අසීරුතාවය, නිලධරයා එවැනි වරදක් සිදු කිරීමට පෙළඹවූ හේතු සාධක හා එහි පසුබිම ආදී කරුණු සුපරීක්ෂාකාරී ලෙස සැලකිල්ලට ගෙන අවස්ථාවෝචිත පරිදි ඉතා සුදුසුම ක්‍රියාමාර්ගය වන්නේ නිලධරයා අනිවාර්යයෙන්ම විශ්‍රාම ගැන්වීම යැයි අදාළ අමාත්‍යාංශ ලේකම්වරයා නිගමනය කරන විටක මේ පිළිබඳව තම අමාත්‍යවරයාගේ ද එකඟත්වය අනුව සම්පූර්ණ වාර්තාවක් රාජ්‍ය පරිපාලන විෂය භාර ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

32:2 එතෙකුදු වුවත්, ත්‍රස්තවාදී හෝ රාජ්‍ය විරෝධී හෝ සාපරාධී හෝ අල්ලස් හෝ දූෂණ හෝ චෝදනා එල්ල වී ඇති හෝ රජයේ මුදල් හෝ දේපළ හෝ සාවද්‍ය පරිහරණයකට ලක් කිරීම හෝ එසේ කිරීමට වෙනත් පාර්ශවයකට ඉඩහැරීම හෝ තමන්ගේ නිල තත්ත්වය අයුතු ලෙස යොදා ගනිමින් තමන්ට හෝ වෙනත් පාර්ශවයකට හෝ අයුතු ලාභයක් උපයා ගැනීමට හැකිවන සේ තීරණයක් ගෙන ඇති බව පෙනී යන විටක දී හෝ උක්ත 32:1 උප වගන්තිය ප්‍රකාරව අදාළ නිලධරයකුට විරුද්ධව කටයුතු නොකොට මෙම සංග්‍රහයේ අනෙකුත් විධිවිධාන අනුව විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීමට ක්‍රියා කළ යුතු ය.

32:3 උක්ත 32:1 උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශ ලේකම්වරයකුගෙන් වාර්තාවක් ලැබී ඇති කල්හි රාජ්‍ය පරිපාලන විෂයභාර ලේකම්වරයා විසින් අදාළ නිලධරයාට විරුද්ධව නඟා ඇති චෝදනා සම්බන්ධයෙන් සම්පූර්ණ වූ ද, නිවැරදි වූ ද, පැහැදිලි කිරීමක් නිශ්චිත කාලයක් තුළ තමන් වෙත ඉදිරිපත් කරන ලෙස අදාළ නිලධරයාට නියම කළ යුත්තේ ය.

32:4 නිලධරයකුට නියම කරන ලද කාලය තුළ දී තම නිදහසට කරුණු හෝ කරුණු පැහැදිලි කිරීමක් හෝ ඉදිරිපත් කිරීමට අපොහොසත් වන විටක දී හෝ උවමනාවෙන්ම පැහැර හරින විටක දී හෝ 32:1 උප වගන්තිය යටතේ තවදුරටත් කටයුතු කිරීම අත්හිටුවා මෙම සංග්‍රහයේ ප්‍රකාශිත විධිවිධානයන්ට අනුකූලව විධිමත් විනය ක්‍රියා පටිපාටියක් අනුගමනය කරන ලෙස රාජ්‍ය පරිපාලන විෂයභාර ලේකම්වරයා විසින් අදාළ ලේකම්වරයා වෙත දන්වා යැවිය යුත්තේ ය.

32:5 අදාළ අමාත්‍යාංශ ලේකම්වරයා විසින් ඉදිරිපත් කරන ලද කරුණු ද, නිලධරයා විසින් කරන ලද පැහැදිළි කිරීම් ද, සුපරීක්ෂාකාරී ලෙස සලකා බලා ඒ සම්බන්ධයෙන් තම නිරීක්ෂණ හා නිර්දේශ සහිතව රාජ්‍ය පරිපාලන විෂයභාර ලේකම්වරයා විසින් තම අමාත්‍යවරයාගේ එකඟත්වය මත ඔහු මඟින් අමාත්‍ය මණ්ඩලය වෙත වාර්තා කළයුතු වන්නේ ය.

32:6 උක්ත 32:5 උප වගන්තිය ප්‍රකාරව වාර්තාවක් ලැබීමෙන් පසු එහි සඳහන් කරුණු සලකා බලා නිලධරයා අනිවාර්යයෙන්ම විශ්‍රාම ගැන්වීමට හෝ ඔහුට විරුද්ධව සාමාන්‍ය විනය ක්‍රියා පටිපාටියක් අනුගමනය කරන ලෙස හෝ නියෝග කිරීමට අමාත්‍ය මණ්ඩලයට බලය ඇත්තේ ය.

## 33. සාමාන්‍ය අකාර්යක්ෂමතාවය මත රජයේ නිලධරයකු විශ්‍රාම ගැන්වීම.

33:1 නිලධරයකු තම සේවා කාලය තුළ සිදු කරනු ලැබ ඇති විෂමාචාර හෝ අනිසි හැසිරීම් හෝ නොසැලකිල්ල හෝ අනවධානය හෝ ආදී කරුණු සම්බන්ධයෙන් දීර්ඝ කාලයක් තුළ විවිධ අවස්ථාවන්හි දී අවවාද කිරීම්, තරවටු කිරීම් හෝ වෙනත් දඬුවම් පනවා ඇති නමුත් එම දඬුවම්

පැමිණවීම මගින් ඔහුගේ හැසිරීම හා කාර්යක්ෂමතාවය යහපත් කර ගැනීමට අපොහොසත් වී ඇති කල්හි තවදුරටත් ඔහු රාජ්‍ය සේවයේ රඳවා ගැනීම රාජ්‍ය සේවයේ කාර්යක්ෂමතාවයට බාධාවක් වන්නේ යැයි විනය බලධරයා විසින් නිගමනය කරන්නේ නම් එම නිලධරයා සාමාන්‍ය අකාර්යක්ෂමතාවය මත විශ්‍රාම ගැන්වීමට ඔහුට බලය ඇත්තේ ය.

33:2 උක්ත 33:1 උප වගන්තිය ප්‍රකාරව කටයුතු කිරීමට හේතු පවතින්නේ යැයි අමාත්‍යාංශ ලේකම්වරයකුට හෝ දෙපාර්තමේන්තු ප්‍රධානයකුට හෝ පෙනී යන අවස්ථාවක දී එම බලධරයා විසින් අවස්ථාවෝචිත පරිදි ඔහු කලින් සේවයේ යෙදුනු දෙපාර්තමේන්තු හෝ ආයතන හෝ වෙතින් ලබාගත් තොරතුරු පදනම් කරගෙන සකස් කරගත් සම්පූර්ණ වාර්තාවක් නිලධරයාගේ නිසි විනය බලධරයා වෙත තමන්ගේ නිරීක්ෂණ හා නිර්දේශ සහිතව ඉදිරිපත් කළ යුතු ය.

33:3 උක්ත 33:2 උප වගන්තිය ප්‍රකාරව වාර්තාවක් ලබන විනය බලධරයකු විසින් නිලධරයා සාමාන්‍ය අකාර්යක්ෂමතාවය මත විශ්‍රාම නොගැන්වීමට හේතූන් තිබේ නම් ඒවා නිශ්චිත කාලයක් තුළ ලිඛිතව තමා වෙත ඉදිරිපත් කරන ලෙස අදාළ නිලධරයාට නියම කළයුතුය.

33:4 අදාළ ලේකම්වරයා හෝ දෙපාර්තමේන්තු ප්‍රධානයා හෝ ඉදිරිපත් කළ වාර්තාවේ කරුණු ද ඒ සම්බන්ධයෙන් අදාළ නිලධරයා විසින් ඉදිරිපත් කරනු ලැබූ තම නිදහසට කරුණු ද සැලකිල්ලට ගෙන නිලධරයා සාමාන්‍ය අකාර්යක්ෂමතාවය මත විශ්‍රාම ගැන්වීමට හෝ වෙනත් සුදුසු දඬුවමක් නියම කිරීමට හෝ විනය බලධරයාට බලය ඇත්තේ ය.

33:5 නියම කරනු ලබන කාලය තුළ දී තම නිදහසට කරුණු ඉදිරිපත් කිරීමට නිලධරයා අපොහොසත් වුවහොත් හෝ හිතාමතා පැහැර හරිනු ලැබුවහොත් හෝ ඉදිරිපත් කිරීමට තරම් නිදහසට කරුණු නැතැයි සලකා උක්ත 33:4 උප වගන්තිය යටතේ සුදුසු නියෝගයක් පැනවීමට විනය බලධරයාට බලය ඇත්තේ ය.

33:6 නිලධරයා සාමාන්‍ය අකාර්යක්ෂමතාවය මත විශ්‍රාම ගැන්වීම සඳහා නියෝගයක් නිකුත් කරන විනය බලධරයා වෙත නිලධරයා විසින් කර ඇති වරදවල්වල හෝ පෙන්වා ඇති අකාර්යක්ෂමතාවයේ හෝ ස්වභාවය හෝ මත ඔහුට ගෙවිය හැකි විශ්‍රාම වැටුපෙන් යම් ප්‍රතිශතයක් අඩු කරන ලෙස රාජ්‍ය පරිපාලන විෂය භාර ලේකම්වරයා වෙත නිර්දේශයක් ඉදිරිපත් කිරීමට බලය ඇත්තේ ය.

## 34. රජයේ නිලධරයකුට විරුද්ධව විනයානුකූලව කටයුතු කිරීමට මූලික කටයුතු සම්පාදනය කරමින් තිබිය දී හෝ චෝදනා පත්‍රයක් නිකුත් කර විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වෙමින් තිබිය දී හෝ අදාළ නිලධරයාට දිවයිනෙන් බැහැරව යාමට අවසර දීම.

34:1 රජයේ නිලධරයකුට විරුද්ධව විනයානුකූලව කටයුතු කිරීමට අදාළ විනය බලධරයා හෝ ආයතන ප්‍රධානයා හෝ මූලික කටයුතු සම්පාදනය කර ඇති නමුත්, එම නිලධරයාට විරුද්ධව චෝදනා පත්‍රයක් මේ දක්වා නිකුත් කොට නොමැති විටක අදාළ නිලධරයා දිවයිනෙන් බැහැරවීමට ඉල්ලා ඇති අවස්ථාවක දී අදාළ ආයතන ප්‍රධානයා විසින් ඒ බව තම නිරීක්ෂණ හා නිර්දේශ සහිතව අදාළ විනය බලධරයා වෙත දන්වා යැවිය යුත්තේ ය. අදාළ සියලු කරුණු සැලකිල්ලට ගෙන අවස්ථාවෝචිත පරිදි අදාළ විනය බලධරයා විසින් නිලධරයාගේ ඉල්ලීම පිළිබඳ සිය නිර්දේශයන් නිවාඩු අනුමත කරන බලධරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. නිවාඩු අනුමත කරන බලධරයා විසින් අදාළ නිවාඩු අනුමත කළ යුත්තේ විනය බලධරයාගේ නිරීක්ෂණ හා නිර්දේශයන් ද සැලකිල්ලට ගෙන ය.

34:2 රජයේ නිලධරයකුට විරුද්ධව විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීම සඳහා චෝදනා පත්‍රයක් නිකුත් කර තිබිය දී අදාළ නිලධරයාට දිවයිනෙන් බැහැරව යාමට අවශ්‍ය වන්නේ නම්, තම ආයතන ප්‍රධානයා මාර්ගයෙන් ඒ සඳහා විනය බලධරයාගේ ලිඛිත එකඟත්වය ලබාගත යුත්තේ ය. එවැනි ඉල්ලීමක් තමන් වෙත ලැබුණු කල්හි සියලුම කරුණු සලකා බලා අවස්ථාවෝචිත පරිදි සුදුසු නිර්දේශයන් විදේශ නිවාඩු අනුමත කරන බලධරයා වෙත ඉදිරිපත් කළ යුත්තේ ය. නිවාඩු අනුමත කරන බලධරයා විසින් අදාළ නිවාඩු අනුමත කළ යුත්තේ විනය බලධරයාගේ නිරීක්ෂණ හා නිර්දේශයන් ද සැලකිල්ලට ගෙන ය.

## 35. රජයේ නිලධරයකුට විරුද්ධව විනයානුකූලව කටයුතු කෙරෙමින් පවතින අවස්ථාවක දී නිලධරයා සේවයෙන් ඉල්ලා අස්වීම.

35:1 රජයේ නිලධරයකුට විරුද්ධව විධිමත් විනය ක්‍රියා පටිපාටියක් ආරම්භ කිරීමෙන් පසු, එහෙත් විනය නියෝගයක් නිකුත් කිරීමට පෙර එම නිලධරයා සේවයෙන් ඉල්ලා අස්වීම සඳහා ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කළහොත්, ඔහුගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කළයුතු වන්නේ ය.

35:2 ඉහත 35:1 පරිදි ඉල්ලා අස්වීම ප්‍රතික්ෂේප කිරීමෙන් පසු ඔහු සේවයට වාර්තා කිරීම පැහැර හැර තිබේ නම් ආයතන සංග්‍රහයේ V වැනි පරිච්ඡේදය ප්‍රකාරව විනය බලධරයා ක්‍රියාකළ යුත්තේය.

35:3 නිලධරයා දැනටමත් වැඩ තහනමකට ලක්ව සිටින්නේ නම් හා ඔහුට විරුද්ධව දැනටමත් පවත්වාගෙන යනු ලබන විධිමත් විනය පරීක්ෂණයට සහභාගී වීම පැහැර හැර ඇත්නම් එම අවස්ථාවේ දී ද ආයතන සංග්‍රහයේ V පරිච්ඡේදය ප්‍රකාරව විනය බලධරයා විසින් ක්‍රියාකළ යුත්තේ ය.

35:4 නිලධරයකුට විරුද්ධව පනවනු ලැබූ විධිමත් විනය පරීක්ෂණයක් අවසන් වී විනය නියෝගය නිකුත් කිරීමට ප්‍රථම ඉල්ලා අස්වීමේ ලිපියක් ලැබුණු විටක එම ඉල්ලීම ප්‍රතික්ෂේප කොට නියමිත පරිදි විනය නියෝගය නිකුත් කිරීමට විනය බලධරයා ක්‍රියාකළ යුත්තේ ය.

## 36. වෛකල්පික විශ්‍රාම ගැන්වීමේ වයසට එළඹෙන නිලධරයෙකුට විරුද්ධව විනයානුකූලව කටයුතු කිරීම.

රා.ප.ච 08/2019 මගින් 36 වගන්තිය සංශෝධනය කර ඇත.

36:1 වෛකල්පික විශ්‍රාම ගැන්වීමේ වයසට එළඹෙන නිලධරයකුට විරුද්ධව, මූලික විමර්ශනයක් පැවැත්වීම හෝ විධිමත් චෝදනා පත්‍රයක් නිකුත් කර තිබීම හෝ විනය ක්‍රියා පටිපාටියේ කොටසක් වශයෙන් රාජකාරී වැඩ තහනම් කිරීමට භාජනය කර තිබීම හෝ විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීම හෝ අධිකරණය ඉදිරියේ ත්‍රස්තවාදී හෝ රාජ්‍ය විරෝධී හෝ සාපරාධී හෝ අල්ලස් හෝ දූෂණ හෝ කරුණු සම්බන්ධයෙන් නඩුවක් පවරා තිබීම හෝ ඔහුගේ සේවය දීර්ඝ කිරීම තීරණය කිරීම සම්බන්ධයෙන් සලකා බැලීමේ දී සැලකිල්ලට ගතයුතු කරුණක් නොවන්නේ ය.

36:2 රජයේ නිලධරයකුට විරුද්ධව විධිමත් විනය ක්‍රියා පටිපාටියක් ආරම්භ කර තිබිය දී ඔහු වෛකල්පික විශ්‍රාම ගැන්වීමේ වයසට එළඹීම නිසා සිය කැමැත්තෙන් විශ්‍රාම ගැනීමට ඉල්ලා සිටින අවස්ථාවක දී හෝ ඔහුගේ සේවය දීර්ඝ කිරීම අදාළ නිලධරයා විසින් වෙනත් කරුණු මත ප්‍රතික්ෂේප කොට ඇති අවස්ථාවක දී හෝ නිලධරයා අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ වයසට එළඹීමේ දී හෝ අදාළ නිලධරයා විශ්‍රාම ගැන්විය යුතු වන්නේ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 12 වගන්තියට යටත් කොටය.

36:3 සේවය දීර්ඝ කිරීම මත සේවයේ යෙදී සිටින නිලධරයකුට විරුද්ධව පැවැත්වෙන මූලික විමර්ශනය හෝ අදාළ විධිමත් විනය ක්‍රියාපටිපාටියට අදාළ කටයුතු හෝ විධිමත් විනය පරීක්ෂණය හෝ අප්‍රමාදව පවත්වා අවසන් කිරීමට හැකි සෑම විධිවිධානයක්ම යෙදීම විනය බලධරයාගේ වගකීම වන්නේ ය.

36:4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 12 වැනි වගන්තියට යටත් කොට විශ්‍රාම ගන්වන ලද නිලධරයකුට විරුද්ධව පවත්වනු ලබන මූලික විමර්ශනය, විනය පටිපාටියට අදාළ අනෙකුත් කටයුතු සහ විධිමත් විනය පරීක්ෂණය, ඔහුගේ විශ්‍රාම ගැන්වීම නොසලකා අවසානය තෙක් විනය බලධරයා විසින් පවත්වා ගෙන යා යුත්තේ ය. මෙහිදී මෙම සංග්‍රහයේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව විනය බලධරයා විසින් කටයුතු කළයුතු වන්නේ ය.

36:5 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 12 වගන්තිය යටතේ විශ්‍රාම ගන්වා ඇති නිලධරයකු තමන්ට විරුද්ධව පවත්වනු ලබන මූලික විමර්ශනයකට හෝ විධිමත් විනය පරීක්ෂණයකට හෝ සහභාගීවීම, අවශ්‍ය තොරතුරු ලබාදීම හා එම කාර්යය අප්‍රමාදව ඉටු කිරීමට සහයෝගය දැක්වීමට වගකීමෙන් බැඳී සිටින්නේ ය.

36:6 විධිමත් විනය පරීක්ෂණය අවසානයේ දී අදාළ විනය බලධරයා විසින් විධිමත් විනය පරීක්ෂණ වාර්තාව සහ අනෙකුත් ලිපිලේඛන, සැලකිල්ලට ගෙන ඔහුට නඟා තිබූ චෝදනාවලට නිවැරදිකරු යයි නිගමනය කරන්නේ නම් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 12 වගන්තියට යටත් කොට කරනු ලැබූ විශ්‍රාම ගැන්වීම සාමාන්‍ය විශ්‍රාම ගැන්වීමක් බවට පරිවර්තනය කරන ලෙස විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ට දන්වා සිටිය යුත්තේය.

36:7 විධිමත් විනය පරීක්ෂණයේ දී ඉදිරිපත් වූ කරුණු අනුව නිලධරයා එක් චෝදනාවකට හෝ චෝදනා කීපයකට හෝ සියලුම චෝදනාවලට හෝ වරදකරු වී ඇති බව විනය බලධරයා නිගමනය කරන්නේ නම් වරදකරු වී ඇති චෝදනාවේ හෝ චෝදනාවල හෝ ස්වභාවය අනුව නිලධරයාට ගෙවිය හැකිව තිබූ විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය හා වෙනත් දීමනා, සම්පූර්ණයෙන් අහිමි කිරීම හෝ යම් ප්‍රතිශතයක් අඩු කිරීම හෝ පිළිබඳව තම නිරීක්ෂණ හා නිර්දේශයන්, චෝදනා පත්‍රය හා විධිමත් විනය පරීක්ෂණ වාර්තාව ඇතුලු අදාළ අනෙකුත් සියලු ලියවිලි සමඟ රාජ්‍ය පරිපාලන විෂයභාර ලේකම්වරයා වෙත අප්‍රමාදව යැවිය යුත්තේ ය.

රා.ප.ච18/2013 මඟින් 36:7 උප වගන්තිය සංශෝධනය කර ඇත

## 37. තනතුර අතහැර යාම.

37:1 ආයතන සංග්‍රහයේ පළමුවන කාණ්ඩයේ V වන පරිච්ඡේදයේ විධිවිධානයන් යටතේ සේවය අතහැර යාමේ නිවේදනයක් ලබා සිටින නිලධරයකු එම නිවේදනයට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කිරීමට අදහස් කරන්නේ නම් එවැනි අභියාචනයක් සේවය අතහැර යාමේ නිවේදනය නිකුත් කොට මාස තුනක් ගතවීමට පෙර නිසි විනය බලධරයා වෙත ඉදිරිපත් කළයුතු වන්නේ ය.

37:2 උක්ත 37:1 උප වගන්තිය ප්‍රකාරව විනය බලධරයා වෙත අභියාචනයක් ඉදිරිපත් වූ පසු එහි සඳහන් කරුණු අනුව නිලධරයා සේවයට වාර්තා නොකොට ඇත්තේ පිළිගත හැකි හේතූන් මත බව විනය බලධරයාට පැහැදිලි වන්නේ නම් අවසර නොලබා සේවයට වාර්තා නොකිරීම සම්බන්ධයෙන් සුදුසු දඬුවම් පනවා නිලධරයා නැවත සේවයේ පිහිටුවීමට නියෝග කිරීමට විනය බලධරයාට බලය ඇත්තේ ය.

37:3 විනය බලධරයා විසින් අදාළ නිලධරයා නැවත සේවයේ පිහිටුවීම ප්‍රතික්ෂේප කොට ඇති අවස්ථාවක දී එම තීරණයට විරුද්ධව අදාළ වන පරිදි අමාත්‍ය මණ්ඩලයට හෝ රාජ්‍ය සේවා

කොමිෂන් සභාවට හෝ එම තීරණය ලබාදුන් දින සිට මාස 06 ක් ඇතුළත අභියාචනයක් ඉදිරිපත් කිරීමට අදාළ නිලධරයාට හැකියාව ඇත්තේය.

## 38. පාඨ අතර අනනුකූලතාවයක් ඇති වූ විට ක්‍රියා කළයුතු ආකාරය.

මෙම සංග්‍රහයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

## රාජ්‍ය නිලධරයන් විසින් සිදුකළ හැකි වරදවල් සම්බන්ධ පළමුවන උපලේඛනය

(1). ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අවනත නොවීම.

(2). ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය අපකීර්තියට පත්වන අයුරින් කටයුතු කිරීම හෝ එසේ කිරීමට ඉඩ හැරීම.

(3). රාජ්‍ය විරෝධී හෝ ත්‍රස්තවාදී හෝ සාපරාධී හෝ කටයුතු සම්බන්ධ වැරදි සිදුකිරීම.

(4). අල්ලස් හෝ දූෂණ හෝ කටයුතු සම්බන්ධයෙන් වැරදි සිදුකිරීම

(5). රාජකාරී වේලාව තුළ දී හෝ රජයේ කාර්යාල පරිශ්‍රයක් තුළ දී හෝ මත්පැන් පානය කර සිටීම.

(6). රාජකාරී වේලාව තුළ දී හෝ රජයේ කාර්යාල පරිශ්‍රයක් තුළ දී හෝ විෂ මත්ද්‍රව්‍ය පාවිච්චි කිරීම හෝ ඒවා ළඟ තබා ගැනීම.

(7). රජයේ මුදල් සාවද්‍ය ලෙස හෝ අයථා ලෙස හෝ පරිහරණය කිරීම හෝ වෙනත් අයෙකුට එසේ කිරීමට ඉඩ සැලසීම.

(8). රජයේ සම්පත් සාවද්‍ය ලෙස හෝ අයථා ලෙස හෝ පරිහරණය කිරීම හෝ එසේ කිරීමට ඉඩහැරීම හෝ අවධානයෙන් හෝ අනවධානයෙන් හෝ ඒවා විනාශ වීමට හෝ වටිනාකම අඩුවීමට හෝ ඉඩ හැරීම.

(9). නොසැලකිල්ලෙන් හෝ අනවධානයෙන් හෝ හිතාමතා හෝ රජයේ අයිතිවාසිකම්වලට හානිවන අයුරින් ක්‍රියා කිරීම හෝ එසේ කිරීමට ඉඩහැරීම.

(10). රාජ්‍ය සේවය අපකීර්තියට පත්වන අයුරින් කටයුතු කිරීම.

(11). රජයට හෝ රාජ්‍ය සේවයට හෝ රාජ්‍ය ආයතනයකට හෝ හානිකර විය හැකි අයුරින් තොරතුරු අනාවරණය කිරීම හෝ ඒවායේ පිටපත් නිසි බලධරයකුගේ අවසරයක් නොමැතිව වෙනත් පාර්ශවයක් වෙත ලබාදීම හෝ එසේ කිරීමට ඉඩ සැලසීම.

(12). රාජකාරී ලිපිලේඛන වෙනස් කිරීමට හෝ විකෘති කිරීමට හෝ විනාශ කිරීම හෝ කූට ලේඛන සැකසීමට හෝ කටයුතු කිරීම.

(13). රජයේ නිලධරයකුගේ රාජකාරී කටයුතුවලට බාධාවන අයුරින් හැසිරීම හෝ කටයුතු කිරීම හෝ රජයේ නිලධරයකුට අපහාස කිරීම හෝ අවඥා කිරීම හෝ ශාරීරික පීඩා පැමිණවීම හෝ තර්ජනය කිරීම.

(14). ජ්‍යෙෂ්ඨ නිලධරයකුගේ නීත්‍යානුකූල නියෝග ක්‍රියාත්මක කිරීම ප්‍රතික්ෂේප කිරීම හෝ අකීකරු වීම හෝ පැහැර හැරීම.

(15). ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසි, රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, භාණ්ඩාගාර චක්‍රලේඛ, දෙපාර්තමේන්තු චක්‍රලේඛ, දෙපාර්තමේන්තු අත්පොත්වල සහ උපදෙස් සංග්‍රහවල විධිවිධාන ද උල්ලංඝනය කිරීම හෝ හිතාමතා හෝ අනවධානයෙන් හෝ නොසලකා හැරීම හෝ මගහැරී යන ආකාරයෙන් කටයුතු කිරීම.

(16). ඉහත දක්වා ඇති වැරදි සිදු කිරීමට අනුබලදීම හෝ සහාය වීම හෝ ඒවා කිරීම සඳහා ඉඩකඩ සලසා දීම.

## රාජ්‍ය නිලධරයන් විසින් සිදුකළ හැකි වරදවල් සම්බන්ධ දෙවන උපලේඛනය

ඉහත පළමුවන උපලේඛනය යටතට නොවැටෙන නමුත් නිලධරයකුගේ අකාර්යක්ෂමතාවය, අදක්ෂතාවය, අනවධානය, අවංකභාවය නැතිකම, අනිසි හැසිරීම, නොසැලකිල්ල හා අවිනය නිසා සිදුකරනු ලබන වෙනත් වැරදි.

## පරිශිෂ්ට ලැයිස්තුව


| පරිශිෂ්ට අංකය | මාතෘකාව | පිටුව |
| --- | --- | --- |
| 1 වැනි පරිශිෂ්ටය | රජයේ සේවකයන් වෙතින් සිදුවන හෝ රජයේ සේවකයන් විසින් සිදු කරනු ලබන හෝ වැරදි පිළිබඳ විග්‍රහය. | 97 |
| 2 වැනි පරිශිෂ්ටය | පරීක්ෂණ විනිශ්චය සභාවලට මඟ පෙන්වීම සඳහා පිළියෙල කළ සටහන් | 101 |
| 3 වැනි පරිශිෂ්ටය | විනයානුකූල දඬුවම්වලට විරුද්ධව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන අභියාචනා පිළිබඳව අමාත්‍යාංශ ලේකම්/ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ වාර්තාව සඳහා ආකෘති පත්‍රය | 105 |
| 4 වැනි පරිශිෂ්ටය | සේවය අතහැර යාමේ නියෝගයකට විරුද්ධව රාජ්‍ය සේවා කොමිෂන් සභාවට කරනු ලබන අභියාචනා පිළිබඳ වාර්තා ඇතුළත් ආකෘති පත්‍රය | 107 |
| 5 වැනි පරිශිෂ්ටය | ආදර්ශ චෝදනා පත්‍රය (චූදිත නිලධරයකු වෙත විනය බලධරයකු විසින් නිකුත් කරනු ලබන චෝදනා පත්‍රයක ආදර්ශ අකෘතිය) | 109 |
| 6 වැනි පරිශිෂ්ටය | ආදර්ශ චෝදනා පත්‍රය (විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 12 වන වගන්තියට යටත් කොට විශ්‍රාම ගන්වන ලද නිලධාරියෙකුට නිකුත් කළයුතු චෝදනා පත්‍රයක ආදර්ශ ආකෘතිය) | 111 |

# 1 වැනි පරිශිෂ්ටය

## රජයේ සේවකයන් වෙතින් සිදුවන හෝ රජයේ සේවකයන් විසින් සිදු කරනු ලබන හෝ වැරදි පිළිබඳව විග්‍රහය

(1). රජයේ සේවකයන් විසින් සිදුකරනු ලැබිය හැකි වැරදි පහත සඳහන් අයුරින් පුළුල් ලෙස විග්‍රහ කළ හැකිය. එසේ වුව ද එම විග්‍රහය සියලුම වැරදි ඇතුළත් කොට සකස් කොට ඇති අංග සම්පූර්ණ විග්‍රහයක් ලෙස නොසැලකිය යුතු අතර, යම් නිලධරයකුට දඬුවම් කළයුතු යැයි සැලකෙන්නා වූ එහෙත් මෙම විග්‍රහයට ඇතුළත් නොවන්නා වූ වෙනත් වැරදි සම්බන්ධයෙන් කටයුතු කිරීම මෙම විග්‍රහය මගින් වළක්වනු නොලබන්නේ ය.

(2). වැරදි, මෙහි පහත දැක්වෙන ශීර්ෂ යටතේ පුළුල් ලෙස වර්ග කළ හැකිය.

අකාර්යක්ෂමතාව,
අදක්ෂතාවය,
නොසැලකිල්ල,
අවංකභාවය නැතිකම,
අනිසි (නිලධරයාගේ රාජකාරී කටයුතු හා සම්බන්ධ වුවත්, නැතත්) හැසිරීම, අවිනය

**අකාර්යක්ෂමතාව :-** මෙය අදක්ෂතාව හෝ නොඑසේ හෝ ඇතිවිය හැක්කකි. නිලධරයකුගෙන් අපේක්ෂිත රාජකාරී කොටස ඔහුගේ උදාසීන භාවය හෝ අනවධානය හෝ වෙනත් දෝෂයක් හෝ හේතුකොට ගෙන සෑහෙන තත්ත්වයකින් ඉටු නොවීම අකාර්යක්ෂමතාව වේ.

**අදක්ෂතාව :-** මෙය ඇති වන්නේ නිලධරයකුගේ තත්ත්වය, ජ්‍යෙෂ්ඨත්වය, ඔහු කෙරෙහි පැවරී ඇති වගකීම් මට්ටම, ඔහුගේ වයස, පළපුරුද්ද, ඔහු දරන තනතුරට බඳවා ගැනීම සඳහා සාමාන්‍යයෙන් නියම කෙරෙන සුදුසුකම් යනාදී කරුණු අනුව සලකා බලන කල ඔහුගේ රාජකාරී කාර්යක්ෂම ලෙස ඉටු කිරීම සඳහා බුද්ධිය අතින් හෝ හතිගුණ අතින් හෝ ශාරීරික අතින් හෝ වෙනත් කරුණු අතින් හෝ ඔහු කෙරෙහි පිහිටා තිබිය යුතු නැතහොත් ඔහු විසින් වර්ධනය කරගෙන තිබිය යුතු යයි අපේක්ෂා කෙරෙන ගුණාංග නොතිබීම නිසාය. මෙය ශිල්පීය, වෘත්තීය හෝ පරිපාලනාත්මක අදක්ෂතාවක් හෝ කාර්ය මණ්ඩල හෝ කම්කරුවන් පාලනය කිරීමේ අදක්ෂතාවක් හෝ සිය කාර්යාලයේ වෙනත් පෞද්ගලික සම්බන්ධතා විෂයෙහි වූ අදක්ෂතාවක් හෝ විය හැකි ය.

**නොසැලකිල්ල :-** තමාට පවරන ලද රාජකාරී කටයුතු පැහැර හැරීම නොසැලකිල්ල වේ. සැලකිල්ලක් හෝ අනලස් බවක් හෝ නොමැතිවීම නිසා සිදුවන ප්‍රමාද දෝෂ හා වැරදි යනාදියත්, රජයේ මුදල් නාස්ති නොවන බවට හෝ රජයේ දේපළවලට අලාභහානි නොවන බවට වගබලා ගනිමින් වැඩ පිළිවෙලක් හා කාර්ය මණ්ඩල යනාදිය අධීක්ෂණය නොකිරීමත් මීට ඇතුළත් වේ.

**අවංකභාවය නැතිකම :-** අනිසි පෞද්ගලික ලාභයක් ලබා ගැනීමේ අරමුණ ඇතිව යම් යම් කටයුතු කිරීම හෝ යම් යම් කටයුතු නොකර හැරීම, වංචාව, රැවටීම, සොරකම, හොර අත්සන් තැබීම/ ව්‍යාජ ලේඛන පිළියෙල කිරීම, වංක භාවය, වාර්තා ලිවීමේ දී සත්‍යය මුළුමනින්ම හෝ කොටස් වශයෙන් හෝ වසන් කිරීම, ලිපි ලේඛන හෝ කරුණු යටපත් කිරීම, අල්ලස් ගැනීම හෝ දීම, තමාගේම ලාභ ප්‍රයෝජන තකා හෝ තම නෑ මිතුරන්ගේ ලාභ ප්‍රයෝජන තකා හෝ තම නිල තත්ත්වය පාවිච්චි කිරීම නැතහොත් තම රාජකාරී කටයුතු ක්‍රියාවේ යෙදවීම, පෞද්ගලික කරුණු සඳහා රජයේ දේපළ හෝ යටත් සේවකයන්ගේ සේවය හෝ යොදා ගැනීම, තම රාජකාරී කටයුතු ඉටු කිරීමේ දී තමාට නිල වශයෙන් ඇසුරු කිරීමට සිදුවන නැතහොත් තම රාජකාරී කටයුතු ඉටු කිරීමේ දී දැනට හෝ මතුවට හෝ උපකාරයක් කිරීමට තමාට හැකිවන පුද්ගලයන්ගෙන් හෝ ව්‍යාපාර ආයතනවලින් හෝ තුටු පඬුරු හෝ උදව් උපකාර හෝ භාර ගැනීම, පෞද්ගලික ඕනෑ එපාකම් හා තම රාජකාරී කටයුතු අතර නියත සට්ටනයක් ඇතිවන වෙනත් ක්‍රියා යන මේවා ය.

**අනිසි හැසිරීම :-** රාජකාරී කටයුතු හා සම්බන්ධයෙන් බලන විට, අනිසි හැසිරීම යනුවෙන් අදහස් කෙරෙන්නේ නිලධරයකු නිල වශයෙන් භුක්ති විඳින විශ්වාසය කඩ කිරීම, වැඩ කරන ස්ථානයේ දී හෝ වේවා වැඩ කරන ස්ථානයෙන් පිටත දී හෝ වේවා සිය යටත් සේවකයන් සම්බන්ධයෙන් අවිචාරවත් ලෙස ක්‍රියා කිරීම, ප්‍රසිද්ධියේ අදහස් උදහස් පළ නොකළ යුතු යයි නිලධරයාට තහනම් කොට ඇති කරුණු සම්බන්ධයෙන් ප්‍රසිද්ධියේ කථා කිරීම හෝ ලිපි පළ කිරීම තහනම් කොට ඇති විටෙක දී දේශපාලන කටයුතුවල නිරතවීම, රජයට පක්ෂපාත නොවන ලෙස සිය යටත් සේවකයන් පෙළඹවීම, සිය නිල තත්ත්වයට හානිකර විය හැකි යයි පෙනෙන නැතහොත් රජයේ සේවය කෙළෙසන නැතහොත් රජයේ සේවය හෝ තමා දරන තනතුර හෝ අපකීර්තියට ලක් කෙරෙන වෙන යම්කිසි ක්‍රියාවක් කිරීම, සිය පෞද්ගලික ඕනෑ එපාකම් හා රාජකාරී කටයුතු හා අතර ඇත්ත වශයෙන් ම ගැටුමක් නැතත්, එසේ ගැටුමක් ඇතැයි පෙනී යන අන්දමේ ක්‍රියාවක් කිරීම වැනි කරුණු ය. සිය රාජකාරී කටයුතු හෝ සම්බන්ධ නොවන අනිසි හැසිරීම යනුවෙන් අදහස් කෙරෙන්නේ බේබදුකම, මත්ද්‍රව්‍ය භාවිතය, ප්‍රසිද්ධ ස්ථානවල අසංවර ලෙස හැසිරීම, මහජනයාගේ ගර්හාවට පාත්‍රවන අන්දමේ දුරාචාරය වැනි කරුණු හා රජයේ සේවය හෝ තමා දරන තනතුර හෝ අපකීර්තියට ලක් කෙරෙන වෙනත් ක්‍රියා ය.

**අවිනය :-** කලට වේලාවට සේවයට නොපැමිණීම, නියෝග ඉටු කිරීම ප්‍රතික්ෂේප කිරීම, උසස් නිලධරයන්ට, යටත් සේවකයන්ට හෝ මහජනයාට අශිෂ්ට ලෙස කතා කිරීම, රාජකාරියෙහි යෙදී සිටින විට බීමත්ව සිටීම, මත්ද්‍රව්‍ය භාවිතා කර සිටීම, අවසර නැතිව කාර්යාලයෙන් ඉවත් වී යාම යනාදිය අවිනය වශයෙන් සැලකේ.

මුදල් රෙගුලාසි සංග්‍රහයේ හෝ, ආයතන සංග්‍රහයේ හෝ දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි යනාදියෙහි හෝ විධිවිධාන උල්ලංඝනය කිරීම් වනාහී අදක්ෂතාව, අනවධානය හෝ අවංක භාවය නැතිකම නිසා ද පැන නැගිය හැකි නිශ්චය වැරදි ය.

**නිදර්ශන :-** නීතිය ක්‍රියාත්මක කරන නිලධරයකු හෝ ඇතැම් අවස්ථාවල දී රජයේ නිලධරයකු හෝ නීති කඩකරන්නකු සමඟ නැතහොත් නීති කඩකරන්නකු වශයෙන් ප්‍රකට පුද්ගලයකු සමඟ ආශ්‍රය කරතොත් ඔහු අනිසි හැසිරීම සම්බන්ධයෙන් වරදකරුවෙකු වන්නේ ය.

සිය රාජකාරී කටයුතු කිරීමේ දී නිලධරයකුට නිල වශයෙන් ඇසුරු කිරීමට සිදුවන ව්‍යාපාරික ආයතනයක් සමඟ පෞද්ගලික සම්බන්ධකම් පවත්වන විටෙක දී, ඉදින් ඒ සම්බන්ධකම් නිසා තමාට ලාභ ප්‍රයෝජනයක් නොලැබෙතත්, ඒ ආයතනය සමඟ එබඳු සම්බන්ධකමක් පවත්වන බව ඔහු විසින් තම උසස් නිලධරයාට දන්වා නැත්නම් ඒ නිලධරයා අනිසි හැසිරීම සම්බන්ධයෙන් වරදකරුවෙක් වන්නේ ය.

යම් නිලධරයෙකුගේ දරුවෙකු, එම නිලධරයාට සිය රාජකාරී කටයුතු කිරීමේ දී නිල වශයෙන් ඇසුරු කිරීමට සිදුවන ව්‍යාපාරික ආයතනයක රක්ෂාවක් හෝ ආධුනික තත්ත්වයේ තනතුරක් හෝ ඉල්ලුම් කොට, හුදෙක් ස්වකීය කුසලතාවය නිසාම එය ලබාගත් අවස්ථාවක දී වුව ද ඒ බව එම නිලධරයා විසින් තම උසස් නිලධරයාට දන්වා නැත්නම්, ඒ නිලධරයා අනිසි හැසිරීම සම්බන්ධයෙන් වරදකරුවෙකු වන්නේ ය.

යම් නිලධරයෙකු ඉහතින් සඳහන් කරන ලද ක්‍රියාවල ප්‍රතිඵලයක් වශයෙන් යම්කිසි පෞද්හලික ලාභ ප්‍රයෝජනාදියක් ලබා ගතහොත් එවිට එම නිලධරයා අවංක භාවයක් නැතිකම සම්බන්ධයෙන් වරදකරුවෙකු වන්නේ ය. සුභ සාධක සංගමයක් හෝ වෙනත් සංගමයක් සඳහා ලාභ ප්‍රයෝජනාදිය ලබා ගැනීම හෝ එබඳු සංගමයක මුවාවෙන් නොහොත් එහි නමින් යම් යම් ක්‍රියා කිරීම අනිසි හැසිරීමක් ලෙස නොහොත් අවංක භාවය නොමැති වීමක් ලෙස ඇතැම් අවස්ථාවල දී සලකනු ලැබිය හැකිය.

වරදක බරපතලකම තීරණය කළ යුත්තේ එය අනිත් කරුණුවලින් වෙන් කොට ගෙන තනිව සලකා බලා පමණක් නොව, අදාළ පුද්ගලයා දරන තනතුර ද එම වරදට සම්බන්ධ අනිත් කරුණු ද සාපේක්ෂව සලකා බැලීමෙනි.

ඉහතින් සඳහන් කරන ලද වර්ගවලට අයත් වන වැරදි (මේ වගන්තිය ඇසුරෙන් තීරණය කළ යුතු වන පරිදි) ඒවායේ බරපතලකමත් වරද ඔප්පු වූයේ වී නම් එම වරදට සම්බන්ධ අනිත් කරුණු ද සාපේක්ෂව සලකා බැලීමෙනි.

ඉහතින් සඳහන් කරන ලද වර්ගවලට අයත් වන වැරදි (මේ වගන්තිය ඇසුරෙන් තීරණය කළ යුතු වන පරිදි) ඒවායේ බරපතලකමත් වරද ඔප්පු වී නම් ඊට උචිත යැයි පෙනෙන දඬුවමක් පදනම් කොට ගෙන අවස්ථානුකූලව පළමු හා දෙවන යන උප ලේඛනවලින් එකකට ඇතුළත් කර ගත හැකිය.

තමා විසින් තම අමාත්‍යවරයාට නිවැරදි උපදෙස් ලියා ඉදිරිපත් කරන ලද්දේ වී නමුත්, එම උපදෙස් ප්‍රතික්ෂේප කරන ලද බව ඔප්පු කිරීමට නිලධරයකුට හැකිනම් මිස, තමා යමක් කළේ නැතහොත් යමක් පැහැර හැරියේ තම අමාත්‍යවරයාගේ නියෝග යටතේ යයි කී පමණින් නිලධරයකු නිර්දෝෂී කිරීමට නුපුළුවන. පළමු උපලේඛනයේ විස්තර කර ඇති අන්දමේ වැරදි සම්බන්ධයෙන් මේ විධිවිධාන විශේෂයෙන් බලපාන්නේ ය.

**9-H 2302**

## 2 වැනි පරිශිෂ්ටය

### පරීක්ෂණ විනිශ්වය සභාවලට මග පෙන්වීම සඳහා පිළියෙල කළ සටහන්

1. පරීක්ෂණ පවත්වන දිනය හා වේලාව, පරීක්ෂණ පවත්වන ස්ථානය, පැමිණිල්ල මෙහෙයවන නිලධරයාගේ නම සහ චූදිතයාගේ නම, ඔහුගේ රැකවරණ නිලධරයාගේ නම යන කරුණු පරීක්ෂණ විනිශ්වය සභාවේ සෑම රැස්වීම් වාරයක් ආරම්භයේ දීම පරීක්ෂණ සටහන්වල ලිවිය යුතු ය.

2. සාක්ෂිකරුවන්ට ඔවුන්ට වඩාත් හුරුපුරුදු භාෂාවෙන් සාක්ෂිදීමට පුළුවන. විනිශ්වය සභාවට හෝ විත්ති පක්ෂයට හෝ අදාළ භාෂාව හොඳින් අවබෝධ නොවන්නේ නම් එහිදී අදාළ සාක්ෂි පරිවර්තනය කළයුතු ය. දිවුරා සාක්ෂිදීම අවශ්‍ය නැත.

3. සියලුම සාක්ෂි සටහන් කරගත යුත්තේ අවිච්චින්න වෘත්තාන්තයක් ලෙස ප්‍රකෘති කථනයෙන් මිස ප්‍රශ්නෝත්තර ආකාරයෙන් නොවේ. උදාහරණ ලෙස "ඔහු කාර්යාලයෙන් ඉවත් වී යනු තමා එවිට දුටුවේය" යයි සාක්ෂිකරු කියයි යන්න වෙනුවට "ඔහු කාර්යාලයෙන් ඉවත් වී යනවා මම එතකොට දැක්කා" යනුවෙන් සටහන් කරගත හැකිය. එහෙත් සටහන් කරන කරුණුවල අර්ථය නිසැකවම අවබෝධ වන ලෙස ඇතැම් අවස්ථාවල දී ප්‍රශ්නෝත්තර වශයෙන් සාක්ෂි සටහන් කරගැනීම අවශ්‍ය වූ විට එසේ කළ හැකිය.

4. සාක්ෂිකරුවකුගේ සාක්ෂිය ඔහු මූලික විමර්ශනයේ දී දෙන ලද සාක්ෂිවලට ප්‍රතිවිරුද්ධ වන විට ඊට හේතුව පැහැදිලි කරන ලෙස ඔහුගෙන් ඉල්ලා සිටිය යුතු ය. ඊට හේතුව පැහැදිලි කළහොත් ඒ සම්බන්ධයෙන් ඔහු කියන කරුණු සටහන් කරගත යුතු ය. ඊට හේතුව පැහැදිලි කිරීමට තමාට නොහැකි බව කියා සිටියහොත් එය ද සටහන් කරගත යුතු ය. එසේ ප්‍රශ්න කළ විට සාක්ෂිකරු නිහඬවෙයි නම් එවිට හතරැස් වරහන් තුළ සටහන් කරගත යුතු ය. මෙහි දී විනිශ්වය සභාව මෙම සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ 20 වැනි වගන්තිය පිළිබඳව ද සිය අවධානය යොමු කළ යුතු ය.

5. සාක්ෂිකරු පිළිතුරක් ලබාදීම ප්‍රතික්ෂේප කරයි නම් ප්‍රශ්නය සටහන් කොට "සාක්ෂිකරු පිළිතුරු නොදෙයි" යන්න හතරැස් වරහන් තුළ සටහන් කළ යුතු ය.

6. සටහන් කරගන්නා ලද සාක්ෂිවලින් පැනනැඟෙන්නා වූ ද, සටහන් කර තැබීමට විනිශ්වය සභාව අදහස් කරගන්නා වූ ද වෙනයම් නිරීක්ෂණ වෙතොත් ඒවා ද, පූර්වෝක්ත ක්‍රමයටම හතරැස් වරහන් තුළ සටහන් කළ යුතු ය. උදා : "ජේම්ස් හිරේ ගොස් තිබෙන බව ඔබ දන්නවාදැයි" මවිසින් ඔහුගෙන් අසන ලද ප්‍රශ්නයට විත්ති පක්ෂය විරෝධය පළකරයි. මම විත්ති පක්ෂයට සවන් දී ඒ විරෝධය නිෂ්ප්‍රභ කරමි.

7. එමෙන්ම විධිමත් විනය පරීක්ෂණයට අදාළ වෙනත් නිරීක්ෂණ ඇත්නම් ඒ ඒ ගැටලු පැනනගින එක් එක් අවස්ථාවන්හි දී අදාළ නිරීක්ෂණ පරීක්ෂණ සටහන්වල අන්තර්ගත කොට සටහන් කළයුතුය. උදා : "මේ අවස්ථාවේ දී සාක්ෂිකරු කලබලකාරී වෙයි. මම /අපි පැය භාගයකට පරීක්ෂණය කල් දමමි/ දමමු."

8. පැමිණිලි පක්ෂයේ සාක්ෂිකරුවන්ගේ සාක්ෂි මෙහෙයවා අවසන් වූ පසු තමාගේ නිදහසට කරුණු කියා සිටීම සඳහා සාක්ෂිකරුවන් කැඳවන්නේ ද යන්න චූදිත නිලධරයාගෙන් විමසා ඔහුගේ පිළිතුර සටහන් කළ යුතු ය. ඉනික්බිති විත්ති පක්ෂයේ සාක්ෂිකරුවෙක් ඇත්නම් ඔවුන්ගේ සාක්ෂි සටහන් කර ගත යුතු ය. විත්ති පක්ෂය සිය සාක්ෂි මෙහෙයවා අවසන් වූ පසු පැමිණිලි පක්ෂයේ සාක්ෂිකරුවන්ගෙන් නැවත සාක්ෂි විමසන්නේ නම් හෝ අලුත් සාක්ෂිකරුවන් කැඳවන්නේ නම් හෝ විත්ති පක්ෂයට ද ඒ පහසුකම ලබාදිය යුතු ය.

9. සාක්ෂිකාරයකුගේ සාක්ෂි විමසා අවසන් වූ විට, තම ප්‍රකාශය කියවා බලා, "කියවා බලා නිවැරදි බව පිළිගනිමි" යන සටහන ලියා එය අත්සන් කරන ලෙස ඔහුට දැන්විය යුතු ය. විනිශ්වය සභාව ද

ප්‍රකාශය අත්සන් කළ යුතු ය. සාක්ෂිකරු සාක්ෂි දුන් බසින් හැර වෙනත් බසකින් සාක්ෂි සටහන් කරගන්නා ලද්දේ නම්, විනිශ්චය සභාව විසින් සටහන් කරගෙන ඇති සාක්ෂිය ඒ අයුරින්ම සාක්ෂිකරුට කියවා තේරුම් කර දී "මම විසින් කියවා තේරුම් කර දෙන ලදී" යන්න ලියා, එහි අත්සන් කළ යුතු ය. සටහන් කරගෙන තිබෙන හැටියට යම්කිසි කරුණක් තමා පළ නොකළේ යයි සාක්ෂිකරු කියතොත්, ඒ බව, සටහන් කර ගෙන තිබෙන සාක්ෂිය සමඟම ඊට පහළින් සාක්ෂිකරුගේ අත්සන ලබා ගැනීමට පෙර විනිශ්චය සභාවේ නිරීක්ෂණත් සහිතව හතරැස් වරහන් තුළ සටහන් කළ යුතු ය.

10. සාක්ෂිකරුගෙන් අසනු ලබන ප්‍රශ්න සරල ඒවා විය යුතු ය. එම ප්‍රශ්න ඇසිය යුත්තේ ඔහු දුටු සිද්ධීන් සම්බන්ධයෙන් ඔහුගෙන් ලබාගත හැකි සෑම තොරතුරක්ම, එනම්, කෙලින්ම ඔහු දුටුවා වූ හෙවත් වෙනත් අන්දමකින් කෙලින්ම ඔහුගේ නිරීක්ෂණයට භාජන වූ නොහොත් ඔහුට පෙනී ගියා වූ හෝ සියලුම කරුණු හැකිතාක් දුරට කාල ක්‍රමානුගතව අනාවරණය කරවා ගත හැකි පරිද්දෙනි. ප්‍රස්තුත කාරණය සම්බන්ධයෙන් තමා දන්නා දේ නොහොත් තොරතුරු කියන ලෙස සාක්ෂිකාරයකුගෙන් ඉල්ලා සිටීම හුදෙක් කල්තියා සකස් කරගත් විස්තරයක් කියා පෑමට ඔහුට අවස්ථාවක් ලබා දීමකි. එහෙයින් සාමාන්‍ය රීතියක් වශයෙන් එබඳු ඉල්ලීමක් කිරීමට ඉඩ නොදිය යුතු ය.

11. වෙනත් පුද්ගලයකු තමාට කී දෙයක්, ඉදින් ඒ පුද්ගලයාගේ ප්‍රකාශය ඒ වන විට සටහන් කරගෙන තිබෙතොත් හෝ පරීක්ෂණය පවත්වා ගෙන යන අතර සටහන් කර ගනු ලබන්නේ නම් හෝ මිස, තම සාක්ෂියේ දී සඳහන් කරන්නට සාක්ෂිකාරයකුට ඉඩ නොදිය යුතු ය.

12. ප්‍රස්තුත කාරණය පිළිබඳව නියම තත්ත්වය අනාවරණය කර ගැනීම විනිශ්චය සභාවේ යුතුකම වන්නේ ය. එහෙයින් ඇත්ත නැත්ත සොයා ගැනීමට, කලින් සාක්ෂි දුන් පුද්ගලයන් යළිත් කැඳවීමට විනිශ්චය සභාවට පුළුවන. පරීක්ෂණය අවසානයේ දී නිලධරයාට විරුද්ධව ඇති චෝදනාව හෝ චෝදනා සම්බන්ධයෙන් ඔහු වැරදිකරු ද නිවැරදිකරු ද යන්න නියත වශයෙන් කීමට විනිශ්චය සභාවට පුළුවන් විය යුතු ය.

13. පරීක්ෂණයේ දී පැමිණිලි පක්ෂය වෙනුවෙන් ඉදිරිපත් කරන ද්‍රව්‍ය (ඒවා ඉදිරිපත් කරන අනු පිළිවෙලට) පැ.1, පැ.2 යනුවෙන් ද විත්ති පක්ෂය වෙනුවෙන් ඉදිරිපත් කරන ද්‍රව්‍ය වි.1, වි.2 යනුවෙන් ද ලකුණු කර විනිශ්චය සභාව විසින් එහි කෙටි අත්සන යෙදිය යුතු ය.

14. විනිශ්චය සභාව විසින් සිය නිගමනවලට එළඹීමේ දී යම්කිසි කරුණක් ඔප්පු වී ඇතැයි සැලකිය යුත්තේ සියලුම සාක්ෂි සලකා බැලීමෙන් පසුව එය එසේ යයි විශ්වාස කරතොත් හෝ අදාළ තත්ත්වය යටතේ එය එසේම වන්නට ඇතැයි සිතා ක්‍රියා කිරීමට විචක්ෂණ පුද්ගලයකු පොළඹවන තරම් සම්භාව්‍ය යයි සලකතොත් හෝ පමණි. විනිශ්චය සභාව විසින් යම් කරුණක් ඔප්පු වී නැතැයි සැලකිය යුත්තේ සියලුම සාක්ෂි සලකා බැලීමෙන් පසුව එය එසේ නොවේ යයි ඒත්තු ගෙන අදාළ තත්ත්වය යටතේ එය එසේ නොවේ යයි සිතා ක්‍රියා කිරීමට විචක්ෂණ පුද්ගලයකු පොළඹවන තරම් අසම්භාව්‍ය යයි සලකතොත් පමණි. යම් කරුණක් සත්‍ය බැව් ඔප්පු වී නොමැත්තේ ද එසේම අසත්‍ය බැව් ඔප්පු වී නොමැත්තේ ද වේ නම් එම කාරණය ඔප්පු නොවූ බව සැලකිය යුතු ය.

15. විනිශ්චය සභාවේ නිගමනවලට පදනම් කරගත යුත්තේ එය වෙත ඉදිරිපත් කෙරෙන සනාථ වූ කරුණු මිස අනුමාන සිතිවිලි මාත්‍ර නොවේ. එහෙත්, ප්‍රස්තුත කාරණයට අදාළ තොරතුරු මඟින් ප්‍රකටව පෙන්නුම් කෙරෙන අනුමිතිවලට එළඹීමේ වරදක් නැත.

## 3 වැනි පරිශිෂ්ටය

### විනයානුකූල දඬුවම්වලට විරුද්ධව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන අභියාචනා පිළිබඳව අමාත්‍යාංශ ලේකම් / දෙපාර්තමේන්තු ප්‍රධානයාගේ වාර්තාව සඳහා ආකෘති පත්‍රය (මෙම වාර්තාව සමඟ අදාළ සියලුම ලිපිගොනු ද එවන්න)

1. නිලධරයාගේ නම :-
2. දෙපාර්තමේන්තුව / අමාත්‍යාංශය :-
3. තනතුර :-
4. උපන් දිනය :-
5. රජයේ සේවයට පත්වීමේ දිනය :-
6. වර්තමාන තනතුරට පත්කල දිනය :-
7. පත්වීම ස්ථිර කළ දිනය :-
8. වැටුප : (i). වැටුප් පරිමාණය :-
   (ii). වැටුප් පරිමාණයේ වැටුප් පියවර :-
   (iii). උපයා ඇති වැටුප් වර්ධක සංඛ්‍යාව :-
9. මාණ්ඩලික ශ්‍රේණිය ද, මාණ්ඩලික නොවන ශ්‍රේණිය ද යන වග :-
10. වැඩ තහනම් කර සිටින්නේ නම්, ඒ කෙදිනක සිට ද යන වග :-
11. වැඩ තහනම් කර සිටි කාලය තුළ දී වැටුප් හා දීමනාවලින් කොටසක් ගෙවනු ලැබුවේ නම් ඒ පිළිබඳ විස්තර :-
12. පරීක්ෂණය පැවැත්වූ නිලධරයාගේ නම සහ තනතුර :-
13. නිලධරයා විසින් චෝදනාවලට එවන ලද පිළිතුරුවලට යොමුව :-
14. පරීක්ෂණවල සටහන්වලට යොමුව :-
    (i). මූලික :-
    (ii). විධිමත් :-
    (iii). ලියවිලි :-
15. පරීක්ෂණ නිලධරයාගේ වාර්තාවට යොමුව :-
    (i). මූලික :-
    (ii). විධිමත් :-
16. විනය නියෝගය :-
17. විනය බලධරයාගේ නියෝගයට යොමුව :-
18. පසුගිය සේවය පිළිබඳ වාර්තා සැකෙවින් :-

19.

| චෝදනා | පරීක්ෂණ නිලධරයාගේ නිගමනයන් |
|---|---|
| 1. | |
| 2. | |

20. අභියාචනයේ සඳහන් එක් එක් කරුණු මත ලේකම්වරයාගේ / දෙපාර්තමේන්තු ප්‍රධානයාගේ නිරීක්ෂණයන් :-
21: ලේකම්වරයාගේ හෝ දෙපාර්තමේන්තු ප්‍රධානයාගේ නිර්දේශය :-

................................................
ලේකම් / දෙපාර්තමේන්තු ප්‍රධානයා

දිනය :- ...............................................................

## 4 වැනි පරිශිෂ්ටය

### සේවය අතහැර යාමේ නියෝගයකට විරුද්ධව රාජ්‍ය සේවා කොමිෂන් සභාවට කරනු ලබන අභියාචනා පිළිබඳව වාර්තා ඇතුළත් ආකෘති පත්‍රය (මෙම වාර්තාව සමඟ පහත සඳහන් අදාළ සියලුම ලිපිගොනු ද එවන්න)

(1). නිලධරයාගේ නම :-
(2). දෙපාර්තමේන්තුව / අමාත්‍යාංශය :-
(3). තනතුර :-
(4). උපන් දිනය :-
(5). රජයේ සේවයට පත්වීමේ දිනය :-
(6). වර්තමාන තනතුරට පත්වූ දිනය :-
(7). වැටුප (i). වැටුප් පරිමාණය :-
(ii). වැටුප් පරිමාණයේ වැටුප් පියවර :-
(iii). උපයා ඇති වැටුප් වර්ධක සංඛ්‍යාව :-
(8). මාණ්ඩලික ශ්‍රේණිය ද, මාණ්ඩලික නොවන ශ්‍රේණිය ද යන වග :-
(9). සේවය අතහැර යාමේ නියෝගය නිකුත් කර ඇත්තේ කෙදිනක සිට ද යන වග :-
(10). නිලධරයාගේ පූර්ව සේවය පිළිබඳ සංක්ෂිප්ත වාර්තාව :-
(11). අභියාචනයේ සඳහන් එක් එක් කරුණු සංඛ්‍යාව හෝ දෙපාර්තමේන්තුවේ / අමාත්‍යාංශයේ හෝ අමාත්‍යාංශ ලේකම්ගේ නිරීක්ෂණයන් :-
(12). දෙපාර්තමේන්තු ප්‍රධානයාගේ හෝ ලේකම්වරයාගේ නිර්දේශය (පැහැදිලිව සැකෙවින්)

......................................................................
දෙපාර්තමේන්තු ප්‍රධානයා / ලේකම්වරයා.

දිනය :- .............................................

5 වැනි පරිශිෂ්ටය

**ආදර්ශ චෝදනා පත්‍රය**

**(චූදිත නිලධරයකු වෙත විනය බලධරයකු විසින් නිකුත් කරනු ලබන චෝදනා පත්‍රයක ආදර්ශ ආකෘතියකි.)**

ඔබ ..................................................................................................................................... නිලධරයකු වශයෙන් ................................................................................................................... සේවය කරමින් සිටිය දී ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ ........................................... උපලේඛනය යටතට ගැනෙන පහත සඳහන් චෝදනාවන්හි අඩංගු වන රාජකාරී පැහැර හැරීම් හා / හෝ විෂමාචාරයන්හි යෙදීම් යන වැරදි එකක් හෝ කීපයක් හෝ සියල්ලම හෝ සිදුකිරීම හේතු කොට ගෙන ඔබ සේවයෙන් පහ නොකිරීමට හෝ වෙනත් අයුරකින් ඔබට දඬුවම් නොපැමිණවීමට හෝ හේතු ඇතොත් මෙම චෝදනා පත්‍රය ලැබී දින ....................... ඇතුළත ...................................................... ........................................................... මඟින් මා වෙත ලිඛිතව ඉදිරිපත් කරන ලෙසට ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදය ................................................ වැනි උපවගන්තිය යටතේ මෙයින් ඔබට නියෝග කරමි.

**චෝදනා**

(i). ..........................................................
(ii). ..........................................................
(iii). ..........................................................
(iv). ..........................................................

02. මෙම චෝදනා සනාථ කිරීම සඳහා පහත සඳහන් සාක්ෂිකරුවන් සහ ලිපි ලේඛන උපයෝගී කරගනු ලැබේ.

**I සාක්ෂිකරුවන්**

(i). ..........................................................
(ii). ..........................................................
(iii). ..........................................................

**II ලිපිලේඛන**

(i). ..........................................................
(ii). ..........................................................
(iii). ..........................................................

03. උක්ත 02 (II) හි දැක්වෙන ලිපිලේඛන පරීක්ෂා කර බැලීමට ඔබට හා/හෝ ඔබගේ රැකවරණ නිලධරයාට අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා ................................................................... ගේ (දෙපාර්තමේන්තු ප්‍රධානයාගේ තනතුර සඳහන් කරන්න.) පූර්ව අනුමැතිය ලබාගෙන ඔහු විසින් නියම කරනු ලබන දිනයක දී ඒවා පරීක්ෂා කර බලා ඔබට අවශ්‍ය වන ලිපි ලේඛනවල ඡායා පිටපත් ......................................................... පූර්ව අනුමැතිය මත නියමිත මුදලක් ගෙවා ලබාගත හැකිය.

04. ඔබ වෙනුවෙන් පෙනී සිටීමට රැකවරණ නිලධරයෙක් තෝරා ගැනීමට ඔබ අදහස් කරන්නේ නම් ඒ සඳහා ඔහු දරන තනතුර (විශ්‍රාමිකයකු නම් දැරූ) සහ රාජකාරී / පෞද්ගලික ලිපිනය සඳහන් කරමින් ඔහු ඔබගේ රැකවරණ නිලධරයා වශයෙන් පෙනී සිටීමට කැමති බවට මේ සමඟ ඇති ආකෘතිය පුරවා මගේ පූර්ව එකඟත්වය ලබාගත යුතුය. ඔබගේ රැකවරණ නිලධරයා රජයේ නිලධරයකු හෝ රජයේ සේවයෙන් විශ්‍රාම ලැබූවකු හෝ විය යුතුය.

05. ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ 15:7 හා 15:8 යන උපවගන්ති අනුව පිළිතුරු සැපයීමට ඔබට පුළුවන. ඔබ නිවැරදිකරුවකු බව පවසා ඔබේ නිදොස් බව සනාථ කිරීමට විධිමත් විනය පරීක්ෂණයක් පවත්වන ලෙස ඉල්ලා සිටින්නේ නම් ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ 19 වන වගන්තියේ දැක්වෙන පරිදි පරීක්ෂණ නිලධරයකු මවිසින් පත්කරනවා ඇත. නීතිඥයකු පරීක්ෂණ නිලධරයා වශයෙන් පත්කරවා ගැනීමට ඔබට අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා ප්‍රමාණවත් හේතු සාධක ඉදිරිපත් කළ යුතුය.

06. ඔබගේ පිළිතුරු නියමිත කාලසීමාව තුළ දී ........................................... (දෙපාර්තමේන්තු ප්‍රධානයා) මඟින් මා වෙත ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් ඔබගේ නිදහසට ඉදිරිපත් කිරීමට තරම් කරුණු නොමැති සේ සලකා ක්‍රියා කරන්නෙමි.

07. කරුණාකර මෙම චෝදනා පත්‍රය ලැබුණු බව ......................................................... (දෙපාර්තමේන්තු ප්‍රධානයා) මඟින් මා වෙත දන්වා එවන්න.

විනය බලධරයා

පිටපත් :- 1.
2.

6 වැනි පරිශිෂ්ටය

**ආදර්ශ චෝදනා පත්‍රය**

**(විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 12 වන වගන්තියට යටත්කොට විශ්‍රාම ගන්වන ලද නිලධරයකුට නිකුත් කළ යුතු චෝදනා පත්‍රයක ආදර්ශ ආකෘතිය)**

ඔබ ........................................................................................................................ නිලධරයකු වශයෙන් ........................................................................................................ සේවය කරමින් සිටිය දී ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ ................................................ උප ලේඛනය යටතට ගැනෙන පහත සඳහන් චෝදනාවන්හි සඳහන් වැරදි එකක් හෝ කීපයක් හෝ සියල්ලම හෝ සිදු කිරීම හේතුකොට ගෙන ඔබට ගෙවිය යුතු විශ්‍රාම වැටුප හෝ පාරිතෝෂිකය හෝ වෙනත් දීමනාවක් හෝ ගෙවීම අහිමි කිරීමට හෝ එයින් කිසියම් ප්‍රතිශතයක් අඩු කිරීමට හෝ ක්‍රියා නොකිරීමට හේතුන් ඇතොත් එයට හේතු මෙම චෝදනා පත්‍රය ලැබී දින ............................................. ඇතුළත .................................................... මඟින් මා වෙත ඉදිරිපත් කරන ලෙස ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ ....................................... වැනි උපවගන්තිය යටතේ මෙයින් ඔබට නියෝග කරමි.

**චෝදනා**

(I). ..................................................................
(II). ..................................................................
(III). ..................................................................
(IV). ..................................................................

02. මෙම චෝදනා සනාථ කිරීම සඳහා පහත සඳහන් සාක්ෂිකරුවන් සහ ලිපිලේඛන උපයෝගී කරගනු ලැබේ.

**I සාක්ෂිකරුවන්**

(i). ..................................................................
(ii). ..................................................................
(iii). ..................................................................
(iv). ..................................................................

**II ලිපිලේඛන**

(i). ..................................................................
(ii). ..................................................................
(iii). ..................................................................

03. උක්ත 02(II) හි දැක්වෙන ලිපිලේඛන පරීක්ෂා කර බැලීමට ඔබට හා/ හෝ ඔබගේ රැකවරණ නිලධරයාට අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා ........................................................................... ගේ (දෙපාර්තමේන්තු ප්‍රධානයාගේ තනතුර සඳහන් කරන්න) පූර්ව අනුමැතිය ලබාගෙන ඔහු විසින් නියම කරනු ලබන දිනයක දී ඒවා පරීක්ෂා කර බලා ඔබට අවශ්‍ය ලිපිලේඛනවල ඡායා පිටපත් ........................................................ පූර්ව අනුමැතිය මත නියමිත මුදලක් ගෙවා ලබා ගත හැක.

04. ඔබ වෙනුවෙන් පෙනී සිටීමට රැකවරණ නිලධරයෙක් තෝරා ගැනීමට ඔබ අදහස් කරන්නේ නම් ඒ සඳහා ඔහු දරන තනතුර (විශ්‍රාමිකයකු නම් දැරූ) සහ රාජකාරී / පෞද්ගලික ලිපිනය සඳහන් කරමින් ඔහු ඔබගේ රැකවරණ නිලධරයා වශයෙන් පෙනී සිටීමට කැමති බවට මේ සමඟ ඇති ආකෘතිය පුරවා මගේ පූර්ව එකඟත්වය ලබාගත යුතුය. ඔබගේ රැකවරණ නිලධරයා රජයේ නිලධරයකු හෝ රජයේ සේවයෙන් විශ්‍රාම ලැබුවකු හෝ විය යුතුය.

05. ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ 15:7 හා 15:8 යන උපවගන්ති අනුව පිළිතුරු සැපයීමට ඔබට පුළුවන. ඔබ නිවැරදිකරු බව පවසා ඔබේ නිදොස් බව සනාථ කිරීමට විධිමත් විනය පරීක්ෂණයක් පවත්වන ලෙස ඉල්ලා සිටින්නේ නම් ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ 19 වන වගන්තියේ දැක්වෙන පරිදි පරීක්ෂණ නිලධරයකු මවිසින් පත්කරනවා ඇත. නීතිඥයකු පරීක්ෂණ නිලධරයා වශයෙන් පත්කරවා ගැනීමට ඔබට අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා ප්‍රමාණවත් හේතු සාධක ඉදිරිපත් කළ යුතුය.

06. ඔබගේ පිළිතුරු නියමිත කාලසීමාව තුළ දී ........................................... (දෙපාර්තමේන්තු ප්‍රධානයා) මඟින් මා වෙත ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් ඔබගේ නිදහසට ඉදිරිපත් කිරීමට තරම් කරුණු නොමැති සේ සලකා ක්‍රියා කරන්නෙමි.

07. කරුණාකර මෙම චෝදනා පත්‍රය ලැබුණු බව ......................................................... (දෙපාර්තමේන්තු ප්‍රධානයා) මඟින් මා වෙත දන්වා එවන්න.

විනය බලධරයා

පිටපත් :- 1.
2.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ:- 06/2004

මගේ අංකය: ආ/9/6/48
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.
2004.12. 15 වැනි දින.

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන්.

## <u>ආයතන සංග්‍රහයේ **XLVIII** වැනි පරිච්ඡේදය සංශෝධනය කිරීම</u>

ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ විධිවිධාන පහත සඳහන් පරිදි සංශෝධනය කිරීමට රජය විසින් තීරණය කර ඇත. ඒ අනුව දැනට චෝදනා පත්‍ර නිකුත් කර ඇති විනය පරීක්ෂණවලට අගතියක් නොවන ලෙස ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII පරිච්ඡේදය පහත සඳහන් පරිදි සංශෝධනය කෙරේ.

I. XLVIII වැනි පරිච්ඡේදයේ 19:5 වැනි උප වගන්තිය දැනට පවතින විධිවිධාන වෙනුවට පහත සඳහන් විධිවිධාන ඇතුළත් කිරීම.

19:5 රජයේ සේවයෙන් විශ්‍රාම ලත් සහ ස්වකීය සේවා කාලය තුළ දී ආයතන සංග්‍රහයේ පළමුවැනි උපලේඛනය යටතේ දක්වෙන වරදකට දඬුවම් නොලැබූ, මාණ්ඩලික නිලධාරියෙකු වශයෙන් දස වසරකට හෝ ඊට වැඩි සේවා කාලයක් ඇති නිලධාරියෙකු හෝ විනය පරීක්ෂණ නිලධාරියෙකු වශයෙන් හෝ පැමිණිල්ල මෙහෙයවන හෝ රැකවරණ නිලධරයෙකු වශයෙන් හෝ වසර පහකට වැඩි කාලයක් කටයුතු කර පළපුරුද්ද ඇති හා මාණ්ඩලික ශ්‍රේණියක වසර අටක සේවා කාලයක් ඇති විශ්‍රාම ලත් නිලධරයන්ගෙන් සහ දස වසරකට වැඩි පළපුරුද්ද ඇති නීතිඥයන්ගෙන් සමන්විත විනය පරීක්ෂණ නිලධාරි සංචිතයක් රාජ්‍ය පරිපාලන විෂය භාර ලේකම්වරයා විසින් ස්ථාපනය කොට අවස්ථාවෝචිත පරිදි සංශෝධනය කරමින් අඛණ්ඩව පවත්වාගෙන යා යුත්තේය. එසේම එම පරීක්ෂණ මඬුල්ල සම්බන්ධයෙන් විස්තර වරින්වර අමාත්‍යාංශ ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ අනෙකුත් බලධරයන්ට ලිඛිතව දැනුම් දීම රාජ්‍ය පරිපාලන විෂය භාර ලේකම්වරයාගේ වගකීම වන්නේය.

II 22:1 උප වගන්තියට පසුව පහත සඳහන් 22:1:1 උප වගන්තිය ඇතුළත් කිරීම:

22:1:1 චූදිත නිලධාරියෙකුට විරුද්ධව චෝදනා පත්‍රයක් නිකුත් කර එක් වසරක් ඇතුළත අදාළ පරීක්ෂණය නිම කර විනය නියෝගයක් නිකුත් කිරීමට විනය බලධාරියා අවශ්‍ය පියවර ගතයුතුය. 31:11 උප වගන්තියෙහි සඳහන් චෝදනාවක් නොවන අවස්ථාවක චූදිත නිලධාරියාගේ ප්‍රමාදයක් නිසා පරීක්ෂණය පමා වන අවස්ථාවක දී හැර වෙනත් කරුණක් නිසා එසේ වසරකට වඩා පරීක්ෂණය අවසන් කර විනය නියෝගය නිකුත් කිරීමට ප්‍රමාද වන්නේ නම් චූදිත නිලධාරියා වැඩ තහනමට ලක් කර ඇත්නම් ඔහු නැවත සේවයේ පිහිටුවා එදින සිට වැටුප් ගෙවිය යුතුය. එතෙක් නොගෙවන ලද වැටුප පිළිබඳව විනය නියෝගය ලැබීමෙන් පසු එහි සඳහන් පරිදි කටයුතු කළයුතුය.

III **27:10** උප වගන්තියට පසුව **27:10:1** සහ **27:10:2** උප වගන්ති ඇතුලත් කිරීම:


**27:10:1** අල්ලස් හෝ දූෂණ හෝ රාජ්‍ය විරෝධී හෝ ත්‍රස්තවාදී ක්‍රියා හෝ සම්බන්ධ චෝදනා සම්බන්ධයෙන් හැර නිලධාරියාගේ රාජකාරියට අදාල නොවන සාපරාධී වරදක් සම්බන්ධයෙන් අධිකරණයේ නඩු පවරා ඇති අවස්ථාවක චෝදනාවේ ස්වභාවය අනුව නිලධාරියා නැවත සේවයේ පිහිටුවීම රාජ්‍ය සේවයේ යහපතට හානිකර නොවන්නේ යැයි විනය බලධාරියා තීරණය කරන්නේ නම් එවැනි අයකු නැවත සේවයේ පිහිටුවිය යුතුය.

**27:10:2** **27:10:1** උප වගන්තිය යටතේ නැවත සේවයේ පිහිටුවීම රාජ්‍ය සේවයේ යහපතට හානිකර බව විනය බලධාරියාට හැඟෙන්නේ නම් අධිකරණ තීන්දුව ලැබෙන තෙක් තවදුරටත් එවැනි නිලධාරියෙකුගේ වැඩ තහනම් කළයුතුය. එවැනි අයකු සම්බන්ධව අධිකරණ තීන්දුව ලැබීමට වසරකට වැඩි කාලයක් ගත වන්නේ නම් නිලධාරියාට වැටුපෙන් භාගයකට නොවැඩි මුදලක් ගෙවීමට බලය දීමට විනය බලධාරියාට හැකිය.

IV **31:12** උප වගන්තියට පසුව පහත සඳහන් **31:12:1** උප වගන්තිය ඇතුලත් කිරීම:

**31:12:1** **27:10:2** උප වගන්තියෙහි සඳහන් අවස්ථාවක අධිකරණ තීන්දුව වසරක් ඇතුලත නොලැබුණහොත් නිලධාරියාගේ මාසික වැටුපෙන් භාගයකට නොවැඩි මුදලක් ඔහුට ගෙවීමට බලය දීමට විනය බලධාරියාට හැකිය.

31:12 උප වගන්තියට



එස්.සී. මාන්නප්පෙරුම
ලේකම්
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : **07/2010**

මගේ අංකය: ආ/9/6/වි.ප. 2-2(V)
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.

**2010.06.22**

අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන්.

**පරීක්ෂණ විනිශ්චය සභා පත්කිරීමේදී අවශ්‍ය සුදුසුකම් සංශෝධනය කිරීම**
**ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLVIII පරිච්ඡේදය**

ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII පරිච්ඡේදයේ **19:4** සහ **19:5** වගන්ති සංශෝධනය කිරීමට රජය තීරණය කර ඇත.

**02.** ඒ අනුව ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII පරිච්ඡේදයේ **19:4** සහ **19:5** උප වගන්ති පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.

**19:4** - රජයේ සේවයේ නියුතු නිලධරයෙකු විධිමත් විනය පරීක්ෂණයකදී විනිශ්චය සභාවක් වශයෙන් විනය බලධරයා විසින් පත්කරනු ලැබිය හැක්කේ, අදාළ නිලධරයා ස්වකීය සේවා කාලය තුළදී ආයතන සංග්‍රහයේ පළමුවන උපලේඛනය යටතේ දැක්වෙන වරදකට දඬුවම් ලබා නොමැත්තේ නම් හෝ ස්වකීය සේවා කාලය තුළදී ආයතන සංග්‍රහයේ දෙවන උපලේඛනය යටතේ දැක්වෙන වරදක් කිරීමෙන් අනතුරුව, වර්ෂ පහක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇත්තේ නම් පමණකි. 19:4 උප වගන්තියට

**19:5** රජයේ සේවයෙන් විශ්‍රාමලත් සහ ස්වකීය සේවා කාලය තුළදී ආයතන සංග්‍රහයේ පළමුවන උපලේඛනය යටතේ දැක්වෙන වරදකට විනයානුකූල දඬුවම් නොලැබූ හෝ ස්වකීය සේවා කාලය තුළදී එහි දෙවන උපලේඛනය යටතේ දැක්වෙන වරදක් කිරීමෙන් අනතුරුව, වර්ෂ පහක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇත්තා වූ, මාණ්ඩලික නිලධරයෙක් වශයෙන් දස වසරක් හෝ ඊට වැඩි සේවා කාලයක් ඇති තැනැත්තන්ගෙන් සහ නීතිඥයන්ගෙන් සමන්විත විනය පරීක්ෂණ නිලධර සංචිතයක්, රාජ්‍ය පරිපාලන විෂය භාර ලේකම්වරයා විසින් ස්ථාපනය කොට අවස්ථාවෝචිත පරිදි සංශෝධනය කරමින් අඛණ්ඩව පවත්වාගෙන යා යුත්තේය. එසේම, එම පරීක්ෂණ මඩුල්ල සම්බන්ධයෙන් විස්තර වරින්වර අමාත්‍යාංශ ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ අදාළ අනිකුත් නිලධරයන්ට ලිඛිතව දැනුම්දීම රාජ්‍ය පරිපාලන විෂයභාර ලේකම්වරයාගේ වගකීමක් වන්නේය. 19:5 උපවගන්තියට

**03.** එසේම මේ දක්වා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් ප්‍රකාශිත විනය පරීක්ෂණ නිලධාරීන්ගේ නාම ලේඛන වෙනත් නියමයක් කරන තුරු ඒ ආකාරයෙන්ම බලපැවැත්වේ.

ඩී. දිසානායක
ලේකම්,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ: 18/2013

මගේ අංකය:EST-9/DICIP/06/0212
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07

2013.09.04

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ සිංහල හා ඉංග්‍රීසි පාඨ ප්‍රතිශෝධනය කිරීම**

ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. එම පරිච්ඡේදයේ 23:9, 24:6, 27:10 සහ 36:7 උප වගන්තිවල සිංහල හා ඉංග්‍රීසි පාඨ නිසි පරිදි ප්‍රතිශෝධනය කර නිවැරදි කළ යුතු බවට 2013.07.25 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කර ඇත.

03. ඒ අනුව දැනට පවත්නා පාඨ වෙනුවට පහත සඳහන් පාඨ ආදේශ කරනු ලැබේ.

(i). 23:9 උප වගන්තියේ ඉංග්‍රීසි පාඨය

23:9. The effective date of the punishment imposed by the disciplinary authority on an accused officer after completion of a formal disciplinary inquiry or after calling for his explanations should be the date on which he committed the offence relevant to the charge.

මේ උප වගන්තියේ සිංහල පාඨයට ප්‍රතිශෝධන නොමැත.

(ii). 24:6 උප වගන්තිය

24:6. විනය නියෝගයක කොටසක් වශයෙන් වැටුප් වර්ධක විලම්භනය කිරීමක් හෝ අඩුකිරීමක් හෝ නැවැත්වීමක් හෝ නියෝග කොට ඇති අවස්ථාවක දී එය ක්‍රියාත්මක කළ යුතු වන්නේ ඉහත 23:9 උප වගන්තියට යටත්ව වේ.

24:6 උප වගන්තියට

(iii). 27:10 උප වගන්තියේ ඉංග්‍රීසි පාඨය

27:10. Where legal proceedings are taken against a public officer for criminal offence or bribery or corruption, the relevant officer should be interdicted forthwith by the appropriate authority.

මේ උප වගන්තියේ සිංහල පාඨයට ප්‍රතිශෝධන නොමැත.

(iv). 36:7 උප වගන්තිය

36:7. විධිමත් විනය පරීක්ෂණයේ දී ඉදිරිපත් වූ කරුණු අනුව චූදිත නිලධාරියා එක් චෝදනාවකට හෝ චෝදනා කිහිපයකට හෝ සියලුම චෝදනාවලට වැරදිකරු වී ඇති බවට විනය බලධරයා විසින් නිගමනය කරන්නේ නම්, වරදකරු වී ඇති චෝදනාවේ හෝ චෝදනාවල ස්වභාවය අනුව නිලධරයාට ගෙවිය යුතු හෝ ප්‍රදානය කළ යුතු යම් විශ්‍රාම වැටුපක්, පාරිතෝෂිකයක් හෝ වෙනත් දීමනාවක් නතර කළ යුතු වන්නේ ද, නොඑසේ නම්, යම් ප්‍රමාණයකින් අඩු කළ යුතු වන්නේ ද යන වග සඳහන් කරමින් චෝදනා පත්‍රය හා විධිමත් විනය පරීක්ෂණයේ වාර්තාව ඇතුළු අනෙකුත් සියලු ලියවිලි ද සමග තම නිරීක්ෂණ හා විනය නියෝගය, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 12 වැනි වගන්තිය අනුව කටයුතු කිරීම සඳහා රාජ්‍ය පරිපාලන විෂය භාර ලේකම් වරයා වෙත අප්‍රමාද ව යැවිය යුත්තේ ය.

36:7 උප වගන්තියට

පී.බී.අබේකෝන්
ලේකම්
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 04/2015

මගේ අංකය : EST-9/DICIP/06/0052
රාජ්‍ය පරිපාලන, පළාත් සභා, පළාත් පාලන සහ
ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.
2015.01.29


අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>ජනමාධ්‍යයන් වෙත ප්‍රකාශ නිකුත් කිරීම</u>**

ජනමාධ්‍යයට හෝ මහජනතාවට හෝ නිල ප්‍රවෘත්ති සැපයීම සම්බන්ධයෙන් වන ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩයේ XLVII පරිච්ඡේදයේ 6 සහ 7 වගන්ති කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. විවිධ විෂයයන් පිළිබඳව රජයේ නිලධරයන් විසින් ජනමාධ්‍ය වෙත ලබාදෙන ඇතැම් තොරතුරු හේතුවෙන් පසුගිය කාලවකවානුව තුළ ගැටලුකාරී තත්ත්වයන් උද්ගත වී ඇති බව නිරීක්ෂණය වී ඇත. මෙම තත්ත්වය පිළිබඳව කඩිනම් අවධානය යොමු කර එවැනි තත්ත්වයන් ඇති නොවීමට අවශ්‍ය පියවර ගත යුතු ය.

03. ජනමාධ්‍යයට හෝ මහජනතාවට හෝ නිල ප්‍රවෘත්ති සැපයීම සම්බන්ධයෙන් වන ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLVII පරිච්ඡේදයේ 6 සහ 7 වගන්තීන්හි විධිවිධාන අනුව සියලුම රජයේ නිලධරයන් කටයුතු කළ යුතු අතර එයින් පරිබාහිරව ක්‍රියා කර කිසියම් ගැටලුකාරී වාතාවරණයක් මතුවුවහොත් ඒ සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කරන බව අදාළ නිලධරයන් වෙත දැන්වීමට කටයුතු කරන ලෙස දන්වා සිටිමි.



ජේ. දඩල්ලගේ
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා, පළාත් පාලන සහ
ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශය

6 වගන්තියට

7 වගන්තියට

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 05/2017

මගේ අංකය: EST-3/DICIP/06/0238
රාජ්‍ය පරිපාලන හා
කළමනාකරණ අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2017.03.06

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 26:3 උප වගන්තිය සංශෝධනය කිරීම

ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 26:3 උප වගන්තිය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි. එම උප වගන්තියට පහත සඳහන් 26:3:1 උප වගන්තිය එකතුකර සංශෝධනය කිරීමට 2017.01.31 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත.

**26:3:1** විනය නියෝගයකින් අතෘප්තියට පත් නිලධරයකුට එම විනය නියෝගයට එරෙහිව අභියාචනය කිරීමට ඇති අයිතිය වඩා සාධනීය ලෙස භාවිතා කිරීම සඳහා විනය නියෝගය ලබා දීමට පාදක කරගත් කරුණු අදාළ නිලධරයාගේ ඉල්ලීම මත ඔහු වෙත දැන්වීමට විනය බලධරයා බැඳී සිටී.

ජේ.ජේ.රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය

26:3 උප වගන්තියට

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 10/2017

මගේ අංකය: EST-3/DICIP/06/0246
රාජ්‍ය පරිපාලන හා
කළමනාකරණ අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.

2017.05.25

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 1:1:1 හා 1:1:2 උප වගන්ති සංශෝධනය කිරීම

ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 1:1:1 හා 1:1:2 උප වගන්ති කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි. එම උප වගන්ති පහත සඳහන් පරිදි සංශෝධනය කිරීමට 2017.05.02 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කර ඇත.

**1:1:1** "විනය බලධරයා" යනුවෙන් අදහස් කරන්නේ පහත සඳහන් 2 වන වගන්තිය අනුව කිසියම් නිලධරයකු සේවයෙන් පහ කිරීමට හෝ ඔහු පිළිබඳ විනය පාලන කටයුතු කිරීමට හෝ බලය පැවරී ඇති නිසි බලධරයාය; තනතුර නිත්‍ය වශයෙන් දරන තැනැත්තා නැති අවස්ථාවකදී එම තනතුරෙහි වැඩ බැලීමට, රාජකාරී ඉටු කිරීමට හෝ රාජකාරී ආවරණය කිරීමට පවතින විධිවිධාන අනුව විධිමත්ව පත්කරනු ලබන ඕනෑම බලධරයෙක් ද "විනය බලධරයා" යන පාඨයෙන් අදහස් කෙරේ.

**1:1:2** වැඩ බැලීමේ හෝ රාජකාරී ඉටුකිරීමේ පත්වීමක් දරන රජයේ නිලධරයකු සම්බන්ධයෙන් වන කල්හි "විනය බලධරයා" යනුවෙන් අදහස් කරන්නේ ඉදින් එම නිලධරයා එම පත්වීම නිත්‍ය පදනමක් මත දැරුවේ නම් එවිට ඔහු සම්බන්ධයෙන් වන නිසි විනය බලධරයා ය.

ආපසු

ජේ.ජේ.රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 28/2017

මගේ අංකය: EST-3/DICIP/06/0253
රාජ්‍ය පරිපාලන හා
කළමනාකරණ අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2017.10.24

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ**
**24:3:5 උප වගන්තිය සංශෝධනය කිරීම**

ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 24:3:5 උප වගන්තිය කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි.

02. එම උප වගන්තිය පහත සඳහන් පරිදි සංශෝධනය කිරීමට 2017.09.26 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කර ඇත.

24:3:5 වෛකල්පික විශ්‍රාම ගන්නා වයසින් පසු ඕනෑම අවස්ථාවක සේවයෙන් විශ්‍රාම ගැන්වීම.

ජේ.ජේ.රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය

ආපසු

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 08/2019

මගේ අංකය: EST-3/DICIP/06/0269
රාජ්‍ය පරිපාලන හා
ආපදා කළමනාකරණ අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2019.03.28

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 36 වගන්තිය සංශෝධනය කිරීම</u>**

ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 36 වගන්තිය කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි.

02. එම වගන්තියට පහත සඳහන් පරිදි 36:8 ලෙස නව උප වගන්තියක් ඇතුළත් කිරීමට 2019.01.29 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත.

36:8 වෛකල්පික විශ්‍රාම ගැන්වීමේ වයසට එළඹීමට පෙර නිලධරයෙකු විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ වගන්තියකට අනුව හෝ වෙනත් නීතියකින් විශ්‍රාම ගැන්විය යුතු වන අවස්ථාවක දී නිලධරයා සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ගයක් පවතින්නේ නම් ඔහු විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 12 වගන්තියට යටත් කොට විශ්‍රාම ගැන්වීමටත්, විනය ක්‍රියාමාර්ගය අවසන්ව විනය නියෝගය ලබාදුන් පසු එකී විනය නියෝගය ක්‍රියාත්මක කිරීමට යටත්ව ඔහු සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ගයක් නොතිබුණේ නම් ඔහු විශ්‍රාම ගැන්විය යුතුව තිබූ වගන්තියේ විධිවිධාන පරිදි ඔහුගේ විශ්‍රාම වැටුප් සැකසීමට කටයුතු කළ යුතු වන්නේ ය.

ජේ.ජේ.රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන හා
ආපදා කළමනාකරණ අමාත්‍යාංශය

ආපසු

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 27/2019

මගේ අංකය: EST-3/DICIP/06/0245
රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ
පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2019.09.09

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 27:10 උප වගන්තිය සංශෝධනය කිරීම

2004.12.15 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2004 මගින් සංශෝධිත ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 27:10 වන උප වගන්තිය කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි.

02. එම වගන්තියේ 27:10:1 සහ 27:10:2 උප වගන්ති පහත සඳහන් පරිදි සංශෝධනය කිරීමට 2019.08.27 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත.

27:10:1 එතෙකුදු වුවත්, අල්ලස් ගැනීමක් හෝ රාජ්‍ය විරෝධී ක්‍රියාවක් හෝ ත්‍රස්තවාදී ක්‍රියාවක් නොවන දූෂණ හෝ සාපරාධී වරදක් සම්බන්ධයෙන් රජයේ නිලධරයෙකුට විරුද්ධව අධිකරණයේ නඩු පවරා ඇති අවස්ථාවකදී එම නිලධරයා සම්බන්ධයෙන් මාස 02කට නොවැඩි කාලයක් තුළදී විනය බලධරයා/ පරිපාලන බලධරයා විසින් මූලික විමර්ශනයක් පැවැත්විය යුතුය. අදාළ මූලික විමර්ශන වාර්තාව විනය බලධරයා/ පරිපාලන බලධරයා විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ඉදිරිපත් කළ යුතු අතර, එම වාර්තාවෙන් අනාවරණය වන කරුණු අනුව නිලධරයා නැවත සේවයේ පිහිටුවීම රාජ්‍ය සේවයේ යහපතට හානිකර නොවන්නේ යැයි රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කරන්නේ නම් එවැනි නිලධරයකු නැවත සේවයේ පිහිටුවිය හැකිය.

27:10:2 27:10:1 උප වගන්තිය යටතේ නිලධරයා නැවත සේවයේ පිහිටුවීම රාජ්‍ය සේවයේ යහපතට හානිකර බව රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කරන අවස්ථාවක අධිකරණ තීන්දුව ලැබෙන තෙක් තවදුරටත් එවැනි නිලධරයකුගේ රාජකාරී වැඩ තහනම් කළ යුතුය. එවැනි අයකු සම්බන්ධ අධිකරණ තීන්දුව ලැබීමට වසරකට වැඩි කාලයක් ගතවන්නේ නම් නිලධරයාට වැටුපෙන් භාගයකට නොවැඩි මුදලක් ගෙවීමට බලය දීමට විනය බලධරයාට හැකිය.

03. එසේම දැනට ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ 27:10 උප වගන්තියේ විධිවිධාන පරිදි රාජකාරී වැඩ තහනම් කර සිටින නිලධරයන් සම්බන්ධයෙන් ද සංශෝධිත 27:10:1 හා 27:10:2 උප වගන්තීන්හි විධිවිධාන අනුව විනය බලධරයන්ට ක්‍රියා කළ හැකි වේ.

ජේ.ජේ.රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ
පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය

ආපසු

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 30/2019

මගේ අංකය: EST-3/DICIP/06/0259
රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ
පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.

2019.09.30

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 13:2, 21:2, 22:1:1 හා 14:12 උප වගන්ති සංශෝධනය කිරීම

ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 13:2, 21:2, 22:1:1 හා 14:12 උප වගන්ති කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි.

02. එම උප වගන්ති පහත සඳහන් පරිදි සංශෝධනය කිරීමට 2019.08.27 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කර ඇත.

**I. ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 13:2 උප වගන්තිය සංශෝධනය කිරීම**

13:2 කිසියම් විෂමාචාරයක් සම්බන්ධ සිදුවීමක් පිළිබඳව මූලික විමර්ශනයක් පැවැත්වීම මාස දෙකක් ඇතුළත අවසන් කළ යුතු බව නියෝගය නිකුත් කරන අවස්ථාවේ දීම මූලික විමර්ශනයක් පැවැත්වීම සඳහා නියෝග කරන බලධරයකු විසින් මූලික විමර්ශන නිලධරයා හෝ නිලධර කමිටුව වෙත අනිවාර්යයෙන් ම නියම කළ යුතු ය. එසේ වුව ද, ඊට අමතර කාලයක් අවශ්‍ය වන්නේ නම් මූලික විමර්ශන නිලධරයා හෝ නිලධර කමිටුව විසින් ප්‍රමාණවත් පිළිගත හැකි හේතු ඉදිරිපත් කරමින් අදාළ බලධරයාගෙන් අනුමතියක් ලබාගත යුතු ය. එතෙකුදු වුවත් සෑම මූලික විමර්ශනයක්ම නොපමාව නිම කිරීමට අදාළ සෑම පාර්ශවයක්ම නිරන්තරයෙන්ම වග බලා ගතයුතු වන්නේ ය.

ආපසු

**II. ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 21:2 උප වගන්තිය සංශෝධනය කිරීම**

21:2 චූදිත පක්ෂය, පිළිගත හැකි හේතූන් පිළිබඳව පූර්ව දැනුම්දීමකින් තොරව විධිමත් විනය පරීක්ෂණයේ ආසන්න පරීක්ෂණ සැසිවාර දෙකක දී නොපැමිණියේ නම් චූදිත නිලධාරී නොමැති සේ සලකා විනිශ්චය සභාව විසින් පරීක්ෂණය අඛණ්ඩව පවත්වාගෙන යා යුතු ය. ඒ අනුව විනය පරීක්ෂණය ඒක පාර්ශවිකව පැවැත්වීමට කටයුතු කරන බව විනිශ්චය සභාව විසින් චූදිත නිලධරයා වෙත ලේඛනගත තැපෑලෙන් දන්වා යැවිය යුත්තේ ය. විනය පරීක්ෂණය පැවැත්වීමට නියම කරනු ලබන ඊළඟ දිනයේ දී චූදිත පක්ෂය ඊට සහභාගීවීමට අපොහොසත් වුවහොත් එදින සිට ඉදිරි පරීක්ෂණ දිනයන්හි චූදිත පක්ෂය ඒ සඳහා සහභාගී වුව ද නොවුව ද විනය පරීක්ෂණය අඛණ්ඩව පවත්වාගෙන යාමට විනිශ්චය සභාව කටයුතු කළයුතු වන්නේ ය.

ආපසු

## III. ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 22:1:1 උප වගන්තිය සංශෝධනය කිරීම

22:1:1 යම් නිලධරයෙකු විසින් සිදු කරන ලද විෂමාචාරයක් සම්බන්ධයෙන් නිකුත් කරන ලද චෝදනා පත්‍රයකට අදාළව පවත්වනු ලබන විධිමත් විනය පරීක්ෂණය එම පරීක්ෂණය ආරම්භ කර මාස හයක් ඇතුළත නිම කළ යුතු ය. ඒ සඳහා අමතර කාලයක් අවශ්‍ය වන්නේ නම් පරීක්ෂණ නිලධාරී විසින් ප්‍රමාණවත් පිළිගත හැකි හේතු ඉදිරිපත් කරමින් විනය බලධරයාගේ අනුමතිය ලබාගත යුතු ය. 31:11 උප වගන්තියෙහි සඳහන් චෝදනාවක් නොවන අවස්ථාවක චූදිත නිලධරයාගේ ප්‍රමාදයක් නිසා පරීක්ෂණය ප්‍රමාද වන අවස්ථාවක දී හැර වෙනත් කරුණක් නිසා එසේ මාස හයකට වඩා ප්‍රමාද වන්නේ නම් චූදිත නිලධරයා වැඩ තහනමට ලක් කර ඇත්නම් විනය පරීක්ෂණයේ සඳහන් කරුණුවලට යටත්ව විනය බලධරයාගේ අභිමතය පරිදි චූදිත නිලධරයා නැවත සේවයේ පිහිටුවා වැටුප් ගෙවිය හැකි ය. එතෙක් නොගෙවන ලද වැටුප පිළිබඳව විනය නියෝගය ලැබීමෙන් පසු එහි සඳහන් පරිදි කටයුතු කළ යුතු ය.

ආපසු

## IV. ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 14:12 උප වගන්තිය සංශෝධනය කිරීම

14:12:1 එසේ වුව ද, යම් රජයේ නිලධරයෙකු යම් තනතුරකට අදාළ උසස් කිරීමේ විභාගයකට හෝ දෙපාර්තමේන්තු පරීක්ෂණයකට හෝ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයකට පෙනී සිටීමට අවශ්‍ය සියලුම පූර්ව සුදුසුකම් සපුරා තිබිය දී වැඩ තහනම් කිරීම යන්න පමණක් ම පාදක කොට ගෙන අදාළ උසස් කිරීමේ විභාගයට හෝ දෙපාර්තමේන්තු පරීක්ෂණයට හෝ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයකට පෙනී සිටීමට නුසුදුස්සෙකු නොවන්නේ ය.

ආපසු


ජේ.ජේ.රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ
පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය